# හෝමාගම නගර සංවර්ධන සැලැස්ම

## 2022–2031



නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# හෝමාගම නගර සංවර්ධන සැලැස්ම

2022–2031

නාගරික සංවර්ධන අධිකාරිය
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

**හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031**
© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2022

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශය, සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදා හැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා නැවිගත කිරීම, බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

**ප්‍රකාශය**
නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන 7 වන හා 9 වන මහල, සෙත්සිරිපාය අදියර I,
බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

වෙබ් අඩවිය - www.uda.gov.lk
විද්‍යුත් තැපෑල - info@uda.gov.lk
දුරකථන අංක - + 94112 873 637
ප්‍රකාශනය 2022 ජූලි

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031, I වන කොටස, II වන කොටස සහ III කොටස වශයෙන් ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ. පළමුවන කොටස සමන්විත වන්නේ සංවර්ධන සැලැස්මේ පසුබිම, මූලික අධ්‍යයන, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය සහ සැලැස්මය. දෙවන කොටස 2022–2031 කාල පරිච්ඡේදය සඳහා සැලසුම් සීමාවට අදාල සැලසුම් සහ සංවර්ධන නියමතා වලින් සමන්විත වේ. III කොටස කලාප සීමා මායිම් ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් වලින් සමන්විත වේ.

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 සකස් කර ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශයේ ප්‍රධාන කාර්යාලය විසිනි.

**අධීක්ෂණය**

මේජර් ජෙනරාල් වී. උදය නානායක්කාර - සභාපති, නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී එන්.පී.කේ.රණවීර - අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී එච්.ඒ.දයානන්ද- අතිරේක අධ්‍යක්ෂ ජනරාල්- නා.සං.අ, නගර නිර්මාණ ශිල්පී එම්.පී. රණතුංග- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) - නා.සං.අ., නීතිඥ සී . ජයවර්ධන - උපදේශක (නීති) - නා.සං.අ., නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න - අධ්‍යක්ෂ(උපායමාර්ගික සැලසුම්) නා.සං.අ., එන්. ඒ.එස්.එන්. නිස්සංක මහතා - අධ්‍යක්ෂ (බස්නාහිර පළාත්) - නා.සං.අ., සී.කේ.ඊ. කළුපහන - අධ්‍යක්ෂ (පරිසර හා භූදර්ශන අංශය) නා.සං.අ. සහ ඩබ්.පී.පී. විජේසිංහ - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිසර හා භූදර්ශන අංශය)- නා.සං.අ.

**සැලසුම් කණ්ඩායම - නාගරික සංවර්ධන අධිකාරිය**

නගර නිර්මාණ ශිල්පී, සුගත් ප්‍රේමසිරි මහතා, අධ්‍යක්ෂ (ඌව පළාත්) - නා.සං.අධි., තුෂාරි දිසානායක මහත්මිය, නියෝජ්‍ය අධ්‍යක්ෂ - සැලසුම්, (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අධි, ඩී.කේ. එස්.පී.සඳරුවන්, නියෝජ්‍ය අධ්‍යක්ෂ,(දේපල කළමනාකරණ) - නා.සං.අධි., කේ.කේ.පී.පී.මයුරි, නගර නිර්මාණ ශිල්පී (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අධි., චතුරිකා ප්‍රිව්භාරි, නගර නිර්මාණ ශිල්පී (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අධි. සහ එස්.එම්. ජී .පී. සමරකෝන් (පරිසර සැලසුම් ශිල්පී)-පරිසර හා භූදර්ශන අංශය- නා.සං.අ

**සහාය කණ්ඩායම් - නාගරික සංවර්ධන අධිකාරිය**

උපායමාර්ගික සැලසුම් අංශය - (අධීක්ෂණය, නියාමනය සහ ගැසට් කිරීම)
පරිසර හා භූ දර්ශන අංශය - (පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම, ආපදා අවධානම අවම කිරීමේ සැලැස්ම, සංරක්ෂණය, සංස්කෘතික හා උරුම සැලසුම් සකස් කිරීම)
භූගෝලීය තොරතුරු පද්ධති අංශය - (භූගෝලීය තොරතුරු දත්ත සැපයීම)
පර්යේෂණ හා සංවර්ධන අංශය - (නව තාක්ෂණික ක්‍රම හඳුන්වාදීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම)

# ප්‍රණාමය

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 සැකසීම, නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශයේ ප්‍රධාන කාර්යාලයේ මූලික අධීක්ෂණය යටතේ සිදු විය. “බුද්ධිමතුන්ගේ හරිත නගරය”- (ග්‍රාමීය සුන්දරත්වය තුලින් විශ්වයට විවර වන දොරටුව) මෙම සැලැස්මේ දැක්මයි. දැනුම හා නවෝත්පාදන හරහා ආර්ථික, සමාජීය, භෞතික සංවර්ධනය අපේක්ෂා කරන, හරිත සුවපහසු නේවාසික ප්‍රදේශයක් නිර්මාණය කිරීම මෙම සැලැස්මෙන් අපේක්ෂා කෙරේ. හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ “රට හදන සෞභාග්‍යයේ දැක්ම ” ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව සකස් කර ඇත.

මෙහිදී 1982 අංක 04 දරණ පණත මගින් සංශෝධනය කරන ලද 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ විධි විධාන යටතේ හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 සඳහා අනුමැතිය ලබාදීම සිදු කර ලද නාගරික සංවර්ධන හා නිවාස සංවර්ධන විෂයභාර ගරු අමාත්‍ය මහින්ද රජපක්ෂ මැතිතුමන්ට අපගේ ගෞරවනීය ස්තුතිය පුදකර සිටිමු.

තවද මෙම ක්‍රියාවලියේදී අවශ්‍ය මගපෙන්වීම හා සහාය ලබාදුන් නාගරික සංවර්ධන, අපද්‍රව බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු පිළිබද ගරු රාජ්‍ය අමාත්‍ය ආචාර්ය නාලක ගොඩහේවා මැතිතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා මහතා වෙත ස්තුතිය පුදකොට සිටිමු.

හෝමාගම ප්‍රාදේශීය සභාවේ සභාපති සම්පත් ජයසිංහ මහතා ඇතුළු මහජන නියෝජිතයන් සහ එම කාර්යාලයේ නිලධාරීන්, හෝමාගම ප්‍රාදේශීය ලේකම් හා එම කාර්යාලයේ සියළුම නිලධාරීන්ටත් මෙහිදී සැලසුම් කණ්ඩායම හා නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් ස්තුතිය ප්‍රකාශ කරමු.

විශේෂයෙන් මෙම සැලැස්ම සකස් කිරීම සඳහා ෛධර්යය හා මගපෙන්වීම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති මේජර් ජෙනරාල් වි. උදය නානායක්කාර මහතාට, අධ්‍යක්ෂ ජෙනරාල්, නගර නිර්මාණ ශිල්පී එන්.පී. කේ.රණවීර මහතාට , අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නගර නිර්මාණ ශිල්පී එච්.ඒ.දයානන්ද මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම්), නගර නිර්මාණ ශිල්පී, එම්.පී.රණතුංග මහතාට, අධ්‍යක්ෂ (බස්නාහිර පළාත්) එන්. ඒ.එස්.එන්. නිස්සංක මහතාට,නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශක (නීති) නීතිඥ සී. ජයවර්ධන මහත්මියට හා උපාය මාර්ගික සැලසුම් අංශයේ අධ්‍යක්ෂ, නගර නිර්මාණ ශිල්පී ප්‍රියානි නවරත්න මහත්මියට අපගේ ස්තුතිය පුදකර සිටිමු.

අවසාන වශයෙන් පාරිසරික හා භූ දර්ශන අංශයේ අධ්‍යක්ෂ වරලත් භූදර්ශන ගෘහ නිර්මාණ ශිල්පී සී.කේ.ර්. කළුපහන මහත්මියට හා එම අංශයේ සියළුම නිලධාරීන්ටත්, භූගෝලීය තොරතුරු පද්ධති අංශයේ අධ්‍යක්ෂක, නගර නිර්මාණ ශිල්පී ජේ.පී.එස්.සෝමසේකර මහත්මිය හා එම අංශයේ සියළුම නිලධාරින්ටත් නන් අයුරින් සහාය දුන් සියළුම නිලධාරින්ටත් සැලසුම් කණ්ඩායම වෙනුවෙන් ස්තුතිය පුද කරමු.

විශේෂන්යෙන්ම නගර නිර්මාණ ශිල්පී චුලේශා දර්ශනී මහත්මියට (පර්යේෂණ හා සංවර්ධන අංශය) – නා. සං. අ. මෙම සැලැස්ම සාර්ථක කරගැනීම සඳහා ලබා දුන් සහයෝගයට ස්තුතිය පුද කරමු.

# ගරු අමාත්‍යතුමාගේ පෙරවදන



හෝමාගම" නගර සංවර්ධනය යථාර්ථයක් කරා...

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව "ගම සහ නගරය පිළිබඳ වෙනසක් නැති සැමට අවශ්‍ය සියළු පහසුකම්, සෑම තැන්හිම පවතින ආකාරයට අපේ රටේ භෞතික අවකාශය ප්‍රයෝජනයට ගත යුතුයි. ඒ සඳහා නව ප්‍රතිනාගරීකරණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍යයය".

මෙරට නාගරීකරණ ක්‍රියාවලිය තුළ පවතින අසම සංවර්ධනය නිසා එකම පළාතේ දිස්ත්‍රික්ක අතර මෙන්ම එකම දිස්ත්‍රික්කයේ නගර අතර පවතින පරතරය හා විෂමතාවයන් ද සැලකිල්ලට ගනිමින් නාගරික සංවර්ධන අධිකාරිය මගින් නගර සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීම කරනු ලැබේ.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය හදුනාගත් නගර 26 ක් සදහා කඩිනම් නගර සංවර්ධන සැලැසුම් මේ වන විට ප්‍රකාශයට පත් කර තිබෙන අතර තවත් නගර 50 ක් සදහා සංවර්ධන සැලසුම් මෙම වසර තුල සකස්කර නීතිගත කිරීමට මේ වන විට කටයුතු කරමින් පවතී. "හෝමාගම" නගර සංවර්ධන සැලැස්ම ද එලෙස ක්‍රියාත්මක වන එක් සැලැස්මකි. 2024 වන විට මෙවැනි නගර සංවර්ධන සැලසුම් 130 කට වැඩි ප්‍රමාණයක් සැකසීම සදහා සැලසුම්කර ඇත.

හෝමාගම නගර සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රමුඛත්වය හිමි වන්නේ හෝමාගම නගරයෙන් සේවා ලබාගන්නා සහ එහි නේවාසික ජනතාව සදහා වන අතර එය තවදුරටත් සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමේ විභවතාවයක් පවතී. එසේම ප්‍රදේශයේ පවතින ස්වාභාවික පරිසර පද්ධතිය මෙන්ම ආර්ථික වටිනාකමක් සහිත ස්ථානද විධිමත් පරිදි නාගරික ජනතාවගේ ප්‍රයෝජනය සදහා යොදා ගැනිමට මෙම සැලැසන්ම මගින් හදුනාගෙන ඇත.

මෙම සැලැස්ම සකස් කිරීමේදී වෘත්තීයවේදීන්, විශේෂඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රජාවගේ අදහස් හා යෝජනා ලබාගත් අතර එය නවීන විශ්ලේෂණ ක්‍රමෝපායන් හා තාක්ෂණික ක්‍රමවේදයන් හරහා මෙම සැලැස්ම සකස් කිරීම සදහා ප්‍රවේශයන් ලබාගන්නා ලදී.

ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා, සැලසුම් කණ්ඩායම් හා නන් අයුරින් මෙම කාර්තව්‍ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කොට සලකමි. තවදුරටත් අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා පොදු මහජනතාවගේ සහයෝගය හා දායකත්වය තුළින් හෝමාගම සංවර්ධන සැලසුම (2022–2031) සාර්ථකව ක්‍රියාත්මක කිරීමට මග සැලසෙනු ඇතැයි විශ්වාස කරමි.

ප්‍රසන්න රණතුංග
*නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය*

# ගරු සභාපතිතුමාගේ පෙරවදන -නාගරික සංවර්ධන අධිකාරිය



නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ කළමනාකාරණයට අදාලව සැලසුම් සකස් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම හිමි ප්‍රධානතම ආයතනයයි. 1978 දී අධිකාරිය පිහිටුවන ලද්දේ එකී ප්‍රදේශවල සංවර්ධනයන් ප්‍රවර්ධනය සහ නියාමනය කරනු වස් ඒකාබද්ධ සැලැසුම්කරණය සහ ක්‍රියාත්මක කිරීමේ අරමුණ ඇතිවය.

ඒ අනුව 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි සංශෝධිත පනතේ II අ කොටස 8 අ(1) වගන්තිය යටතේ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කල නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමට අධිකාරිය වෙත බලය පැවරී ඇත. ඒ අනුව, ප්‍රදේශයේ භෞතික, ආර්ථික, සාමාජයීය සහ පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන හෝමාගම සංවර්ධන සැලැස්ම සකස් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවීන සැලසුම් මෙවලම් හා ක්‍රමෝපායන් උපයෝගීකර ගනිමින් හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 වසර දක්වා බලාත්මක වන ලෙස පිළියෙල කර ඇත. හෝමාගම සංවර්ධන සැලැස්ම, සැලසුම් ප්‍රදේශයේ පවතින ගැටළු විසදීමටත්, ප්‍රදේශයට හිතකර සංවර්ධනයන් සහතික කිරීම සඳහා විභවතා ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමටත් උපාය මාර්ගික ප්‍රවේශයක් අනුගමනය කර ඇත. එබැවින් මහජන අවශ්‍යතා ඉටු කරනු වස් මෙම සැලැස්ම අනුගමනය කර එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වන ලෙස සියලුම පාර්ශවකරුවන් ගෙන් සහ මහජනතාව ගෙන් ඉල්ලා සිටිමි.

මෙම සැලැස්ම නියමිත කාලය තුල සාර්ථකව නිම කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායමට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි. තවද මෙම කර්තව්‍ය සාර්ථකව නිම කිරීම සඳහා සහයෝගය සහ දායකත්වය ලබාදුන් සියළුම පාර්ශවකරුවන්ට සහ ප්‍රජාවට කෘතඥ වන අතර සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ සියලු දෙනාගේම උපරිම සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

*මේජර් ජනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර*
*සභාපති*
*නාගරික සංවර්ධන අධිකාරිය.*

# ගරු සභාපතිතුමාගේ පෙරවදන - හෝමාගම ප්‍රාදේශීය සභාව



හෝමාගම ප්‍රදේශය ග්‍රාමීය සුන්දරත්වයෙන් අනූන වූ, සීඝ්‍ර ජනගහන වර්ධනයක් පෙන්නුම් කරන භෞතික වශයෙන් සීග්‍ර සංවර්ධනයකට ලක්වන ප්‍රදේශයක් ලෙස හඳුනා ගැනීමට හැකියාව ඇත. හෝමාගම ප්‍රාදේශීය සභාවේ දැක්ම වනුයේ නව තාක්ෂණය සමඟ මුසුවෙමින් මිනිසුන්ට ජීවත්වීමට හිතකර පරිසරයක් නිර්මාණය කිරීමයි. මිනිසුන්ගේ පොදු අවශ්‍යතා සපුරාලමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට අවශ්‍ය වටපිටාව සකස්කර දීමයි.

"බුද්ධිමතුන්ගේ හරිත නගරය"යන දැක්ම පදනම් කර ගනිමින් හෝමාගම ප්‍රදේශය සඳහා නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කිරීම නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙන ඇති කාලෝචිත උත්සාහයක් ලෙස හඳුනා ගැනීමට පුළුවන. ලෝකයේ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් සංවර්ධනය කරා යන ගමනේදී නව තාක්ෂණය පසුබිම් කරගෙන දියුණු ආර්ථික ස්ථාවරත්වයක් රට තුල ගොඩ නැගීමට කටයුතු කරනු දැකිය හැක. ඒ තුලින් නේවාසිකයන්ගේ ජීවන තත්ත්වයේ සීග්‍ර දියුණුවක් සිදු වීම යථාර්තයක් බව එම රටවල්වල ඒකපුද්ගල ආදායම දෙස බැලීමේදී පැහැදිලි වනු ඇත. ඒ අනුව හෝමාගම ප්‍රදේශය නව තාක්ෂණය හා විද්‍යාව තුලින් නිපදවෙන නව නිපැයුම් මෙන්ම විද්වතුන් බිහි කිරීම හරහා ශ්‍රී ලංකා ආර්ථිකය නගා සිටුවීමට තෝරා ගැනීම විශේෂිත වේ. තවද සංවර්ධන සැලැස්ම හරහා හරිත ප්‍රදේශය සුරක්ෂිත කිරීම හා නේවාසිකයන්ගේ සුව පහසුභාවය පිළිබඳව මූලික අවධානය ලබා දී තිබීම හෝමාගම ප්‍රදේශය ලැබූ භාග්‍යක් ලෙස හඳුනා ගැනීමට පුළුවන. හෝමාගම සංවර්ධන සැලැස්ම 2030 හරහා මෙම ප්‍රදේශයේ මිනිසුන් සංවර්ධනයේ නිවැරදි මාවතකට යොමු කිරීමට අවස්ථාව සකස් කරන අතර ඒ සම්බන්ධයෙන් මෙම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන පාර්ශවකරුවා වශයෙන් නාගරික සංවර්ධන අධිකාරියට අපගේ සුභාශිංසනය පිරිනැමේ.

නව සංවර්ධන දැක්මක් හා කාලෝචිත සංවර්ධන අභිමතාර්ථයන් පෙරදැරි කර ගනිමින් අනාගත ලෝකයට පිය නගන්නට, හෝමාගම ප්‍රදේශයේ ජනතාවට ස්වශක්තියෙන් නැඟී සිටින්නට, ධනවත් නගරයක් නිර්මාණය කරන්නට හා සාර්ථක සැලසුම්ගත නගරයක් නිර්මාණය කරන්නට නව සංවර්ධන සැලැස්ම මූලික පදනම යොදා ඇත. ඒ අනුව හෝමාගම ප්‍රදේශයේ පාර්ශවකරුවන් ලෙස හෝමාගම ප්‍රදේශයේ සියලුම ප්‍රදේශවාසීන් මෙම සංවර්ධන සැලැස්ම සමඟ සම්බන්ධවී කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

සම්පත් ජයසිංහ
*ගරු සභාපති*
*හෝමාගම ප්‍රාදේශීය සභාව*

# පූර්විකාව

1999 වර්ෂයේ අංක 1084/20 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සමස්ත හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව සමස්ත හෝමාගම ප්‍රදේශිය සභා ප්‍රදේශය සඳහා සකස් කරන ලද 2008-2020 හෝමාගම සංවර්ධන සැලැස්ම යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය මත හෝමාගම ප්‍රදේශය සඳහා නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට අවධානය යොමු කෙරිණි.

විශේෂයෙන්ම 2012-2021 යන වර්ෂවලට අදාලව එක් එක් රාජ්‍ය නොවන ආයතනවලින් සහ සිදු කරන ලද සමීක්ෂණවලට අදාල දත්ත භාවිතයට ගනිමින් විද්‍යානුකූලව සිදු කරන ලද විශ්ලේෂණයන්ට අනුව එළඹෙන ලද නිගමනයන් පදනම් කර ගැනීම මෙම නව සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ මූලික පියවර ලෙස හැඳින්වීමට පුළුවන. එලෙස හඳුනා ගන්නා ලද නිගමනයන් සංවර්ධන සැලසුම් ක්‍රියාවලියේ විවිධ අවස්ථාවන්හිදී භාවිතයට ගනිමින් තීරණ ගැනීම සිදු කර ඇති අතර එම තීරණ හෝමාගම ප්‍රදේශයේ ප්‍රායෝගික ක්‍රියාවලිය හා සම්මිශ්‍රණය කරමින් 2022–2031 කාල සීමාව සඳහා හෝමාගම නව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සිදු කර ඇත.

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය I, II හා III කොටස වශයෙන් ප්‍රකාශයට පත් කරයි. එහි I කොටස පසුබිම් අධ්‍යයනය,මූලික අධ්‍යයන, සැලැස්මේ අවශ්‍යතාවය, සැලසුම් රාමුව, ශ.දු.අ.න. (SWOT) විශ්ලේෂණය සහ සංවර්ධන සැලැස්ම යන පරිච්ඡේද වලින් සමන්විත වේ. II කොටස 2022–2031 කාලපරිච්ඡේදය සඳහා බලපවත්වන සැලසුම් හා ගොඩනැගිලි නියමනා සහ කලාපකරණ නියමනා වලින් සමන්විත වේ. III කොටස, කලාපීකරණ මායිම් වලට අදාළ භූ ඛණ්ඩාංක සහ සියලු ඇමුණුම් සමඟ කලාප සීමාවන්ගෙන් සමන්විත වේ.

මෙහි එන පළමු වන කොටසෙහි, පළමු පරිච්ඡේදය මඟින් සංවර්ධන සැලැස්මේ පසුබිම විස්තර කරන අතර තවදුරටත් සංවර්ධන සැලැස්මක් යනු කුමක්ද, එහි නෛතික පසුබිම, සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්, එහි විෂයපථය හා අනුගමනය කරන ලද සැලසුම් ක්‍රියාවලිය විස්තර කර ඇත. දෙවන හා තුන්වන පරිච්ඡේද හරහා පිළිවෙලින් අධ්‍යන ප්‍රදේශය, එහි සැලසුම් ඉතිහාසය, සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම සහ සංවර්ධන සැලැස්මෙහි අවශ්‍යතාවය පිළිබඳව දීර්ඝ විස්තරයක් සිදු කර ඇත. හතරවන පරිච්ඡේදය හරහා සංවර්ධන සැලැස්මේ දැක්ම, එහි අරමුණු, අභිමතාර්ථ හා පරමාර්ථ පිළිබඳ සඳහන් කරන අතර පස්වන පරිච්ඡේදය මඟින් ඊට පසුබිම් වූ ශ.දු.අ.න. (SWOT) විශ්ලේෂණය සම්බන්ධයෙන් දීර්ඝ විස්තරයක් ලබා දී ඇත. තවද එහි එන හය වන පරිච්ඡේදය මඟින් සංකල්පීමය සැලැස්ම හා යෝජිත භූමි පරිහරණ සැලැස්ම පිළිබඳ සඳහන් කර ඇති අතර තවදුරටත් එහි අනු කොටස් යටතේ හෝමාගම සංවර්ධන සැලැස්මේ ප්‍රධාන උපාය මාර්ගික සැලසුම් වන මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම, තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග සැලැස්ම, ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ග සැලැස්ම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සැලැස්ම අන්තර්ගත කර ඇත.

ඒ හා සමානව, දෙවන කොටස – හත්වන පරිච්ඡේදය සැලසුම් සහ ගොඩනැගිලි නියමනා විස්තර කිරීම සඳහා කැපවී ඇති අතර අටවන පරිච්ඡේදයේ හඳුනාගත් කලාප සහ කලාප නියමනා විස්තර කර ඇති අතර නවවන පරිච්ඡේදයේ යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා සහ රක්ෂිත ප්‍රදේශ ඇතුළත් වේ.

එලෙස සකස් කරන ලද 2022–2031 නව හෝමාගම සංවර්ධන සැලැස්ම නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීම මෙම අධිකාරියේ හා ශ්‍රී ලංකා රජයේ අපේක්ෂාව වී ඇත.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2288/14 - 2022 ජූලි මස 12 වැනි අඟහරුවාදා - 2022.07.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා හට 1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර, 2020 සැප්තැම්බර් මස 24 දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සලකා බැලීමෙන් පසු හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කරමි.

ප්‍රසන්න රණතුංග (පා.ම),
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ජූලි මස 04 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

---

**හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීම**

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තිය ප්‍රකාරව පිළියෙල කරන ලද, හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම, 2022 ක් වූ ජූලි මස 04 වැනි දින, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින්, එකී 1982 අංක 04 දරන නාගරික

1A - G 37086 — 46 (2022/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංවර්ධන අධිකාරිය (සංශෝධිත) පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අනුමත කළ බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

**ප්‍රසන්න රණතුංග (පා.ම),**
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය.

2022 ජූලි මස 12 වැනි දින,
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,
17 හා 18 මහල,
"සුහුරුපාය",
සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

---

**හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

1982 අංක 4 දරන පනතින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 8 (අ) වගන්තියේ බලතල ප්‍රකාරව හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා විසින්, එකී පනතේ 8(ඊ) වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2022 ජූලි මස 04 වැනි දින අනුමත කරන ලද බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

**මේජර් ජනරාල් (විශ්‍රාමික) උදය නානායක්කාර,**
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2022 ජූලි මස 12 වැනි දින.

EOG 07-0083

# පටුන

ප්‍රණාමය III
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන IV
ගරු සභාපතිතුමාගේ පෙරවදන V
ගරු ප්‍රාදේශීය සභා සභාපතිතුමාගේ පණිවිඩය VI
පූර්විකාව VII
ගැසට් නිවේදනය VIII
පටුන X

I වන කොටස

පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම 01

1.1. හැඳින්වීම 02
1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශව කරුවන් 03
1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය 04
1.4. සැලසුම් ක්‍රියාවලිය 05

පරිච්ඡේදය 02 : මූලික අධ්‍යයනය 09

2.1. අධ්‍යයන ප්‍රදේශය 10
2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භය 12
2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම 21

පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය 29

පරිච්ඡේදය 04 : සංවර්ධන සැලැසුම් රාමුව 43

4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම 44
4.2. දැක්මෙහි ප්‍රකාශනය (Vision Statement) 44
4.3. සංවර්ධන සැලසුමේ ප්‍රධාන අරමුණු 45
4.4. සංවර්ධන සැලැස්මේ පරමාර්ථ 46

පරිච්ඡේදය 05 : ශ.දු.අ.න. (SWOT) විශ්ලේෂණය 49

පරිච්ඡේදය 06 : සංවර්ධන සැලැස්ම 117

6.1. හැඳින්වීම 118
6.2. සංවර්ධන උපාය මාර්ග 119
6.3. සංකල්පීමය සැලැස්ම (The Concept Plan) 121

6.3.1. හැඳින්වීම 121

6.4. යෝජිත භූමි පරිහරණ සැලැස්ම 124

6.4.1. හැඳින්වීම 124
6.4.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම 126
6.4.3. අපේක්ෂිත නගර ආකෘතිය 127

6.5. මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම 128

6.5.1. මහාමාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග 128
6.5.2. යෝජිත මහාමාර්ග සංවර්ධන ධුරාවලිය 132
6.5.3. යෝජිත බහු මහල් වාහන නැවතුම් අංගන සැලැස්ම 138
6.5.4. යෝජිත අතුරු මාර්ග හා සේවා මාර්ග (Proposed Bypass Roads & Service Road Developments) සංවර්ධන ව්‍යාපෘති 142
6.5.5. යෝජිත මීගොඩ කුඩා ප්‍රවාහන මධ්‍යස්ථානය නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 145
6.5.6. යෝජිත මාකුඹුර අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය 146

6.6. නිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග සැලැස්ම 146

6.6.1. හැඳින්වීම 146
6.6.2. පරිසර සංරක්ෂණ ප්‍රදේශ 147
6.6.3 භූදර්ශන කළමනාකරණ සැලැස්ම 149
6.6.4. දර්ශනීය ස්ථාන (Scenic view points) 149
6.6.5. හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආපදා අවධානම අවම කිරීමේ සැලැස්ම 151
6.6.6. හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS) 154
6.6.7. සංස්කෘතික, ආගමික සහ පෞරාණික වටිනාකමින් යුතු ස්ථාන කළමනාකරණ සැලැස්ම 166

6.7. ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම 168

6.7.1. හැඳින්වීම 168
6.7.2. ප්‍රධාන ආර්ථික පෙරගමන්කරුවන් (Main Economic Drivers) 169
6.7.3. සුළු පරිමාණ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති (NON –Based Sector) 179

6.8. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම 186

6.8.1. ජල සැපයුම් සැලැස්ම (Water Supply Plan) 186
6.8.2. විදුලි සැපයුම් හා කළමනාකරණ සැලැස්ම (Electricity Supply & Management Plan) 188
6.8.3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම (Solid Waste Management Plan) 191
6.8.4. මළ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම (Swearage Management Plan) 198
6.8.5. සේවා කළමනාකරණ සැලැස්ම (Services Management Plan) 200

6.9. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම 204

6.9.1. හැඳින්වීම 204
6.9.2. ක්‍රමෝපායමාර්ග ව්‍යාපෘති 209
6.9.3. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආයතනික ව්‍යුහය 225
6.9.4. මුඛනා පදනම මත ව්‍යාපෘති හඳුනා ගැනීම 235

## 2 වන කොටස

පරිච්ඡේදය 07 : සංවර්ධන කලාප සහ කලාපීකරණ නියමනා 241

7.1. හැඳින්වීම 242
7.2. සංවර්ධන කලාප හා කලාපීකරණ නියමනා 242
7.3. කලාප සංගුණකය (Zoning Factor) 244

1 වන උපලේඛනය 245
2 වන උපලේඛනය 246
3 වන උපලේඛනය 246

7.3.1. කලාප සංගුණක සැලැස්ම 2022–2031 247

7.4. සැලසුම් ප්‍රදේශය සඳහා වූ පොදු කලාපීකරණ නියමනා 248

පරිච්ඡේදය 08 : යෝජිත සංවර්ධන කලාප හා නියමනා 255

8.1. වැඩි සනත්ව වාණිජ කලාපය I (හෝමාගම) 256

8.1.1 වැඩි සනත්ව වාණිජ කලාපය I සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් 256

8.2. වැඩි සනත්ව වාණිජ කලාපය II (කහතුඩුව) 261

8.2.1. වැඩි සනත්ව වාණිජ කලාපය – II (කහතුඩුව) සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් 261

8.3. වැඩි සනත්ව වාණිජ කලාප III (ගොඩගම) 266

8.3.1. වැඩි සනත්ව වාණිජ කලාපය – III (ගොඩගම) සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් 266

8.4. මධ්‍ය සනත්ව නේවාසික කලාපය 271

8.4.1. මධ්‍ය සනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් 271

8.5. වැඩි සනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම – 01) 277

8.5.1. වැඩි සනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම – 01) සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් 277

8.6. වැඩි සනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය 281

8.6.1. වැඩි සනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාප සඳහා බලපවත්වන නියමනා 281

8.7. අඩු සනත්ව නේවාසික කලාපය 285

8.7.1. අඩු සනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් 285

| | | |
|---|---|---|
| 8.8. | නෙත් බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය | 289 |
| 8.8.1. | නෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් | 289 |
| 8.9. | කුඹුරු වගා හා නෙත්බිම් කෘෂිකාර්මික කලාපය | 291 |
| 8.8.1. | කුඹුරු වගා හා නෙත්බිම් කෘෂිකාර්මික කලාපය සඳහා බලපවත්වන නියමනා සහ භාවිතයන් | 291 |
| පරිච්ඡේදය 09 : යෝජිත සංවර්ධන කලාප හා නියමනා | | 295 |
| 9.1. | යෝජිත මාර්ග පළල ක්‍රියාත්මක වන මාර්ග | 296 |
| 9.1.1. | යෝජිත A වර්ගයේ මාර්ග | 296 |
| 9.1.2. | යෝජිත B වර්ගයේ මාර්ග | 296 |
| 9.1.3. | යෝජිත "C" වර්ගයේ මාර්ග | 298 |
| 9.1.4. | යෝජිත D වර්ගයේ මාර්ග | 302 |
| 9.1.5. | ගොඩනැගිලි සීමා ක්‍රියාත්මක වන මාර්ග | 302 |
| 9.1.6. | යෝජිත වීථි රේඛාව සංවර්ධන කටයුතු සඳහා විවෘත කිරීම | 303 |
| 9.2. | දුම්රිය මාර්ග රක්ෂිත සහ අධිවේගී මාර්ග රක්ෂිත | 304 |
| 9.2.1. | දුම්රිය මාර්ග | 304 |
| 9.2.2. | අධිවේගී මාර්ග රක්ෂිත | 304 |
| 9.3. | ඇළ / දොළ , වැව්, ගංගා සහ ජලාශ සඳහා රක්ෂිත / ගොඩනැගිලි සීමා | 305 |


## 3 වන කොටස


| | | |
|---|---|---|
| අර්ථකතනයන් | | 308 |
| කෙටි යෙදුම් | | 308 |
| සිතියම් ලැයිස්තුව | | 309 |
| වගු ලැයිස්තුව | | 310 |
| රූප සටහන් ලැයිස්තුව | | 311 |
| ප්‍රස්ථාර ලැයිස්තුව | | 313 |
| ඇමුණුම් | | 314 |
| ඇමුණුම 1: | ජාතික භෞතික සැලැස්ම 2050 | 314 |
| ඇමුණුම 2: | බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්ම 2017 | 315 |
| ඇමුණුම 3: | එන්විවෝ NVIVO විශ්ලේෂණය | 316 |
| ඇමුණුම 4: | පැට්‍රික් ඇබර්කොම්බේ සැලැස්ම (1948) | 323 |
| ඇමුණුම 5 : | මහ කොළඹ ව්‍යුහ සැලැස්ම 1972 | 324 |
| ඇමුණුම 6: | බස්නාහිර පළාත් සංවර්ධන ජීව්‍යතා විශ්ලේෂණය 2014 | 325 |
| ඇමුණුම 7: | හෝමාගම කලාපීකරණ සැලැස්ම 2008-2020 | 326 |
| ඇමුණුම 8: | භූමි පරිහරණ සැලැස්ම 2017 | 327 |
| ඇමුණුම 9: | හෝමාගම සැලසුම් බල ප්‍රදේශයට අයත්ග්‍රාම නිලධාරී වසම් | 328 |
| ඇමුණුම 10: | 2030 වර්ෂය සඳහා වන ජනගහන වර්ධන පුරෝකථනයන් | 329 |

| | | |
|---|---|---|
| ඇමුණුම 11: | රුක් රෝපණ තීරු ප්‍රදේශ සඳහා යෝජිත ශාක වර්ග | 334 |
| ඇමුණුම 12: | ප්‍රමුඛතා පදනම මත ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා කරන ලද බර තැබීම් | 335 |
| ඇමුණුම 13: | කලාප සංගුණකය ගණනය කල ආකාරය | 339 |
| ඇමුණුම 14: | සම්බන්ධීකරණ ආයතන | 345 |
| ඇමුණුම 15 : | ඉහළ ඝනත්ව වාණිජ කලාපය I (හෝමාගම) – කලාපීකරණ මායිම් | 346 |
| ඇමුණුම 16: | ඉහළ ඝනත්ව වාණිජ කලාප II (කහතුඩුව) – කලාපීකරණ මායිම් | 348 |
| ඇමුණුම 17: | ඉහළ ඝනත්ව වාණිජ කලාප III (ගොඩගම) – කලාපීකරණ මායිම් | 351 |
| ඇමුණුම 18 : | මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය– කලාපීකරණ මායිම් | 353 |
| ඇමුණුම 19: | වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය<br>(සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම 1 හි කලාපීකරණ මායිම්) | 362 |
| ඇමුණුම 20: | ඉහළ ඝනත්ව විද්‍යා හා තාක්ෂණ කලාපය II – කලාපීකරණ මායිම් | 365 |
| ඇමුණුම 21: | අඩු ඝනත්ව නේවාසික කලාපය – කලාපීකරණ මායිම් | 367 |
| ඇමුණුම 22: | තෙත්බිම් කලාපීකරන සැලැස්ම 2020 –2030 | 370 |
| ඇමුණුම 23: | කළුගල් කැඩීම හා කැණීම් සිදු කිරීම සඳහා භූ විද්‍යා හා පතල් කැණීම්<br>කාර්යාංශය විසින් හඳුනාගෙන ඇති ප්‍රදේශ – හෝමාගම සැලසුම් ප්‍රදේශය | 371 |
| ඇමුණුම 24: | ඇළ මාර්ගවල ප්‍රමාණයේ තීව්‍රතාවය (හෝමාගම සැලසුම් ප්‍රදේශය) | 372 |
| ඇමුණුම 25 : | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 14 සහ 24(2) යන වගන්තිය<br>යටතේ ගැසට් කරන ලද හෝමාගම ප්‍රාදේශීය සභාව සතු මාර්ග | 373 |
| ඇමුණුම 26: | සංවර්ධන කලාප තුළ අනුමත භාවිතයන්ගේ සංක්ෂිප්තය | 387 |
| ඇමුණුම 27: | ඝනත්ව කලාප අනුව අනුමත භාවිතයන් සඳහා වන නිර්වචන | 391 |

පරිශීලිත මූලාශ්‍ර 400



# පළමු කොටස

01

පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මේ පසුබිම

01 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මේ පසුබිම

හැඳින්වීම

# 1.1. හැඳින්වීම

සංවර්ධන සැලැස්මක් යනු යම් ප්‍රදේශයක් සතුව පවතින භෞතික, ආර්ථික, සමාජීය හා පාරිසරික සාධක, උපක්‍රමානුකූල ලෙස, තිරසාර සංවර්ධනයකට යොමු කරන ආකාරය දක්වන හා ඒ සඳහා ප්‍රදේශයේ පාර්ශවකරුවන්, විශේෂයෙන්ම එහි ජීවත්වන නේවාසිකයන් සංවර්ධන කටයුතු වලදී ක්‍රියා කල යුතු ආකාරය දක්වන, නෛතිකව පිළිගැනීමකට ලක්වුණු ලිඛිත වාර්තාවකි.

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8 ' අ' වගන්තියේ බලතල ප්‍රකාරව, අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන බල ප්‍රදේශයක් සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ කාර්යභාරය 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරී (සංශෝධන) පනතේ 8 'අ' වගන්තිය මගින් නාගරික සංවර්ධන අධිකාරියට බලය පැවරී ඇත.

ඒ අනුව හෝමාගම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ නෛතික පසුබිම සලකා බැලීමේදී 1978 වර්ෂයේ සැප්තැම්බර් මස 30 දිනැති අංක 4/1 ගැසට් පත්‍රය යටතේ හෝමාගම නාගරික ප්‍රදේශය ප්‍රථමවරට නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර එම ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 7 කින් සමන්විත විය. ඉන්පසුව පිළිවෙලින් 1979 වර්ෂයේ ඔක්තෝම්බර් මස 01 දිනැති, අංක 56/6 ගැසට් පත්‍රය මගින් අතුරුගිරිය ප්‍රදේශය ආවරණය වන පරිදිත්, 1983 මාර්තු මස 01 දිනැති අංක 234/7 ගැසට් පත්‍රය මගින් මත්තේගොඩ ප්‍රදේශය ආවරණය වන පරිදිත් හා වර්ෂ 1999 ජුනි මස 17 දින අංක 1084/20 ගැසට් පත්‍රය මගින් එහි ඉතිරි ප්‍රදේශය ආවරණය වන පරිදි හා ඒ අනුව වත්මන් හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සම්පූර්ණයෙන්ම (වර්ග කිලෝමීටර 138) ආවරණය වන පරිදි නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව 1986 වර්ෂයේදී පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශයේ මඟ පෙන්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් වසර 15 ක කාලසීමාවක් (1986–2001) සඳහා හෝමාගම නාගරික ප්‍රදේශය ආවරණය කරමින් ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික යන අංශ හරහා තිරසාර සංවර්ධනයක් අරභයා දල සංවර්ධන සැලැස්මක් පිළියෙළ කරන ලදී. ඉන් පසුව නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශයේ මඟපෙන්වීම යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2008–2025 කාලසීමාව සඳහා හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය කරමින් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කර නීති ගත කරන ලදී (ගැසට් අංක 1627/28 –2009 නොවැම්බර් 13).

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය අරභයා ක්‍රියාත්මක කිරීමට යෝජිත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය ඔස්සේ බොහෝ ප්‍රදේශයන් සීඝ්‍ර නාගරීකරණයකට යොමු වන බව දක්නට ලැබේ. ඒ අනුව පවත්නා සංවර්ධන සැලැස්මට ප්‍රතිශෝධනයක් ලබා දෙමින් ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, පාරිසරික හා භෞතික සංරචක තිරසාර සංවර්ධනයකට යොමු කිරීම පෙරදැරි කරගනිමින් 2022–2031 කාල සිමාව සඳහා මෙම සංවර්ධන සැලැස්ම සකස් කරනු ලබයි.

## 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්



සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේ ක්‍රියාවලියේදී එහි ආරම්භයේ සිට අවසානය දක්වාම විවිධ අවස්ථාවන්වලදී අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගය ලබා ගැනීම සිදුවිය. ඒ අනුව සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේ ක්‍රියාවලියේ විවිධ අදියරයන්හිදී එනම් දත්ත එක්රැස් කිරීම, ප්‍රදේශ හා සම්බන්ධ ගැටළු හා විභවතා හඳුනාගැනීම, දත්ත විශ්ලේෂණය, උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම හා නියමනා ගොඩනැගීම සඳහා අදාළ පාර්ශවකරුවන්ගේ සහාය ලබාගැනීම සිදු කරන ලදී.

2017 නොවැම්බර් මස 08 වන දින නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සංවිධානය කර පවත්වන්නට යෙදුනු පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම කණ්ඩායම් ආකාරයෙන් සිදු කරන ලදී. ඒ සඳහා සහභාගී වූ සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් පහත පරිදි වර්ග කල හැකිය.

### මූලික පාර්ශවකරුවන්

1. *හෝමාගම ප්‍රාදේශීය සභාව*
2. *හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*

### මූලික උපදේශන ආයතන

1. *මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය*
2. *නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය*
3. *මධ්‍යම පරිසර අධිකාරිය*
4. *මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය*
5. *මාර්ග සංවර්ධන අධිකාරිය*
6. *ලංකා විදුලි බල මණ්ඩලය*
7. *ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය*
8. *වාරිමාර්ග දෙපාර්තමේන්තුව*
9. *ගොවිජන සංවර්ධන සේවා දෙපාර්තමේන්තුව*
10. *ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව*
11. *ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව*
12. *ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව*
13. *ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*
14. *ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ ආයතනය*
15. *විද්‍යා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය*
16. *බස්නාහිර පළාත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය*
17. *ජාතික අපදා කළමනාකරණ ආයතනය*
18. *ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය*
19. *කලාප අධ්‍යාපන කාර්යාලය*
20. *මොරටුව විශ්ව විද්‍යාලය*
21. *ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය*
22. *මහින්ද රාජපක්ෂ ජාතික පාසල*
23. *ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය*
24. *ශ්‍රීමත් ආතර් සි ක්ලාක් ආයතනය*
25. *කර්මාන්ත සංවර්ධන මණ්ඩලය*
26. *ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය*
27. *කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය*

අනෙකුත් පාර්ශවකරුවන්

28. *වෙළඳ සංගමය – හෝමාගම ප්‍රාදේශීය සභාව*
29. *ත්‍රි රෝද රථ සංගමය – හෝමාගම ප්‍රාදේශීය සභාව*

## 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමේදී පොදුවේ පිළිගත හැකි පවතින දත්තයන් විශ්ලේෂණය කරමින් දිගුකාලින සංවර්ධන දැක්මක් කරා ගමන් කිරීම සංවර්ධන සැලැස්ම තුලින් බලාපොරොත්තු වේ. එම විශ්ලේෂණයන්ට, වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තිය, අදාළ ප්‍රදේශය අනාගතයේදී මුහුණ දිය හැකි අභියෝග සහ සංවර්ධනය කරා යාමට ඇති විභවතා සලකා බැලීමෙන් ආර්ථික, භෞතික, සමාජීය හා පාරිසරික වශයෙන් සැලසුම්මය පැතිකඩකින් අන්තර් සම්බන්ධතාවක් නිර්මාණය කිරීම මෙම සැලැස්ම මඟින් සිදුකරයි.

ශ්‍රී ලංකාවේ ජාතික භෞතික සැලැස්මට (2050) අනුව හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ආර්ථික සංවර්ධන කලාපය තුළ පිහිටා ඇත (ඇමුණුම 01). ඒ අනුව රට අදාළව සංවර්ධන සැලැස්ම සකස් විය යුත්තේ හුදෙක් නේවාසික සංවර්ධනයක් පමණක් නොව රටේ ආර්ථිකය නඟා සිටුවීමට සමත් ප්‍රදේශයක් ලෙස නිර්මාණය කිරීම බව මෙහිදී සැලකිල්ලට භාජනය කරන ලදී. එසේම 2017 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද බස්නාහිර පළාත් ව්‍යුහ සැලැස්මට (ඇමුණුම 02) අනුව හෝමාගම ප්‍රදේශයෙන් 1/3 ක පමණ ප්‍රමාණයක් කොළඹ හර (Colombo Core) ප්‍රදේශයට අයත් වේ. එබැවින් හෝමාගම සංවර්ධන සැලැස්ම කොළඹ හර ප්‍රදේශයට සහාය දක්වන ප්‍රදේශයක් ලෙස නිර්මාණය විය යුතු බව තීරණය කරන ලදී.

ඒ අනුව 2022–2031 සංවර්ධන සැලැස්ම හරහා ප්‍රධාන වශයෙන් නේවාසිකයන් සඳහා ජීවත්වීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම හා ස්වභාවික පාරිසරික ප්‍රදේශ හා එහි ලක්ෂණ සුරක්ෂිත කිරීම ප්‍රධාන වශයෙන් අවධානයට යොමු කරන ලදී. එසේ නේවාසික ප්‍රදේශයන් නිර්මාණය කිරීමේදී වැඩි, අඩු හා මධ්‍යස්ථ වශයෙන් ඝනත්ව තීව්‍රතාවන් නිර්මාණය කිරීමට අවධානය යොමුකර ඇති අතර එය හුදෙක් නේවාසික භාවිතයන් සඳහා අවකාශය තර කිරීමක් නොකර යෝජිත නගර ආකෘතිය (Urban Form) නිර්මාණය කිරීමට අවධානය යොමු කර ඇත. මෙහිදී මූලිකවම භෞතික උපාය මාර්ගික සැලැස්ම ඔස්සේ ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන සංවර්ධන ක්‍රියාවලියේ විවිධ ඝනත්ව අවස්ථා සාර්ථකත්වයට පත්කර ගැනීම උදෙසා හෝමාගම, කහතුඩුව හා ගොඩගම නගර සංවර්ධනයන් සඳහා ප්‍රධාන බර තැබීමක් සිදු කරනු ලබයි. තවද රෙගුලාසි හා නෛතික රාමුවක් ඔස්සේ හා විශේෂිත සංවර්ධන ව්‍යාපෘති උපක්‍රමශීලීව භාවිතා කරමින් විවිධ සැලසුම් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන අතර එහිදී පරිසර සාධකය කෙරෙහින් වැඩි අවධානය යොමු කරන ලැබේ. මේ සැලැස්ම මගින් යෝජිත භූමි භාවිතයන් එක් කලාපයකට පමණක් සීමා කිරීමක් අපේක්ෂා නොකරන අතර නේවාසික අවශ්‍යතාවයන් මත අපේක්ෂිත සංවර්ධන දැක්ම ළඟා කරගැනීම සඳහා භාවිතයන් ක්‍රමවත් මඟ පෙන්වීමකට යොමු කිරීමක් මෙම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම මඟින් බලාපොරොත්තු වේ.

මෙම සංවර්ධන සැලැස්මට පරිබාහිරව අනෙකුත් ආයතන හා මෙම අධිකාරිය මඟින් සිදුකරනු ලබන හා ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘතීන් හා සංවර්ධන සැලසුම් මෙම සැලැස්මට අන්තර්ගත කරගැනීම අවධානයට යොමු කර ඇත. උදාහරණ ලෙස මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, බරාව තෙත් බිම් සංවර්ධන ව්‍යාපෘතිය, රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය හා සීතාවක, හොරණ හා බොරලැස්ගමුව සංවර්ධන සැලසුම් විශේෂයෙන් සඳහන් කල හැක.

කෙසේ වෙතත්, 2022–2031 සඳහා වන සංවර්ධන සැලැස්ම අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (මාර්ගෝපදේශ සැලසුම් ප්‍රදේශය I) සහ කහතුඩුව අන්තර් හුවමාරු ප්‍රදේශය (මාර්ගෝපදේශ සැලසුම් ප්‍රදේශය II) සඳහා මාර්ගෝපදේශ සැලසුම් නිශ්චිත මාර්ගෝපදේශ සමඟ සකස් කෙරේ. හෝමාගම සහ ගොඩගම නගර මධ්‍යස්ථාන සඳහා සවිස්තරාත්මක ව්‍යාපෘති සැලසුම් පිළියෙළ කිරීමට හඳුනාගෙන ඇත.

නවද ආර්ථික, සමාජීය, පාරිසරික හා භෞතික සංරචක දෙස අවධානය යොමු කරමින් මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම, තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග සැලැස්ම, ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලැස්ම, අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ග සැලැස්ම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සැලැස්ම හා සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි සැලැස්ම පිළියෙළ කිරීමට කටයුතු කිරීම සිදු කර ඇත.

මේ සියලු සංවර්ධන අභිමතාර්ථයන් සංකලනය කරමින්, දිගුකාලීන හා කෙටිකාලීන සංවර්ධන ව්‍යාපෘති හරහා සංවර්ධනය සඳහා පසුබිමක් නිර්මාණය කිරීම තුළින් ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික හැසිරීම්වල ඒකාබද්ධතාව ඇති කිරීම හා තිරසාර සංවර්ධනයක් ඇති කිරීම උදෙසා හෝමාගම සංවර්ධන සැලැස්ම (2031) සකස් කිරීමේ අවකාශය සලසා ගත් බව මෙහිදී සඳහන් කල හැක.



## 1.4. සැලසුම් ක්‍රියාවලිය

මෙම සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී සම්ප්‍රදායික සැලසුම් ක්‍රියාවලියෙන් බැහැර ක්‍රමවේදයක් අනුගමනය කිරීම මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ ක්‍රියාවලියේදී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණයකි. සංවර්ධන සැලැස්ම තුළින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගැනීම උදෙසා සැලසුම්කරුවාට පහසු හා නම්‍යශීලී ක්‍රමවේදයක් ඔස්සේ යමින් මෙම සංවර්ධන සැලැස්ම පිළියෙළ කර ඇත.

**පසුබිම් අධ්‍යයනය**

පසුබිම් අධ්‍යයනය යටතේ සැලසුම සඳහා අවශ්‍යය ප්‍රාථමික හා ද්විතික දත්ත එක්රැස් කිරීම නව තාක්ෂණික ක්‍රමවේදයන් එනම් ඩ්‍රෝන (Drone) තාක්ෂණය, චන්ද්‍රිකා තාක්ෂණය හා ජායා රූප ඔස්සේ සිදු කරන ලදී. මෙහිදී පොදුවේ පිළිගත හැකි මට්ටමේ නිරවද්‍ය දත්ත එක්රැස් කිරීමේදී ආයතන අතර පවතින අකාර්යක්ෂම සහසම්බන්ධතාව සහ දත්ත බෙදාහැරීමේ දුර්වලතාව හේතුවෙන් අත්‍යවශ්‍ය දත්ත හා තොරතුරු ලබා ගැනීම ඉතා අපහසු විය.

**විෂය පථය**

අතීත, වර්තමාන හා අනාගත සංවර්ධන අභිමතාර්ථ හමුවේ, ප්‍රතිපත්ති හා රෙගුලාසි හා නව ව්‍යාපෘති විශ්ලේෂණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස නව සැලැස්මක් සකස් කිරීමේ අවකාශය මෙමඟින් පැහැදිලි කෙරේ. මෙහිදී පසුබිම් අධ්‍යයනය මඟින් ලබා ගත් දත්ත ප්‍රාථමික විශ්ලේෂණයකට යොමු කර සංවර්ධන සැලැස්ම යොමු විය යුතු දිශාව හඳුනා ගැනීම සිදු කර ඇත. ඒ අනුව සමස්ත සංවර්ධන සැලැස්මේ ඉදිරිකාලීන දැක්ම හා සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම සිදු වේ.

## ගැටළු හා විභාවතාවයන් හඳුනා ගැනීම

මෙහිදී ප්‍රදේශයේ පසුබිම් අධ්‍යනය තුළින් ප්‍රදේශයේ වත්මන් තත්ත්වය සම්බන්ධයෙන් ලබාගන්නා අවබෝධය හරහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම සිදු කරන ලදී. උපාය මාර්ගික සැලසුම් නිලධාරීන්ගේ දැනුම හා අන්දැකීම් හා විස්තරාත්මක විශ්ලේෂණ-යන්ගෙන් ලැබුණු ප්‍රතිඵල හා ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණයන්ගෙන් ලැබුණු සාරාංශ හා එන්විවෝ විශ්ලේෂණය පදනම් කර ගනිමින් ප්‍රදේශය සතු ගැටළු හා විභාවතාවයන් හඳුනා ගැනීම සිදු කර ඇත.

තවද විශේෂයෙන්ම මෙම සංවර්ධන සැලැස්මට අදාළව පාර්ශවකරුවන්ගේ අදහස් විමසීම (2017/11/06 දින සිදු කරන ලද ) හරහා ප්‍රදේශය පිලිබඳ අවබෝධය වර්ධනය කරගැනීමක් සිදු කරන අතර එන්විවෝ (NVIVO) විශ්ලේෂණය (ඇමුණුම 03 ) මඟින් ද ගැටළු හා විභවතා හඳුනා ගැනීම තහවුරු කරගැනීමක් සිදු කරනු ලදී.

## සංවර්ධන දැක්ම, අරමුණු හා අභිලාෂයන් නිර්මාණය කිරීම

මේ හරහා සංවර්ධන සැලැස්මේ ප්‍රධාන ප්‍රවේශ 03 ක් පිලිබඳ අවධානය යොමු කිරීමක් සිදු කරන ලදී. ගැටළු හා විභවතා හඳුනා ගැනීම හරහා සංවර්ධන සැලැස්ම යායුතු ගමන් මග හෝ දැක්ම නිර්මාණය කරන අතර සංවර්ධන දැක්ම උදෙසා අරමුණු හා අභිලාෂයන් සකස් කිරීම සිදු කරයි.

නමුත් මෙහිදී අරමුණු නිර්මාණය කිරීමෙන් පසු අභිමතාර්ථ නිර්ණය කරගැනීම උදෙසා දත්ත විශ්ලේෂණයෙන් ලබාගන්නා ප්‍රතිඵල පමණක් ප්‍රමාණවත් නොවන හෙයින් විස්තරාත්මක විශ්ලේෂණයක අවශ්‍යතාවය තීව්‍ර දැනෙන අවස්ථාවක් ලෙස සඳහන් කල හැකිය.

## දත්ත විශ්ලේෂණය

මෙය මූලිකවම දැක්මට ළඟා වීම සඳහා අභිමතාර්ථ නිර්මාණය පෙරදැරි කරගෙන සිදු කරනු ලැබේ. විශේෂයෙන්ම ප්‍රදේශයේ ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික හැසිරීම් දත්ත බවට පරිවර්තනය කොට භූගෝලීය දත්ත පද්ධති (GIS) විශ්ලේෂණයන්ට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් සිදු කරන ලදී.

තවද ප්‍රදේශයේ පාරසරික සංවේදී ප්‍රදේශ, සංවර්ධන විභවතා ප්‍රදේශ හා සංවර්ධනයේ දිශාවන් හඳුනා ගැනීම අරඹයා සංවේදීතා විශ්ලේෂණය, ජීවී අවකාශ විශ්ලේෂණය, විභවමය අවකාශ විශ්ලේෂණය, කලාපීය සම්බන්ධතාවය , ඒකාබද්ධතා විශ්ලේෂණය, ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය, ගෙෆි විශ්ලේෂණය (Gephi), එන්විවෝ විශ්ලේෂණය (NVIVO) හා අවකාශ සැලසුම් ජාල විශ්ලේෂණය (SDNA) හරහා මෙම දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

## උපායමාර්ගික සැලසුම් සකස් කිරීම

මෙම සංවර්ධන සැලස්ම යටතේ හඳුනාගන්නා ලද දැක්ම, අරමුණු හා අභිමතාර්ථයන් සැබෑ භූමිය මත ස්ථාපනය කිරීම උදෙසා ආර්ථික, සමාජීය, භෞතික හා පාරසරික හැසිරීම්, සැලසුම් කාල සීමාව තුළ සිදු විය යුතු ආකාරයට අවස්ථාවක් හෝ මුලපිරීමක් මෙමඟින් සිදු කරන ලදී.

අරමුණු අභිමතාර්ථයන් ඔස්සේ දැක්ම කරා ගමන් කරන්නේ කෙසේද? යන්නට පිළිතුරු ලෙස විශේෂිත සැලසුම් කිහිපයක් හඳුන්වා දීම සිදු කරයි. හෝමාගම සංවර්ධන සැලැස්ම 2021–2031 ට අනුව කලාපීකරණ සැලැස්මක්, මහාමාර්ග හා ප්‍රවාහන සැලැස්මක්, නගර මධ්‍යය සැලසුම්, පරිසර කළමනාකරණ සැලැස්මක් හා යටිතල පහසුකම් සංවර්ධන සැලැස්මක් හඳුන්වා දීමක් සිදු කර ඇත.

## සැලසුම් නීති හා රෙගුලාසි නිර්මාණය කිරීම

මෙහිදී හෝමාගම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් නීති හා ගොඩනැගිලි රෙගුලාසි හඳුන්වාදෙනු ලබන අතර සැලසුමට අදාළව ඒවා ගොනු කිරීමක් සිදු කරනු ලබයි. මේ යටතේ කලාපකරණ රෙගුලාසි, සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි, සාමාන්‍ය හා විශේෂ රෙගුලාසි නිර්මාණය කිරීම සිදු වේ.

### අදහස් හා යෝජනා ලබා ගැනීම

මෙම අදියර තුල දළ සංවර්ධන සැලැස්ම මහජනයා වෙත සහ පළාත් පාලන ආයතන වල අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා යොමුකරන අතර සැලැස්ම මහජන දැනුවත් කිරීම උදෙසා දින 60 ක කාල රාමුවක් තුළ පළාත් පාලන ආයතනයේ තැබීම සිදුකරයි. එමෙන්ම මෙම කාලය තුළ මහජන හා පළාත් පාලන ආයතනවලට සහ පාර්ශවකරුවන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම තුළින් මහජනයාගේ හා පාර්ශවකරුවන්ගේ පිළිගැනීම හා පළාත් පාලන ආයතනයන්ගේ අදහස් හා යෝජනා ලබා ගැනීම මූලික අරමුණ වේ.

එමෙන්ම ප්‍රධාන කාර්යාල තුළ වැඩමුළු සංවිධානය කරමින් දළ සංවර්ධන සැලසුම නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වෙත ඉදිරිපත් කරනු ලබන අතර මෙමඟින් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ අවසන් අදහස් හා යෝජනා සංවර්ධන සැලැස්මට ලබා ගැනීම අරමුණ වේ.

### සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුවට ඉදිරිපත් කිරීම

මෙම අදියරේදී පළාත් පාලන ආයතනයේ අදහස් හා යෝජනාවන්ද, පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනාවන්ද ඇතුළත්ව පිළියෙල කරන ලද දළ සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව ප්‍රධාන සැලසුම් කමිටුවේ අදහස් හා යෝජනා ද සැලකිල්ලට ගෙන අවසන් සංවර්ධන සැලැස්ම පිළියෙල කරනු ලැබේ.

### අනුමැතිය ලබා ගැනීම හා ප්‍රකාශයට පත් කිරීම

මේ යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ. එනම්,

1. ප්‍රධාන සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීම
2. සැලැස්ම ත්‍රෛයි භාෂා වලට පරිවර්තනය කිරීම
3. කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම
4. විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම
5. ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කිරීම
6. පුවත්පත් මඟින් මහජනතාව දැනුවත් කිරීම

02

පරිච්ඡේදය

# මූලික අධ්‍යයනය

# 2.1. අධ්‍යයන ප්‍රදේශය

හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර දිශාවේ පිහිටා ඇති අතර කොළඹ නගරයේ සිට හයිලෙවෙල් මාර්ගයේ කි. මී. 21ක් පමණ දුරින් හෝමාගම නගරය පිහිටා ඇත. වර්ග කිලෝමීටර 138 ක් පමණ විශාලත්වයකින් යුත් මෙම ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් 91 කින් සමන්විත වේ. මෙම ප්‍රාදේශීය සභා ප්‍රදේශයට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ග්‍රාම නිලධාරී වසම් 10ක්ද අයත් වේ. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ හෝමාගම ප්‍රාදේශීය සභාව 1988 දී ස්ථාපනය කර ඇත. මෙම ප්‍රදේශයට උතුරින් ගම්පහ දිස්ත්‍රික් මායිම වන කැළණි ගඟින් ද, දකුණින් කළුතර දිස්ත්‍රික්කයද, නැගෙනහිරින් හංවැල්ල හා පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ද මායිම් ලෙස සටහන් කල හැකි අතර බටහිරින් කඩුවෙල, මහරගම සහ කැස්බෑව යන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල මායිම් ද පිහිටා ඇත. භූගෝලීය වශයෙන් සලකා බලන විට උතුරු බණ්ඩාංක 109.2 ත් 190.7, නැගෙනහිර බණ්ඩාංක 173.2 ත් 122.8 අතර ප්‍රදේශය තුළ මෙම ප්‍රදේශය ව්‍යාප්තව ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ රූපන කලාප බෙදීම් අනුව සලකා බලන විට හෝමාගම ප්‍රාදේශිය සභා ප්‍රදේශය අයත් වන්නේ නිරිතදිග තැනිතලා ප්‍රදේශය ලෙස සලකනු ලබන වෙරළබඩ පහත් තැනිතලා ප්‍රදේශයටය. ප්‍රදේශයේ උන්නතාංශ මට්ටම පිළිබද සැලකිමේදි කැළණි ගඟ ආසන්නයේදි මුහුදු මට්ටමේ සිට මීටර් 10ක පමණ උසක් දක්නට ලැබෙන අතර, ප්‍රදේශය අභ්‍යන්තරයට වන්න මීටර් 80ක් දක්වා ඉහළ මට්ටමක් දක්වා දිවෙයි. කෙසේ වුවත් සමස්ථ දිවයින සම්බන්ධයෙන් සලකා බලන විට නිරිත දිග පහත් තැන්නට අවේනික රැලි කඳු රටා මෙම ප්‍රදේශයේ දක්නට නොලැබෙන්නේ වෙරළබඩට මදක් කිට්ටුවෙන් පිහිටිම හේතුවෙනි. එබැවින් ප්‍රදේශයේ දක්නට ඇති බොහෝ භූ රූපන ලක්ෂණයන් අඩ තැනි හෝ අවසාදිත තැන්පත් වු දියලු නිම්න ලෙස සැලකිය හැකිය. මෙම භූරූපන රටාවේ පරිණත ලක්ෂණ ඉනාමත් පැහැදිලිව පානළුව ප්‍රදේශයේදි පුස් ඇලි ඔය ගමන් ගන්නා ගං දගර රටාවෙන් සහ අවසාදිත තැන්පත් ව නිර්මාණය වු පුළුලු පිටාර තැන්නක් වන බරාව නමින් හදුන්වනු වන ප්‍රදේශයෙන් මනාව පැහැදිලි වේ.

**සිතියම 2.1 :** හෝමාගම ප්‍රාදේශීය සභාවේ පිහිටීම



**සැකසුම :** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021

## 2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

හෝමාගම සංවර්ධන සැලසුම 2008–2025, හෝමාගම නගරය පදනම් කරගත් නේවාසික හා කර්මාන්ත සංවර්ධනය සඳහා සුදුසු ප්‍රදේශයක් ලෙස නිර්මාණය කිරීමට අවකාශය සකස් කර ඇත. විශේෂයෙන්ම ග්‍රාමීය ලක්ෂණයන්ගෙන් අනූන වූ මෙම ප්‍රදේශය කොළඹ නගරයේ ව්‍යාප්තව පවතින රැකියා අවස්ථා හරහා නිර්මාණය වූ නේවාසික පිරිසකට ජීවත් වීමට සුවපහසු ගෙවත්තක් නිර්මාණය කිරීමට මූලිකවම දායක වන බව ඉඩම් අනුබෙදුම් ව්‍යාප්තියේ ප්‍රමාණයෙන් තහවුරු වනු ඇත. එවන් පසුබිමක ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද මාහේනවත්ත නව නගර සංවර්ධන ව්‍යාපෘතිය හා යෝජිත තාක්ෂණ / දැනුම් කේන්ද්‍රික නගර ව්‍යාපෘතියේ විවිධ උත්සාහයන් ප්‍රදේශයේ තිරස් හා සිරස් සංවර්ධනයේ විශාල පෙරළියක් නිර්මාණය කිරීමට ප්‍රයත්න දරණ බව යෝජිත යටිතල පහසුකම් හා ප්‍රවාහන පහසුකම් සැලසුම් මඟින් සනාථ වනු ඇත.

ඉතිහාසය සඳහන් කරන පරිදි හෝමාගම ප්‍රදේශය තුළ ජනාවාස බිහිවීම සීතාවක රාජධානි සමය දක්වා දිවයයි. ඓතිහාසික මූලාශ්‍රවලට අනුව දේවානම් පියතිස්ස රජු දවස ඇඹුල්ගම රජමහා විහාරය ආශ්‍රිතව ලෙන් විහාර තිහක් පමණ ඉදිකළ බව කියවෙයි. එමෙන්ම එකල තුන්වෙනි විජයබාහු රජු විසින් හෝමාගම ප්‍රදේශයේ ව්‍යාප්තව පැවති ගිරිදුර්ග හේතුවෙන් ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස භාවිතා කල බවද සටහන් කරයි (උපුටා ගැනීම : සම්පත් පැතිකඩ වාර්තාව 2017).

ඒ අනුව එවකට ගිර්දුර්ග ව්‍යාප්තව පැවති ප්‍රදේශය, වර්තමානයේ හෝමාගම ප්‍රදේශයේ උන්නතාංශයෙන් වැඩි ප්‍රදේශ ලෙස නම්කර ඇති බව පෙනී යන අතර බොහෝමයක් කළුගල් කැඩීම් සම්බන්ධ ක්‍රියාකාරකම් එම ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්තව ඇතිබව හඳුනාගත හැකිය. එපමණක් නොව සීතාවක රාජධානි සමයේ සීතාවක ප්‍රදේශයට ඔබ්බෙන් පිහිටි හෝමාගම ප්‍රදේශයේ එම ජනාවාස බිහිවීම කැළණි ගඟ ආසන්නයේ පිහිටි භූගෝලීය පසුබිම අවකාශය ලෙස ගෙන සිදු වූ බවට ද අදහස් පවතී.

පසුව එනම් 18 වන ශතවර්ෂයේදී, ඉංග්‍රීසින්ගේ පාලනයත් සමඟ අවධානයට ගැනෙන හෝමාගම ප්‍රාදේශය වතු කෘෂිකර්මාන්තය ව්‍යාප්ත කිරීම සඳහා යොදා ගන්නා ලදී. මෙම කාලය තුළ ප්‍රධාන වශයෙන් පොල්, රබර් හා සුළු අපනයන භෝග වගාව පැවතුන අතර ආසන්න වශයෙන් විශාල වතු 33 ක පමණ කෘෂිකාර්මික කටයුතු ව්‍යාප්තව පැවති බවට ඉතිහාසය සටහන් කරයි. උදා: මවුන්ට් ක්ලිෆඩ්, සිල්වන් හර්ස්ට් සහ මත්තේගොඩ ගෘෆ් සඳහන් කල හැක. මිට අමතරව සම්ප්‍රදායික කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක කෘෂිකාර්මික කටයුතු පැවති බවද සටහන් කරයි.

මෙහි සඳහන් පරිදි වර්තමානයේ හෝමාගම නගරය පිහිටි ප්‍රදේශය ආශ්‍රිතව මෙම වතු කෘෂිකර්මාන්තය ව්‍යාප්තව පැවති බවට අනුමාන කල හැක. ඒ අනුව විශේෂත්වය වනුයේ සීතාවක රජ දවස කැළණි ගඟ ආශ්‍රිතව ජනවාස බිහි වූ ප්‍රදේශයට පරිබාහිර වුන් කොළඹ නගරයට ආසන්න ප්‍රදේශයේ මෙම මහා පරිමාණ වතු කෘෂිකර්මාන්තය ව්‍යාප්ත වූ බවය.

පසුව 1908 වර්ෂයේදී දුම්රිය මාර්ගයද, 1918 වර්ෂයේදී හයිලෙවල් මාර්ගයද, හෝමාගම ප්‍රදේශය හරහා ඉදි කර ඇත්තේ වතු වගාවේ ආර්ථිකමය ප්‍රතිලාභ වර්ධනය කරගැනීම උදෙසා කොළඹ නගරය හා හෝමාගම ප්‍රදේශය අතර සම්බන්ධතාව තීව්‍ර කිරීම අරමුණු කරගෙනය. විශේෂයෙන්ම ඵලදායි හා කාර්යක්ෂම මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීමෙන් හෝමාගම ආශ්‍රිතව සිදු වූ වතු වගාවේ සුවිශාල සංවර්ධනයන්ගේ ප්‍රතිලාභ මානව පිළිබිඹු වේ. සම්පත් පැතිකඩ තොරතුරු අනුව හෝමාගම දුම්රියපල මුල්කරගෙන, මිට පෙර කුඩා කඩමණ්ඩියකින් හා කුඩා මාර්ග පද්ධතියකින් ගමනාගමන කටයුතු සිදුකල ග්‍රාමීය ලක්ෂණයන්ගෙන් යුතු වූ මෙම ප්‍රදේශය නෙරපුම් නගරයක් (Pressure Town) යනුවෙන් හඳුන්වා දී ඇත.

කාලීනව කොළඹ නගරයේ ඇති වූ ඉහළ ඉඩම් පරිභෝජනය හේතුවෙන් ආර්ථික, සමාජීය හා පරිපාලන කටයුතු උපග්‍රාහී නගර කරා වර්ධනය විය. ඒ අනුව වර්ෂ 1948 දී ශ්‍රීමත් පැට්‍රික් ඇබර්කොම්බේ නම් නගර නිර්මාණකරු විසින් කොළඹ නගරයට ආසන්නයේ පිහිටි උපග්‍රාහක නගරයක් ලෙස හෝමාගම නගරය හඳුනාගන්නා ලදී (ඇමුණුම 4). මේ කාලවකවානුවේදී හෝමාගම ප්‍රදේශයේ බොහෝමයක් ප්‍රදේශ පොල් හා රබර් වගාවෙන් ගහන වූ අතර කාර්යක්ෂම මාර්ග පද්ධතිය හා ප්‍රමාණයෙන් විශාල ඉඩම් නගරාශ්‍රිතව දක්නට ලැබීම යන හේතු සාධක මත සංවර්ධනය කරා ගමන් කිරීමේ සුවිශේෂී සංධිස්ථානයක් ලෙස හඳුනා ගැනිණි.

පසුකාලීනව එනම් 1970 වර්ෂයේදී පනාගොඩ ප්‍රදේශයේ අශෝක් ලේලන්ඩ් වාහන නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය බිහිවූ අතර වර්ෂ 1980 දී මෙම කර්මාන්තශාලාවේ කටයුතු අඩපන වන අතරතුර ශ්‍රී ලංකාවේ එවකට පැවති කර්මාන්ත අමාත්‍යාංශය විසින් එම ප්‍රදේශය ටෙම්පල් බර්ග් කර්මාන්ත කලාපය යනුවෙන් කර්මාන්ත සංවර්ධනය සඳහා හඳුන්වා දෙන ලදී. මෙමඟින් හෝමාගම ප්‍රදේශය තුළ විශාල රැකියා අවස්ථා සමූහයක් නිර්මාණය කළ අතර බහුතරයක් උදෙසා වාසස්ථාන නිර්මාණය කරගැනීමට අවස්ථාව සැලසෙන ලදී. පසුකාලීනව එනම් 1988 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටුවාන ප්‍රදේශයේ කටුවාන කර්මාන්ත පුරය නමින් කර්මාන්ත කලාපයක් නිර්මාණය කරන ලදී.

1998 වර්ෂයේ ස්ථාපිත කරන ලද මහ කොළඹ නගර සැලැස්ම (Metro Colombo Regional structure Plan) (ඇමුණුම 05) යටතේ හෝමාගම ප්‍රදේශය කොළඹ නගරයේ සුවිසල් ග්‍රාමීය ප්‍රදේශය (Vast Hinterland) ලෙස හඳුනාගෙන තිබූ අතර මහා පරිමාණ සංවර්ධනයන් සඳහා යොදාගත හැකි ඉඩම් හෝමාගම නගරය ආශ්‍රිතව විහිදී තිබෙනු දැකගත හැකිවිය. මේ හේතු මත කොළඹ ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණෙන් හෝමාගම ප්‍රදේශය කර්මාන්ත සංවර්ධනය සඳහා යොදාගැනීම තුළින් රැකියා අවස්ථා බිහි කිරීමටත්, නිවාස අවශ්‍යතාව සපුරාලීම උදෙසාත් යොදාගත හැකි බව එම සැලැස්ම සඳහන් කරනු ලබයි. හෝමාගම ප්‍රදේශය සංවර්ධනය කිරීම හා දියුණු කිරීම සම්බන්ධයෙන් එම සැලසුම් කණ්ඩායම කරන ලද විශ්ලේෂණයන්ට අනුව පහත කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමුකර තිබුණි.

1. *සංවර්ධනයට සුදුසු ඉඩම් වල ව්‍යාප්තිය*
2. *පැවති මහාමාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම් (විදුලිය , ජලය)*
3. *කොළඹ නගරයට ආසන්නයේ පිහිටා තිබීම*
4. *එවකට හෝමාගම ප්‍රදේශය සුවිශාල නගරාසන්න ප්‍රදේශයක් ලෙස ක්‍රියා කල ආකාරය*

මීට අමතරව 1986 වර්ෂයේදී හෝමාගම පැරණි නගර සභා ප්‍රදේශය උදෙසා එවකට පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝමාගම ප්‍රදේශය සඳහා 1986 – 2001 කාලසීමාව සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කරන ලදී. මෙම සැලැස්මේ ප්‍රධාන අරමුණ වුයේ කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන උප නගරයක් ලෙස කොළඹ නගරය සහ හෝමාගම අතර පවතින සම්බන්ධතාවය ශක්තිමත් කිරීමය. ඒ අනුව හෝමාගම නගරය සේවා මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමත්, පවතින සම්පත් උපරිම ලෙස හා ඵලදායි ලෙස සංවර්ධනය සඳහා යොදා ගැනීමත් හා ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කෙරිණි.

මේ අනුව ක්‍රමක්‍රමයෙන් විවිධ සංවර්ධන අවශ්‍යතා මත හෝමාගම ප්‍රදේශය සතු නාගරික ලක්ෂණ නගර සීමාවෙන් ඔබ්බට ව්‍යාප්ත වීම 2000 වර්ෂ වන විට දැකගත හැකිවිය (ඇමුණුම 06). එම නාගරික ලක්ෂණ ව්‍යාප්තවීමට සුවිශේෂී හේතුවක් ඍජුවම හඳුනා ගැනීමට නොහැකි වුවද, ඉතිහාසයේ පටන් කොළඹ ප්‍රධාන නගරයට උපග්‍රාහී නගරයක් ලෙස කලාපයේ ජනතාවට, වෘත්තීය හා නේවාසික පහසුකම් සපයන මධ්‍යස්ථානයක් ලෙස මෙම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ සෙසු ප්‍රදේශ පුරා ප්‍රචලිත වීම එයට හේතු වූ බව මෙහිදී සඳහන් කල හැක.

## 02 පරිච්ඡේදය
## මූලික අධ්‍යයනය

### සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2008 – 2025 කාල සීමාව සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මේ (ඇමුණුම 07) උවද ප්‍රධාන අරමුණ වී ඇත්තේ නේවාසිකයන්ට සුවපහසු ජීවිතයක් ගතකිරීම සඳහා සුදුසු ආර්ථික, සමාජීය හා භෞතික පහසුකම් සලසාදීමට කටයුතු කිරීමයි. නෛතිකමය වශයෙන් පිළිගැනුණු කලාපිකරණ සැලැස්මක් හඳුන්වාදීම මඟින් අද දක්වාම නේවාසික භාවිතයන් කළමනාකරණය කිරීමක් හා එම භාවිතයන් සඳහා පැහැදිලි මඟපෙන්වීමක් සිදුකරන බව දැකගත හැක.

වර්තමානය වන විට හෝමාගම ප්‍රදේශය, විශේෂයෙන්ම දියගම ජාත්‍යන්තර ක්‍රීඩාංගනය ඉදිවීම, දක්ෂිණ අධිවේගී මාර්ගය ඉදිවීම, නාගරික සංවර්ධන අධිකාරියෙහි මූලිකත්වයෙන් පිටිපන ප්‍රදේශයෙහි නැනෝ තාක්ෂණ ආයතනය බිහි වීම, තාක්ෂණ නගරයට සමගාමීව පිටිපන ප්‍රදේශයේ හරිත විශ්ව විද්‍යාලය ඉදිවීම, දියගම තාක්ෂණ විශ්වවිද්‍යාලය (ITUOM) ඉදිවීම සහ ජනගහන වර්ධනයට සාපේක්ෂව නිවාස, රැකියා හා අපරවයුහ සේවා පහසුකම් සැපයීම රාජ්‍ය හා පෞද්ගලික ආයතනයන්ගෙන් සිදුවීම හෝමාගම ප්‍රදේශයේ සංවර්ධනයට නව මුහුණුවරක් එකතු කරන්නක් විය.

එපමණක් නොව වර්තමානයේ හෝමාගම සංවර්ධනයේ සලකුණු තුළ මාලබේ තාක්ෂණ සංවර්ධනයන් අභිබවමින් හෝමාගම තාක්ෂණ නගර සංකල්පය යටතේ ඉදිවන ශ්‍රී ලංකාවේ අග්‍රගන්‍ය තාක්ෂණික විශ්ව විද්‍යාල පද්ධතිය, ප්‍රදේශයේ භූමි භාවිතයන්ගේ, සමාජීය, ආර්ථික හා යටිතල පහසුකම් වල විශාල වෙනසකට මුලපුරනු ඇත.

එමෙන්ම මෙම ප්‍රදේශය ආශ්‍රිත සමාජීය, ආර්ථික, භෞතික හා පාරිසරික අංගයන් කෙරෙහි අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වනු ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ගණනය කරන ලද දත්ත වලට අනුකූලව 2012 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික්කය තුළ පමණක් සමස්ථ ජනගහනය බස්නාහිර පළාතේ සමස්ත ජනගහනයේ ව්‍යාප්තියෙන් 40% ක් පමණ වෙයි. එනම් ජන සංඛ්‍යාව 2,310,000 ක පමණ ඉහල අගයක් ගනී. කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තියට සාපේක්ෂව හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ජන ව්‍යාප්තිය 11% ක් පමණ වේ. 2001 වර්ෂයේදී හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු ජනගහනය 197,227 ක් වූ අතර 2012 වර්ෂයේ එය 252, 469 අගයක් ගනී. එමෙන්ම 2001 –2012 අතර කාලය තුළ ජනගහන වර්ධන වේගය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේදී කොළඹ දිස්ත්‍රික්කය තුළ එය 0.36% අගයක් ගනී. කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සලකා බලන විට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහන වර්ධන වේගය 2.29% ක ඉහළ අගයක් ගන්නා බව පැහැදිලි වේ. 1981 – 2001 අතර කාලය තුළ ජනගහන වර්ධන වේගය 2.5% ක් අගයක් ගන්නා අතර ඊට සාපේක්ෂව 2019 වර්ෂයේදී ජන සංඛ්‍යාව 296,380 පමණ ඉහල අගයක් ගනී.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්තයන්ට අනුව හෝමාගම ප්‍රදේශයේ එක් කුටුම්බයක සාමාන්‍යයෙන් පුද්ගලයන් ගණන 4 ක් පමණ වේ. සාමාන්‍ය ජනඝනත්වය හෙක්ටයාර් එකකට පුද්ගලයන් 24 ක් පමණ වේ. කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ඇතුළුව අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ජනඝනත්වයට සාපේක්ෂව, පාදුක්ක හා සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හැරුණුවිට හෝමාගම ප්‍රදේශය අඩු ජනඝනත්වයක් වාර්තා කරයි. එය පහත ප්‍රස්ථාරය 2.1 මඟින් මනාව පැහැදිලි වේ.

***ප්‍රස්ථාරය 2.1.*** *ජනසනත්වය 2012 වර්ෂය - කොළඹ දිස්ත්‍රික්කය (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්)*




***මූලාශ්‍රය:*** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත වාර්තාවන්ට අනුව 2012 වර්ෂයේ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුළු නිවාස ප්‍රමාණය ඒකක 61,505ක් පමණ වේ. ඒ අතරින් නිවාස 59,121 ක ප්‍රමාණයක් ස්ථිර නිවාස ගණයට වැටෙන අතර නිවාස 2,282 ක ප්‍රමාණයක් අර්ධ ස්ථිර නිවාස වේ. අනෙකුත් නිවාස 102 ක ප්‍රමාණය ඉදකිරීම් මට්ටමේ පවත්නා නිවාස ලෙස හඳුනා ගත හැකිය. 2019 සම්පත් පැතිකඩ වාර්තා අනුව හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය කෙරෙන ජනසංඛ්‍යාව අනුව උපකල්පිත නිවාස සංඛ්‍යාව 74,095 කි. ඉන් 80% ක් ස්ථිර නිවාස වන බව අනාවරණය වේ.

එපමණක් නොව 2017 වර්ෂයේදී සිදු කරන ලද භූමි පරිභෝජන රටාව (ඇමුණුම 08) පිළිබඳ විශ්ලේෂණයට අනුව හෝමාගම ප්‍රදේශයේ ආර්ථික පසුබිම පිළිබඳ අවබෝධයක් ලබා ගත හැක. ඒ අනුව කාලයත් සමඟ හෝමාගම ප්‍රදේශය ජනාකීර්ණ ප්‍රදේශයක් බවට පත්වීම හේතුකොට ගෙන, එම ප්‍රදේශයේ මුළු භූමි ප්‍රදේශයෙන් 13% ක ප්‍රමාණයක් වාණිජ හා සේවා කටයුතු සඳහා භාවිතා කරනු දැක ගත හැකි අතර 43% ක ප්‍රමාණයක් නේවාසික භාවිතය සඳහා යොදා ගනු දැක ගත හැක. මෙහි විශේෂත්වය වන්නේ 18 වන සියවසේ සිට පැවත ආ විශාල වතු ඉඩම් එළිපෙහෙළි කර අනු බෙදුම් කිරීම සඳහා යොදා ගැනීම හරහා නේවාසික භාවිතයන් සඳහා ඉඩම් වල ඉල්ලුම සාපේක්ෂව වර්ධනය වීමයි. වර්තමානයේ රබර් හා පොල් සඳහා භූමි භාවිතය කොපමණක් ද යන්න කෙරෙහි අවධානය යොමු කිරීමේදී එය පිළිවෙලින් 10% ක් හා 3% ක් අතර අඩු ප්‍රතිශතයක පවතින බව හඳුනා ගැනීමට පුළුවන.

02 පරිච්ඡේදය
## මූලික අධ්‍යයනය

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

ග්‍රාමීය සෞන්දර්යයෙන් ඔප වැටුණු ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි මෙම ප්‍රදේශය තුළ මුළු භූමි ප්‍රමාණයෙන් 9% ප්‍රමාණයක කුඹුරු ව්‍යාප්ත වී ඇති බවක් දැකිය හැකිය. ප්‍රදේශය පුරා විහිදුනු මුළු හරිත ප්‍රදේශ ප්‍රමාණය පිළිබඳ කරුණු විමසා බැලූ විට පසක් වනුයේ, එය 30% කට ආසන්න අගයක් ගන්නා බවයි. ඒ අනුව හෝමාගම ප්‍රදේශය නාගරික ලක්ෂණයන්ට වඩා හරිත ගහණයෙන් වැඩි නේවාසික ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව පහත ප්‍රස්ථාරය 2.2 මඟින් දක්වා ඇත.

*ප්‍රස්ථාරය 2.2. හෝමාගම සැලසුම් ප්‍රදේශය තුළ භූමි භාවිතයේ ව්‍යාප්තිය - 2017*

0.00%
වනාන්තර

0.1,0%
උපයෝගිතා පහසුකම්

0.1,0%
ලඳු කැලෑ

0.3,1%
තෙත් බිම්

0.4,1%
උද්‍යාන හා ක්‍රීඩා පිටි

0.4,1%
ජලාශ්‍රිත ප්‍රදේශ

0.5,1%
ගල් කඳු ප්‍රදේශ

0.7,1%
කර්මාන්ත

0.9,2%
පරිපාලන ආයතන

1.0,2%
කෘෂිකාර්මික

1.6,3%
මංමාවත්

1.9,3%
පොල්වගාව

5.0,9%
වෙනත්

5.1,9%
කුඹුරු

5.3,10%
රබර්

0.7,1%
ආගමික ස්ථාන

7.3,13%
වෙළඳ

23.6,43%
නේවාසික

***මූලාශ්‍රය:*** *භූ සැලසුම් දත්ත 2008 හා 2017 වර්ෂය, භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය සහ බස්නාහිර පළාත් අංශය නාගරික සංවර්ධන අධිකාරිය*

එමෙන්ම හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2019 වර්ෂය සඳහා නිකුත් කරන ලද සම්පත් පැතිකඩ වාර්තාවට අනුව හෝමාගම ප්‍රදේශයේ කෘෂිකර්මාන්තයේ නියැලෙන පවුල් ප්‍රමාණය 4%ක පමණ අඩු ප්‍රතිශතයක් වාර්තා කරයි.

ඒ අනුව පැහැදිලි වනුයේ 2019 වර්ෂයේදී ලක්ෂ තුනකට පමණ ආසන්න ප්‍රමාණයක ජන සංඛ්‍යාවක් වාසය කරන මෙම ප්‍රදේශයේ ගොවි පවුල් 8000 – 12000 ක් අතර සුළු ප්‍රමාණයක් වන බවත් භූමි පරිභෝජන රටාව අනුව වී වගාවට යොදා ගන්නා භූමි ප්‍රමාණය මුළු භූමි ප්‍රමාණයෙන් 9% ක් වැනි මට්ටමක පවතින බවත්ය.

රැකියාවන්වල බෙදීයාම අනුවද පැහැදිලි වනුයේ පෞද්ගලික අංශයේ හා රාජ්‍ය අංශයේ රැකියාවල නියුතු ප්‍රමාණය සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා බවත් කෘෂිකර්මාන්තයෙහි නියුතු ප්‍රමාණය 7% ක් වැනි අඩු ප්‍රමාණයක් වන බවත්ය. ඒ අනුව හෝමාගම ප්‍රදේශය ග්‍රාමීය පරිසර ලක්ෂණ පෙන්නුම් කලද ආර්ථික මට්ටමෙන් ඉහළ අදායමක් උපයන මිනිසුන් වාසය කරන ප්‍රදේශයක් බවට තහවුරු වනු ඇත. රැකියා ස්වභාවය මත රැකියා නියුක්තිය රූපය 2.1 මගින් දැක්වේ.



*රූපය 2.1. රැකියාවන්ගේ ස්වභාවය මත සේවා නියුක්තිය - 2019*




***මූලාශ්‍රය:** සම්පත් පැතිකඩ වාර්තාව, 2019 වර්ෂය, හෝමාගම ප්‍රදේශීය ලේකම් කාර්යාලය*

එමෙන්ම වාණිජ භාවිතයන්ගේ ව්‍යාප්තිය පිළිබඳ සඳහන් කිරීමේදී එය ප්‍රධාන නගර වටා ඒකරාශී වී ඇති බවත්, බොහොමයක් වාණිජ භාවිතයන් නේවාසිකයන්ට සේවා පහසුකම් සපයන ඒවා බවත්, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2019 වර්ෂය සඳහා නිකුත් කරන ලද සම්පත් පැතිකඩ වාර්තාවට අනුව පැහැදිලි වේ. එය පහත දක්න ව්‍යාප්තිය මගින් පෙන්වා දිය හැක.

***මගුව 2.1.** වාණිජ භාවිතයන්ගේ ව්‍යාප්තිය හෝමාගම සැලසුම් ප්‍රදේශය- 2016 වර්ෂය*

| වාණිජ භාවිතයන්ගේ ව්‍යාප්තිය හෝමාගම සැලසුම් ප්‍රදේශය- 2016 වර්ෂය | |
|---|---|
| **සේවා මධ්‍යස්ථාන** | **සංඛ්‍යාව** |
| ස.තො.ස. අලෙවි සැල් | 15 |
| සුපිරි වෙළඳසැල් | 28 |
| බේකරි | 88 |
| භෝජන ශාලා | 309 |
| සිල්ලර වෙළඳසැල් | 1830 |
| රෙදිපිළි වෙළඳසැල් | 251 |
| කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන | 10 |
| සැලුන් | 133 |
| පොහොර ගබඩා/කෘෂි රසායන ද්‍රව්‍ය අලෙවිසැල් | 11 |
| ගබඩා | 19 |
| ඉන්ධන පිරවුම් හල් | 08 |
| මුද්‍රණාල | 27 |
| බලපත්‍ර මත්පැන් අලෙවිසැල් | 08 |
| බලපත්‍ර මස් අලෙවිසැල් | 09 |
| දුරකථන මධ්‍යස්ථාන | 80 |
| ෆාමසි | 57 |

***මූලාශ්‍රය:** සම්පත් පැතිකඩ වාර්තාව, 2016, හෝමාගම ප්‍රදේශීය ලේකම් කාර්යාලය*

## 02 පරිච්ඡේදය
## මූලික අධ්‍යයනය

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

හෝමාගම නගර මධ්‍යයේ වාණිජ භාවිතයන්ගේ විහිදීම පිලිබඳ නිරීක්ෂණය කිරීමේදී ද පැහැදිළි වනුයේ ප්‍රදේශයේ නේවාසිකයන් අරමුණු කරගනිමින් සේවා පහසුකම් ආශ්‍රිත භාවිතයන් බහුලව ව්‍යාප්තවී ඇති බවත් විශේෂයන්ම මෙම භාවිතයන් බොහොමයක් ප්‍රධාන මාර්ග දෙපස ව්‍යාප්ත වී ඇති බවත්ය (රූපය 2.2.). මධ්‍ය ප්‍රමාණයේ ගොඩනැගිලිවලින් සමන්විත මෙම නගරය, හයිලෙවල් මාර්ගය හරහා කොළඹට හා අවිස්සාවේල්ල ප්‍රදේශයට ගමන් ගන්නා මඟීන්ට නාගරික පහසුකම් සැපයීමට නිර්මාණය වී ඇති ආකාරයක් දැකගත හැකිය.

ප්‍රධාන වශයෙන් හෝමගම නගරය හැරුණු විට වෙළඳ හා වාණිජ කටයුතු කෙරෙන සේවා මධ්‍යස්ථාන ලෙස කහතුඩුව, පොල්ගස්ඕවිට, ගොඩගම, හබරකඩ, හා මීගොඩ ප්‍රධාන ස්ථානයක් ගනී. නේවාසික කලාපයක් ලෙස හැරුණු විට හෝමාගම අතීතයේ සිටම කර්මාන්ත ව්‍යාප්තියේ දී ප්‍රමුඛස්ථානයක් ගෙන ඇති අතර හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව කටුවාන, ටෙම්පල් බර්ග්, මීගොඩ හා පනාගොඩ කර්මාන්තපුරයන් දක්නට ලැබේ. මිට අමතරව සුළු කර්මාන්ත ප්‍රදේශය පුරා විහිදී ඇති ආකාරයක් දක්නට ලැබේ.

***රූපය 2.2 :*** *හෝමාගම නගරය හා හයිලෙවල් පාර දෙපස වාණිජ භාවිතයන් ඒකරාශී වී ඇති ආකාරය*




***මූලාශ්‍රය:*** *ගූගල් මාවත් දර්ශන (Google Street View) රූප රාමු - 2015 වර්ෂය*

හෝමාගම ප්‍රදේශයේ භූමි පරිහරණ ව්‍යාප්තියට අනුව එහි මුළු භූමි ප්‍රමාණයෙන් 1% ජලාශ්‍රිත ප්‍රදේශ වීමත් තවත් 1% ප්‍රමාණයක් පහත් බිම් ලෙස ව්‍යාප්ත වීමත් සුවිශේෂී ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකි අතර මෙහි දැකිය හැකි තවත් සුවිශේෂී ලක්ෂණයක් වනුයේ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින ජල ප්‍රදේශ බහුතරයක් කුඹුරු පාදක කරගනිමින් ව්‍යාප්තව පැවතීමයි. තවද ඇළ මාර්ගවල ප්‍රමාණය හා එහි වැදගත්කම නිර්ණය කරන විශ්ලේෂණයට අනුව කැළණි ගඟ, පුස්වැලි ඔය, මහා ඔය හා නුදුන් ඇළ ප්‍රධානත්වයක් උසුලනු ලබන අතර ප්‍රධාන දිය බස්නා ප්‍රදේශය වශයෙන් කැළණි ගඟ හා කළු ගඟ ප්‍රදේශ හඳුනා ගත හැකිය.

ඇළ මාර්ග වල ප්‍රමාණයේ තීව්‍රතාවය රූපය 2.3. මඟින් දැක්වෙන අතර ප්‍රධාන පාරිසරික සංවේදී කලාප ලෙස අක්කර 200 කට අසන්න ප්‍රදේශයක ව්‍යාප්තව පවතින බරාව සංරක්ෂිත ප්‍රදේශය සහ අක්කර 100 කට ආසන්න ප්‍රදේශයක ව්‍යාප්තව ඇති බදුවිලවත්ත පාරිසරික සංවේදී ප්‍රදේශය හඳුන්වාදිය හැකිය. (සිතියම් අංක 2.2)

*රූපය 2.3 : ඇළ මාර්ගවල ප්‍රමාණයේ තීව්‍රතාව - හෝමාගම සැලසුම් ප්‍රදේශය*




*මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය, නා. සං. අධි.,2020*

නවද හෝමාගම ප්‍රදේශයේ මහා මාර්ග පද්ධතිය හා ප්‍රවාහන පහසුකම් පිලිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. මන්ද යත් කොළඹ නගරය හා යාකෙරෙමින් දිවෙන ප්‍රධාන මාර්ග 3ක් මෙම ප්‍රදේශය හරහා ගමන් කිරීමත්, දක්ෂිණ අධිවේගී මාර්ගයේ සම්බන්ධතාවය සහ කැළණිවැලි දුම්රිය මාර්ගය හෝමාගම නගරය හරහා ගමන් කිරීමත්ය. හෝමාගම නගරයේ සිට හයිලෙවල් මාර්ගයෙන් (A4) කොළඹ අගනගරයට සහ අවිස්සාවේල්ල, රත්නපුර, බදුල්ල, අම්පාර සහ මඩකලපුව දක්වාත් කොළඹ, හංවැල්ල, පහත්ගම මාර්ගයෙන් පස්යාල හරහා මහනුවර දක්වාත්, කොළඹ – හොරණ මාර්ගයෙන් බණ්ඩාරගම හරහා කළුතර, පානදුර නගර දක්වාත් ඍජු ප්‍රවේශකත්වයක් ඇත. මෙයට අමතරව කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා හයිලෙවල් මාර්ගයට තරමක් සමාන්තරව කැළණි වැලි දුම්රිය මාර්ගය හෝමාගම නගර මධ්‍ය හරහා ගමන් කෙරේ. දකුණු අධිවේගී මාර්ගය ඉදිවීමත් සමඟ ගාල්ල මාතර නගර කරා පැය 2ක පමණ කාලයක් තුළදී ළඟා වීමේ අවස්ථාව උදාවී ඇත.

එමෙන්ම ප්‍රාදේශීය මාර්ග පද්ධතිය සම්බන්ධ විස්තර පහත පරිදි සඳහන් කල හැක. කොට්ටාව අධිවේගී අන්තර් හුවමාරුවට කිලෝමීටර 3ක් දුරින් හෝමාගම නගරය පිහිටා තිබෙන අතර කහතුඩුව අධිවේගී අන්තර් හුවමාරුව හෝමාගම ප්‍රාදේශීය සභා සිමාව තුළ පිහිටා තිබේ. එපමණක් නොව මෙම ප්‍රදේශයට හෝමාගම රෝහල දුම්රිය නැවතුම්පල, හෝමාගම නගරයේ ප්‍රධාන දුම්රිය නැවතුම්පල, ගොඩගම දුම්රිය නැවතුම්පල, පනාගොඩ දුම්රිය නැවතුම්පල, මීගොඩ දුම්රිය නැවතුම්පල, වටරැක දුම්රිය නැවතුම්පල හා ලියන්වල දුම්රිය නැවතුම්පල යනුවෙන් දුම්රිය නැවතුම් ස්ථාන 7 ක් දක්නට ලැබෙන අතර හෝමාගම ප්‍රධාන බස් නැවතුම්පල නව නගර මධ්‍යයේ පිහිටා ඇති අතර මීගොඩ නගරය ආශ්‍රිතව කුඩා ප්‍රමාණයේ බස් නැවතුම් මධ්‍යස්ථානයක්ද දක්නට ලැබේ. ඒ අනුව එම මහා මාර්ග හා ගමනාගමන පහසුකම් රූපය 2.4. මඟින් දැක්වේ.

**සිතියම 2.2 :** *ජලාශ්‍රිත හා පහත්බිම් ප්‍රදේශවල ව්‍යාප්තිය - හෝමාගම සැලසුම් ප්‍රදේශය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

*රූපය 2.4 : හෝමාගම සැලසුම් ප්‍රදේශය හරහා වැටී ඇති මහා මාර්ග හා ගමනාගමන පහසුකම්*




***මූලාශ්‍රය:** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

# 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සමස්ත හෝමාගම ප්‍රදේශිය ලේකම් කොට්ටාශය ආවරණය කරන අතරම පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් දහයකින් යුක්තව නිර්ණය කර ඇත. හෝමාගම ප්‍රදේශය පදනම් කොට ගෙන එනෙක් මෙනෙක් කාලය තුල සිදු වූ සංවර්ධන සැලසුම් කෙරෙහි අවධානයේදී පැහැදිලි වනුයේ එය සමස්ත හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ආවරණය කරමින් සිදු කර ඇති බවයි. එමෙන්ම හෝමාගම වත්මන් සංවර්ධන සැලස්ම (2008 – 2025) ට ප්‍රතිශෝධනයක් ලෙස 2031 සඳහා නව සංවර්ධන සැලැස්මක් නිර්මාණය කිරීම මෙහි මූලික අරමුණක් වී ඇත.

හෝමාගම සැලසුම් ප්‍රදේශය හඳුනාගැනීමේදී, ප්‍රදේශයේ වර්ග ප්‍රමාණය පිලිබඳ මූලික අවධානය යොමු කල බව සඳහන් කල යුතුය. මන්ද යත් අනෙකුත් ප්‍රාදේශීය සභා හෝ නගර සභා ප්‍රදේශ වර්ග ප්‍රමාණය අතින් සාපේක්ෂව වර්ග කිලෝමීටර 80 ට වඩා අඩු ප්‍රමාණයක් ගනී. නමුත් හෝමාගම ප්‍රකාශිත සැලසුම් ප්‍රදේශය ප්‍රමාණයෙන් තරමක් විශාල වන අතර එහි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 138 ක ප්‍රදේශයක් ආවරණය කරන බව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ දත්තයන් අනුව තහවුරු වේ. ප්‍රකාශිත හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය සිතියම් අංක 2.3. මඟින් දක්වා ඇත.

***සිතියම 2.3 :*** *ප්‍රකාශිත හෝමාගම සැලසුම් ප්‍රදේශය*




***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**සිතියම 2.4 :** *භූගෝලීය පසුබිම - හෝමාගම සැලසුම් ප්‍රදේශය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 02 පරිච්ඡේදය
## මූලික අධ්‍යයනය

### සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් සැලසුම් ප්‍රදේශ පිළිබඳ අධ්‍යයනයේදී පැහැදිලි වනුයේ හෝමාගම ආශ්‍රිතව ක්‍රියාත්මක වන කඩුවෙල, මහරගම, කැස්බෑව, පාදුක්ක, සීතාවක, හොරණ හා බියගම නගර සභා හා ප්‍රාදේශීය සභා ආවරණය කරමින් 2030 වර්ෂය උදෙසා සංවර්ධන සැලසුම් සකස් කරන බවයි. එමෙන්ම තනිව ගත් කල හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය ප්‍රමාණයෙන් වර්ග කිලෝමීටර් 138 ක ප්‍රදේශයක් ආවරණය කරන හෙයින් සහ තාක්ෂණ නගරය වැනි මහා පරිමාණ ව්‍යපෘති මෙම ප්‍රදේශයට යෝජනා වී ඇති හෙයිනුත්, සැලසුම් නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ පහසුව හේතුවෙන්ද හෝමාගම ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව උදෙසා සංවර්ධන සැලස්ම (2031) සකස් කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීමේදී අවධානය යොමු කරන තවත් කරුණක් ලෙස භූගෝලීය ලක්ෂණ අධ්‍යයනය කිරීම පෙන්වාදිය හැකිය. හෝමාගම ප්‍රදේශයට අනුව පවතින ප්‍රධාන භූගෝලීය මායිම් කිහිපයක් ලෙස කළු ගඟ අතු ගංගාවක් වන මහ ඔය, කැළණි ගඟ අතු ගංගාවක් වන පුස්වැලි ඔය හා කැළණි ගඟ හඳුනාගැනීමට පුළුවන. දැනට ක්‍රියාත්මක වන සැලසුම් ප්‍රදේශයේ සීමාවන් අධ්‍යයනයෙන් පසක් වනුයේ දැනටමත් එම භූගෝලීය සීමාවන් අවධානයට යොමුකර ඇති බවයි. ප්‍රදේශයේ භූගෝලීය ලක්ෂණ සිතියම් අංක 2.4. මඟින් දක්වා ඇත.

ඒ අනුවද පැහැදිලි සැලසුම් සීමාවක් මෙම ප්‍රදේශයට ලැබී ඇති හෙයින් 2022–2031 නව සංවර්ධන සැලැස්මද හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුල සිදු කිරීමට තීරණය කරන ලදී.

එමෙන්ම ග්‍රාම නිලධාරී වසම් අනුව ගත් විට හෝමාගම මුළු සැලසුම් ප්‍රදේශයට ග්‍රාම නිලධාරී වසම් 91 ක් ඇතුලත් වේ. එම ග්‍රාම නිලධාරී වසම් 91 කම ආවරණය වන පරිදි හෝමාගම සැලසුම් ප්‍රදේශය නිර්ණය වී ඇති හෙයින්ද නව සංවර්ධන සැලැස්මද හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව පදනම් කරගෙනම සිදු කිරීමට සැලසුම් කණ්ඩායම තීරණය කරන ලදී.

මෙහිදී විශේෂයෙන්ම සඳහන් කල යුතු කාරණය වනුයේ හෝමාගම සංවර්ධන සැලස්ම, ඉහත සඳහන් කරන ලද සියලු සැලසුම් ප්‍රදේශ අරභයා සිදු කරනු ලබන සංවර්ධන සැලසුම් (2031) ඒකාබද්ධ කර ගනිමින් හා ඊට අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් නිර්මාණය කිරීමට සමත් වන ලෙස සංවර්ධන සැලස්ම සකස් කිරීමට කටයුතු කර ඇති බවයි.

බස්නාහිර පළාත තුල හෝමාගම ප්‍රදේශයේ ක්‍රියාකාරීත්වය අධ්‍යයනය කිරීම සඳහා හා එමගින් හෝමාගම ක්‍රියාකාරී සැලසුම් සීමාව නිර්ණය කිරීම උදෙසා (Development Pressure) සංවර්ධන තීව්‍රතාවය විශ්ලේෂණය සිදුකරන ලදී (රූපය 2.6.) එපමණක් නොව කාලයත් සමග භූමි පරිහරණයේ වෙනස්වීම් සිදුවීමේ රටාව මෙම අධ්‍යයනයට ඇතුලත් කර ගන්නා ලදී. කොළඹ දිස්ත්‍රික්කය තුළ භූමි පරිහරණ රටාව වෙනස්වීම රූපය 2.5. මඟින් දක්වා ඇත.

*රූපය 2.5 : භූමි පරිහරණයේ වෙනස්වීම - කොළඹ දිස්ත්‍රික්කය*




***මූලාශ්‍රය:*** *article.sapub.org/10.5923.j.ajgis.20170603.01.html,2017*

*රූපය 2.6 : සංවර්ධන තීව්‍රතා විශ්ලේෂණය (Development Pressure Analysis)*




***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

රූපය 2.6. මඟින් පැහැදිලි කරනුයේ සංවර්ධන තීව්‍රතාව විශ්ලේෂණය වන අතර එමඟින් යම් ප්‍රදේශයක් ආශ්‍රිතව දක්නට ලැබෙන නාගරික ක්‍රියාකාරකම් වල විහිදීම හා ලක්ෂණයන්ගේ විහිදීම අධ්‍යයනය කරන අතර බස්නාහිර පළාත තුල එය කෙසේද යන්න මෙම විශ්ලේෂණය මඟින් පෙන්නුම් කරයි.

## 02 පරිච්ඡේදය
## මූලික අධ්‍යයනය

### සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීමේ කාර්යය හමුවේ උක්ත විශ්ලේෂණය සම්බන්ධ කරගැනීමේදී , එය කොළඹ දිස්ත්‍රික්කයේ සිට හෝමාගම හා ගොඩගම නගර දෙසට හයිලෙවල් මාර්ගය ඔස්සේ විහිදෙන ආකාරයක් දැක ගැනීමට පුළුවන.

හෝමාගම, ගොඩගම, මත්තේගොඩ, දියගම, අතුරුගිරිය, මාහේනවත්ත, මීගොඩ හා කහතුඩුව යන ප්‍රදේශ හැරුණුවිට හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෙසු ප්‍රදේශ ග්‍රාමීය ලක්ෂණ පෙන්නුම් කරන බව දැකිය හැකිය. පාදුක්ක, බණ්ඩාරගම, හංවැල්ල හා මාලබේ යන ප්‍රදේශ වල නාගරික ලක්ෂණයන්ගේ ව්‍යාප්තිය හෝමාගම ප්‍රදේශය සමග සමීප ලෙස බද්ධවීමක් දක්නට නොලැබේ.

මේ කරුණු කාරණා හේතු කොටගෙන හා අනාගතයේදී ක්‍රියාත්මක වීමට නියමිත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය, මිල්ලෑව කර්මාන්තපුරය, රුවන්පුර අධිවේගී මාර්ගය හා මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය වැනි ව්‍යාපෘති හරහා මුළු හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයම නාගරීකරණයට යොමු වේයැයි උපකල්පනය කරමින්, ඉදිරි වර්ෂ 10 සඳහා සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව අරභයා සිදු කල යුතු බව තීරණය කරන ලදී.

එලෙස සකස් කරන සැලැස්ම සෙසු ප්‍රදේශ සඳහා සකස් කරමින් පවතින සංවර්ධන සැලසුම් ආදේශ කරගනිමින් හා එහි ව්‍යාපෘතීන් සම්බන්ධ කර ගනිමින් සැලසුම් කිරීම විය යුතු බවද තීරණය කරන ලදී. ඒ අනුව වර්තමානයේ හෝමාගම ප්‍රාදේශීය සභාව ලෙස හඳුන්වනු ලබන, වර්ග කිලෝමීටර 138 කින් යුතු හා ග්‍රාම නිලධාරී වසම් 91 කින් සමන්විත ප්‍රදේශය හෝමාගම සැලසුම් ප්‍රදේශය ලෙස ගෙන සංවර්ධන සැලැස්ම (2022–2031) සකස්කිරීමට තීරණය කරන ලදී. හෝමාගම සංවර්ධන සැලසුම් ප්‍රදේශය සිතියම අංක 2.5. මඟින් දක්වා ඇත.

හෝමාගම සංවර්ධන සැලසුම් ප්‍රදේශයට (2022 –2031) අයත්වන ග්‍රාම නිලධාරී වසම් (ඇමුණුම 09) හි සඳහන් වේ.

***සිතියම 2.5 :*** *හෝමාගම සංවර්ධන සැලසුම් ප්‍රදේශය 2022 - 2031*




***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

03

පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

03 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

හෝමාගම සැලසුම් කලාපය කොළඹ දිස්ත්‍රික්කය තුළ හා කොළඹට ආසන්නයේ පිහිටා ඇති නිසාත්, වර්තමානයේ පවතින සීඝ්‍ර සංවර්ධනයත් හේතුවෙන් දේශීය මෙන්ම විදේශීය වශයෙන් ඇදී එන විවිධ සංවර්ධන යෝජනා සහ ව්‍යාපෘති නිසාත් වේගවත් නාගරීකරණයකට ලක් වෙමින් පවතී.

අවශ්‍යතාවය 01

මේ ආකාරයට හෝමාගම සැලසුම් කලාපය ඉලක්ක කරගනිමින් හෝමාගම ප්‍රදේශයට ඇදී එන දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති හා වැඩි වර්ධන වේගයකින් ක්‍රමයෙන් වැඩිවන ජනගහනය ග්‍රාමීය පරිසර පද්ධතිය ආක්‍රමණය කෙරෙමින් පවතින හෙයින් ආර්ථික, සමාජීය,භෞතික හා පාරිසරික වශයෙන් සැලසුම්මීය වශයෙන් ගැටළු රැසක් නිර්මාණය කෙරෙමින් පවතින බව දක්නට ලැබේ.

## අවශ්‍යතාවය 01

***වර්තමාන නේවාසික ක්‍රියාකාරකම් පරිසර සංවේදී කලාප ප්‍රදේශයන්ට ව්‍යාප්තවීමේ ප්‍රවණතාව වැඩිවීම හේතුවෙන් පාරිසරික සංවේදී කලාපයන්ගේ පැවැත්මට ඇතිවිය හැකි තර්ජනය මග හරවා ගැනීමට පියවර ගැනීම අවශ්‍යය වීම.***

ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කය වූ කලි පසුගිය වකවානුවල සිට අද දක්වා සීඝ්‍ර නාගරීකරණයකට ලක්වෙමින් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකි අතර, එවන් පසුබිමක හෝමාගම 2012 වර්ෂයේ ජනලේඛන හා සංඛ්‍යා ලේඛන වාර්තාවලට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ ජීවත්වන 40% ක් වූ මුළු ජනගහනයෙන් 11% ක්, එනම් ප්‍රමාණයෙන් 252,469 කට ආසන්න ජන සංඛ්‍යාවක් තම ස්ථිර පදිංචිය සඳහා තෝරාගත් ප්‍රදේශයකි. එය කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ හා සසඳන කල ජනගහනය අතින් හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පස්වෙනි ස්ථානය ගනී. කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය පහත ප්‍රස්ථාරය මඟින් දැක්වේ.

***ප්‍රස්ථාරය 3 1:*** *කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය 2012*




***සැකසුම:*** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

**සිතියම 3.1 :** *ජන ඝනත්වය 2001 වර්ෂය - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය*




**මූලාශ්‍රය :** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2001*

**සිතියම 3.2 :** *ජන ඝනත්වය 2012 වර්ෂය - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය*




**මූලාශ්‍රය :** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

**සිතියම 3.3 :** *ජන ඝනත්වය 2019 වර්ෂය - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය*




**මූලාශ්‍රය :** *සම්පත් පැතිකඩ වාර්තාව, හෝමාගම ප්‍රා.ලේ., 2019*

## 03 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

අවශ්‍යතාවය 01

එලෙස සාපේක්ෂව ඉතා ඉහල ජනගහනයක් සිටින හෝමාගම ප්‍රදේශයේ 2001 – 2012 වර්ෂ තුළ ජනගහණ වර්ධන වේගය 2.29% ප්‍රතිශතයක් ගන්නා අතර 2012 වර්ෂයේ දත්ත වලට අනුව ජනඝනත්වයේ ව්‍යාප්තිය හෝමාගම නගරය අවට පිහිටා ඇති ගොඩගම, මීගොඩ සහ කහතුඩුව ප්‍රදේශවලට ද විහිදී යාමේ ප්‍රවනතාවක් දක්නට ලැබේ. එපමණක් නොව 2001 වර්ෂයට සාපේක්ෂව 2012 සහ 2019 වර්ෂයේ ජනඝනත්වය ප්‍රධාන නගරවලින් ඔබ්බට එනම් ග්‍රාමීය ප්‍රදේශ කරා ආකර්ෂණය වීමේ සීඝ්‍ර වර්ධනයක් පැහැදිලිව දක්නට ලැබෙනු ඇත. හෝමාගම සැලසුම් ප්‍රදේශයේ ජනඝනත්වය 2001, 2012 සහ 2019 ඉහත සිතියම් අංක 3.1, 3.2 හා 3.3 මඟින් දැක්වේ.

මේ ආකාරයෙන් විහිදී ඇති මුළු ජනගහනයේ භූමි පරිභෝජනයට අනුව මුළු භූමියෙන් 43% ක නේවාසික ව්‍යාප්තියක් දක්නට ලැබෙන අතර එම නේවාසික පරිසරයට සේවා සපයන වාණිජ හා කර්මාන්ත භාවිතයන් පිලිවෙලින් මුළු භූමියෙන් 13% ක් හා 1% ක් පමණ වන අතර එය ප්‍රස්ථාරය 2.2. මඟින් පැහැදිලි වේ.

***රූපය 3.1 :*** *පාරිසරික සංවේදී කලාපයන්ගේ විහිදීම*




***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

එමෙන්ම මෙම ප්‍රදේශයට ආවේනික වූ නිර්මිත භෞතික පරිසරය හා සමානව ස්වාභාවික පරිසර පද්ධතියක් දක්නට ලැබීම සුවිශේෂී ලක්ෂණයක් වේ. ඒ තුළ ජල රැඳවුම් නිසියාකාරව පවත්වාගෙන යාමට අවශ්‍ය වන කුඹුරු පද්ධතියක්ද, ඒ හා බැඳී ඇති ජල මූල පද්ධතියක්ද හඳුනා ගත හැකිය. බස්නාහිර පළාත් තෙත්බිම් සංරක්ෂණ සැලැස්ම යටතේ හඳුනාගත් විශේෂ පාරිසරික කලාප වන, තෙත් බිම් සංරක්ෂණ කලාප දෙකක් මෙම සැලසුම් ප්‍රදේශය තුළ මෙම ප්‍රදේශයේ දැකිය හැකිය. එනම් පුස්වැලි ඔය ආශ්‍රිතව, ඔය දෙපස රමණියව විහිදී ඇති බරාව නම් තෙත් බිම් ප්‍රදේශය හා බොල්ගොඩ ජල රැඳවුම් කලාපය ආශ්‍රිතව විහිදී ඇති බදුවිල යන පරිසර පද්ධතියයි.

එම වර්ගීකරණයට අමතරව මෙම පරිසර පද්ධතීන් මගින් සිදුවන කාර්යන් මත, ජල රැඳවුම් කලාප, ජල ප්‍රදේශ, කුඹුරු ඉඩම් ව්‍යාප්තය,තෙත් බිම්, කැලෑ, ලඳු කැලෑ, ආරක්ෂණ කලාප, ගල් කඳු ප්‍රදේශ, ගංවතුර ඇතිවන ප්‍රදේශ යන නිර්ණායක යටතේ කරන ලද පාරිසරික සංවේදී කලාපයන්ගේ විහිදීම් විශ්ලේෂණයේදී කරන ලද නිගමනයන්ට අනුවද නිරණය වුයේ බරාව හා පුස්වැලි ඔය ආශ්‍රිත ප්‍රදේශ සමග කැළණි ගඟ අවට ප්‍රදේශය පාරිසරික සංවේදී කලාප ප්‍රදේශ ලෙස ප්‍රකට වන බවයි. එය රූපය 3.1 මඟින් පෙන්වා ඇත.

එමෙන්ම වර්තමානයේ හෝමාගම ප්‍රදේශය කේන්ද්‍ර කරගත් සංවර්ධනයේ තෙරපුම් ප්‍රදේශයන්ගේ ව්‍යාප්තිය විශ්ලේෂණයට අනුව හා මෙම පරිසර පද්ධතියේ සංවේදීතාව මැන බැලීම සඳහා සකස්කරන ලද විශ්ලේෂණය තුලනය කර බැලීමේදී තහවුරු වනුයේ වර්තමානයේ සංවර්ධන ක්‍රියාවලින් පරිසර සංවේදී කලාප දෙසට ව්‍යාප්තවීමේ ප්‍රවනතාවක් පවතින බවයි.

මේ ආකාරයට සංවර්ධන හා පාරිසරික සට්ටනයන් හේතුවෙන් වර්තමානයේ කැළණි ගඟ ආශ්‍රිතව ඉවුර දෙපස ජීවත්වන, එනම් ආටිගල නැගෙනහිර, පානළුව හා පුස්වැලි ඔය දෙපස පිහිටි ප්‍රදේශ වන ජල්තර, හේන්පිට, වටරැක උතුර, වල්පිට හා නාවලමුල්ල යන ගම්වල ජීවත්වන ජනතාව ගංවතුර තත්ත්වයන්ට මුහුණ දීමට සිදුව ඇත. මින් ගම්‍ය වනුයේ ගංවතුර උවදුරට මුහුණ දීමට සිදුව ඇත්තේ හඳුනාගන්නා ලද පාරිසරික සංවේදී කලාපයන්ගේ නේවාසික භාවිතයේ යෙදී සිටින පුද්ගලයන්ට පමණක් බවයි. කැළණි ගඟ ආශ්‍රිතව ගංවතුර තත්ත්වය වර්ෂ 1989 දී අඩි 01 පමණ උසට, අවුරුද්දකට 3 න් 4 වතාවක් ඇති වුවද, පාරිසරික වෙනස්වීම් මත අවුරුදු 15කට පසුව එම ප්‍රමාණය අඩි 05 ක් දක්වා උසට ජල ගැලීම් ඇතිවී ඇති බවත් ආපදා කළමනාකරණ ආයතනය මඟින් නිකුත් කරන දත්ත මගින් තහවුරු වේ.

ඒ සමඟම පුස්වැලි ඔය ආශ්‍රිත දත්ත විමසීමේදී එම ප්‍රදේශය කැළණි ගඟට සාපේක්ෂව බෑවුමක පිහිටීමත්, එම බෑවුම් ආශ්‍රිතව වාසස්ථාන ඉදිවීමත් මත පුස්වැලි ඔය දෙපස නිවාස අඩි 15ක් පමණ උසට පැමිණෙන ජල ගැලීමකට ගොදුරු වන බවයි. කැළණි ගඟ දෙපස අඩි 05 ක් උසට ජලගැලීමකට ලක් වූ විට පුස්වැලි ඔය දෙපස ප්‍රදේශය අඩි 15ක උසට ජල ගැලීමකට ලක්වන බව මෙමගින් තව දුරටත් පැහැදිලි කල හැක.

මේ ආකාරයට ක්‍රමක්‍රමයෙන් වැඩිවන ජල ගැලීම් නිසා ප්‍රදේශයේ විශාල පිරිසක් මේ අයුරින් පීඩා විඳීමට මූලික හේතුවක් ලෙස ස්වභාවික පරිසර පද්ධතිය ආශ්‍රිතව දිනෙන් දින ඉහල යන නිවාස ඉදිවීමේ ප්‍රවනතාව හඳුනා ගත හැක. 2008 වර්ෂයේ සිට 2016 දක්වා ගංවතුර උවදුරට මුහුණපාන ප්‍රමාණය වැඩි වී ඇති බැවින් තහවුරු වනුයේ පාරිසරික සංවේදී කලාප ආශ්‍රිතව වාසස්ථාන සකස් කර ජීවත්වන පිරිස කාලීනව වර්ධනය වී ඇති බවයි. මෙම කාලයන් තුළ ගංවතුර තර්ජනයට ලක් වූ ජන සංඛ්‍යාව පිළිබඳ පහත වගුව 3.1 මඟින් දැක්වේ.

*වගුව 3.1 : ගංවතුර තර්ජනයට ලක් වූ නිවාස හා ජන සංඛ්‍යාව - හෝමාගම ප්‍රදේශය*

| දිනය | ආපදාවන්ට ලක් වූ ජන සංඛ්‍යාව | මරණ සංඛ්‍යාව | ව්‍යසනයට හසු වූ නිවාස ගණන | විනාශ වූ නිවාස ගණන | පවුල් ගණන |
|---|---|---|---|---|---|
| 2008/06/01 | 1827 | | | | 469 |
| 2010/05/18 | 139 | | 13 | 3 | 41 |
| 2011/05/27 | 820 | | 6 | 3 | 234 |
| 2012/05/27 | 842 | | 6 | 3 | 240 |
| 2016/05/15 | 5266 | 3 | 7 | 16 | 1349 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, 2016*

මීට හේතු සාධක විමසා බැලීම උදෙසා සැලසුම් කණ්ඩායම විසින් ජනගහන ව්‍යාප්තිය, වර්ධන වේගය, ඉඩම් වටිනාකම හා වර්තමානයේ ඉඩම් විකිණීම් සිදුවන ප්‍රදේශ අධ්‍යයනය කිරීමට විශ්ලේෂණයන් කිහිපයක් සිදුකරන ලදී. එම විශ්ලේෂණයන්ට අනුව අවසන් නිගමනය වූයේ එම පාරිසරික සංවේදී කලාප ආශ්‍රිතව නිවාස ඉදිවීමට ප්‍රධාන හේතුවක් ලෙස අඩු ඉඩම මිලගණන් පැවතීම හා එම ඉඩම සඳහා මුදල් ආයෝජනය කල හැකි පිරිස් එම ප්‍රදේශ වලට වැඩි වශයෙන් ආකර්ෂණය වීම දැකගත හැකි බවයි. එමෙන්ම වර්ෂ 2031 පමණ වන විට හෝමාගම සැලසුම් කලාපයට ලක්ෂ 6 ක පමණ ජන සංඛ්‍යාවක් අපේක්ෂා කරන අතර එම ජනගහනය පරිසර සංවේදී කලාප පිහිටි ප්‍රදේශ දක්වා ව්‍යාප්තවීමේ ප්‍රවනතාවක් පවතින බව, කරුණු විශ්ලේෂණයේදී හඳුනාගත හැකි විය. එබැවින් මෙම ප්‍රදේශයේ පවතින ස්වභාවික පරිසරය රැකගනිමින් අනාගතයේ දී මේ ප්‍රදේශයට ඇදී එන විවිධ සංවර්ධන ව්‍යාපෘති නිසි මගපෙන්වීමකට යොමු කිරීම හා විධිමත් සැලැස්මක අවශ්‍යතාව මේවනවිට පැන නැගී ඇති බව කිව හැක.

# අවශ්‍යතාවය 02

## *ලංකා ආර්ථික ප්‍රවණතාවයේ (Economic Trend) දිශාව සැලකිල්ලට ගනිමින් හා කලින් කලට හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය මධ්‍යම රජයන්ගේ අවධානයට යොමු වූ දිශාව මත නවෝත්පාදන සඳහා අත්‍යාවශ්‍ය සංවර්ධන පසුබිම හා එමගින් භූමිය ඇතුළු යටිතල පහසුකම් සඳහා බිහි වන ඉල්ලුමට සරිලන ධාරිතාව සකස් කිරීම සඳහා සැලසුම්මය වශයෙන් අවශ්‍යය පියවර ගැනීම අත්‍යාවශ්‍ය වීම.*

තිරසාර සංවර්ධනය යන තේමාව යටතේ දේශීය ආර්ථිකය නගා සිටුවීම පෙරදැරි කරමින් නවෝත්පාදන සඳහා අවශ්‍යය මූලික පසුබිම සකස් කිරීම උදෙසා හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය 2006 වර්ෂයේ සිට මධ්‍යම රජයේ අවධානයට යොමු වූ බව හඳුනා ගත හැකිය. "මහින්ද චින්තන" ඉදිරි දැක්ම ඔස්සේ යමින් ග්‍රාමීය ආර්ථිකය දියුණු කිරීම හරහා දේශීය ආර්ථිකය වර්ධනය කිරීම යන අරමුණ අරභයා නවීන තාක්ෂණය හරහා වන නිපැයුම් සඳහා අවශ්‍යය අවකාශය සකස් කිරීමට මාහේනවත්ත ප්රදේශය තෝරාගැනීම එහි ප්‍රතිඵලයක් විය. රට සමගාමීව නැනෝ තාක්ෂණ ආයතනය බිහිවීම, මහින්ද රාජපක්ෂ ජාතික පාසල බිහිවීම විශේෂ අවධානයට යොමු කල හැකිය.

පසුව 2016 වර්ෂයේදී මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යංශය යටතේ " තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය" යන තේමාව ඔස්සේ හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය අවධානයට යොමු වන අතර ඒ හරහා අක්කර 2000 ට ආසන්න ඉඩම් ප්‍රමාණයක් අත්කර ගැනීමට යෝජනා වී තිබූ අතර රට සමගාමීව ජාතික ව්‍යාපාර කළමනාකරණ හරිත සරසවිය , කොළඹ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාල ඉදිවීම සිදුවිය.

2020 වර්ෂයේදී "සෞභාගයේ දැක්ම" මධ්‍යම රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය යටතේ අධ්‍යාපනය හා නවෝත්පාදනය සඳහා විශේෂ අවධානය යොමු කර තිබෙන අතර හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය සෘජුව අවධානයට යොමු කර නොමැති වුවද, ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ විශේෂ අවධානය යොමු වී තිබෙනු දැකිය හැක. ඒ අනුව මෙම ප්‍රදේශය " දැනුම් කේන්ද්‍රික" නගරයක් ලෙස නිර්මාණය කල යුතු බවට අවධානය යොමු කර ඇත.

කෙසේ නමුදු, ලංකා ආර්ථික ප්‍රවණතාවයේ දිශාව සැලකිල්ලට ගනිමින් හා කලින් කලට හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය මධ්‍යම රජයන්ගේ අවධානයට යොමු වූ දිශාව මත නවෝත්පාදන සඳහා අත්‍යාවශ්‍ය සංවර්ධන පසුබිම හා එමගින් බිහි වන භූමිය ඇතුළු යටිතල පහසුකම් සඳහා වන ඉල්ලුමට සරිලන ධාරිතාව සකස් කිරීම සඳහා සැලසුම්මය වශයෙන් අවශ්‍යය පියවර ගැනීම අත්‍යාවශ්‍ය වීම මෙම සැලැස්ම යටතේ අවධානට යොමු කර ඇත.

අවුරුදු 15කට ආසන්න කාලයක් තිස්සේ මෙම ප්‍රදේශය නවෝත්පාදන අවශ්‍යතාවය සඳහා වෙන් වුනු ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට හා ඊට අවශ්‍යය යටිතල පහසුකම් ලබා දීමට අවශ්‍යය ප්‍රතිපාදන විශාල ප්‍රමාණයක් එක් එක් කාලවලදී වෙන් කර ඇති බව අනාවරණය වේ. කොළඹ වාණිජ නගරයට හා අධිවේගී ප්‍රවේශයන්ට ආසන්නයේ පිහිටා ඇති ප්‍රදේශයක් ලෙස හා අනෙකුත් සමාජීය, ආර්ථික හා භෞතික වටිනාකම්වලින් සමන්විත ප්‍රදේශයක් ලෙස හෝමාගම – මාහේනවත්ත ප්‍රදේශය දැනුම හා නවෝත්පාදන සඳහා නිර්මාණය වන ප්‍රදේශයක් ලෙස ඊට අවශ්‍යය පසුබිම සකස් කර ගෙන ඇත. විශාල ප්‍රදේශයක් ආවරණය කෙරෙමින් එහි ප්‍රතිලාභ විහිදී යමින් පවතින අවස්ථාවක, එම සංවර්ධන විභවතා අපතේ නොයවන්නට අවශ්‍ය පරිදි සැලසුම්මය වශයෙන් මූලික අවධානය යොමු කල යුතු වීම නව සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය අවධාරණය කරයි .

තවද, විධිමත් යටිතල පහසුකම් ලබාදීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතරම එය සපයාදීම සම්බන්ධයෙන් පැහැදිලි දැක්මක් සහිත, සැලැස්මක් අත්‍යවශ්‍ය වන බව සඳහන් කල යුතුය.

### *යෝජිත දැනුම් කේන්ද්‍රික නගරය සඳහා පවතින ජල සැපයුම ප්‍රමාණවත්ද? එය සපයා ගන්නේ කෙසේද?*

වර්තමානයේ හෝමාගම ප්‍රදේශයට ජලය සපයනු ලබන්නේ ලබුගම හා කලටුවාව ජලාශවලිනි. එමෙන්ම වර්තමානයේ හෝමාගම ප්‍රදේශයේ සියලුම නේවාසිකයන්ට ප්‍රමාණවත් වන පරිදි නල ජලය සපයා දීමක් සිදු කර නොමැති අතර, මුළු ප්‍රදේශය ආවරණය වන පරිදි ජල සැපයුම ලබා දීමක් සිදු කර නොමැත. එවන් තත්ත්වයක් තුළ හෝමාගම දැනුම් කේන්ද්‍රික නගරය හරහා පහත සඳහන් පරිදි අනාගතයේදී දිනකට අවශ්‍ය වන ජල ප්‍රමාණය තක්සේරු කිරීමක් සිදු කොට ඇත. එයට අනුව මෙම දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ එම නගර සිමාව තුල සිදුවන ක්‍රියාකාරකම් උදෙසා පමණක් අනාගතයේදී දිනකට ඝන මීටර 58,000 (m3 /day) ප්‍රමාණයක ජල අවශ්‍යතාවයක් පවතින බව තක්සේරු කර ඇත. එමෙන්ම පවතින ජල සැපයුම පරිදි අනාගතයේදී වැඩිවන ජනගහනයට ජල සම්පාදනය සිදුකරනුයේ කෙසේද හා එය කොපමණ අගයක් ගන්නේද යන්න සංවර්ධන සැලැස්ම මගින් අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

### *හෝමාගම මළ අපද්‍රව්‍ය කළමනාකරණය*

මළ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දැනට විදිමත් සැලැස්මක් ක්‍රියාත්මක නොවන අතර බහුතරයක් වූ නේවාසිකයන් තම ගෙවත්ත ආශ්‍රිතව මල අපද්‍රව්‍ය බැහැරලීම සිදු කරන අතර නාගරික ප්‍රදේශ අශ්‍රිතව හා පරිසර සංවේදී කලාප ආශ්‍රිතව ජීවත්වන මිනිසුන්ගෙන් සීමිත පිරිසක් ජල ප්‍රදේශ වලට මළ අපද්‍රව්‍ය බැහැරලීම සිදු කරනු දැක ගත හැක.

03 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

අවශ්‍යතාවය 02

එමෙන්ම යෝජිත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධනය යටතේ අනාගතයේදී නිකුත්කරන මළ අපද්‍රව්‍ය සඳහා දිනකට ජල අවශ්‍යතාවය කියුබික් මීටර් 46,000 ක ප්‍රමාණයක් අනුමාන කරන අතර එය බැහැර කරලීම හා කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් සැලැස්මක් ප්‍රකාශයට පත් කර නොමැත. තවද 2031 වර්ෂය සඳහා ලක්ෂ 6 ක් දක්වා ජනගහන වර්ධනයක් අපේක්ෂා කරන හෝමාගම ප්‍රදේශයට අනාගතේදී මෙම මළ අපද්‍රව්‍ය බැහැරකරලීමේ ක්‍රමවේදය යහපත් හා තිරසාර සංවර්ධනයක් සඳහා තර්ජනයක් විය හැකි බැවින් සංවර්ධන සැලැස්ම හරහා මේ පිලිබඳ අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වනු ඇත.

### *ඝන අපද්‍රව්‍ය කළමනාකරණය*

හෝමාගම ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ක්‍රමවේදය පිලිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදලි වනුයේ විධිමත් ක්‍රමවේදයකින් තොරව හෝමාගම ප්‍රාදේශීය සභාව හරහා ඝන අපද්‍රව්‍ය බැහැර කරලීම දුවවන්ත ප්‍රදේශයට හා කරදියාන ප්‍රදේශයට මුදාහරින බවයි. කෙසේ නමුදු වර්තමානයේ ලක්ෂ 4 කට ආසන්න ප්‍රමාණයක් වෙසෙන හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව වර්තමානයේ දිනකට ටොන් 30කට ආසන්න ප්‍රමාණයක ඝන අපද්‍රව්‍ය ඒකරාශී වන අතර අනාගතයේදී ඉදිවීමට යෝජිත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධනය යටතේ දිනකට ටොන් 57ක ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක් එක්රැස් වියහැකි බවට තක්සේරු කර ඇත. එසේ එක්රැස්වන ඝන අපද්‍රව්‍ය බැහැර කරලීමේ ක්‍රමවේදය, එක් රැස් කිරීමේ ක්‍රම වේදය හා කළමනාකිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් සංවර්ධන සැලැස්ම හරහා අවධානය යොමු කිරීම අවශ්‍ය වන බව මෙහිදී සඳහන් කල හැක.

### *බලශක්ති සැපයුම*

වර්තමානයේ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව 100% ක විදුලි බල සැපයුමක් දක්නට ලැබෙන අතර අනාගතයේදී වර්ධනය වන ජනසංඛ්‍යාව හා යෝජිත කර්මාන්ත හා විශ්ව විද්‍යාල පද්ධතිය ක්‍රියාත්මක වීම උදෙසා ප්‍රමාණවත් ධාරිතාවයකින් හෙබි විදුලි සැපයීමක් අත්‍යවශ්‍ය වනු ඇත. ඒ අනුවද හෝමාගම ප්‍රදේශය සඳහා නව සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පැහැදිලි කල හැක.

එමෙන්ම සාර්ථක දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතියක් යන විෂයට අදාලව සිදු කරන ලද බැංගලෝර්හි ක්‍රියාත්මක කරන ලද තාක්ෂණ නගර සංවර්ධනය හා එහි බලපෑම් සම්බන්ධව කරන ලද අධ්‍යයනයට අනුව පැහැදිලි වනුයේ එවැනි මහා පරිමාණ ව්‍යාපෘතියක් හරහා ප්‍රදේශයේ විශාල වපසරියකට එහි ප්‍රති විපාක බලපැවැත්විය හැකි බවයි. විශේෂයෙන්ම නේවාසික භාවිතය සඳහා ප්‍රදේශය තුළට ඇදී එන ප්‍රමාණය හා භූමි භාවිතයේ මෙන්ම ගොඩනැගිලිවල පිහිටීම හා එහි ප්‍රමාණයන් වල වෙනස් වීම හා ඝනත්වය විශාල වෙනසකට බඳුන් විය හැකි බවයි. එපමනක් නොව මහා මාර්ග හා ගමන ගමන පහසුකම් වල සහ වාහන තදබදයද වර්ධනය වීමකට ලක්විය හැකි බවයි. ඒ අනුව දැනුම් කේන්ද්‍රික නගර ව්‍යාපෘතිය හරහා සිදුවිය හැකි අහිසි බලපෑම් මගහරවා තිරසාර හා සාර්ථක නගරයක් නිර්මාණය කිරීම උදෙසා අවශ්‍ය මග පෙන්වීම සිදු කරනු උදෙසා 2031 වර්ෂය සඳහා හෝමාගම ප්‍රදේශයට නව සංවර්ධන සැලැස්මක් අවශ්‍ය බව සඳහන් කල හැකිය.

### *අනෙකුත් සමාජ යටිතල පහසුකම්*

නවද දැනුම් කේන්ද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව අනෙකුත් සමාජීය යටිතල පහසුකම් සැපයීම අත්‍යාවශ්‍ය වීම හඳුනාගෙන ඇත. පදික වේදිකා සහ දුම්රිය වැනි ප්‍රවාහන, සේවා ආයු කාලය වැඩි කරන සහ මිනිස් සෞඛ්‍ය ප්‍රවර්ධනය කරන සේවාවන්, ළමයින් සඳහා පාසැල් පසු කටයුතු වැනි ප්‍රජා යහපැවැත්මට සහාය වන සේවාවන්, සොබාදහම, ක්‍රීඩා, විනෝදය, පවුල, සමාජ ක්‍රියාකාරකම් සහ පෞද්ගලිකත්වය භුක්ති විඳීම සඳහා අවශ්‍ය පහසුකම් හා හදිසි සේවා සහ අනෙකුත් ආරක්ෂක යටිතල පහසුකම් ක්‍රීඩා සහ විනෝදය සඳහා ස්ථාන සැපයිය යුතු බව සැලසුම්මිය වශයෙන් හඳුනා ගෙන ඇත.

# අවශ්‍යතාවය 03

*2017/11/08 දින සිදු කරන ලද පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමට අනුව හෝමාගම ප්‍රදේශය තුළ දැනට ක්‍රියාත්මක වන කර්මාන්ත ක්‍රියාකාරකම් නේවාසික ක්‍රියාකාරකම් සමඟ මිශ්‍ර වීම හේතුවෙන් ඇති වී ඇති හා ඇති විය හැකි අහිසි බලපෑම් කෙරෙහි අවධානය යොමු කිරීම.*

සංවර්ධන සැලැස්ම අරමුණු කරගෙන පැවැත්වූ පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමට අනුව (ඇමුණුම 03) හඳුනාගත් කරුණු කිහිපයක් වන කර්මාන්ත හා යටිතල පහසුකම් සංවර්ධනය සහ නේවාසික සංවර්ධනයට යෝග්‍ය නගරයක් නිර්මාණය කිරීම යන අවශ්‍යතාවයන් සපුරාලීමද මෙම සංවර්ධන සැලැස්මේ පරමාර්ථයක් විය යුතු බව ඔවුන්ගේ අදහස විය.

වර්තමානයේ නේවාසික භාවිතයට සුදුසු යයි හඳුනාගන්නා ලද ප්‍රදේශ වල විවිධ කර්මාන්ත කටයුතු ව්‍යාප්ත වීම හේතු කොටගෙන සහ අවිධිමත් ගොඩනැගිලි ඉදිවීම සහ නේවාසික හා කර්මාන්ත කටයුතු මිශ්‍ර වීමේ ප්‍රවණතාවක් මේ වන විට ප්‍රදේශයේ පැවතීම නිසා අද වන විට මේ ප්‍රදේශයේ නේවාසික හා කර්මාන්ත කටයුතු අතර ගැටුම්කාරී තත්ත්වයක් මතු වෙමින් පවතී. තවද මෙම ප්‍රදේශයේ කර්මාන්ත කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට බලපාන ප්‍රධාන කරුණු කිහිපයක් ද මේ යටතේ හඳුනාගන්නා අතර ඒවානම්, අනාගත කර්මාන්ත කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම, සුළු පරිමාණ හා මධ්‍ය පරිමාණ කර්මාන්ත දියුණු කිරීම සඳහා අවධානය අඩු මට්ටමක පැවතීම හා විධිමත් හා දියුණු පහසුකම්වලින් සපිරි කර්මාන්ත කලාපයක අවශ්‍යතාව පැවතීම හඳුන්වා දිය හැක.

***රූපය 3.2 :*** *ඒ.බී.හා සී කාණ්ඩයේ කර්මාන්තවල ව්‍යාප්තිය - කොළඹ දිස්ත්‍රික්කය 2014*




***මූලාශ්‍රය:*** *මධ්‍යම පරිසර අධිකාරිය, 2014*

## 03 පරිච්ඡේදය සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

අවශ්‍යතාවය 03

හෝමාගම ප්‍රදේශය සඳහා වර්තමානයේ ක්‍රියාත්මක කෙරෙන 2008–2025 කලාපිකරන සැලැස්මට අනුව කර්මාන්ත ව්‍යාප්තිය සඳහා කටුවන හා ටෙම්පල්බර්ග් කරමාන්ත කලාප පිහිටුවා ඇතත් මධ්‍යම පරිසර අධිකාරිය විසින් නිකුත් කරන ලද දත්ත අනුව A, B හා C (වැඩි, මධ්‍ය හා සුළු වශයෙන් දූෂ්‍යකාරක කර්මාන්ත ) කාණ්ඩ යටතේ පරිසර දූෂ්‍යකාරක කර්මාන්ත (වානේ ආශ්‍රිත කර්මාන්ත, ටයිල් සහ කැණීම් ආශ්‍රිත කර්මාන්ත, ඇලුමිනියම් ආශ්‍රිත කර්මාන්ත, ඇඟලුම්, විදුලි බුබුලේ ප්‍රතිචක්‍රීකරණ ආශ්‍රිත කර්මාන්ත, යන්ත්‍රෝපකරණ නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත, රසායන නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්තය හා ආහාර ආශ්‍රිත කර්මාන්ත) හෝමාගම සැලසුම් කලාපය පුරාම විසිදීමක් දක්නට හැකිය. කොළඹ දිස්ත්‍රික්කය තුල A, B හා C කාණ්ඩයේ කර්මාන්තවල විසිදීම රූපය 3.2 මඟින් දක්වා ඇත.

ඒ අනුව පැහැදිලි වන්නේ වර්තමානය වන විට නිවාස පිහිටා ඇති ප්‍රදේශ දක්වා කර්මාන්තවල විසිදීම විවිධ පාරිසරික ප්‍රශ්න ඇති කිරීමට බලපෑම් වන බවයි. විශේෂයෙන්ම ජන ඝනත්වයේ විසිදීම පිලිබඳ කරන ලද අධ්‍යයනයන්ට අනුව හෝමාගම නගරය, මත්තේගොඩ, ගොඩගම, කහතුඩුව හා මාගේනවත්ත යන ප්‍රදේශ වල ඉහල ජනඝනත්වයක් දැකිය හැකිය.

එම ජන ඝනත්වය විසිදීමේ ප්‍රදේශ හා මධ්‍යම පරිසර අධිකාරිය විසින් හඳුනාගන්නා ලද දූෂ්‍යකාරක කර්මාන්ත ව්‍යාප්තිය සංසන්දනාත්මකව අධ්‍යනය කර බැලීමේදී පැහැදිලි වනුයේ ජනඝනත්වයෙන් ඉහල ප්‍රදේශ වල ඉහල දූෂ්‍යකාරක කර්මාන්ත වැඩි වශයෙන් ව්‍යාප්ත වීම හඳුනා ගත හැකි බවයි.

මේ සියලු කරුණු සැලකිල්ලට ගනිමින්, 2022–2031 කාලසීමාව සඳහා සංවර්ධන සැලැස්ම සකස් විය යුතු බවට ඒකමතිකව තීරණය කර ඇති අතර, රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ සමස්ත රටේ සංවර්ධනය, වර්ධනය කිරීම උදෙසා හා හෝමාගම ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා, නව මුහුණුවරකින් හා නවෝත්පාදන බිහි කිරීමට සමත් මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම උදෙසා සුදුසු වාතාවරණයක් සකසා දීමින්, පවතින පරිසර සංවේදී කලාප හා හරිත ප්‍රදේශ සුරක්ෂිත කිරීම ප්‍රධාන කරගත්, උසස් ඝනයේ පහසුකම් වලින් සමන්විත නේවාසික ප්‍රදේශයක් බිහි කිරීම පෙරදැරි කරගත් සංවර්ධනයකට මගපෙන්වීමක් ලෙස මෙම සංවර්ධන සැලස්මේ දිශානතිය සකස් විය යුතු බව මෙම විශ්ලේෂණයන් ඔස්සේ තීරණය වී ඇත.

04

පරිච්ඡේදය

# සංවර්ධන සැලසුම් රාමුව

# 4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම

**Homagama**
**The Green City of Experts**
**A global gateway emerging within a country landscape**

**බුද්ධිමතුන්ගේ හරිත නගරය**
**ග්‍රාමීය සුන්දරත්වය තුලින් විශ්වයට විවර වන දොරටුව**

# 4.2. දැක්මෙහි ප්‍රකාශනය (Vision Statement)

හරිත නගරය (Green City) යන වචනය පිලිබඳ විවිධ විචාරකයන්ට අනුව විවිධ අදහස් ඉදිරිපත් කිරීමට ලක් වුවකි. හරිත නගරයක් යනු කුමක්ද? යන්න පිළිබඳව, පිළිගත් අදහසක්, ජෝන් මෝල්ටන්, ග්‍රීන් විච් හා කොන් (John Moulton, Green Which සහ Conn) යන අය විසින් නගරය හරිත නගරයකට සමාන කරන විශේෂාංග මොනවාද? (What features makes a city “Green”?) යන වාර්තාවෙහි සටහන් කර ඇත. ඔවුන්ට අනුව කැලිකසල හා අපද්‍රව්‍ය නිර්මාණය වීම අවම කිරීම මගින්, පරිසර හානිය හා දූෂණය අවම කරන, ප්‍රතිචක්‍රීකරණය දෙසට නැඹුරුවූ, අහිතකර විමෝචනයන් අවම කෙරෙන, හරිත උද්‍යාන නිර්මාණය කිරීම වැඩිකිරීම කරන අතරතුර නිවාස ඝනත්වය වර්ධනය කෙරෙන හා තිරසාර දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වලට යොමු වූ නගර හරිත නගරයක් ලෙස නිර්වචනය කල හැකි බවයි.

හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ වර්තමාන භෞතික, ආර්ථික, සමාජීය හා පාරිසරික ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කල විට, පැහැදිලි වනුයේ, එය එතරම් නාගරික ලක්ෂණ ප්‍රදර්ශනය නොකරන, හරිතවර්ණ වෙල් යාය දසතින් දිස්වන, ග්‍රාමීය ලක්ෂණවලින් සමන්විත, ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික ලක්ෂණ ප්‍රදර්ශනය කෙරෙන හා පරිසර දූෂණය හා ස්වභාවික විපත්වලින් අවම වූ, නේවාසික ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකි බවයි.

ඒ අනුව හෝමාගම සංවර්ධන සැලැස්මේ (2022–2031) දැක්මට අදාලව හරිත නගරය යන්නෙන් වර්තමානයේ හෝමාගම ප්‍රදේශය තුලින්, හරිත නගරය යන නිර්වචනයට සමාන ලක්ෂණ ප්‍රදර්ශනය කෙරෙන භෞතික හා පාරිසරික ලක්ෂණ කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරුණු, හරිත උද්‍යාන නිර්මාණය කිරීම හරහා නේවාසික ඝනත්වය වර්ධනය කිරීම පෙරදැරි කරගත්තක් බව සඳහන් කල හැකිය.

මෙහිදී “බුද්ධිමතුන්ගේ” යන්නෙන් පැහැදිලිවම හෝමාගම ප්‍රදේශය තුළ වර්තමානයේ හා අනාගතයේදී ප්‍රදේශයේ සංවර්ධනය නැඹුරු වෙතැයි අනුමාන කරන අංශයන් සංවර්ධන සැලැස්මේ දැක්ම හරහා ආවරණය කිරීම අරමුණු කර ඇත. විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තිය හරහා හෝමාගම ප්‍රදේශය අවකාශ කරගෙන ක්‍රියාත්මක කෙරෙන දැනුම් කේන්ද්‍රික නගරය, හෝමාගම සංවර්ධන සැලැස්මට අනුගත කරගැනීම අරමුණු කරගෙන හා ප්‍රදේශයේ බහුතර සංවර්ධන නැඹුරුතාව නේවාසික සංවර්ධනයට යොමු වී තිබීම හා එහි සීඝ්‍ර වර්ධනයක් දක්නට ලැබෙන නිසාවෙනුත්, අනාගතයේදී හරිත නගරයක් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන ගමනේ එක් සංරචකයක් ලෙස නේවාසික ඝනත්වය වර්ධනය කිරීම අරමුණු කරගෙන සංවර්ධන සැලැස්මේ (2022–2031) දැක්ම ඊට සමගාමීව සිදු විය යුතු බව තීරණය කෙරිණි. තවද හරිත නගරයක් නඩත්තු වීම හුදෙක් උගතුන් විසීම මඟින් පමණක් ළඟා කර ගත නොහැකි අතර, ඊට බුද්ධිමත් නේවාසික ජනතාවක් වාසය කල යුතු වේ. එසේ නොවන තත්ත්වයක් තුළ මුඩුක්කු හා පැල්පත් නිවාස බිහි වීම විය හැකි අතර සංවර්ධනය නිවැරදි මගපෙන්වීමකට යොමු නොවූ තත්ත්වයක් තුළ එවැනි සාර්ථක හරිත නගරයක් නිර්මාණය කිරීම අපහසුය.

ඒ අනුව යමින් හෝමාගම සංවර්ධන සැලැස්මේ (2022–2031) සංවර්ධන දැක්ම "බුද්ධිමතුන්ගේ හරිත නගරය" යනුවෙන් නිර්මාණය කෙරිනි.

## 4.3. සංවර්ධන සැලසුමේ ප්‍රධාන අරමුණු

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 හි, සැලසුම් දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රධාන අරමුණු 04 ක් මත පදනම් වූ බව සඳහන් කල යුතුය.

අරමුණ 01

පරිසරය සුරකින, හරිත නගරයක්
A safeguarded environment, A Green City

මෙහි අදහස වනුයේ පවතින පරිසරය ආරක්ෂා කරන අතරම, හරිත නගරයක් නිර්මාණය කිරීම සඳහා විශේෂ අවධානයක් යොමු කල නගරයක් ස්ථාපිත කිරීම යන්නයි.

අරමුණ 02

පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක්
An Affluence City, A Comfortable Neighborhood

මෙහි අදහස වනුයේ දියුණු, කුඩා නගර මධ්‍යස්ථානයක් වටා නිර්මාණය කෙරුණු, මනුෂ්‍යය වාසයට හිතකර, සෞඛ්‍යාරක්ෂිත, ප්‍රියජනක, පහසුකම් සපිරි නේවාසික ප්‍රදේශයක් ස්ථාපිත කිරීම යන්නයි.

අරමුණ 03

සමස්ත ප්‍රදේශයම ආවරණය කෙරුණු, කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක්
An Efficient Infrastructure Network, Covering The Entire Area

මෙමගින් අදහස් කිරීමට බලාපොරොත්තු වනුයේ සමස්ත හෝමාගම ප්‍රදේශය ආවරණය කරන, කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීම යන්නයි.

අරමුණ 04

විද්‍යාව හා තාක්ෂණය පදනම් කර ගත් නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා සේවා තිරයක්
Promote A Service Corridor For Setting Up Science & Technology Based Innovation And Knowledge Centric Hubs.

මෙහි අරමුණ වනුයේ යෝජිත දැනුම් කේන්ද්‍රීය නගරය හා බැඳුණු සේවා ව්‍යාප්ත කිරීම සඳහා සේවා ප්‍රදේශයක් නිර්මාණය කිරීමයි.

# 4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

අරමුණ 01

**පරිසරය සුරකින, හරිත නගරයක්**
A safeguarded environment, A Green City

පරමාර්ථ

1. 2031 වර්ෂය වන විට හෝමාගම සැලසුම් ප්‍රදේශය ආශ්‍රිත, බස්නාහිර පළාත් තෙත්බිම් සැලැස්ම (2006) යටතේ හඳුනා ගැනුණු තෙත්බිම් ප්‍රදේශ 100% ක මට්ටමෙන් සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම.
2. 2031 වර්ෂය වන විට හෝමාගම සැලසුම් ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින 1% ක් වූ ජලාශ්‍රිත ප්‍රදේශ 100% ක මට්ටමෙන් සුරක්ෂිත කිරීමට කටයුතු කිරීම.
3. මාලබේ සිට මාහේනවත්ත දක්වා සංවර්ධනය කිරීමට යෝජිත සේවා කලාපය තුල, හරිත පෙදෙස් ආශ්‍රිතව සිදුවන සංවර්ධන කටයුතු අරබයා, හරිත ප්‍රදේශ ප්‍රති නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පසුබිම සංවර්ධන සැලැස්ම හරහා සකස් කිරීම.
4. 2031 වර්ෂය වන විට හෝමාගම සැලසුම් කලාපය තුල කැළණි ගංගා තිරය, මහා ඔය හා පුස්වැලි ඔය ආශ්‍රිත රක්ෂිත ප්‍රදේශ හරිත කලාප ලෙස හා විනෝද උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම.
5. බරාව පරිසර සංවේදී කලාපය ආශ්‍රිත හෙක්ටයාර 3370 ක් පමණ වූ ප්‍රදේශය පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා විවෘත කිරීම තුළ එහි භූමියේ වටිනාකම ඉහල නැංවීමට කටයුතු කිරීම.
6. 2031 වර්ෂය වන විට හෝමාගම සැලසුම් ප්‍රදේශයේ නගරාශ්‍රිතව ආශ්‍රිතව ව්‍යාප්තව පවතින සුදුසුයැයි හඳුනාගනු ලබන මාර්ග, හරිත මාර්ග (Boulevards) ලෙස සංවර්ධනය කිරීම.
7. 2031 වර්ෂය වනවිට හෝමාගම, ගොඩගම හා කහතුඩුව යන නගරාශ්‍රිතව හරිත නගර සංකල්පය ප්‍රදර්ශනය කිරීමට හා හරිත සංකල්පය යටතේ නගරය කියවීම (Legibility) සඳහා හරිත උද්‍යාන නිර්මාණය කිරීම.

අරමුණ 02

**පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක්**
An Affluence City, A Comfortable Neighborhood

පරමාර්ථ

1. 2031 වර්ෂය වන විට හෝමාගම හා කහතුඩුව යන නගර, ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන (Neighbourhood Centres) ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.
2. 2031 වර්ෂය වන විට සමස්ත හෝමාගම ප්‍රදේශය ආවරණය කෙරෙන පරිදි 1% ක පමණ මට්ටමෙන් පවතින උද්‍යාන හා විනෝද කටයුතු පහසුකම් 50% ක මට්ටම දක්වා වර්ධනය කිරීමට කටයුතු කිරීම.
3. 2031 වර්ෂය වන විට සමස්ත හෝමාගම සැලසුම් ප්‍රදේශය, මාර්ග පද්ධතිය හා බැඳුනු (Road Hierarchy ) ඝනත්වය මත පදනම් වූ (Density Based) සංවර්ධනයකට යොමුකිරීමට අවැසි නෛතික පසුබිම සංවර්ධන සැලැස්ම හරහා නිර්මාණය කිරීම.
4. 2031 වර්ෂය වන විට සැමට සුවපහසු සේවා නගරයක් ලබා දීමේ අරමුණෙන් හෝමාගම හා කහතුඩුව යන ප්‍රධාන නගර ආශ්‍රිතව, නගර මධ්‍යයේ සිට මීටර 500ක් පමණ වපසරියක මිනිසුන්ට පයින් ගමන් කිරීම සඳහා වන පහසුකම් (Walkability Facilities) සැපයීමට කටයුතු කිරීම.

අරමුණ 03

### සමස්ත ප්‍රදේශයම ආවරණය කෙරුණු, කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක්
An Efficient Infrastructure Network, Covering The Entire Area

පරමාර්ථ

1. 2031 වර්ෂය වන විට සමස්ත හෝමාගම සැලසුම් ප්‍රදේශය ආවරණය වන පරිදි, ප්‍රදේශය තුල පවතින මාර්ග අතර සම්බන්ධතාව (Connectivity) වර්ධනය වන ලෙස, දැනුම් කේන්ද්‍රිය නගරය හා සමගාමීව, ප්‍රමුඛතා පදනම මත හඳුනාගැනෙන මාර්ග සංවර්ධනය කිරීමට සැලැස්ම හරහා පසුබිම සැකසීම.

2. 2031 වර්ෂය වන විට හෝමාගම, ගොඩගම, කහතුඩුව හා මීගොඩ යන නගර ආශ්‍රිතව පවතින ප්‍රවාහන පහසුකම් (Transport Facilities), අනෙකුත් නාගරික පහසුකම් (Urban Facilities) සමග ඒකාබද්ධ කිරීමට කටයුතු කිරීම.

3. 2031 වර්ෂය වන විට සමස්ත හෝමාගම සැලසුම් ප්‍රදේශය ආවරණය වන පරිදි නල ජල අවශ්‍යතාවය (Potable Water Demand) 100% ක මට්ටමෙන් සපුරාලීම, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම මගින් පසුබිම සකස් කිරීම.

4. 2031 වර්ෂය වන විට සමස්ත හෝමාගම සැලසුම් ප්‍රදේශය ආවරණය වන පරිදි විදුලි අවශ්‍යතාවය (Electricity Demand) 100% ක මට්ටමෙන් සපුරාලීම, ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය හරහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම සංවර්ධන සැලැස්ම මගින් සකස් කිරීම.

5. 2031 වර්ෂය වන විට අරුවක්කාලු අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය හා සම්බන්ධ වීම හරහා හෝමාගම සැලසුම් ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අවශ්‍ය පසුබිම සැලැස්ම මගින් නිර්මාණය කිරීම.

6. 2031 වර්ෂය වන විට සමස්ත හෝමාගම ප්‍රදේශය ආවරණය වන පරිදි මල අපද්‍රව්‍ය කළමනාකරණ වැඩපිළිවෙල සඳහා සැලසුම මඟින් පසුබිම සකස් කිරීම.

අරමුණ 04

### විද්‍යාව හා තාක්ෂණය පදනම් කර ගත් නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා සේවා තිරයක්
Promote A Service Corridor For Setting Up Science & Technology Based Innovation And Knowledge Centric Hubs.

පරමාර්ථ

1. 2031 වර්ෂය වන විට ගොඩගම හා මීගොඩ ප්‍රදේශ තුල සිදුවන සංවර්ධන ව්‍යාපෘති එකිනෙකට සම්බන්ධ කර ගැනීම තුලින්, යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපයේ ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය ලෙස ගොඩගම නගරය සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.

2. 2031 වර්ෂය වන විට මාලබේ සිට මාහේනවත්ත, මොරගහහේන සහ මිල්ලෑව දක්වා සැලසුම් සංකල්පය හරහා සංවර්ධනය කිරීමට යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය සේවා තීරය මාහේනවත්ත දැනුම් කේන්ද්‍රිය කලාපය, මීගොඩ හා ටෙම්පල් බර්ග් කර්මාන්ත කලාපය සංවර්ධනය කිරීම හරහා ශක්තිමත් කිරීම.

3. 2031 වර්ෂය වන විට යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය තුල සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන මාහේනවත්ත දැනුම් කේන්ද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතිය, මීගොඩ හා ටෙම්පල් බර්ග් කර්මාන්ත කලාපය අතර ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කිරීම තුලින් සම්බන්ධතාව(Connectivity) තීව්‍ර කිරීමට කටයුතු කිරීම.

05

පරිච්ඡේදය

# ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය

හෝමාගම සංවර්ධන සැලැස්මේ 2022–2031 දැක්ම සාක්ෂාත් කරගැනීම උදෙසා සකස් කරන ලද අරමුණු පදනම් කරගනිමින් ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය සිදු කල අතර විස්තරාත්මක විශ්ලේෂණයන් මත පදනම් වීම මෙම විශ්ලේෂණයේ සාර්ථකත්වය කෙරෙහි බලපා ඇත.

## අරමුණ 01 පරිසරය සුරකින, හරිත නගරයක්

*මගුව 5.1 : ශ.දු.අ.ත. SWOT විශ්ලේෂණය - අරමුණ 01*

### S — Strengths ශක්තීන්

- 2016 වර්ෂයට අනුව සකස් කරන ලද භූමි පරිහරණ සැලැස්මට අයත් දත්ත අනුව, මුළු භූමි ප්‍රමාණයෙන් 25% ක ප්‍රතිශතයක් හරිත ප්‍රදේශයන් ලෙස හඳුනා ගත හැකි වීම.
- 2016 වර්ෂයට අනුව සකස් කරන ලද භූමි පරිහරණ සැලැස්මට අයත් දත්ත අනුව, එහි මුළු භූමි ප්‍රමාණයෙන් 1% ක භූමි ප්‍රතිශතයක් ජලාශ්‍රිත ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි වීම.
- හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ස්වභාවික සෞන්දර්යයෙන් අනූන වූ වැව් 03 ක් සනත්වයෙන් වැඩි නේවාසික කලාපය තුල දක්නට ලැබීම

### W — Weaknesses දුර්වලතා

- 2001 – 2012 වර්ෂ වලදී සිදුවන ලද ජනගහන වර්ධනයේ වෙනස්වීමට අනුව, බහුතර පිරිසක් (මුළු ජනගහනයෙන් 12% ක ප්‍රතිශතයක්) පරිසර සංවේදී කලාපවලට නැඹුරු වීම.
- හෝමාගම ප්‍රදේශයේ නගර ආසන්නව දක්නට ලැබෙන කුඹුරු ඉඩම් අනවසර ගොඩකිරීම්වලට ලක්ව තිබීම.
- ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින ප්‍රධාන ඇළ මාර්ග විධිමත් නඩත්තුවකට යටත් නොවීම හේතුවෙන් විනාශවීමේ තර්ජනයට ලක්ව තිබීම.

*සැකසුම: බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## O

**Opportunities**
**අවස්ථා**

- හෝමාගම ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින පහත් බිම් බහුතරයක්, ශ්‍රී ලංකාවේ බලය ලත් ආයතන මගින් පිළියෙළ කරන ලද බස්නාහිර පළාත් තෙත් බිම් සැලැස්ම මගින් (Wetland Master Plan) තෙත් බිම් සංරක්ෂණ කලාප ලෙස හඳුනාගෙන තිබීම.

- නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස්කරන ලද සංවර්ධන සැලැස්ම (2008 -2025) ට අනුව පුස්වැලි ඔය දෙපස අක්කර 400 කින් යුත් තෙත් බිම් ප්‍රදේශය, තෙත්බිම් සංරක්ෂණ කලාපයට ඇතුලත් වී තිබීම හා ඒ සඳහා බරාව තෙත්බිම් උද්‍යාන ව්‍යාපෘතිය යෝජනා වී තිබීම.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කැළණි ගඟ දෙපස අඩි 50ක (ගඟ ඉවුරේ සිට) ප්‍රදේශය, සුරක්ෂිත ප්‍රදේශ ලෙස පරිසර හිතකාමී සංවර්ධන කටයුතුවලට යොදා ගැනීමට යෝජනා කර තිබීම.

## T

**Threats**
**තර්ජන**

- වර්තමානයේ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති මහා පරිමාණ ව්‍යාපෘති හෝමාගම ප්‍රදේශයේ 13% ක් වූ හරිත ප්‍රදේශ අවකාශ කරගෙන ක්‍රියාත්මක වීම.

- විවිධ පෞද්ගලික ආයතන මගින් සිදු කරනු ලබන ඉඩම් අනු බෙදුම්, පරිසර සංවේදී කලාප ආශ්‍රිතව හා හරිත ප්‍රදේශ ආවරණය කරගෙන ක්‍රියාත්මක වීම.

## අරමුණ 01

පරිසරය සුරකින, හරිත නගරයක්
A safeguarded environment, A Green City

## ශක්තීන් (Strengths)

### 1. *2016 වර්ෂයට අනුව සකස් කරන ලද භූමි පරිහරණ ව්‍යාජ්තියට අයත් දත්ත අනුව, මුළු භූමි ප්‍රමාණයෙන් 25% ක ප්‍රතිශතයක් හරිත ප්‍රදේශයන් ලෙස හඳුනා ගත හැකි වීම.*

නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2008 වර්ෂයේ සකස් කරන ලද භූමි පරිහරණ ව්‍යාප්තියට අයත් දත්තයන් හා භූමි පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2016 වර්ෂයේ දත්තයන් අනුව යාවත්කාලින කරන ලද භූමි පරිහරණ දත්තයන් අනුව හරිත ප්‍රදේශයන්ගේ විහිදීම හෝමාගම මුළු භූමි ප්‍රමාණයෙන් 25% කි. ප්‍රස්ථාරය 2.2. මඟින් මෙම තත්ත්වය දක්වා ඇත.

2022–2031 හෝමාගම නව සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණක් වනුයේ විධිමත්, හරිත නගරයක් නිර්මාණය කිරීමයි. ඒ අනුව වර්තමානය වනවිට 25% ක පමණ හරිත ප්‍රදේශ හෝමාගම ප්‍රාදේශීය සභාව ආශ්‍රිතව විහිදී පැවතීම, ප්‍රබල ශක්තියක් ලෙස හඳුනා ගැනීමට හැකිය.

### 2. *2016 වර්ෂයට අනුව සකස් කරන ලද භූමි පරිහරණ ව්‍යාජ්තියට අයත් දත්ත අනුව, එහි මුළු භූමි ප්‍රමාණයෙන් 1% ක භූමි ප්‍රතිශතයක් ජලාශ්‍රිත ප්‍රදේශ ලෙස හඳුනාගත හැකි වීම. ප්‍රස්ථාරය 2.2. මඟින් මෙම තත්ත්වය දක්වා ඇත.*

එමෙන්ම හරිත නගරයක් හුදෙක් ගස්වැල් වලින් පමණක් නිර්මාණය කල හැකි දෙයක් පමණක් නොවේ. හරිත පද්ධතියක් වූ කලි පරිසර පද්ධතියකි. එහි තුරු ලතා, සතා සිවුපාවා හා විශේෂයෙන්ම ජල ප්‍රදේශ පැවතීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දැනට ව්‍යාප්තව පවතින, මුළු භූමි ප්‍රමාණයෙන් 1% ක් වූ ජලජ ප්‍රදේශ මෙහි දක්නට ලැබෙන සුවිශේෂී ශක්තියක් ලෙස හඳුනා ගත හැකිය. එමෙන්ම එම ජල ප්‍රදේශය, තෙත්බිම් ප්‍රදේශ සමඟ මනා ලෙස ඒකාබද්ධ වී ඇති ආකාරය දැකිය හැකි තවත් සුවිශේෂී ලක්ෂණයක් වේ (සිතියම 5.1).

**සිතියම 5.1 :** *තෙත්බිම් ප්‍රදේශ හා ජලජ ප්‍රදේශ ප්‍රතිබද්ධව පැවතීම - හෝමාගම සැලසුම් ප්‍රදේශය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**05 පරිච්ඡේදය**
**ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය**

අරමුණ 01

ශක්තීන්

3. ***හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ස්වාභාවික සුන්දරත්වයෙන් අනූනවූ වැව් 03 ක් ඝනත්වයෙන් වැඩි නේවාසික කලාපය තුල දක්නට ලැබීම (රූපය 5.1). එම වැව්වල පිහිටීම සිතියම 5.2. මඟින් පෙන්වා දී ඇත.***

හෝමාගම ප්‍රදේශය නේවාසික භාවිතය සඳහා වැඩි ඉල්ලුමක් පවතින ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකි අතර ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012–2019 දත්ත අනුව ජනගහන වර්ධන වේගය 2.4 ක් වීම හා කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලට සාපේක්ෂව පස්වන තැනට වැඩි ජන සංඛ්‍යාවක් වෙසෙන (11%) ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. ඒ අනුව හරිත නගරයක් නිර්මාණය කිරීමට යාමේදී මෙවැනි සංරක්ෂණයට ලක් වූ පරිසර පද්ධතීන් ව්‍යාප්තව පැවතීම විශේෂ ප්‍රබලතාවක් ලෙස හඳුනා ගත හැකිය. තවද හෝමාගම සංවර්ධන සැලැස්ම 2008–2025 යටතේ එම වැව් සඳහා වැව් ඉවුරේ සිට මීටර් 15 ක රක්ෂිතයක් වෙන් කර තිබීමද විශේෂත්වයක් ගන්නා බව මෙහිදී සඳහන් කල යුතුය.

***රූපය 5.1 :*** *හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබෙන වැව්*



***මත්තේගොඩ වැව***



***ඔලුපට්ටාව වැව***



***කුඩා වැව***

***මූලාශ්‍රය:*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

**සිතියම 5.2 :** *වැව් වල පිහිටීම - හෝමාගම සැලසුම් කලාපය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

# දුර්වලතා (Weakneses)

## 1. *2001–2012 වර්ෂ වලදී සිදුවන ලද ජනගහන වර්ධනයේ වෙනස්වීමට අනුව, බහුතර පිරිසක් (මුළු ජනගහනයෙන් 12% ක ප්‍රතිශතයක්) පරිසර සංවේදී කලාපවලට නැඹුරු වීම.*

මෙහිදී සිදු කරන ලද දත්ත විශ්ලේෂණයන්ට අනුව සහ ගංවතුර තර්ජනයෙන් පීඩාවට පත්වන ජන සංඛ්‍යාව හෝමාගම ප්‍රදේශයේ මුළු ජනගහනයෙන් 12% ක් බව හඳුනා ගත හැකිය. ඒ අනුව, මෙහි පවතින ප්‍රධාන දුර්වලතාවය වනුයේ, ජන සංඛ්‍යාවේ වෙනස්වීම පෙන්වන සිතියම 5.3 සහ සිතියම 5.4 අනුව, වැඩිවන ජනගහනය පරිසර සංවේදී ප්‍රදේශවල පදිංචිවීම මෙම ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය තුළ දක්නට ලැබෙන ගැටලුවකි. මෙම තත්ත්වය රූපය 3.1 මඟින් දක්වන පරිසර සංවේදීතා විශ්ලේෂණය හා සිතියම 5.3 සහ සිතියම 5.4 හි සඳහන් තොරතුරු සංසන්දනාත්මකව විමසීමේදී ඒ බව මනාව පැහැදිලි වේ. හරිත නගරයක් නිර්මාණය කිරීමට යන ගමනේදී ප්‍රදේශය ආශ්‍රිතව එවැනි තත්ත්වයක් උද්ගතව පැවතීම දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය.

## 2. *හෝමාගම ප්‍රදේශයේ ප්‍රධාන නගරාසන්නයන්හි දක්නට ලැබෙන කුඹුරු ඉඩම්, අනවසර ගොඩකිරීම්වලට ලක්ව තිබීම.*

මෙම කරුණ හරිත නගරයක් නිර්මාණය කිරීමට යන ගමනේදී ප්‍රධාන දුර්වලතාවයක් ලෙස හඳුනා ගැනීමට හේතු වූයේ, හෝමාගම ආශ්‍රිත ප්‍රධාන නගර රේඛීය සංවර්ධනයකට (Linear Development) යොමු වී ඇති නිසාවෙනි. මෙහිදී නගර ආසන්නව පවතින හරිත ප්‍රදේශ විනාශ වීමකට ලක්වනුයේ, හුදෙක් ආර්ථික ලාභ මත පදනම් වෙමිනි. මෙහිදී විධිමත් සැලැස්මකට අනුව එම නගරාසන්න හරිත ප්‍රදේශ, හරිත සංකල්පයට ඇතුලත් කර ගැනීමට ඇති හැකියාව බිඳ වැටෙන නිසාවෙන් මෙය ප්‍රධාන දුර්වලතාවක් ලෙස හඳුනා ගත හැකිය.

***රූපය 5.2 :*** *හෝමාගම නගරය ආසන්නයේ දක්නට ලැබෙන අනවසර ගොඩ කිරීම්*




***මූලාශ්‍රය:*** *ගූගල් චන්ද්‍රිකා ඡායාරූප, Google Earth*

**සිතියම 5.3 :** *2001–2012 වර්ෂවල ජනගහනයේ වෙනස්වීම - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය*



**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**සිතියම 5.4 :** *2012 - 2019 වර්ෂවල ජනඝනත්වයේ වෙනස්වීම - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

*රූපය 5.3 : ගොඩගම නගරය ආසන්නයේ දක්නට ලැබෙන අනවසර ගොඩ කිරීම්*




*මූලාශ්‍රය : ගූගල් චන්ද්‍රිකා ඡායාරූප, Google Earth*

*රූපය 5.4 : හෝමාගම හයිලෙවල් මාර්ගය ආසන්නයේ දක්නට ලැබෙන අනවසර ගොඩ කිරීම්*



*මූලාශ්‍රය : ගූගල් චන්ද්‍රිකා ඡායාරූප, Google Earth*

## 3. ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින ප්‍රධාන ඇළ මාර්ග විධිමත් නඩත්තුවකට යටත් නොවීම හේතුවෙන් විනාශවීමේ තර්ජනයට ලක්ව තිබීම.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතනය මගින් 2012 වර්ෂයේ සිදු කරන ලද ගංවතුර තත්ත්වය පිළිබඳ දත්ත වාර්තාවට අනුව (Flood Hazard Profıle of Sri Lanka ) බොහොමයක් ගංගා පිටාර ගැලීමට ප්‍රධාන හේතු ලෙස සටහන් කර ඇත්තේ ඇළ මාර්ග පටු වීම හා වතුර ගලායාමේ ප්‍රවණතාව අවම වීම හේතුවෙන් ඇතිවන අවහිරයන් බවයි. ඉහත සඳහන් කල ආකාරයට ප්‍රධාන ඇළ මාර්ග විධිමත් නඩත්තුවකට යොමු නොවීම හේතුවෙන්, එම ඇළ මාර්ග ගොඩ ඉඩම් බවට පත්වීම හරහා, පරිසර පද්ධතීන් බිඳ වැටීම විය හැකිය. දැනට ශේෂ වී පවතින එම ඇළ මාර්ගද විනාශ වී යාමෙන්, හරිත නගරයක් සැලසුම් කරන්නට යන ගමනේදී, නව පරිසර පද්ධතියක් නිර්මාණය කිරීම අවශ්‍ය නොවන අතර මෙම දුර්වලතාවයට, පිළියම් හඳුනාගැනීම මෙහිදී වැදගත් වේ.

***රූපය 5.5 :*** *ප්‍රධාන ඇළ මාර්ග - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය*




***මූලාශ්‍රය:*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




***වගුව 5.2 :*** *හෝමාගම සංවර්ධන සැලැස්ම 2008 - 2020 අනුව ඇළ මාර්ග සඳහා හඳුනාගන්නා ලද රක්ෂිත සීමාවන්*

| *ඇළ මාර්ග* | *තැබිය යුතු රක්ෂිතය (ඇළ ඉවුරේ සිට)* |
|---|---|
| *පුස්වැලි ඔය* | *10 m* |
| *හේන්පිට ඇළ, මහ ඔය* | *8 m* |
| *නුදුන් ඇළ සහ පානළුව ඇළ* | *5 m* |
| *අනෙකුත් ඇළ* | *1 m* |

***මූලාශ්‍රය:*** *හෝමාගම සංවර්ධන සැලැස්ම 2008 – 2025, බස්නාහිර පළාත, නාගරික සංවර්ධන අධිකාරිය*

# අවස්ථා (Opportunities)

### 1. *හෝමාගම ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින පහත් බිම් බහුතරයක්, ශ්‍රී ලංකාවේ බලය ලත් ආයතන මගින් පිළියෙළ කරන ලද බස්නාහිර පළාත් තෙත් බිම් සැලැස්ම තුළ (Wetland Master Plan) තෙත් බිම් සංරක්ෂණ කලාප ලෙස හඳුනාගෙන තිබීම (සිතියම 5.5).*

විධිමත්, හරිත නගරයක් නිර්මාණය කිරීම හුදෙක් තනි ආයතනයක් හරහා සිදු කල නොහැකිය. ඒ අනුව ශ්‍රී ලංකාවේ බලය ලත් ආයතන කිහිපයක් එකට එකතුවී, නිර්මාණය කරන ලද බස්නාහිර පළාත් තෙත් බිම් සැලැස්ම ප්‍රබල අවස්ථාවක් ලෙස මෙහිදී සඳහන් කල හැකිය. තවද ඉන් හෝමාගම ප්‍රදේශයට අයත්වන 10% ක් වූ තෙත්බිම් ප්‍රදේශ සියල්ලක්ම අන්තර්ගත කොට තිබීමත්, බොහොමයක් පහත්බිම්, තෙත් බිම් සංරක්ෂණ කලාප ලෙස හඳුනාගෙන තිබීම මෙහිදී සඳහන් කල හැකිය.

### 2. *නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස්කරන ලද සංවර්ධන සැලැස්ම (2008 -2025) ට අනුව පුස්වැලි ඔය දෙපස අක්කර 400 කින් යුත් තෙත් බිම් ප්‍රදේශය, තෙත්බිම් සංරක්ෂණ කලාපයට ඇතුලත් වී තිබීම හා ඒ සඳහා බරාව තෙත්බිම් උද්‍යාන ව්‍යාපෘතිය යෝජනා වී තිබීම (ඇමුණුම 08).*

නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිළියෙළ කරන ලද සංවර්ධන සැලැස්ම යටතේ, ක්‍රියාත්මක කරනු ලබන කලාපීකරණ සැලැස්මට අදාලව පුස්වැලි ඔය දෙපස අක්කර 200 ට ආසන්න ප්‍රදේශයක්, තෙත්බිම් සංරක්ෂණ කලාප ලෙස හඳුනා ගෙන ඇත. මෙම සංරක්ෂණ කලාප පදනම් කර ගනිමින් පුස්වැලි ඔය දෙපස ආශ්‍රිතව අක්කර 400 ක පමණ භූමි ප්‍රදේශයක් බරාව තෙත්බිම් ව්‍යාපෘතිය යටතේ හඳුනාගෙන ඇත. පරිසරය සුරකින , හරිත නගරයක් නිර්මාණය කිරීම යන අරමුණ සාක්ෂාත් කර ගැනීමේදී, මෙම ප්‍රයත්න දෙක ප්‍රබල අවස්ථා 2ක් ලෙස සඳහන් කල හැකිය. මන්ද යත් ඇළ මාර්ග වල ප්‍රමාණයේ හෝ වැදගත්කමේ තීව්‍රතාව නිර්ණය කිරීම සඳහා කරන ලද විශ්ලේෂණයට අනුව (රූපය 2.3.) මෙම සැලසුම් කලාපය හා බරාව ව්‍යාපෘතිය (රූපය 5.5.), ඔය දෙපස විශාල ප්‍රදේශයක් සුරක්ෂිත කිරීමට පසුබිම් සපයන බව කිව හැකිය.

**සිතියම 5.5 :** *බස්නාහිර පළාත් තෙත් බිම් සැලැස්ම 2006 වර්ෂය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

*රූපය 5.6 : බරාව ජෛව විවිධත්ව උද්‍යාන ව්‍යාපෘතිය*




***මූලාශ්‍රය:** www.skyscrapercity.com/showthread.php?p=136622389,*
*හෝමාගම සංවර්ධන ව්‍යාපෘතීන් , සුබිතපුරවර සංවර්ධන වැඩසටහන,2015*

හුදෙක් නේවාසික භාවිතයන්ගෙන් හා වගා කටයුතුවලින්, විනාශවීමට සැරසෙන මෙම ප්‍රදේශය, පරිසර පද්ධතිය සුරැකෙන ව්‍යාපෘතියක් යටතේ, ප්‍රදේශයේ වානිජමය වටිනාකම වැඩි කිරීමට බෙහෙවින් හේතුවන බවත්, ඒ තුලින් පරිසර පද්ධතියේ ආරක්ෂාවට ආවරණයක් සපයන්නට හැකියාව ලැබෙන බවත් හඳුනා ගත හැකිය. මෙම පරිසර පද්ධතිය ආශ්‍රිතව ජීවත්වන නේවාසිකයන් බහුතරයක්, මැටි කර්මාන්තය, ගල් කැඩීම හා රඹුටන් වගාව, සත්ව පාලනය වැනි රැකියාවන්වල නියුක්ත වන අතර, ප්‍රමිතියකින් තොරව සිදුවන එවැනි ක්‍රියාකාරකම් වලට තිරසාර සංරක්ෂණයක් සපයන්නට, මෙම සංවර්ධන ව්‍යාපෘතිය විශේෂ අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය. තවද පරිසර සංවේදී ප්‍රදේශ, ප්‍රමාණයෙන් විශාල වපසරියකට වර්ධනය කර, හරිත නගරයක් නිර්මාණය කිරීමට, විශේෂයෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කල හැකි වීම ප්‍රබල අවස්ථාවක් ලෙස සටහන් කල හැකිය.

**05 පරිච්ඡේදය
ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය**

අරමුණ 01

අවස්ථා

### 3. වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කැළණි ගඟ දෙපස අඩි 50ක (ගඟ ඉවුරේ සිට) ප්‍රදේශය, සුරක්ෂිත ප්‍රදේශ ලෙස, පරිසර හිතකාමී සංවර්ධන කටයුතුවලට යොදා ගැනීමට යෝජනා වී තිබීම

හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දැකිය හැකි කිලෝමීටර 6 ක් දුරට විහිදෙන කැළණි ගංගා නිරය පාදක කර ගෙන ශ්‍රී ලංකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින්, ප්‍රකාශයට පත් කර ඇත.

හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දැකිය හැකි ප්‍රධාන නදී ප්‍රදේශයක් ලෙස කැළණි ගඟ නදී ප්‍රදේශය හැඳින්විය හැකි අතර, හෝමාගම නගරයෙන් උතුරු ප්‍රදේශයේ සියලුම කුඩා හා විශාල ඇළ මාර්ග, කැළණි ගඟ හා බැදී පවතී. තවද එම ගංගා නිරය සමග ලෝ ලෙවල් මාර්ගය සමාන්තරව ගමන් කිරීම ප්‍රදේශයේ ස්වභාවික සුන්දරත්වය වර්ධනය කිරීමටත්, ස්වභාවික දර්ශන තලයක් නිර්මාණය කරන්නටත් හැකි වී ඇත.

කැළණි ගඟ දෙපස වත්මන් තත්ත්වය විමසා බැලීමේදී පසක් වනුයේ, ඝන බිත්ති වලින් සැකසුනු විශාල ගොඩනැගිලි රැසක් ඒකරාශී වී ඇති බවය. කැළණි ගඟ හා බැදී පවතින දර්ශනීය ප්‍රදේශ එමගින් ආවරණය වී ඇති බවය.

හරිත නගරක් නිර්මාණය කිරීමේ මූලික අරමුණු කිහිපයක් දැකිය හැක. ඒ අතර ප්‍රදේශය ආශ්‍රිත උෂ්ණත්වය සමනය කිරීම, ස්වභාව සෞන්දර්යේ තිරසාර පැවැත්ම සඳහා අවකාශ සකස් කිරීම ප්‍රධාන විය හැකිය. ඒ අනුව වර්ග කිලෝ මීටර 132 කින් යුතු විශාල ප්‍රදේශයක් ආශ්‍රිතව ව්‍යාප්තව පවතින කැළණි ගඟ නිරය හා එහි රක්ෂිත ප්‍රදේශය, සුළං කවුළු නිර්මාණය කිරීමටත්, ඒ තුලින් නගරය සිසිල් කර උෂ්ණත්වය සමනය කිරීමටත් යොමු කල හැකි වනු ඇත. රක්ෂිතය නෛතික රාමුවකින් බල ගැන්වෙන හෙයින්, ගොඩනැගිලි ඉදි වීම වැළකෙන අතර එය මෙහිදී ප්‍රබල අවස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකිය (රූපය 5.7).

***රූපය 5.7 :** කැළණි ගඟ දෙපස ඉදි වී ඇති ගොඩනැගිලිවල ස්වභාවය*




***මූලාශ්‍රය:** ගූගල් මාර්ග ජායාරූප (Google Street View), 2015*

# තර්ජන (Threats)

## 1. *වර්තමානයේ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති මහා පරිමාණ ව්‍යාපෘති හෝමාගම ප්‍රදේශයේ 13% ක් වූ හරිත ප්‍රදේශ අවකාශ කරගෙන ක්‍රියාත්මක වීම.*

ඉහත සඳහන් කල කරුණු බොහොමයකින්, හෝමාගම ප්‍රදේශය හරිත ලක්ෂණයන්ගේ වැඩි විභවතාවක් පෙන්වන ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. 2016 වර්ෂයට අනුව සකස් කරන ලද භූමි පරිහරණ දත්ත අනුව මුළු භූමි ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් හරිත ප්‍රදේශ ලෙස හඳුනා ගත හැකිය. හරිත නගරයක් ක්‍රියාත්මක කිරීමට යන ගමනේදී එම ලක්ෂණය සුවිශේෂී වූ කරුණක් ලෙස දක්වා ඇත. එහෙත් වර්තමානයේ ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති මහා පරිමාණ ව්‍යාපෘති, හරිත ප්‍රදේශ අවකාශ කරගෙන ක්‍රියාත්මක වීම ප්‍රබල තර්ජනයක් වී ඇත. තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අත්කරගැනීමට හඳුනා ගැනුණු ඉඩම් පිලිබඳ අවධානය යොමු කිරීමේදී පැහැදිලි වනුයේ, බොහොමයක් ඉඩම් රබර්, පොල් ඉඩම් අවකාශ කරගෙන ඇති බවයි. එය මුළු භූමි ප්‍රමාණයෙන් 6% වන අතර ව්‍යාප්තව පවතින 25% ක් වූ හරිත ප්‍රදේශයන්ගෙන් 13% ක තරම් සැලකිය යුතු අගයකි. ඒ අනුව හරිත නගරයක් නිර්මාණය කිරීමට යාමේදී ස්වභාවිකව ක්‍රියාත්මක වී පවතින හරිත ප්‍රදේශ එලෙස විනාශ වී යාම ප්‍රබල තර්ජනයක් ලෙස හඳුනා ගත හැකිය.

## 2. *විවිධ පෞද්ගලික ආයතන මගින් සිදු කරනු ලබන ඉඩම් අනු බෙදුම්, පරිසර සංවේදී කලාප ආශ්‍රිතව හා හරිත ප්‍රදේශ අවකාශ කරගෙන ක්‍රියාත්මක වීම.*

කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන නේවාසික ප්‍රදේශයක් ලෙස හෝමාගම ප්‍රචලිතව ඇති බව එහි භූමි පරිහරණ දත්ත අනුව හඳුනා ගත හැකිය. එපමනක් නොව නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කරනු ලබන සැලසුම් අනුමත කිරීමේ ක්‍රියාවලියට අනුව ද, විශාල අනුමත කිරීම් ප්‍රමාණයක් නේවාසික භාවිතයන් සඳහා සිදු වන බව හඳුනා ගත හැකිය.

මේ සියලු කරුණු අනුව ඉඩම් අනු බෙදුම් සිදුවන ප්‍රදේශ පිලිබඳ අවධානය යොමු කිරීමෙන් පසක් වනුයේ, නේවාසික භාවිතයන් සඳහා පවතින අධික ඉල්ලුම හේතු කොට ගෙන, ඉඩම් අනු බෙදුම් රාශියක් සිදුවන බවත්, ඒවා බහුතරයක් හරිත ප්‍රදේශ පාදක කොට ගෙන ක්‍රියාත්මක වන බවත්ය (සිතියම 5. 1, 5.6 හා සිතියම 5.7).

මෙහි සඳහන් කල යුතු සුවිශේෂී කාරණය වනුයේ හෝමාගම නගරය ආසන්නව වුවද ඉහල නිවාස ඝනත්වයක් දක්නට නොමැති තත්වයක් තුල, ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින හරිත ප්‍රදේශ අවකාශ කොට ගෙන, වැඩි වන නේවාසික අවශ්‍යතාව සපුරාලීමට පෞද්ගලික ආයතන ක්‍රියාත්මක වීමයි. එය හරිත නගර සංකල්පය ක්‍රියාත්මක කිරීමට ප්‍රබල තර්ජනයක් වන බවයි.

**සිතියම 5.6 :** *සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත ඉඩම්වල ව්‍යාප්තිය*



***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**සිතියම 5.7 :** *ඉඩම් අනුබෙදුම් බහුල ලෙස ක්‍රියාත්මක වන ප්‍රදේශ හෝමාගම සැලසුම් ප්‍රදේශය - 2017 වර්ෂය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## අරමුණ 02 පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක්

*මගුව 5.3 : SWOT විශ්ලේෂණය - අරමුණ 02*

### S — Strengths ශක්තීන්

- කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ප්‍රදේශයන්ට සාපේක්ෂව හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු ජනඝනත්ව ව්‍යාප්තිය වැඩි අගයක් ගත් නමුත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් අනුව එහි ජන ඝනත්වය හා නිවාස ඝනත්වය පහල අගයක් ගැනීම.
- කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලට සාපේක්ෂව හෝමාගම ප්‍රදේශය ස්වභාවික විපත්වලට ගොදුරු වීමේ ප්‍රවනතාව අවම වීම.
- වර්තමාන තත්ත්වය තුල හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වන නේවාසිකයන්ට ප්‍රමාණවත් ජල පහසුකම්, විදුලිය පහසුකම් හා සමාජීය පහසුකම් ව්‍යාප්තව පැවතීම.
- හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව වැඩි ජනඝනත්වයක් පෙන්වන ප්‍රදේශයන් වල ව්‍යාප්තව පවතින පොදු උද්‍යාන පද්ධතිය.

### W — Weaknesses දුර්වලතා

- වර්තමානයේ ජනඝනත්ව වර්ධනය ප්‍රසාරණය වීමේ ප්‍රවණතාව පරිසර සංවේදී කලාපවලට විහිදීම තුලින් ගංවතුර උවදුර වැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වීම වර්ධනය වීම හා එම ප්‍රදේශ ආශ්‍රිත ඉඩම් මිල ගණන් සාපේක්ෂව පහළ අගයක් ගැනීම.
- හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින ප්‍රධාන නගර ආශ්‍රිත නාගරික පහසුකම් හා ඇවිදීමට ඇති පහසුකම් විධිමත් පරිදී සංවිධානය නොවීම.

*සැකසුම: බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## O

**Opportunities**
**අවස්ථා**

- යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන නේවාසික භාවිතයන් ප්‍රමාණය ඉහල අගයක් ගැනීම.
- යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රැකියා අවස්ථා (22600) හරහා ප්‍රදේශය සඳහා පවතින නේවාසික ආකර්ෂණය වර්ධනය විය හැකිවීම.

## T

**Threats**
**තර්ජන**

- යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වීම අඩාල කිරීම සඳහා මහජන විරෝධතා හරහා නගරය තුලට ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන නේවාසිකයන් ප්‍රමාණය අඩු විය හැකි වීම.

## අරමුණ 02

පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක්
An Affluence City, A Comfortable Neighborhood

## ශක්තීන් (Strengths)

1. *කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් පළාත් පාලන ප්‍රදේශයන්ට සාපේක්ෂව හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු ජනගහන ව්‍යාප්තිය වැඩි අගයක් ගන්නා නමුත් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් අනුව එහි ජන ඝනත්වය හා නිවාස ඝනත්වය පහල අගයක් ගැනීම.*

නේවාසික භාවිතය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ පවතින ඉල්ලුම අතින් හෝමාගම ප්‍රදේශයට හිමි වනුයේ සුවිශේෂී ස්ථානයකි. 2012 වර්ෂයට සාපේක්ෂව කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහන ව්‍යාප්තිය අනුව පැහැදිලි වනුයේ කොළඹ දිස්ත්‍රික්කයේ මුළු ජනගහනයට සාපේක්ෂව, හෝමාගම ප්‍රදේශිය සභාවේ ජනගහන ව්‍යාප්තිය 11% ක් පමණ වන බවයි. කොළඹ දිස්ත්‍රික්කය තුල හෝමාගම, ජනගහන ව්‍යාප්තිය අතින් පස්වන ස්ථානයේ පසුවන බවයි.

එමෙන්ම නේවාසික ප්‍රදේශයක් නිර්මාණය කිරීම අරමුණු කරන අවස්ථාවක එහි ජනගහන වර්ධන වේගය පිළිබඳ නිරීක්ෂණය කිරීම මෙහිදී ඉතා වැදගත් වේ. කොළඹ දිස්ත්‍රික්කයේ 2001 හා 2012 වර්ෂවල ජනගහන වර්ධන වේගය පිලිබඳ දත්ත අධ්‍යනය කිරීමේදී පැහැදිලි වනුයේ, කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව, හෝමාගම ප්‍රදේශිය සභා බල ප්‍රදේශයේ ජනගහන වර්ධන වේගය ඉහල අගයක් ගන්නා බවයි. කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශිය ඒකක වලට සාපේක්ෂව, ජනගහන වර්ධන වේගය 2.29% ක් පමණ ඉහල අගයක් ගන්නා බව පහත දත්ත අනුව පැහැදිලි වනු ඇත.

*වගුව 5 4: කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පරිපාලන ඒකක අනුව ජනගහන වර්ධන වේගය 2001 - 2012*

| ප්‍රදේශය | ජනගහන වර්ධන වේගය (2001-2012) |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | 0.36% |
| හෝමාගම | 2.29% |
| කඩුවෙල | 1.68% |
| කැස්බෑව | 1.53% |
| කොලොන්නාව | 1.20% |
| මහරගම | 0.82% |
| තිඹිරිගස්යාය | -0.78% |
| පාදුක්ක | 1.67% |

**මූලාශ්‍රය:** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2001 – 2012 වර්ෂ දත්ත*

නේවාසික ප්‍රදේශයක් ස්ථාපිත කිරීමට සාපේක්ෂව ඉහල ජනගහන වර්ධන වේගයක් පැවතීම ප්‍රබල ශක්තියක් ලෙස හඳුනා ගත හැකි අතරම, හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දැකිය හැකි තවත් ප්‍රබල ශක්තියක් ලෙස එහි ජන ඝනත්වය හා නිවාස ඝනත්වය අවම අගයක් ගැනීම හඳුනා ගත හැකිය (ප්‍රස්ථාරය 2.1, 5.1 , 5.8 සහ සිතියම 5. 9). මන්ද ඝනත්වය රඳා පවතිනුයේ එහි භූමි ප්‍රමාණය මත වන නිසාවෙනි.

***ප්‍රස්ථාරය 5 1 :*** *නිවාස ඝනත්වය 2012 වර්ෂය - බස්නාහිර පළාත*

## නිවාස ඝනත්වය 2012 වර්ෂය - කොළඹ දිස්ත්‍රික්කය




***මූලාශ්‍රය:*** *ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2012 වර්ෂ දත්ත*

2012 වර්ෂයේ දත්ත අනුව ජනඝනත්වය හා නිවාස ඝනත්වය අනුව හෝමාගම ප්‍රදේශිය සභාව අවම මට්ටමේ සිට තුන්වන ස්ථානයේ පසුවන බව නිරීක්ෂණය කල හැක. නේවාසික භාවිතයක් නම් 60% ක මට්ටමක ඉදිකිරීමකට යාමට අවස්ථාව තිබියදීත්, මෙලෙස නිවාස ඝනත්වය හා ජන ගණත්වය අවම අගයක පැවතීම එම ප්‍රදේශය ආශ්‍රිත ප්‍රබල ශක්තියක් ලෙස හඳුනා ගත හැකිය.

**සිතියම 5.8 :** *නිවාස ඝනත්වය 2012 වර්ෂය - හෝමාගම ප්‍රා.සභා ප්‍රදේශය*




**මූලාශ්‍රය :** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව 2012*

**සිතියම 5.9 :** *නිවාස ඝනත්වය 2019 වර්ෂය - හෝමාගම ප්‍රා.සභා ප්‍රදේශය*




**මූලාශ්‍රය :** *සම්පත් පැතිකඩ වාර්තාව (2019), හෝමාගම ප්‍රා.ලේ.කාර්යාලය*

### 2. *කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශ වලට සාපේක්ෂව හෝමාගම ප්‍රදේශය ස්වභාවික විපත්වලට ගොදුරු වීමේ ප්‍රවනතාව අවම වීම.*

2022–2031 නව සංවර්ධන සැලැස්මට අනුව පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක් ස්ථාපිත කිරීම අරමුණු කර ඇත. එහිදී යම් ප්‍රදේශයක් නේවාසිකයන්ට සුවපහසු ප්‍රදේශයක් වන්නට නම් බලපාන එක් ප්‍රබල කාරණයක් ලෙස ස්වභාවික විපත්වලින් මිදුණු ප්‍රදේශයක් වීම හඳුන්වා දිය හැකිය.

ශ්‍රී ලංකාවේ පිහිටීම අනුව හෝමාගම ප්‍රදේශය තෙත් කලාපයේ පිහිට තිබෙන අතර මුහුදු මට්ටමේ සිට මීටර 10 ක් පමණ උසකින් පිහිටා ඇත. නවද ජලාශ්‍රිත භාවිතයන්ගෙන් ආවරණය වූ ප්‍රදේශයක් ලෙසද හඳුනා ගත හැකිය. එවැනි ස්වභාවික පරිසරයක් ආශ්‍රිතව ඇති විය හැකි ප්‍රබල ස්වභාවික උවදුරක් ලෙස ගංවතුර උවදුර පෙන්වා දීමට පුළුවන. කොළඹ දිස්ත්‍රික්කය පිලිබඳ අවධානය යොමු කිරීමේදී බහුල වශයෙන්ම මෙම ගංවතුර අවදානම ඉස්මතු වන අතර ඒ තුලින් ලෙඩ රෝග පැතිරීමේ ප්‍රමාණය වර්ධනය වූ බව හඳුනාගත හැකිය.

හෝමාගම ප්‍රදේශය, කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටා තිබියදීත් එවැනි ස්වභාවික විපත්වලට ගොදුරුවීමේ අවකාශය සාපේක්ෂව අවම මට්ටමක පැවතීම, සුවපහසු නේවාසික නගරක් නිර්මාණය කිරීමට ප්‍රබල ශක්තියක් වන බව පැහැදිලි කරුණකි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් කරන ලද සමීක්ෂණයන්ට අනුව හෝමාගම ප්‍රදේශය ගංවතුර උවදුරට ගොදුරු වන බව හඳුනා ගත හැකි අතර, ගංවතුර උවදුරට ලක්වන ප්‍රදේශ වැඩිදුරටත් පැහැදිලිව හඳුනා ගැනීම මෙහිදී වැදගත් වනු ඇත.

විශේෂයෙන්ම මෙහි සඳහන් කල යුතු කරුණ වනුයේ ගංගා පිටාර ගැලීම හේතුවෙන් මෙම ප්‍රදේශ ජලයෙන් යටවන බවත්, කැළණි ගඟ දෙපස පහත් බිම් ආශ්‍රිතව ගංවතුර තත්ත්වයන් දැකිය හැකි බවයි. මෙම ප්‍රදේශ අතරට හෝමාගම ග්‍රාම නිලධාරී වසම් 91 න් ආටිගල නැගෙනහිර, පානළුව, ජල්තර, හේන්පිට, වටරැක උතුර, වල්පිට හා නාවලමුල්ල යන ග්‍රාම නිලධාරී වසම් අයත් වන බව හඳුනා ගත හැකි අතර 2000 වර්ෂයේ සිට ගංවතුර උවදුරට ලක් වූ මිනිසුන් ප්‍රමාණය වැඩි වී ඇති බවක් හඳුනා ගත හැකිය. පුස්වැලි ඔය ආශ්‍රිතව අඩි 15 ක් පමණ උසට වසරකට දෙවතාවක් තුන්වතාවක් පමණ ජලයෙන් යට තත්ත්වයක් මෙම ප්‍රදේශය ආශ්‍රිතව දැක ගත හැකිය.

වගුව 3.1. අනුව බැලු බැල්මට ආපදා තත්ත්වයක් පෙන්නුම් කලද, ගංවතුර ආපදා තත්ත්වය පරිසර සංවේදී ප්‍රදේශ ආශ්‍රිතව දැකිය හැකි අතර, ඒ දෙසට නේවාසික භාවිතයන් ව්‍යාප්ත විම හේතු කොට ගෙන ආපදා තත්ත්වය වැඩි වී ඇති බවක් දැක ගත හැක. ගංවතුරට ලක්වන ප්‍රදේශ වල වැඩි වීමක් හඳුනා ගැනීමට නොහැකි වන අතර ඇළ මාර්ග අවහිර වීම හේතුවෙන් ගංවතුර ගැලීමේ ප්‍රමාණයේ වැඩි වීමක් අනාවරණය කල හැකිය (සිතියම 5.10).

ඒ අනුව හෝමාගම ප්‍රදේශ ස්වභාවික විපත්වලින් අවම ප්‍රදේශයක් ලෙසත්, එම ප්‍රදේශය ආශ්‍රිතව දැකිය හැකි ප්‍රබල ශක්තියක් ලෙසත් හඳුනා ගත හැකිය.

**සිතියම 5.10 :** *ගංවතුර ආපදාමය තත්ත්වයට ලක් වූ ප්‍රදේශ - 2014 වර්ෂය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

### 3. *වර්තමාන තත්ත්වය තුළ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ජීවත් වන නේවාසිකයන්ට ප්‍රමාණවත් ජල පහසුකම්, විදුලිය පහසුකම් හා සමාජීය පහසුකම් ව්‍යාප්තව පැවතීම.*

හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව 2019 වන විට ජනගහනය ලක්ෂ හතරකට ආසන්න අගයක් ගන්නා බව සම්පත් පැතිකඩ වාර්තාව හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද විශ්ලේෂණයන්ට අනුව පැහැදිලි වේ. මෙහිදී පවත්නා ප්‍රවාහන පහසුකම්, ජල පහසුකම්, විදුලිය පහසුකම් හා අනෙකුත් සමාජීය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි විහිදී ඇති ආකාරයක් දැකිමට පුළුවන. හෝමාගම ප්‍රදේශයේ බහුතරයක් නේවාසිකයන් ළිං වතුර භාවිත කරන අතර, සෙසු පිරිස (නගර ආශ්‍රිතව ජීවත්වන පිරිස) නල ජලය භාවිත කරන ආකාරයක් දැකිය හැකිය. එමෙන්ම ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ තොරතුරු අනුව විදුලිය සැපයුම 100% ක් බව ප්‍රකාශ කර ඇත. තවද ප්‍රදේශය ආශ්‍රිතව හෝමාගම මූලික රෝහල, වෑතර දිස්ත්‍රික් රෝහල ඇතුළුව අනෙකුත් සෞඛ්‍ය පහසුකම් ව්‍යාප්ත වී ඇති ආකාරයක් දැකිය හැක. තවද අධ්‍යාපන පහසුකම් අනුවද හෝමාගම මහින්ද රාජපක්ෂ ජාතික පාසල, වෘත්තිය පුහුණු ආයතන, පාලි බෞද්ධ විශ්ව විද්‍යාලය, නැනෝ තාක්ෂණ ආයතනය ඇතුළුව අනෙකුත් ප්‍රාථමික, ද්විතීය හා තෘතිය අධ්‍යාපන ආයතනවල ව්‍යාප්තියක් දැක ගත හැකිය.

මේ අනුව 2031 වර්ෂය වනවිට වර්ධනය කර ගැනීමට අපේක්ෂිත ලක්ෂ 6 ක් වූ ජන සංඛ්‍යාවට යටිතල පහසුකම් සැපයීමට ගන්නා උත්සාහයන් සඳහා ප්‍රබල ශක්තියක් විය හැකි බව අවධාරණය වනු ඇත. නව සංවර්ධන සැලැස්මට අනුව පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක් ස්ථාපිත කිරීම අරමුණු කර ඇත. ඒ අනුව පවතින යටිතල පහසුකම් වල ව්‍යාප්තිය, වර්තමානයේ එහි ප්‍රමාණවත් බව ප්‍රබල ශක්තියක් ලෙස අවධාරනාත්මකව පෙන්වා දිය හැකිය.

වර්තමානයේ දී හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව විදුලිය පහසුකම්, නල ජලය පහසුකම්, අධ්‍යාපන සේවා පහසුකම් හා සෞඛ්‍ය සේවා පහසුකම් ව්‍යාප්තවී ඇති ආකාරය පිළිවෙලින් සිතියම් 5.11, 5.12, 5.13 සහ 5.14 මඟින් පෙන්වා දී ඇත.

*සිතියම 5.11 : විදුලි පහසුකම්වල ව්‍යාප්තිය - හෝමාගම සැලසුම් ප්‍රදේශය - 2016*




*සැකසුම : බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**සිතියම 5.12 :** *නල ජල පහසුකම්වල ව්‍යාප්තිය - හෝමාගම සැලසුම් ප්‍රදේශය - 2016*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

***සිතියම 5.13 :** අධ්‍යාපන ආයතනවල ව්‍යාප්තිය - හෝමාගම සැලසුම් ප්‍රදේශය*




***සැකසුම :** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**සිතියම 5.14 :** *සෞඛ්‍ය සේවා පහසුකම්වල ව්‍යාප්තිය - හෝමාගම සැලසුම් ප්‍රදේශය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 4. *හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව වැඩි ජනඝනත්වයක් පෙන්වන ප්‍රදේශයන් වල ව්‍යාප්තව පවතින පොදු උද්‍යාන පද්ධතිය.*

නගර නිර්මාණකරණය හමුවේ, නාගරික නේවාසික ප්‍රදේශයන් සඳහා අත්‍යවශ්‍යයෙන්ම සපුරාලිය යුතු පහසුකමක් ලෙස පොදු උද්‍යාන හා විනෝද උයන් නිර්මාණය කිරීම හඳුන්වා දිය හැකිය. යම් නාගරික ප්‍රදේශයක් ආශ්‍රිතව ජන සංඛ්‍යාවේ ප්‍රමාණයේ ව්‍යාප්තිය හා ජන ඝනත්වය මත උද්‍යාන පහසුකම් සපයනු දැක ගත හැකිය. සාමාන්‍ය අදහසට අනුව යම් ප්‍රදේශයක් ආශ්‍රිතව මිනිසුන් 1000කට හෙක්ටයාර් 1.4 ක භූමි ප්‍රදේශයක් උද්‍යාන (මිනිසා විසින් නිර්මාණය කරන ලද) පහසුකම් ලෙස වෙන් කර දීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව 2019 වර්ෂය වන විට හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ජීවත්වන ලක්ෂ හතරක ජන සංඛ්‍යාවකට හෙක්ටයාර් 12 ක පමණ උද්‍යාන ප්‍රදේශයක් වෙන් වී තිබීම ප්‍රබල ශක්තියක් ලෙස හඳුනා ගත හැකිය. එසේ වෙන්වී ඇති පොදු උද්‍යාන කිහිපයක් පහත රූපය 5.8 හි දක්වා ඇත.

***රූපය 5.8 :*** *හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින පොදු උද්‍යාන*



***මූලාශ්‍රය:*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

**සිතියම 5.15 :** *හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව පවතින පොදු උද්‍යානවල ව්‍යාප්තිය (2019)*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

# දුර්වලතා (Weakneses)

### 1. *වර්තමානයේ ජනගහන වර්ධනය ප්‍රසාරණය වීමේ ප්‍රවණතාව පරිසර සංවේදී කලාපවලට විහිදීම තුලින් ගංවතුර උවදුර වැනි තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වීම සීඝ්‍රයෙන් වර්ධනය වීම හා එම ප්‍රදේශ ආශ්‍රිත ඉඩම් මිල ගණන් සාපේක්ෂව පහළ අගයක් ගැනීම.*

"පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක්" නිර්මාණය කිරීමේ අරමුණ හමුවේ, මෙම තත්ත්වය සැලසුම් ප්‍රදේශය ආශ්‍රිතව දැකිය හැකි ප්‍රබල දුර්වලතාවක් ලෙස හඳුනා ගත හැකිය. හෝමාගම ප්‍රදේශයට පවතින ඉහල නේවාසික ඉල්ලුම, පරිසර සංවේදී ප්‍රදේශයක් සඳහා මෙම නේවාසික ඉල්ලුම් වැඩිවීම හා එමගින් ආපදාවලට ගොදුරුවන පිරිස වැඩිවීම, ඉහළ සුවපහසු නේවාසික ප්‍රදේශයක, ලක්ෂණයක් විය නොහැකිය. තවද එම පරිසර සංවේදී ප්‍රදේශ ආශ්‍රිතව පවත්නා සාපේක්ෂ අඩු ඉඩම් වටිනාකම මේ තත්ත්වය වර්ධනය කිරීමට හේතු වී ඇති බව සඳහන් කළ හැකිය.

ඒ අනුව ඉඩම් මිලගණන් ප්‍රදේශය තුල සාධාරණ ලෙස බෙදී යන ලෙසත්, සාධාරණ මිලක් නිර්මාණය කිරීමත්, ජීවත් වීම සඳහා සෑම දෙනාටම සුදුසු ඉඩමක් තෝරාගැනීමට ඇති හැකියාව වර්ධනය කිරීමත්, සංවර්ධන සැලැස්ම තුළින් ඉඩ ප්‍රස්ථාව සලසාදීම මෙමගින් බලාපොරොත්තු වේ.

තවද 2001–2012 වර්ෂවල ජනගහනයේ වෙනස්වීම අනුව, ජනගහනයේ විශාල ලෙස වැඩි වීම හා එම ජනගහනය මෙම පරිසර සංවේදී ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්ත වීම, ප්‍රදේශය තුල පොහොසත් නාගරික ලක්ෂණය විනාශ වීමට හේතුවක් විය හැකිය. ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම හමුවේ පොහොසත් නගරයක් නිර්මාණය වී ඇති බව හැගවිමට, නගරය වටා කේන්ද්‍ර වී නිර්මාණය වූ ජන සනත්වයක් නිර්මාණය කිරීම අපහසු වේ.

හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව හඳුනා ගන්නා ලද පරිසර සංවේදී ප්‍රදේශ රූපය 3.1 මඟින් පෙන්වා දී ඇති අතර ඊට සමගාමීව ඉඩම්වල මිල ගණන්වල ව්‍යාප්තිය සිතියම 5.16 මඟින් පෙන්වා දී ඇත.

### 2. *හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින ප්‍රධාන නගර ආශ්‍රිත නාගරික පහසුකම් හා ඇවිදීමට ඇති පහසුකම් විධිමත් පරිදී සංවිධානය නොවීම.*

හෝමාගම නව සංවර්ධන සැලැස්මේ දැක්ම යටතේ නිර්මාණය කිරීමට බලාපොරොත්තු වනුයේ හුදෙක් සාමාන්‍ය නගරයක් තුල දැකිය හැකි නේවාසික ප්‍රදේශයක් නිර්මාණය කිරීම නොවේ. හෝමාගම වූ කලි නව තාක්ෂණ විශ්වවිද්‍යාල හා පර්යේෂණවල නියැලී සිටින පිරිසකට අනාගත නේවාසික පහසුකම් සැපයීමට අදහස් කරන නගරයකි. සාර්ථක නේවාසික නගරයක් ආශ්‍රිතව දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ 8 ක් පිලිබඳ මෙහිදී සැලකිලිමත් වීම වැදගත්වේ. සැන් ෆ්‍රැන්සිස්කෝ හි සැලසුම් දෙපාර්තමේන්තු දත්ත අනුව සාර්ථක නේවාසික නගරයක් තුල පහත සඳහන් කරුණු අන්තර්ගත විය යුතුව තිබේ.

1. *Walk to Shops – වෙළඳ අවශ්‍යතා ඇවිදීමට පහසු දුරකින් පැවතීම*
2. *Safe Streets – ආරක්ෂාකාරී මාර්ග පැවතීම*
3. *Get around Easily – නගරයේ ඕනෑම අවශ්‍යතාවක් සඳහා පහසුවෙන් ළඟා විය හැකි බව*
4. *Housing Choice – විවිධ වර්ගයේ නිවාස තෝරාගැනීමට පවතින අවකාශය*
5. *Gathering Places – උද්‍යාන පහසුකම්*
6. *City Services – පොදු පහසුකම්*
7. *Special Character – නගරය ආශ්‍රිත සුවිශේෂී ලක්ෂණ මතු කර දැක්වීම*
8. *Part of Whole – ප්‍රධාන නගර සමග පවතින සම්බන්ධතාව*

**සිතියම 5.16 :** *ඉඩම් මිල ගණන් වල ව්‍යාප්තිය 2016 වර්ෂය හෝමාගම සැලසුම් ප්‍රදේශය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

සුවපහසු නේවාසික නගරයක් නිර්මාණය කිරීමට නම්, මෙම ලක්ෂණ යම්තාක් දුරකට හෝ එම නේවාසික ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්ත වී තිබිය යුතුය. නමුත් හෝමාගම නේවාසික නගරය දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වනුයේ, එහි පැවතිය යුතු ඉහත සඳහන් නාගරික ලක්ෂණ ප්‍රදර්ශනය නොවන බවයි.

හෝමාගම නව සංවර්ධන සැලැස්ම සකස්කිරීමට සමගාමීව 2017 / 11 / 08 දින පවත්වන්නට යෙදුනු පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමට අනුව අනාවරණය වූ කරුණු කිහිපයක් ලෙස ඉහත සඳහන් කරන සාර්ථක නේවාසික ලක්ෂණ දැකීමට නොහැකි බව හඳුනා ගත හැකි විය. විශේෂයෙන්ම ප්‍රවාහන පහසුකම් අතර ශක්තිමත් හා මහජනයාට පහසු සම්බන්ධතාවක් දක්නට නොලැබෙන බවත්, නේවාසිකයන්ට පයින් යාමට ඇති අවකාශය ඉතාමත් දුර්වල මට්ටමක පවතින බවත් හඳුනා ගත හැකි අතර එම ලක්ෂණ හෝමාගම, ගොඩගම, කහතුඩුව හා මීගොඩ යන නගර ආශ්‍රිතව ව්‍යාප්තව පවතින බවත් හඳුනා ගත හැකිය.

මෙහිදී හෝමාගම නගරය ආශ්‍රිත නාගරික පහසුකම්වල ව්‍යාප්තිය හා ඇවිදීමට ඇති පහසුකම්වල ස්වභාවය පහත රූපය 5.9 හා 5.10 මඟින් පෙන්වා දී ඇති අතර පවතින පොදු උද්‍යානවල ව්‍යාප්තිය සිතියම 5.15 මඟින් පෙන්වා දී ඇත.

***රූපය 5.9 :*** *හෝමාගම නගරයේ පිහිටීම හා එහි ව්‍යාප්තිය*




***මූලාශ්‍රය :*** *ගූගල් චන්ද්‍රිකා ඡායාරූප, 2018*

***රූපය 5.10 :*** *හෝමාගම නගරය - ආරක්ෂාකාරී හා ඇවිදීමට ඇති පහසුකම් අවම බව*




***මූලාශ්‍රය :*** *ගූගල් චන්ද්‍රිකා ඡායාරූප, 2018*

05 පරිච්ඡේදය
ශ.දු.අ.ත. (SWOT)
**විශ්ලේෂණය**

අරමුණ 02

අවස්ථා

# අවස්ථා (Opportunities)

යෝජිතව තිබු තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා ක්‍රියාත්මක කෙරුණු යටිතල පහසුකම් ව්‍යාපෘති හෝමාගම ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවලට අවශ්‍යය පසුබිම සකස් කල බවක් දක්නට ලැබේ. එමෙන්ම නව සංකල්පයක් යටතේ තාක්ෂණ නගරයක් නිර්මාණය කිරීමේදී සැලසුම්මය වශයෙන් කුමන අංශ කෙරෙහි විශේෂයෙන් අවධානය ලබා දිය යුතුද යන්න පිලිබඳ අවබෝධයක් ලැබිණි. ඒ අනුව හෝමාගම ප්‍රදේශය දියුණු කල හැකි විධි පිලිබඳ විශේෂ අවධානයක් මෙම සැලැස්ම හරහා යොමු කෙරිණි.

## 1. *යෝජිතව තිබු තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කරන නේවාසික ප්‍රමාණය ඉහල අගයක් ගැනීම. .*

හෝමාගම නව නගර සංවර්ධන සැලැස්මට අනුව, හෝමාගම ප්‍රදේශය තුල පැල්පත් නිවාස බිහි වීම වැළක්විය යුතු අතරම, පොහොසත්, බුද්ධිමත් නේවාසිකයන් පිරිසකට වාසස්ථානයක් විය යුතුය. ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම්, අඩු නේවාසික ව්‍යාප්තියක් පවතින තත්ත්වයක් තුළ ස්ථාපනය කිරීම සාර්ථක නොවන අතර තාක්ෂණ නගරයක් වැනි මහා පරිමාණ ව්‍යාපෘතියක් හරහා නේවාසික ප්‍රමාණය ඉහල දැමීමට අපේක්ෂා කිරීම විශේෂ අවස්ථාවක් ලෙස හඳුනා ගත හැකිය.

තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා ආකර්ෂණය කර ගැනීමට බලාපොරොත්තු වන නේවාසික ජන සංඛ්‍යාව 114,500 කි. මෙම නේවාසිකයන් පිරිස අවස්ථා තුනක් යටතේ ආකර්ෂණය කර ගැනීමට ක්‍රියාකරන බව පෙන්වා දිය හැකිය. අඩු ඝනත්ව නේවාසික කලාපය, මධ්‍ය ඝන්තව නේවාසික කලාපය හා වැඩි ඝනත්ව නේවාසික කලාපය වශයෙන් නේවාසිකයන් ආකර්ශනය කර ගැනීමේ වැඩ පිළිවෙලක් එහි දක්නට ලැබේ. තවද නිවාස වර්ග අනුව එහි බෙදී යාම අනුව ඉදි කිරීමට අපේක්ෂා කරන නිවාස ප්‍රමාණය පහත පරිදි සඳහන් කල හැක.

***වගුව 5.5 :*** *ඉදිකිරීමට අපේක්ෂිත නිවාස ප්‍රමාණය , 2030 - තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය*

| වර්ගීකරණය | ප්‍රදේශය (,000 වර්ග මීටර) | ප්‍රතිශතය | නිවාස ගණන |
|---|---|---|---|
| අධි ඝනත්ව නිවාස (මිශ්‍ර නිවාස) | 482 | 22.4 | 6,584 |
| අධි ඝනත්ව නිවාස (මහල් නිවාස) | 701 | 30.6 | 8,980 |
| මධ්‍ය ඝනත්වය නිවාස (නගර නිවාස) | 1,332 | 46.4 | 13,628 |
| අඩු ඝනත්ව නිවාස (වෙන්වූ නිවාස) | 117 | 0.6 | 188 |
| එකතුව | 2,632 | 100.0 | 29,380 |

***මූලාශ්‍රය :*** *විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ,2017*

## 2. *යෝජිත තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රැකියා අවස්ථා (22,600) හරහා ප්‍රදේශය සඳහා පවතින නේවාසික ආකර්ෂණය වර්ධනය විය හැකිවීම.*

තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ පුරෝකථනය කරන ලද ශ්‍රමිකයින් සංඛ්‍යාව 709,832 කි. ඔවුන් තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන පර්යේෂණ හා සංවර්ධන ආයතන, කර්මාන්ත, පාසල්, කාර්යාල සහ වාණිජ හා වෙළඳ යන සංවර්ධන ව්‍යාපෘති හරහා ආකර්ෂණය කර ගැනීමට අපේක්ෂා කර ඇත.

එම ශ්‍රමික ජන සංඛ්‍යාව අතුරින් දිනපතා රැකියාව සඳහා නගරයට පැමිණෙන ප්‍රමාණය 649,087 ක් බව ගණනය කර ඇත. මෙම ශ්‍රමික පිරිස මීගොඩ, මාහේනවත්ත, මාලඹේ හා දියගම යන ප්‍රදේශ ආශ්‍රිතව සිදුවන ව්‍යාපෘති පදනම් කරගෙන ගණනය කර ඇත.

ඒ අනුව අනාගතයේ මෙම ශ්‍රමික පිරිස අතුරින්, හෝමාගම නම නේවාසික ප්‍රදේශය ලෙස තෝරා ගැනීම සිදු විය හැකි අතර, එමගින් 2030 වර්ෂයේ නේවාසික ජන සංඛ්‍යාව සීග්‍රයෙන් ඉහළ යාමට ප්‍රබල අවස්ථාවක් සලසා දෙන බව හඳුනා ගත හැකිය.

*වගුව 5.6 : පුරෝකථනය කරන ලද ශ්‍රම බලකාය 2030 - තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය*

| වර්ගීකරණය | සමස්ත ක්‍රියකාරී ජනගහනය (පුද්ගලයින්) | තාක්ෂණ අංශයේ නේවාසික ජනගහනය (පුද්ගලයින්) | වාහන තදබදය ජනිත කිරීමට බලපාන ජනගහනය (පුද්ගලයින්) |
|---|---|---|---|
| නේවාසික ජනගහනය | 508,100 | - | 508,100 |
| පර්යේෂණ හා සංවර්ධන අංශය | 121,725 | 30,431 | 91,294 |
| කාර්මික පහසුකම් | 27,016 | 8,105 | 18,911 |
| පාසල් | 8,203 | 6,445 | 1,758 |
| රජයේ කාර්යාල | 14,342 | 3,586 | 10,756 |
| වාණිජ හා ව්‍යාපාරික පහසුකම් | 30,446 | 12,178 | 18,268 |
| **එකතුව** | **709,832** | **60,745** | **649,087** |

***මූලාශ්‍රය:*** *විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ,2017*

## අරමුණ 03 සමස්ත ප්‍රදේශයම ආවරණය කෙරුණු, කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක්

*මගුම 5.7 : SWOT විශ්ලේෂණය - අරමුණ 03*

### S — Strengths ශක්තීන්

- සංවර්ධනය සඳහා යොදාගත හැකි මට්ටමේ විශාල ඉඩම් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබීම හා සාපේක්ෂව එහි මිලගණන් අඩුමට්ටමකින් පැවතිම.
- හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව රජයට අයත් ඉඩම් නගරාශ්‍රිතව දක්නට ලැබීම හා ඒවා සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි වීම.

### W — Weaknesses දුර්වලතා

- නොදියුණු හා පටු අභ්‍යන්තර මාර්ග පද්ධතියක් පැවතීම හා මිනිසුන්ට පයින් ගමන් කිරීමට සුදුසු පරිසරයක් නගර ආශ්‍රිතව දක්නට නොලැබීම.
- වැඩිවන ජන සංඛ්‍යාවට සාපේක්ෂව ව්‍යාප්තව පවතින මූලික යටිතල පහසුකම් වන ජල පහසුකම්, විදුලිය පහසුකම්, ඝන අපද්‍රවය කළමනාකරණ පහසුකම්, මල අපද්‍රව්‍ය හා වැසි ජල කළමනාකරණ පහසුකම් ප්‍රමාණවත් නොවීම.

*සැකසුම: බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

# O

**Opportunities**
**අවස්ථා**

- හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති ප්‍රවාහන පහසුකම් සම්බන්ධ ව්‍යාපෘති හඳුනා ගත හැකි වීම.
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරමින් පවතින මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය
- ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති අරුවක්කාලු හා කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල.

# T

**Threats**
**තර්ජන**

- කොළඹ සිට හෝමාගම ප්‍රදේශය හා ප්‍රවේශ වීමට පවතින ප්‍රධාන මාර්ගයන්හි පවතින වාහන තදබදය.

## අරමුණ 03

**සමස්ත ප්‍රදේශයම ආවරණය කෙරුණු, කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක්**
An Efficient Infrastructure Network, Covering The Entire Area

## ශක්තීන් (Strengths)

### 1. *සංවර්ධනය සඳහා යොදාගත හැකි මට්ටමේ විශාල ඉඩම් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබීම හා සාපේක්ෂව එහි මිලගණන් අඩුමට්ටමකින් පැවතිම.*

සමස්ත ප්‍රදේශයම ආවරණය කෙරුණු, කාර්යක්ෂම යටිතල පහසුකම් පද්ධතියක් නිර්මාණය කිරීමේදී, එහි පවතින හිස් ඉඩම් වල ව්‍යාප්තිය ප්‍රධාන වශයෙන් බලපාන කරුණක් ලෙස සඳහන් කල හැකිය. හෝමාගම ප්‍රදේශය දෙස අවධානය යොමු කල විට, නව සංවර්ධන සැලැස්ම විශේෂයෙන්ම දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවකාශය සකස් කිරීම අපේක්ෂා කරයි. මන්ද ප්‍රදේශයේ බොහොමයක් යටිතල පහසුකම් සංවර්ධනය වීම, යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන නිසාවෙනි.

එලෙස මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යාමේදී, හෝමාගම වැනි නේවාසික කලාපයක් තුල, නේවාසිකයන්ට බලපෑමක් නොකර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හැකි පරිදි හිස් ඉඩම් ව්‍යාප්ත වී තිබීම ප්‍රදේශය ආශ්‍රිත ප්‍රබල ශක්තියක් ලෙස හඳුනා ගත හැකිය.

නවද කොළඹ දිස්ත්‍රික්කය තුල කොළඹ ප්‍රධාන නගරයට ආසන්නයෙන් එම ඉඩම් සාපේක්ෂව අඩු මිලකට ලබා ගත හැකි වීමද විශේෂයෙන් සඳහන් කල හැක.

***රූපය 5.11 :*** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට යෝජිත ඉඩම්*




***මූලාශ්‍රය:*** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය, 2018*

1. *හෝමාගම ප්‍රදේශය තුල රජයට අයත් ඉඩම් නගරාශ්‍රිතව දක්නට ලැබීම හා ඒවා සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි වීම.*

පෙර සඳහන් කල පරිදි හෝමාගම යනු එතරම් පොහොසත් නාගරික ලක්ෂණ ප්‍රදර්ශනය කරන නගරයක් නොවන අතර, ව්‍යාප්තව පවතින ප්‍රධාන නගර ආශ්‍රිතවද ග්‍රාමීය ලක්ෂණ ඉස්මතු කර දක්වයි. එනම් දැනට නගර වශයෙන් හඳුනාගෙන පවතින හෝමාගම, ගොඩගම, කහතුඩුව හා මීගොඩ යන නගර පසුබිම තුල වුවත් ග්‍රාමීය ලක්ෂණ මතු කරන, කුඩා සේවා මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මක වන බවක් දැකිය හැකිය.

ඒ අනුව 2031 නව සංවර්ධන සැලැස්ම අනුව ලක්ෂ 6 ක් දක්වා නේවාසික ජන සංඛ්‍යාව වර්ධනය කිරීමට අපේක්ෂා කරන තත්ත්වයක් තුළ එවැනි කුඩා සේවා මධ්‍යස්ථානවල පැවැත්ම ප්‍රමාණවත් නොවනු ඇත. එම සේවා මධ්‍යස්ථාන ප්‍රමාණවත් හා ගුණාත්මක, පොහොසත් පහසුකම් සපයන විශාල නගර ඒකකයන් බවට පත් වීම අවශ්‍ය වන අතරම, එම නගර නිර්මාණය වීම සඳහා භූමිය අවශ්‍ය වේ.

මේ තත්ත්වයන් තුළ, හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව, හෝමාගම නගරය හා ගොඩගම නගරයක් ආශ්‍රිතව, නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩම් හඳුනා ගත හැකි වීම, ප්‍රබල සාධකයක් ලෙස සඳහන් කල හැකිය.

***රූපය 5.12 :*** *හෝමාගම නව නගර සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශය*




***මූලාශ්‍රය :*** *ගූගල් චන්ද්‍රික ඡායාරූප, 2018*

***රූපය 5.13 :*** *ගොඩගම නව නගර සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශය*




***මූලාශ්‍රය:*** *ගූගල් චන්ද්‍රික ඡායාරූප, 2018*

# දුර්වලතා (Weaknesses)

## 1. *නොදියුණු හා පටු අභ්‍යන්තර මාර්ග පද්ධතියක් පැවතීම හා මිනිසුන්ට පයින් ගමන් කිරීමට සුදුසු පරිසරයක් නගර ආශ්‍රිතව දක්නට නොලැබීම.*

නේවාසික කලාපයක් ලෙස හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව පවතින වත්මන් තත්ත්වයට අනුව, ප්‍රධාන නගර හා ප්‍රදේශය අභ්‍යන්තරයේ පවතින මාර්ග පද්ධතිය පිළිබඳ සෑහීමකට පත් විය නොහැකිය. මෙහිදී අභ්‍යන්තර මාර්ග පද්ධතිය කෙරෙහි විශේෂ අවධානය යොමු වනුයේ, මාහේනවත්ත තාක්ෂණ නගර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම හරහාය. එමෙන්ම 2031 වර්ෂය වන විට මගින් 85,000 ක් පමණ වූ මගී ජන සංඛ්‍යාවක් හෝමාගම ප්‍රදේශය කරා ආකර්ෂණය වේයැයි පුරෝකතන කර ඇත. තවද නේවාසික ජන සංඛ්‍යාව ලක්ෂ 6ක් අපේක්ෂා කෙරේ.

ඒ අනුව සාර්ථක නේවාසික නගරයක් නිර්මාණය කිරීම උදෙසාත්, දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථක ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසාත් ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබෙන නොදියුණු හා පටු අභ්‍යන්තර මාර්ග පද්ධතිය ප්‍රබල දුර්වලතාවක් ලෙස හඳුනා ගත හැකිය.

තවද හෝමාගම සංවර්ධන සැලැස්ම සකස්කිරීමට සමගාමීව පවත්වන ලද පාර්ශවකරුවන්ගේ අදහස් විමසීමේ සමුළුවට අනුව හඳුනා ගැනීමට හැකි වූ කරුණක් ලෙසද මෙය හඳුන්වා දිය හැකි අතර ප්‍රදේශය ආශ්‍රිතව සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණයන්ට අනුව ඒ බව තහවුරු කල හැක.

හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව පවතින ප්‍රධාන අභ්‍යන්තර මාර්ගවල ස්වභාවය රූපය 5.14 මඟින් පෙන්වා දී ඇත.

***රූපය 5.14 :*** *ප්‍රදේශයේ පවතින මාර්ගයන්හි වර්තමාන තත්ත්වය*


උඩුවන මාර්ගය වත්මන් තත්වය


කහතුඩුව මාර්ගය වත්මන් තත්වය


ටෙම්පල්බර්ග් කර්මාන්ත කලාපය හරහා වූ ලේලන්ඩ් මාර්ගය


පාදුක්ක මාර්ගය


හෝමාගම නගරය තුල මහ ජනතාවට ඇවිදීමට ඇති පහසුකම් සපුරා නැති බව


ගොඩගම නගරය තුල මහ ජනතාවට ඇවිදීමට ඇති පහසුකම් සපුරා නැති බව

**මූලාශ්‍රය:** *Google Street View,2014*

2. *වැඩිවන ජන සංඛ්‍යාවට සාපේක්ෂව ව්‍යාප්තව පවතින මූලික යටිතල පහසුකම් වන, ජල පහසුකම්, විදුලිය පහසුකම්, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම්, මළ අපද්‍රව්‍ය හා වැසි ජල කළමනාකරණ පහසුකම් ප්‍රමාණවත් නොවීම.*



මෙහිදී විශේෂයෙන්ම තාක්ෂණ නගර ව්‍යාපෘතිය හරහා නිර්මාණය වන ජනගහනය පිළිබඳ වැඩි අවධානයක් යොමුකර ඇත. ඒ අනුව ජලය, විදුලිය හා මළ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා වන ඉල්ලුම පිලිබඳ අවධානය යොමු කර ඇත.

ඒ අනුව තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා 2030 වර්ෂයේදී ඇතිවිය හැකි ජලය සඳහා වන ඉල්ලුම, මළ අපද්‍රව්‍ය ජනනය වීම සහ විදුලිය සඳහා වන ඉල්ලුම සම්බන්ධ තොරතුරු වගුව 5.8, 5.9 හා 5.10 මඟින් පෙන්වා දී ඇත.

**වගුව 5.8 :** *පානීය ජලය සඳහා පුරෝකථනය කරන ලද ඉල්ලුම - 2030*

| | ප්‍රමාණය | ඒකකයක් සඳහා ජල සැපයුම (ලීටර) | නිර්මිත උපරිම දෛනික ජල සැපයුම (දිනකට ඝනමීටර ) | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| ගෘහස්ත ජලය | 150,337 (පුද්ගලයින්) | 198 (ඒකපුද්ගල දෛනික ජල අවශ්‍යතාව) | 29,767 | නාගරික |
| කාර්මික හා වාණිජමය ජලය | 5554.085 (වර්ග මීටර්) | 5 (ඒකපුද්ගල දෛනික ජල අවශ්‍යතාව) | 27,770 | ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය |
| **එකතුව** | | | **58,000 පමණ** | |

**මූලාශ්‍රය:** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

**වගුව 5.9 :** *පුරෝකතනය කරන ලද මල අපද්‍රව්‍ය නිර්මාණය වීම - 2030*

| | ප්‍රමාණය | ඒකකයක් සඳහා ජල සැපයුම (ලීටර) | නිර්මිත උපරිම දෛනික ජල සැපයුම (දිනකට ඝනමීටර ) |
|---|---|---|---|
| ගෘහස්ත අපජල ප්‍රමාණය | 150,337(පුද්ගලයින්) | 157 (ඒකපුද්ගල දෛනික අපජල නිෂ්පාදනය) | 23,603 |
| කාර්මික හා වාණිජමය අපජල ප්‍රමාණය | 5,554,085 (වර්ග මීටර) | 3.96 (ලීටර) | 21,994 |
| **එකතුව** | | | **46,000 පමණ** |

**මූලාශ්‍රය:** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

**වගුව 5.10 :** *විදුලිය සඳහා පුරෝකථනය කරන ලද ඉල්ලුම - 2030*

| විස්තරය | සංවර්ධනය කල හැකි මුළු ඉඩම් ප්‍රමාණය (වර්ග මීටර) | උපකල්පිත අගයන් (වර්ග මීටරයට කිලෝවොට් පැය) | ධාරිතාව (මෙගාවොට් ඇම්පියර්) | වෙනත් කරුණු |
|---|---|---|---|---|
| නව නිවාස ඉල්ලුම | 29378 (නිවාස) | 1.2 (නිවාස ඒකකයක් සඳහා කිලෝවොට්) | 43.1 | 77.8 |
| තොරතුරු තාක්ෂණ කලාපය | 2921082 | 35 | 125 | 225.7 |
| වාණිජ කලාපය | 362769 | 35 | 15.5 | 28 |
| මහජන පහසුකම් සැපයීම සඳහා වූ ප්‍රදේශ | 4322120 | 10 | 52.8 | 95.4 |
| අධ්‍යාපන පහසුකම් | 160594 | 20 | 3.9 | 7.1 |
| කාර්මික නිෂ්පාදන | 302743 | 35 | 13 | 23.4 |
| සමස්ත විදුලි පරිභෝජනය | | | 253.3 (පරිවර්තක ධාරිතාවය) | 457.4 (අපේක්ෂිත සමස්ත බලශක්ති භාවිතය 2030) |

**මූලාශ්‍රය:** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

එමෙන්ම තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා නිර්මාණය වෙතැයි පුරෝකථනය කරන ලද ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය දිනකට ටොන් 57 ක් පමණ වන අතර වර්තමානය තුල ඒවා බැහැර කිරීම සඳහා විධිමත් ඝන අපද්‍රව්‍ය කලමනාකරණ පද්ධතියක් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දක්නට නොලැබේ.

වසර 15 ක කාලයක් සිට දැනුම හා නවෝත්පාදනය පදනම් කරගත් ආයතන, ව්‍යාපෘති හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය තුළ ව්‍යාප්තව පවතින බවක් දක්නට ලැබේ. එමෙන්ම එම ආයතන හා ව්‍යාපෘති වටා විශාල ජනගහනයක් ඒකරාශී වී ඇති බවක් දක්නට ලැබේ. ඒ අනුව ක්‍රමක්‍රමයෙන් යටිතල පහසුකම් සඳහා පවතින ඉල්ලුම වැඩිවන බවක් දැකිය හැක. අනාගතයේදී නේවාසික වශයෙන් මෙම ප්‍රදේශය තුළ ඇතිවිය හැකි වෙනස්කම් අනුව තාක්ෂණ නගර ව්‍යාපෘතිය හරහා ඇතිවිය හැකි බලපෑම් දුර්වලතා ලෙස අනාගතයේදී ද ඇතිවිය හැකි බව හඳුනා ගත හැකිය.

## අවස්ථා (Opportunities)

### 1. *හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති ප්‍රවාහන පහසුකම් සම්බන්ධ ව්‍යාපෘති හඳුනා ගත හැකි වීම.*

යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව සංවර්ධනය කිරීමට හඳුනාගන්නා ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති පහත පරිදි පෙළගැස්විය හැකිය.

පවතින මාර්ගයන්හි පළල මීටර් 22 ක් දක්වා පුළුල් කිරීමේ ව්‍යාපෘති

- *කහතුඩුව මාර්ගය*
- *උඩුවන මාර්ගය*
- *පිටිපන තලගල මාර්ගය*
- *දම්පේ පිටිපන මාර්ගය*
- *මාකුඹුර බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය හා මාහේනවත්ත, මීගොඩ යා කෙරෙන යෝජිත විදුලි දුම්රිය මාර්ගය*
- *කහතුඩුව අන්තර් හුවමාරුව හා රත්නපුර නගරය යාකර ඉදිකිරීමට යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය*
- *හෝමාගම දියගම මාර්ගය*
- *කොට්ටාව තලගල මාර්ගය*

එම මාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති සිතියම 5.17 හා සිතියම 5.18 මඟින් පෙන්වා දී ඇත.

***සිතියම 5.17 :*** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට හඳුනා ගන්නා ලද මාර්ග*




***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**සිතියම 5.18 :** හෝමාගම නගරය හා අනෙකුත් ප්‍රධාන නගර යා කරමින් සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග සංවර්ධන ව්‍යාපෘති



***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 2. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකරමින් පවතින මාකුඹුර බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය



*රූපය 5.15 : මාකුඹුර බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය*




***මූලාශ්‍රය:*** *https://www.pressreader.com*

කොට්ටාව මාකුඹුර බහුවිධ ප්‍රවාහන සේවා මධ්‍යස්ථානය හා හෝමාගම නගරය අතර දුර ප්‍රමාණය කිලෝමීටර 3 ක් පමණ වේ. හෝමාගම නගරය හා අනෙකුත් ප්‍රාදේශීය නගර අතර කාර්යක්ෂම ප්‍රවාහන සම්බන්ධතාවක් ඇති කිරීමට මෙම ව්‍යාපෘතිය ප්‍රබල අවස්ථාවක් වන බව මෙහිදී සඳහන් කල හැක. විශේෂයෙන්ම දකුණු අධිවේගී මාර්ගය හා කැළණි වැලි දුම්රිය මාර්ගය, හයිලෙවල් මාර්ගය හා යෝජිත විදුලි දුම්රිය මාර්ග පද්ධතිය අතර ශක්තිමත් සම්බන්ධතාවක් නිර්මාණය කරන අතරම සියලුම ප්‍රවාහන අවශ්‍යතා එකම ප්‍රවේශයකින් සපුරාලීම හරහා හෝමාගම ප්‍රදේශය තුල පවතින අතුරු මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමට අවධානය යොමු වීම මේ හරහා සිදු විය හැක.

## 3. ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති අරුවක්කාලූ හා කරදියාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල.

හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව පවතින ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල පිලිබඳ අවධානය යොමු කිරීමේදී, එය මනා කළමනාකරණයට යටත් වූ ක්‍රියාවලියක් නොවන බව හඳුනා ගත හැකිය. එවැනි ප්‍රාදේශීය රාමුවක් තුල කොළඹ මහා නගර සභා බල ප්‍රදේශය කේන්ද්‍රකොට ගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත කරදියාන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සුවිශේෂී අවස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකිය. ප්‍රදේශය තුලින් දිනකට උත්පාදනය කෙරෙන ඉක්මනින් දිරපත්වන කැලිකසල ටොන් 140 ක ප්‍රමාණයක් බැහැර කිරීමට මෙමගින් අවස්ථාව උදාවනු ඇත.

එමෙන්ම පුත්තලම ප්‍රදේශයේ අරුවක්කාලු සන අපද්‍රව්‍ය බැහැරකරලීමේ ව්‍යාපෘතිය ද මෙහිදී ප්‍රධාන අවස්ථාවක් ලෙස හඳුන්වා දිය හැකිය. මෙම ව්‍යාපෘතියට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ උද්ගතව පවතින කැලිකසල බැහැර කරලීමේ ප්‍රශ්නයට දිර්ඝකාලින හා සුරක්ෂිත කසල බැහැර කරලීමේ ක්‍රම වේදයක් ලෙස ක්‍රියාත්මක කල හැකි වීම හා හෝමාගම ප්‍රදේශයේද ලක්ෂ 6 ක් දක්වා වර්ධනය කිරීමට බලාපොරොත්තුවන ජන සංඛ්‍යාව තුලින් නිර්මාණය විය හැකි කසල බැහැර කරලීමට අවකාශයක් සපයන අවස්ථාවක් ලෙසද හඳුනා ගත හැකිය.

***රූපය 5.16 :*** *අරුවක්කාලු ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය*




**මූලාශ්‍රය:** *http://www.dailynews.lk/2017/06/27/local/120173/puttalam-landfill-ready-2019*

# තර්ජන (Threats)

## 1. *කොළඹ සිට හෝමාගම ප්‍රදේශය හා ප්‍රවේශ වීමට පවතින ප්‍රධාන මාර්ගයන්හි පවතින වාහන තදබදය.*

හෝමාගම ප්‍රදේශය සාර්ථක නේවාසික කලාපයක් බවට පත්වීමට නම් ඒ හා ඍජුව සම්බන්ධවීමට පවතින ප්‍රධාන මාර්ග පද්ධතිය නිසැකවම හේතුවනු ඇත. විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය ලෙස සැලකෙන කොළඹ නගරය හා සම්බන්ධවීමට පවතින මහා මාර්ග පද්ධතිය හා එහි තත්ත්වය ප්‍රධාන වශයෙන් බලපානු ඇත. හෝමාගම තුල දැනුම් කේන්ද්‍රික නගරය ස්ථාපිත කිරීම හරහා, රටේ ආර්ථික තත්ත්වය නගා සිටුවීමට යන අවස්ථාවක, හෝමාගම හා කොළඹ නගරය අතර පවතින ප්‍රවාහන පද්ධතියේ තත්ත්වය නිසැකවම බල පවත්වනු ඇත.

ඒ අනුව වර්තමානයේ කොළඹ නගරය හා සම්බන්ධවීමට පවතින ප්‍රධාන මාර්ගවල පවතින වාහන තදබදය හෝමාගම ප්‍රදේශයේ සංවර්ධනයට යම්තාක් දුරකට තර්ජනයක් ලෙස හඳුන්වා දිය හැකිය.

*__වගුව 5.11 :__ කොළඹ නගරයේ සිට දිවෙන ප්‍රධාන මාර්ගවල පවතින වාහන තදබදය*

| කොරිඩෝව | උච්ච පැය මාර්ග තදබදය (වාහන) | පැයකට ධාරිතාවය (වාහන) | වෙනස (වාහන) |
|---|---|---|---|
| මාලබේ කොරිඩෝව | 5100 | 4400 | -700 |
| මහනුවර කොරිඩෝව | 4400 | 3300 | -1100 |
| මීගමුව කොරිඩෝව | 4000 | 4400 | +400 |
| ගාලු කොරිඩෝව | 2900 | 2300 | -600 |
| ලෝලෙවල් කොරිඩෝව | 2900 | 2200 | -700 |
| හොරණ කොරිඩෝව | 2200 | 2300 | +100 |
| හයිලෙවල් කොරිඩෝව | 2000 | 2300 | +300 |

***මූලාශ්‍රය:*** *COM Trans අධ්‍යනය, ORIENTAL CONSULTANTS CO., LTD.,2014*

# අරමුණ (04) විද්‍යාව හා තාක්ෂණය පදනම් කර ගත් නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා සේවා තිරයක්

*සගුව 5.12 : SWOT විශ්ලේෂණය - අරමුණ 04*

## S — Strengths ශක්තීන්

- වර්තමානයේ ක්‍රියාත්මකව පවතින ටෙම්පල්බර්ග් කර්මාන්ත කලාපය යෝජිත සේවා තිරය තුල පිහිටා තිබීම. (වර්තමාන තත්ත්වය තුල කර්මාන්ත 30ක් පමණ ක්‍රියාත්මක වේ)
- වර්තමානයේ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව සිටින මුළු ශ්‍රම බලකාය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 40% වන අතර ඉන් 30% වෘත්තිකයන් වීම.
- සංවර්ධනය සඳහා යොදාගත හැකි විශාල ඉඩම් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබීම හා ඒවා මිනිසුන් වාසය කරන ඉඩම් නොවීම.
- වත්මන් තත්ත්වය තුල යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය තුල දක්නට ලැබෙන තාක්ෂණ සංවර්ධනයන් හා සමගාමී පහසුකම්.

## W — Weaknesses දුර්වලතා

- යෝජිත සේවා තිරය නගර කලාපය තුල සාපේක්ෂව ඉහල නිවාස ඝනත්වයක් දක්නට ලැබීම.
- යෝජිත සේවා තිරය නගරයට සේවා පහසුකම් සැපයීමට සමත්, පොහොසත් නගරයක් එම කලාපය තුල දක්නට නොලැබීම.
- සේවා තිරය නගර ක්‍රියාකාරීත්වය සඳහා පවතින මහා මාර්ග හා ප්‍රවාහන පහසුකම් වල කාර්යක්ෂම බව ප්‍රමාණවත් නොවීම.
- යෝජිත තාක්ෂණ නගරය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින බොහොමයක් ඉඩම්වල අයිතිය පෞද්ගලික අංශය සතු වීම.
- යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය හා සමගාමී ව්‍යාපාරික ප්‍රජාව ආකර්ෂණය කර ගැනීමට සමත් කර්මාන්ත හා සේවා ආයතන එම කලාපය තුල මේවනවිට ව්‍යාප්තව නොපැවතීම.

*සැකසුම: බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## O

**Opportunities**
**අවස්ථා**

- යෝජිත මීගොඩ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය.
- හෝමාගම හා අනෙකුත් ප්‍රාදේශීය නගර යා කෙරෙමින් ඉදිකිරීමට යෝජිත මහා මාර්ග හා දුම්රිය ප්‍රවාහන පහසුකම් පද්ධතිය
- හෝමාගම නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය සාර්ථකත්වයට පත්කර ගැනීම උදෙසා, ආර්ථික හා ව්‍යාපාර කලාපයක් නිර්මාණය කිරීමට යෝජනා වී තිබීම.
- යෝජිත තාක්ෂණ නගර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට අදහස් කෙරෙන කර්මාන්ත කලාපය හා පර්යේෂණ කලාපය.
- තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිත ජල සැපයුම් මධ්‍යස්ථානය, විදුලි සැපයුම් මධ්‍යස්ථානය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා මල අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල.

## T

**Threats**
**තර්ජන**

- දැනුම් කේන්ද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතිය ඉදි කිරීම සම්බන්ධයෙන්, නේවාසික ප්‍රජාවගෙන් ඇති විය හැකි දැඩි විරෝධතා
- දේශපාලන අස්ථාවරතා මත දැනුම හා නවෝත්පාදනය පදනම් කරගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍යය පසුබිම වෙනස් කිරීම.

# අරමුණ 04

විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නවෝත්පාදන හා සේවා සඳහා තාක්ෂණ තිරයක්
Promote a Tech Corridor, Accommodating High Tech Industries and Service

නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය නගරයක් (Innovation and knowledge centric city) යන්න ශ්‍රී ලංකාවේ නගර සංවර්ධන සංවර්ධන සංකල්පයට, ඇතුලත් වන අලුත් සංකල්පයක් ලෙස හැඳින්වීමට පුළුවන. නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය නගරයක් යන්න හුදෙක්, යටිතල පහසුකම් සැපයීමෙන් හා විශ්ව විද්‍යාල හා අනෙකුත් පර්යේෂණ ආයතන ඉදි කල පමණින්, පැවැත්ම තහවුරු කල හැකි ක්‍රියාවලියක් බව හඳුනා ගැනීමට නොහැකිය. මෙහි සාර්ථකත්වය උදෙසා, එහි පැවැත්ම තහවුරු කරන මූර්ත දේපල, මූල්‍ය දේපල, දල දේශීය නිෂ්පාදිතය, රැකියා අවස්ථා, තාක්ෂණ උපකරණ, වෙළඳපොල, මූල්‍ය ආයතන, සේවා ආයතන යන සියල්ලන්ගේ ක්‍රියාකාරිත්වය සාර්ථකත්වයට පත්කළ යුතුය.

නවෝත්පාදන සඳහා අත්‍යාවශ්‍ය සංවර්ධන පසුබිම හා එමගින් බිහි වන භූමිය ඇතුළු යටිතල පහසුකම් සඳහා වන ඉල්ලුමට සරිලන ධාරිතාව සකස් කිරීම සඳහා සැලසුම්මය වශයෙන් අවශ්‍යය පියවර ගැනීම අත්‍යාවශ්‍ය වීම මෙම සැලැස්ම යටතේ අවධානට යොමු කර ඇත.

ඒ අනුව නවෝත්පාදන රැගත් දැනුම් කේන්ද්‍රිය නගරයක් නිර්මාණය කිරීමට යාමේදී ඒ සඳහා අවශ්‍යය ජානික පරිසරය නිර්මාණය කිරීම සඳහා අවශ්‍යය කරුණු සම්බන්ධයෙන් මෙහිදී විශේෂ අවධානය යොමු කල යුතුය. National Innovative Capacity (MICHAEL E. PORTER, Harvard Business School and Director, Institute for Strategy and Competitiveness, SCOTT STERN, Northwestern University and the Brookings Institution) සඟරාවට අනුව එම කරුණු පහත පරිදි පෙළගැස්විය හැකිය.

සාධක (ආදාන) කොන්දේසි

1. *උසස් තත්වයේ මානව සම්පත් – විශේෂයෙන්ම විද්‍යාත්මක, තාක්ෂණික හා කළමනාකරණ නිලධාරීන්*
2. *ශක්තිමත් මූලික පර්යේෂණ යටිතල පහසුකම් විශ්වවිද්‍යාල*
3. *උසස් තත්ත්වයේ තොරතුරු යටිතල*
4. *අවදානම් ප්‍රාග්ධනය සඳහා විශාල සැපයුමක්*
5. *නවීන තාක්ෂණය සඳහා දේශීය පාරිභෝගිකයන්ගේ ඉල්ලුම*
6. *දක්ෂ දේශීය සැපයුම්කරුවන් සහ අදාල සමාගම් පැවතීම*
7. *හුදෙකලා කර්මාන්ත වෙනුවට කර්මාන්ත පොකුරු නිර්මාණය කිරීම*
8. *පුද්ගලික අංශයේ උපාය මාර්ග සහ රාජ්‍ය අංශයේ ප්‍රතිපත්ති අතර අන්තර් ක්‍රියාකාරිත්වය*

මෙම සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවට නව මුහුණුවරක්, අත්දැකීමක් වන හෙයින්, ඉහත සඳහන් ලක්ෂණ පදනම් කරගෙන මෙම විශ්ලේෂණය සිදු කල බව සඳහන් කල යුතුය.

# ශක්තීන් (Strengths)



1. *වර්තමානයේ ක්‍රියාත්මකව පවතින ටෙම්පල්බර්ග් කර්මාන්ත කලාපය යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය තුල පිහිටා තිබීම (වර්තමාන තත්ත්වය තුල කර්මාන්ත 30ක් පමණ ක්‍රියාත්මක වේ).*

***රූපය 5.17 :*** *හෝමාගම සංවර්ධන සැලසුම් සංකල්පය 2022–2031*




***මූලාශ්‍රය:*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

ඉහතින් දක්වා ඇත්තේ නව හෝමාගම සංවර්ධන සැලැස්මේ (2022–2031) සැලසුම් සංකල්පයයි. ඊට අදාලව යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය හා වර්තමානයේ ක්‍රියාත්මක වන ටෙම්පල්බර්ග් කර්මාන්ත කලාපය එම කලාපය තුල ක්‍රියාත්මක වේ. නාගරික සංවර්ධන අධිකාරිය සතු ටෙම්පල්බර්ග් කර්මාන්ත කලාපය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වූ ලිපි ගොනු දත්තයන්ට අනුව හා 2017/11/08 දින පැවැත්වූ පාර්ශවකරුවන්ගේ සමුළුවට අනුව එහි කර්මාන්ත 30 ක් පමණ ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම එම කර්මාන්ත කලාපය ආශ්‍රිතව ලේලන්ඩ් වාහන නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාව වැනි තාක්ෂණික නිපැයුම් හා බැඳුනු කර්මාන්ත ව්‍යාප්තව පැවතීම විශේෂත්වයක් ලෙස දැක්විය හැක.

### 2. වර්තමානයේ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව සිටින මුළු ශ්‍රම බලකාය මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 85% වන අතර ඉන් 45% වෘත්තිකයන් වීම.

සම්පත් පැතිකඩ වාර්තාව 2019 වර්ෂයට අදාල දත්ත අනුව හෝමාගම ප්‍රාදේශීය සභා ඒකකයේ මුළු ජනගහනය 279,236 පමණ වේ. එම ප්‍රදේශය ආශ්‍රිත ශ්‍රම බලකාය (176,300) මුළු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස 45% ක් පමණ වේ. සම්පත් පැතිකඩ වාර්තා දත්ත අනුව, රැකියාවන්ගේ ස්වභාවය අනුව ප්‍රදේශයේ ව්‍යාප්තව සිටින වෘත්තිකයන් ප්‍රමාණය (වගුව 5.13 ) ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස ගත් විට 60% ක අගයක් වීම ප්‍රදේශය සතු ප්‍රබල ලක්ෂණයක් ලෙස හඳුනා ගත හැකිය. තාක්ෂණ නගරයක් නිර්මාණය කිරීම හමුවේ, ප්‍රදේශය ආශ්‍රිතව දැනුමෙන් හා උගත්කමින් සන්නද්ද ශ්‍රමික පිරිසක් සිටීම ප්‍රබල සාධකයක් ලෙස හඳුන්වා දිය හැකිය.

*වගුව 5.13 : රැකියාවල ස්වභාවය අනුව සේවා නියුක්තිය - හෝමාගම ප්‍රදේශිය සභාව*

| රාජ්‍ය අංශය | පෞද්ගලික අංශය | කෘෂි-කාර්මික | කාර්මික | සේවා සහ විකුණුම් සේවකයන් | ස්වයං රැකියා | කුලී වැඩ | විදේශ රැකියා | අර්ධකාලින රැකියා | අර්ධ රාජ්‍ය අංශය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 13.4% | 36% | 5% | 3% | 4% | 6% | 5% | 2% | 4% | 5% |

***මූලාශ්‍රය:** සම්පත් පැතිකඩ වාර්තාව 2019*

### 3. සංවර්ධනය සඳහා යොදාගත හැකි විශාල ඉඩම් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබීම හා ඒවා මිනිසුන් වාසය කරන ඉඩම් නොවීම.

කලින් සඳහන් කල දත්තයන්ට අනුව හෝමාගම ප්‍රබල නේවාසික කලාපයක් ලෙස හඳුනා ගත හැකිය. එම නේවාසික කලාපය තුල නේවාසික භාවිතයන්ගෙන් පරිබාහිරව, සංවර්ධනය සඳහා යොදාගත හැකි විශාල ප්‍රමාණයේ ඉඩම් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව හඳුනාගත හැකි වීම ප්‍රබල ශක්තියක් ලෙස සටහන් කල හැකිය. සංවර්ධන සංකල්පය යටතේ හඳුනා ගැනෙන තාක්ෂණ තිරය තුල මෙම ඉඩම් දක්නට ලැබීමත්, ඒවා බොහොමයක් රබර් ඉඩම් වීමත් මෙහි විශේෂත්වයක් ලෙස සටහන් කල හැක. සිතියම 5.5 අනුව එම ඉඩම්වල ස්වභාවය පෙන්වා දී ඇත.

සිතියම 5.5 අනුව, යෝජිත තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, ගොඩනැගිලි ඝනත්වය අඩු ප්‍රදේශ තුල විහිදී ඇති අතර, භූමි පරිහරණ දත්ත අනුව එම ව්‍යාපෘතීන් නේවාසික භාවිතයන්ගෙන් මිදුණු හරිත ප්‍රදේශ හා කළුගල් ව්‍යාප්තව පවතින ප්‍රදේශ අවකාශ කරගෙන ඇති බව පැහැදිලි කල හැකිය.

ඒ අනුව මෙම තාක්ෂණ තීරය ශක්තිමත් කිරීමට අවශ්‍ය ව්‍යාපාරික ප්‍රජාව හා ආයතන, කර්මාන්ත, පර්යේෂණ ආයතන හා අධ්‍යාපන ආයතන ඒකරාශී කිරීමට හැකි ලෙස හිස් ඉඩම් ව්‍යාප්තව පැවතීම ප්‍රබල ශක්තියක් ලෙස හඳුන්වා දිය හැකිය.

4. *වර්තමානයේදී යෝජිතව තිබූ තාක්ෂණ නගර කලාපය තුල දක්නට ලැබෙන දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධනයට සමගාමී පහසුකම්.*

මෙහිදී විශේෂ අවධානය, හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව ඇති, අධ්‍යාපන ආයතන, පර්යේෂණ හා සංවර්ධන ආයතන හා අනෙකුත් පොදු අධ්‍යාපන ආයතන සඳහා යොමු කර ඇත.

***රූපය 5.18 :*** *වර්තමානයේ තාක්ෂණ නගර කලාපය තුල ව්‍යාප්තව පවතින පහසුකම්*




***මූලාශ්‍රය:*** *Master Plan For Science & Technology Based New Town Of Colombo, Sri Lanka,2017*

05 පරිච්ඡේදය
ශ.දු.අ.ත. (SWOT) විශ්ලේෂණය

අරමුණ 04

ශක්තීන්

- NSBM හරිත විශ්ව විද්‍යාලය




මෙම ආයතනය නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය (Ministry of Skills Development and the Vocational Training) යටතේ පිහිටුවා ඇත. මෙම ආයතනය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (University Grant Commission) යටතේ පිළිගත් ස්වදේශීය හා අන්තර්ජාතික වශයෙන් පිළිගැනීමට ලක්වන කළමනාකරණ, පරිසනක, ඉංජිනේරු හා වෙනත් උපාධි පිරිනැමීමට සුදුසුකම් ලබා ඇත. දැනට ශිෂ්‍යයින් 9000ක් පමණ ප්‍රථම උපාධි, උසස් උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලා හදාරනු ලබන අතර ඇමරිකාව, ඔස්ට්‍රේලියා සහ මැලේසියා (UK, Australia සහ Malaysia) විශ්ව විද්‍යාල සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. ක්‍රියාත්මක වන ප්‍රධාන අධ්‍යාපන පීඨ ලෙස, ව්‍යාපාර කළමනාකරණ පීඨය හා පරිසනක ඉංජිනේරු පීඨය හඳුනා ගත හැකිය.

- මහින්ද රාජපක්ෂ ජාතික පාසල

මෙම පාසලේ අධ්‍යාපන කටයුතු 6 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා ඉගැන්වීම් සිදු කරන අතර පුස්තකාල පහසුකම්, පරිසනක පහසුකම්, තාක්ෂණික විද්‍යාගාර පහසුකම්, ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් සිදුකරන පරිසණක පහසුකම්, විද්‍යාව පදනම් කරගත් විද්‍යාගාර පහසුකම් හා ක්‍රීඩා පහසුකම් සලසා ඇත.

*රූපය 5.19 : මහින්ද රාජපක්ෂ ජාතික පාසල*




***මූලාශ්‍රය:** විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම,2017*

• ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC)



අන්තර් ජාතිකමය වශයෙන් වැදගත්කමක් උසුලන නැනෝ තාක්ෂණය හා සමගාමී පර්යේෂණයන් සිදු කිරීම සඳහා මෙම ආයතනය 2008 වර්ෂයේදී ස්ථාපිත කර ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය හා පෞද්ගලික ආයතන කිහිපයක් ඒකාබද්ධ වී ස්ථාපිත කර ඇති මෙම ආයතනය නැනෝ තාක්ෂණය පදනම් කර ගත් වෙළඳ භාණ්ඩ නිපදවීම අරමුණු කරගෙන ක්‍රියා-ත්මක වේ. තවද මෙම ආයතනය සමග බද්ධ වී සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන විද්‍යා උද්‍යානය (Science Park) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කල හැකිය.

• ශ්‍රී ලංකා ටෙලිකොම් දත්ත මධ්‍යස්ථානය (SLT Data Center)



**මූලාශ්‍රය:** *SLT Website (http://www.slt.lk)*

මෙම දත්ත මධ්‍යස්ථානය Tier3 වර්ගයේ දත්ත මධ්‍යස්ථානයක් වන අතර සන්නිවේදනය සඳහා වූ යටිතල පහසුකම් සැපයීම සඳහා ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස සඳහන් කල හැකිය. වැලිකඩ ශ්‍රී ලංකා ටෙලිකොම් ප්‍රධාන දත්ත මධ්‍යස්ථානය සමග සෘජු සම්බන්ධතා පවත්වන මෙම ආයතනය දත්ත පහසුකම් (Data Hosting) හා තරඟකාරී මිල ගණන් (Competitive Price Packages) සඳහා ප්‍රධාන වශයෙන් පහසුකම් සපයනු ලබයි.

# දුර්වලතා (Weakneses)

### 1. *යෝජිත දැනුම් කේන්ද්‍රික නගර කලාපය තුල සාපේක්ෂව ඉහල නිවාස ඝනත්වයක් දක්නට ලැබීම.*

***සිතියම 5.19 :*** *යෝජිත දැනුම් කේන්ද්‍රික කලාපය තුල පවතින ඉහල නිවාස ඝනත්වය*




**මූලාශ්‍රය:** *COM Trans අධ්‍යනය, ORIENTAL CONSULTANTS CO., LTD.,2014*

ඉහත පෙන්වා දී ඇත්තේ සංවර්ධන සැලැස්ම 2022–2031 සැලැස්ම මගින් හඳුනා ගැනුණු නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය තුල ව්‍යාප්තව පවතින නිවාස ඝනත්වයේ ස්වභාවයයි. ඒ අනුව යෝජිත තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හා මීගොඩ ඉලෙක්ට්‍රොනික් කර්මාන්ත කලාපය ආශ්‍රිතව ඉහල නිවාස ඝනත්වයක් පෙන්නුම් කරන බව පැහැදිලි වේ. එහි හෙක්ටයාර 1 කට නිවාස 400 ත් 1000 ත් අතර ප්‍රමාණයක් වන බව හඳුනා ගත හැකිය.

ඒ අනුව එවැනි ඉහල නිවාස ඝනත්වයක් පවතින තත්ත්වයක් තුල, නේවාසිකයන් නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය සංවර්ධනයකට යොමු කරවීම හා ඉඩම් සංවර්ධනය සඳහා යොදාගැනීම තරමක් අපහසු තත්ත්වයක් නිර්මාණය කරනු ඇත. මෙය එම ප්‍රදේශය ආශ්‍රිත ප්‍රබල දුර්වලතාවක් බව සඳහන් කල හැක.

### 2. *යෝජිත දැනුම් කේන්ද්‍රීය නගරයට සේවා පහසුකම් සැපයීමට සමත්, පොහොසත් නගරයක් එම කලාපය තුල දක්නට නොලැබීම.*

ලෝකයේ ක්‍රියාත්මක තාක්ෂණ නගර කෙසේ වෙතත් ආසියාවේ දක්නට ලැබෙන ප්‍රධාන තාක්ෂණ නගර දෙස අවධානය යොමු කිරීම මෙහිදී අත්‍යවශ්‍යය වේ.

*රූපය 5.20 : සිංගප්පූරුව තාක්ෂණ නගරය*



*රූපය 5.21 : ක්වාලාලම්පූර් සහ මැලේසියාව*



***මූලාශ්‍රය:*** *www.techinasia.com/startup-scenes-asia-lets-11-asias-top-tech-cities*

*රූපය 5.22 : වෙළඳ කලාපය ගුරාගන් නගරය*



*රූපය 5.23 : චීනය වෙළඳ නගරය*



***මූලාශ්‍රය:*** *https://edition.cnn.com/2018/04/22/world/osm-gurgaon-india-tech-hub/index.html, https://www.techinasia.com/chinas-2ndtier-tech-hubs*

සිංගප්පූරුව, ටෝකියෝ, ජපානය, බෙල්ජියම සහ ෂැංහයි, චිනය, ක්වාලාලම්පූර්, මැලේසියාව, තායිපේ, තායිවාන්, හොංකොං, සියාවුල්, දකුණු කොරියාව, ජකාර්තා, ඉන්දුනීසියාව, බැංකොක්, තායිලන්තය, හනොයි, හො චි මින් සිටි, වියට්නාමය, මැනිලා, පිලිපීනය, ඉන්දියාව සහ පාකිස්ථානය යන නගර ආසියාවේ ක්‍රියාත්මක වන ප්‍රධාන තාක්ෂණ නගර ලෙස හඳුනා ගත හැකිය.

ඒ අනුව යෝජිත හෝමාගම නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය තුල එවැනි නාගරික පසුබිමක් දක්නට නොලැබීම ප්‍රබල දුර්වලතාවක් ලෙස හඳුනාගත හැකිය. එම කලාපය තුල ගොඩගම නගරය දක්නට ලැබුනද එහි ඉහත සඳහන් කල ලක්ෂණ දක්නට නොලැබෙන අතර එහි සැලසුම්මය වශයෙන් සංවිධානය නොවුණු ආකාරයක් දැකිය හැකිය.

### 3. *යෝජිත දැනුම් කේන්ද්‍රිය නගරය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින බොහොමයක් ඉඩම්වල අයිතිය පෞද්ගලික අංශය සතු වීම.*

මෙහිදී දක්නට ලැබෙන තවත් එක් ප්‍රබල දුර්වලතාවක් ලෙස ප්‍රදේශය ආශ්‍රිත බහුතර ඉඩම් අයිතිය පෞද්ගලික අංශය සතුවීම හඳුන්වා දිය හැකිය. තාක්ෂණ නගර ව්‍යාපෘතිය යටතේ, දැනට හඳුනා ගෙන පවතින බොහොමයක් ඉඩම් නේවාසිකයන්ට අයත් ඉඩම් වන අතර, ඒවා සංවර්ධනය සඳහා යොදා ගැනීමේදී රජයට පවරා ගැනීමක් සිදුවිය යුතු අතර ඒ සඳහා වන්දි ගෙවීමක් සිදුවිය යුතුය. ඒ අනුව එය සංවර්ධන කටයුතු සඳහා පවතින ප්‍රබල බාධකයක් බව සඳහන් කල හැකිය.

*වගුව 5.14 : ඉඩමේ අයිතියේ ස්වභාවය පිලිබඳ විස්තර*

| ඉඩම් වර්ගය | පවුල් ගණන |
|---|---|
| සින්නක්කර ඉඩම් | 50030 |
| මාධ්‍ය පාන්තික ඉඩම් | 3647 |
| බලපත්ලාභී ඉඩම් | 548 |
| අනවසර ඉඩම් | 517 |
| ජයභූමි ඉඩම් | 857 |
| විහාර දේවාල සතු ඉඩම් | 110 |
| ඉඩම් ප්‍රතිපත්ති හා කොමිෂන් සභාව සතු (LRC) ඉඩම් | 382 |
| ඉඩම් නොමැති | 2402 |
| රජයේ ඉඩම් | 117 |
| වෙනත් | 520 |
| එකතුව | 59130 |

## ඉඩම් අයිතියේ ස්වභාවය පිළිබඳ විස්තර



සින්නක්කර ඉඩම් 50030
මාධ්‍ය පාන්තික ඉඩම් 3647
බලපත්ලාභී ඉඩම් 548
අනවසර ඉඩම් 517
ජයභූමි ඉඩම් 857
විහාර දේවාල සතු ඉඩම් 110
ඉඩම් ප්‍රතිපත්ති හා කොමිෂන් සභාව (LRC)සතු ඉඩම් 382
ඉඩම් නොමැති 2402
රජයේ ඉඩම් 117
වෙනත් 520
එකතුව 59130

***මූලාශ්‍රය:** සම්පත් පැතිකඩ 2016*

### 4. *යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය හා සමගාමී ව්‍යාපාරික ප්‍රජාව ආකර්ෂණය කර ගැනීමට සමත් කර්මාන්ත හා සේවා ආයතන එම කලාපය තුල ව්‍යාප්තව නොපැවතීම.*

හොමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සකස් කරන ලද සම්පත් පැතිකඩ වාර්තාවට අනුව (2016) පෙළගස්වන ලද ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලයේ (BOI) අනුමැතිය සහිත කර්මාන්ත ව්‍යාප්තිය හා ප්‍රදේශය ආශ්‍රිත මහා පරිමාණ කර්මාන්ත ව්‍යාප්තිය දෙස අවධානය යොමු කිරීම මෙහිදී වැදගත් වේ. ඒ අනුව පානිය ජලය බෝල්තල් කිරීම, බිම වර්ග නිෂ්පාදනය කිරීම, කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන, ගල්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, කෘෂි රසායනික ද්‍රව්‍ය, ඇඟලුම් හා පොලිතින් නිෂ්පාදනය වැනි කර්මාන්ත

ව්‍යාප්තියක් එහි දක්නට ලැබේ. තවද අන්තර්ජාතික වශයෙන් නමක් දිනු බ්‍රැන්ඩික්ස්, මාස්, හේලීස් (Brandix, Mass, Hayleys) වැනි කර්මාන්ත හෝ සේවා මධ්‍යස්ථාන ව්‍යාප්ත නොවීම යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධනය සඳහා ව්‍යාපාරික ප්‍රජාව ආකර්ෂණය කරගැනීමට පවතින දුර්වලතාවයක් ලෙස සඳහන් කල හැකිය.



## අවස්ථා (Opportunities)

### 1. යෝජිත මීගොඩ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය.

***රූපය 5.24 :** යෝජිත මීගොඩ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය*




***මූලාශ්‍රය:** විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ, ශ්‍රී ලංකාව*

වර්තමානයේ මීගොඩ දුම්රිය නැවතුම් පොළ පිහිටා ඇති ස්ථානය සඳහා මෙම බහුවිධ ප්‍රවාහන මධස්ථානය ඉදිකිරීමට යෝජනා වී තිබේ. යෝජිත ඉලෙක්-ට්‍රොනික් දුම්රිය මාර්ගය, කොට්ටාව සිට දියගම හරහා කඩුවෙල දක්වා ඉදිකිරීමට යෝජිත විදුලි දුම්රිය සේවය හා බස් සේවය මීගොඩ බහුවිධ ප්‍රවාහන මධ්‍ය-ස්ථානය හා ඒකාබද්ධ කිරීම මෙහිදී අවධානය යොමුකර ඇත.

අද වන විට මීගොඩ ආශ්‍රිතව පොහොසත් වෙළඳ මධ්‍යස්ථානයක්, උද්‍යාන පහසුකම්, ප්‍රවාහන පහසුකම් සමග ඒකාබද්ධ නොවීම හේතුවෙන්, මෙම ව්‍යාපෘතිය හරහා පොහොසත් සේවා මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම ඔවුන්ගේ අරමුණ වේ. මේ හරහා යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය කලාපයට පහසුකම් සපයන ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදි වීම හා පොහොසත් සේවා මධ්‍යස්ථානයක් නිර්මාණය වීම ප්‍රබල අවස්ථාවක් ලෙස හඳුනා ගත හැකිය.

## 2. හෝමාගම හා අනෙකුත් ප්‍රාදේශිය නගර යා කෙරෙමින් ඉදිකිරීමට යෝජිත මහා මාර්ග හා දුම්රිය ප්‍රවාහන පහසුකම් පද්ධතිය.

***රූපය 5.25 :** තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා ඉදිකිරීමට යෝජිත මහා මාර්ග හා දුම්රිය ප්‍රවාහන පහසුකම් පද්ධතිය*




***මූලාශ්‍රය:** විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ, ශ්‍රී ලංකාව*

හෝමාගම යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපය තුල මහා මාර්ගවල පවතින ගුණාත්මකභාවය පිලිබඳ දුර්වලතාවලදී පැහැදිලි කර ඇති අතර ඊට අදාලව මෙම යෝජිත මහා මාර්ග හා දුම්රිය මාර්ග පහසුකම් එය මග හරවා ගැනීම සඳහා ප්‍රබල අවස්ථාවක් ලෙස සඳහන් කල හැකිය.

## 3. යෝජිතව තිබූ තාක්ෂණ නගර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට අදහස් කෙරෙන කර්මාන්ත කලාපය හා පර්යේෂණ කලාපය.

යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධනය හුදෙක් හෝමාගම ප්‍රදේශය පාදක කරගනිමින් සංවර්ධනය කිරීමට යෝජනා කෙරුණු ව්‍යාපෘතියක් නොවේ. එය හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය මෙන්ම මාලබේ, දියගම, කටුවන, මීගොඩ යන තාක්ෂණ කලාප හා කර්මාන්ත කලාප ආවරණය කර ගනිමින් ඉදිකිරීමට යෝජනා වූ ව්‍යාපෘතියකි. රූපය 5.28 හි සඳහන් ආකාරයට යෝජනා වී තිබෙන කර්මාන්ත කලාප හා පර්යේෂණ කලාප නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රිය කලාපයක් නිර්මාණය කිරීමේදී සංවර්ධනයේ දිශාව සම්බන්ධයෙන් සැලසුම්මය උපාය මාර්ග සඳහා යම් අදහසක් ලබා දීමට සමත් ඇත.

## 4. යෝජිතව තිබූ තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට යෝජිත ජල සැපයුම් මධ්‍යස්ථානය, විදුලි සැපයුම් මධ්‍යස්ථානය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා මළ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩ පිළිවෙල.

හෝමාගම සංවර්ධන සැලැස්මේ (2022–2031) අරමුණ 2ක යටතේ වැඩිවන ජන සංඛ්‍යාවට සාපේක්ෂව මූලික යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවන බව සාකච්ඡා කරන ලදී. එහිදී විශේෂයෙන්ම තාක්ෂණ නගරය හරහා අපේක්ෂා කරන යටිතල පහසුකම් සැපයීම සඳහා අවධානය යොමු කර ඇත. ඒ අනුව තාක්ෂණ නගර ව්‍යාපෘතිය යටතේ, එම පහසුකම් සැපයීම ක්‍රමවත් හා කාර්යක්ෂම කිරීම සඳහා යෝජනා වී ඇති ඉහත සඳහන් ව්‍යාපෘති යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපයක් නිර්මාණය කිරීමේදී ද ප්‍රබල අවස්ථාවක් බව සටහන් කල හැකිය.

*රූපය 5.26 : තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඉදිකිරීමට අදහස් කරන කර්මාන්ත කලාප හා පර්යේෂණ කලාප*




| | | | |
|---|---|---|---|
| 1 | Tertiary Education | 7 | Electronic Cluster Development |
| 2 | IT & High Tech Development | 8 | Telecommunication Data Center |
| 3 | Business incubator Program | 9 | E-Sport Development |
| 4 | Nano Technology Program | 10 | Industrial Park |
| 5 | Bio Technology Program | 11 | Government Agency |
| 6 | R&D Programs | 12 | National Space Hub |

*මූලාශ්‍රය : විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ, ශ්‍රී ලංකාව 2017*

*රූපය 5.27 : යෝජිත අපජල පිරිපහදු මධ්‍යස්ථාන*




***මූලාශ්‍රය:** විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ, ශ්‍රී ලංකාව*

*රූපය 5.28 : යෝජිත විදුලි සැපයුම් මධ්‍යස්ථානය*




***මූලාශ්‍රය:** විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ, ශ්‍රී ලංකාව*

*රූපය 5.29 : යෝජිත මල අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය*




**මූලාශ්‍රය:** *විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ, ශ්‍රී ලංකාව,2017*

*රූපය 5.30 : යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම*




**මූලාශ්‍රය:** *විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නව නගරය සඳහා ප්‍රධාන සැලැස්ම, කොළඹ, ශ්‍රී ලංකාව,2017*

06

පරිච්ඡේදය

# සංවර්ධන සැලැස්ම

# 6.1. හැඳින්වීම

හෝමාගම සංවර්ධන සැලසුම් බල ප්‍රදේශය හෙක්ටයාර 13800 ක භූමි ප්‍රමාණයක විහිදුණු ග්‍රාම සේවා වසම් 91 කින් සමන්විත වේ. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2012 වර්ෂයේ දත්තයනට අනුව 252,469 ක ජනගහනයක් මෙම ප්‍රදේශයේ ජීවත්ව සිටි. සම්පත් පැතිකඩ දත්තයන්ට අනුව 2016 වර්ෂයේදී ජනගහනය 282,668 ක් ලෙස දැක්වේ. ජනගහන වර්ධනය සලකා බැලීමේදී ස්වභාවික ජනගහන වර්ධන වේගය 2.4% ක් ලෙස දක්වා ඇත. ගණනය කිරීම් වලට අනුව 2.4% ක් වූ ජනගහන වර්ධන වේගය ඔස්සේ වර්ෂ 2031 දී මෙම ප්‍රදේශය තුල ජනගහනය 650,000 (ඇමුණුම 10) ක් බව පුරෝකථනය කල හැක.

මීට සමගාමීව, ප්‍රදේශයට ජනගහනය සංක්‍රමණය වන රටාව අධ්‍යනය කලවිට හා ඉඩම් භාවිතයන්ගේ වෙනස් වීම (Changes of Land Uses) සැලකීමේදී සංක්‍රමණික ජනගහනයෙන් 45% ක ප්‍රමාණයක් (මූලාශ්‍ර: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012 වර්ෂයට අයත් දත්ත) මේ ප්‍රදේශය තුළම නේවාසිකයන් ලෙස පදිංචි වන බව වර්තමාන තත්ත්වයන් අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වෙ. නාගරික ප්‍රදේශයන් ආශ්‍රිත නේවාසික භාවිතයන් සහිත ඉඩම් හා අත්හරින ලද වගා බිම් සීග්‍රයෙන් වාණිජ භාවිතයන් බවට පරිවර්තනය වීමේ රටාවක්ද ක්ෂේත්‍ර අධ්‍යයනයන්හිදී දැකිය හැකි අතර මෙම අගය ප්‍රධාන මාර්ග දෙපස ඉඩම් භාවිතයෙන් 30% ක් *(මූලාශ්‍ර: නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සිදුකරන ලද අධ්‍යයනයන්ට අනුව)* ලෙස සඳහන් කල හැක.

මෙම කරුණු සැලකිල්ලට ගැනීමේදී ආසන්න වශයෙන් 40,000 ක පමණ ජනගහනයක් වර්ෂ 2031 වන විට රැකියා අවස්ථා සඳහා හෝමාගම ප්‍රදේශයට පැමිණ පදිංචි වීමේ ප්‍රවණතාවක් ඇති බව පෙන්වා දිය හැකිය. මේ අනුව ස්වභාවික ජනගහන වර්ධනයත්, රැකියා අවස්ථා සඳහා සංක්‍රමණය වී මෙහි පදිංචි වන ජනගහනයත් සලකා 2031 වර්ෂය වන විට ප්‍රදේශය තුල මුළු නේවාසික ජනගහනය ලක්ෂ හයකට ආසන්න ප්‍රමාණයක් දක්වා වර්ධනය වන බව පුරෝකථනය කල හැකි වේ.

2022–2031 හෝමාගම නව සංවර්ධන සැලැස්මේ ප්‍රධාන අරමුණු අනුව හෝමාගම නගරය සුවපහසු නේවාසික නගරයක් මෙන්ම විධිමත් යටිතල පහසුකම් සහිත වූ සේවා නගරයක් ලෙස සංවර්ධනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඇති අතර තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට නගරයට පැමිණෙන ජනගහනයේද සීග්‍ර වර්ධනයක් ඉදිරියේදී අපේක්ෂා කල හැකිය. ඒ අනුව ගණනය කිරීම්වලට අනුව සේවා ලබා ගැනීමේ අරමුණින් සහ රැකියා අවස්ථා සඳහා පිටතින් පැමිණෙන ජනගහනය 2031 වර්ෂයේදී දිනකට මිනිසුන් 85,914 ක් ලෙස දැක්විය හැක.

යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය උදෙසා පැමිණෙන ජනගහනය සැලකීමේදී මෙම අගය 265,945 ක් දක්වා වර්ධනය විය හැකි බවද ගණනය කර දැක්විය හැකිය. මෙහිදී දැනුම් කේන්ද්‍රීය නගරය තුළ වූ විශ්ව විද්‍යාල වලට පැමිණෙන ගුරුවරුන්, සිසුන් හා කාර්යාලවල මෙන්ම අලුතින් පැන නගින රැකියා අවස්ථා සඳහා පැමිණෙන ජනගහනයද ඇතුලත් කර ඇත.

සාරාංශ වශයෙන් ගත්විට ස්වභාවික ජනගහන වර්ධනය හේතුවෙන් 688,000ක් වූ ජනගහනයද රැකියා අවස්ථා හා නව නගර ව්‍යාපෘති හේතුවෙන් හෝමාගමට සංක්‍රමණය වන 85,914 ක් වූ ජනගහනයද එකතුවෙන් මුළු ජනගහනය 800,000 ක්ද සේවා හා අනෙකුත් අවශ්‍යතා වෙනුවෙන් හෝමාගමට පැමිණෙන ජනගහනය 200,000 ක්ද වශයෙන් පුරෝකථනය කර දක්වා ඇත. මේ අනුව ගත් විට 2031 වර්ෂයේදී ප්‍රදේශය තුල මුළු ජනගහනය ආසන්න වශයෙන් 900,000 ක් සංසරණය වීම අපේක්ෂා කල හැකිය. එසේ හෙයින් 900,000 ක් වූ ජනගහනයට අවශ්‍ය පහසුකම් සහිත නගරයක් 2031 දී නිර්මාණය විය යුතුය.

මූලික පහසුකම් වන නල ජලය, විදුලිය, හා සනීපාරක්ෂක පහසුකම් වැඩිවන ජනගහනයට සරිලන අයුරින් තිබේදැයි සවිස්තරාත්මකව සොයා බැලිය යුතු වේ.

## 6.2. සංවර්ධන උපාය මාර්ග

හෝමාගම සංවර්ධන සැලැස්ම (2022–2031) ක්‍රියාත්මක කිරීමෙහි ලා යොදා ගන්නා උපාය මාර්ග හා එම උපාය මාර්ග සංවර්ධන ව්‍යාපෘති ආකාරයෙන් භූමිය තුල ක්‍රියාත්මක කිරීම යන අංශ කෙරෙහි මූලික අවධානය යොමු කිරීම මෙහිදී සිදු කර ඇත.

ඒ අනුව සංවර්ධන සැලැස්මේ දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා නිර්මාණය කරන ලද මූලික අරමුණු යථාර්තයක් බවට පත් කරන්නට සහ එම එක් එක් අරමුණු ළඟා කර ගැනීම සඳහා හඳුනා ගන්නා ලද අභිමතාර්ථ පදනම් කරගනිමින් ක්‍රියාවෙහි නැංවීම සඳහා සුදුසු යයි තීරණය කරන ලද සංවර්ධන උපාය මාර්ග පහත පරිදි පෙළගැස්විය හැකිය. එම උපාය මාර්ග, උපාය මාර්ගික සංවර්ධන සැලසුම් 6ක් යටතේ ක්‍රියාවෙහි නැංවීම අපේක්ෂිතයි.

### *උපායමාර්ග. 1. ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ උපාය මාර්ග සැලැස්ම (Land & Building Development Strategic Plan)*

මෙම සැලැස්ම යටතේ 2031 වර්ෂය සඳහා යෝජනා කරන ලද හෝමාගම කලාපිකරණ සැලැස්ම (Zoning Plan), ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ ක්‍රියාවලිය (Land & Building Development Process), ඒ හා සමගාමී සැලසුම් රෙගුලාසි පිලිබඳ විස්තරාත්මක සැලැස්මක් ඉදිරිපත් කිරීම අපේක්ෂාව වී ඇත. තවද ඊට අනුබද්ධව ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති ඇතුලත් යෝජිත භූමි පරිහරණ සැලැස්ම (Proposed Land Use Plan) පිලිබඳ විශේෂ අවධානයක් ද මෙහිදී යොමු කර ඇත.

විශේෂයෙන්ම මෙම සැලැස්ම හෝමාගම නව සංවර්ධන සැලැස්මේ දෙවන කොටස ලෙස ඉදිරිපත් කිරීම සිදු කර ඇති අතර කලාප හා කලාපිකරණ රෙගුලාසි හා අනෙකුත් පොදු රෙගුලාසි එහි අන්තර්ගත කිරීමට කටයුතු යොදා ඇත.

### *උපායමාර්ග. 2. මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම (Transportation Development Strategic Plan)*

හෝමාගම සංවර්ධන සැලැස්ම (2022–2031) සකස් කිරීමේ ක්‍රියාවලියේදී ඝණත්වය මත පදනම් වූ කලාපිය සංවර්ධනයක් මූලිකවම අපේක්ෂා කර ඇත. මෙහිදී එක් එක් ප්‍රදේශය සඳහා සුදුසු ඝණත්වය තීරණය කිරීමේදී විධිමත් මහා මාර්ග හා ප්‍රවාහන සැලැස්මක් පැවතීම ඉතා වැදගත් වේ. ඒ අනුව සංවර්ධන සැලැස්මට අදාල ඝණත්වය ළඟා කර ගැනීම උදෙසා හා නාගරික ආකෘතියක් (Urban Form) ළඟා කර ගැනීම උදෙසා විශේෂිත උපාය මාර්ග සැලැස්මක් ලෙස මෙම මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම ඉදිරිපත් කර ඇත.

එමෙන්ම මෙම සැලැස්මට අදාල බලාත්මක කරන රෙගුලාසි සංවර්ධන සැලැස්මේ දෙවන වෙළුමෙහි අනතර්ගත කිරීම සිදු කර ඇත.

## *උපායමාර්ග. 3. තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග සැලැස්ම (Sustainable Environment Development Strategic Plan)*

හෝමාගම සංවර්ධන සැලැස්මේ ඉදිරි දැක්මේ දැක්වෙන මූලික සංකල්පය වන හරිත සංකල්පය මත පදනම්ව සුවපහසු නේවාසික කලාපයක් හා හරිත නගරයක් ලෙස හෝමාගම නගරය සංවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත. මේ සඳහා පාදක වන යෝජිත සංවර්ධන උපාය මාර්ගයන් සවිස්තරාත්මකව තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග සැලැස්ම මගින් ඉදිරිපත් කර ඇති අතර සැලැස්මට අදාල බලාත්මක කරන රෙගුලාසි සංවර්ධන සැලැස්මේ දෙවන වෙළුමෙහි අනතර්ගත කිරීම සිදු කර ඇත.

## *උපායමාර්ග. 4. ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලැස්ම (Economic Development Strategic Plan)*

හෝමාගම සංවර්ධන සැලැස්ම (2021–2031) මගින් කලාපීය හා ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය හා ඉන් ලැබෙන ප්‍රතිලාභ පිලිබඳ සවිස්තරාත්මක කරුණු ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලැස්ම තුලින් ඉදිරිපත් කර ඇත.

එමෙන්ම එහිදී සංවර්ධන සැලැස්ම යටතේ ඉදිරි වර්ෂ තුල හෝමාගම ප්‍රදේශයේ ආර්ථිකය නගා සිටුවීමේ අරමුණෙන් ක්‍රියාත්මක කිරීමට යෝජිත ව්‍යාපෘති පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීමක් සිදු කර ඇත.

## *උපායමාර්ග.5. අපරවඅපුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම (Infrastructure Facilities Development Strategic Plan)*

හෝමාගම සැලසුම් ප්‍රදේශය තුල ස්ථාපිත කිරීමට යෝජිත සංවර්ධන ක්‍රියාවලින් සාර්ථක කරගැනීම උදෙසාත් නගරයේ වැඩිවන ජනගහනය උදෙසා අත්‍යාවශ්‍ය අපරවයුහ පහසුකම් ලෙස හඳුනාගෙන ඇති ජලය, විදුලිය, අපද්‍රව්‍ය කළමනාකරණය හා සමාජීය අපරවයුහ පහසුකම් යන අංශයන්ගේ සිදුවන සංවර්ධනයන් හා යෝජිත ව්‍යාපෘතීන් පිලිබඳ විශේෂිත අවධානයක් යොමු කරමින් මෙම අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම ඉදිරිපත් කර ඇත.

## *උපායමාර්ග. 6. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම (Project Implementation Strategic Plan)*

හෝමාගම සංවර්ධන සැලසුම (2022–2031) මඟින් හඳුනාගත් සියලුම සංවර්ධන ව්‍යාපෘතීන් භූමියෙහි ක්‍රියාවට නැංවීමේදී සැලකිය යුතු කරුණු පිලිබඳ සවිස්තරාත්මක සටහනක් හා හඳුනාගත් ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීමට යෝජිත අනු පිළිවෙල දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්මක් මෙම පරිච්ඡේදය හරහා ඉදිරිපත් කර ඇත.

## 6.3. සංකල්පිමය සැලැස්ම (The Concept Plan)

### 6.3.1. හැඳින්වීම

හෝමාගම සංවර්ධන සැලැස්මෙහි (2022–2031) අභිප්‍රාය වනුයේ ඉහත හඳුනාගත් ගැටළුකාරී තත්ත්වයන් නිරාකරණය කර ගනිමින් ජාතික ප්‍රතිපත්ති ඔස්සේ ප්‍රදේශය තුල යෝජිත ව්‍යාපෘති වන දැනුම් කේන්ද්‍රීය නගර ව්‍යාපෘතිය, මහා මාර්ග හා අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා අනෙකුත් සංවර්ධනයන් හා ඒකාබද්ධ වෙමින් සියළු පහසුකම් සහිත සුවපහසු හා විධිමත් නගරයක් ලෙස හෝමාගම ප්‍රදේශය අනාගත සංවර්ධනය කරා රැගෙන යාමයි. " බුද්ධිමතුන්ගේ හරිත නගරය" යන දිගුකාලීන දැක්ම හරහා තාක්ෂණය හා නව නිපැයුම් ආශ්‍රිත කර්මාන්තයන්, විශ්ව විද්‍යාල හා ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතනයන් සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දීම උදෙසාත් ප්‍රදේශය පුරා විසිරුණු හරිත ප්‍රදේශයන්ගෙන් සමන්විත වන පොහොසත් නේවාසික නගරයක් නිර්මාණය කිරීම හෝමාගම සංවර්ධන සැලැස්මේ දැක්ම වී ඇත.

හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කයේ නගරාසන්න, එසේත් නැතිනම් කොළඹ තදාසන්න (Suburban) ප්‍රදේශයක් ලෙස හඳුනා ගත හැකිය. මූලිකවම ග්‍රාමීය සුන්දරත්වය හා මුසු වූ නේවාසික භාවිතයන් සඳහා ඉහළ නැඹුරුතාවක් පෙන්නුම් කරන මෙම පෙදෙස වර්තමානය වන විට නවෝත්පාදනය සඳහා අත්‍යාවශ්‍ය සංවර්ධන පසුබිම සකස් කිරීම හා දැනුම් කේන්ද්‍රික නගරයක් නිර්මාණය කිරීමට සැලසුම්මය වශයෙන් යොමු කර ඇති බව පෙනීයයි. නව සංවර්ධන ව්‍යාපෘති හරහා එනම් මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය, දක්ෂිණ අධිවේගී මාර්ගයේ කොට්ටාව අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හා කහතුඩුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානවල පිහිටීම, යෝජිත මාහේනවත්ත දනුම් කේන්ද්‍රීය නගරය, කැලණිවැලි දුම්රිය මාර්ග ව්‍යාපෘතිය හා රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය මෙම ප්‍රදේශය අවකාශ කරගෙන ක්‍රියාත්මක වීම, එහි නව සංවර්ධන අවශ්‍යතාවයන් නිර්මාණය වීම හරහා ප්‍රදේශයේ සංවර්ධනයට පවතින ඉල්ලුම වර්ධනය වන ආකාරයක් දැකිය හැකිය. මෙම තත්ත්වය යටතේ හෝමාගම ප්‍රදේශය තුල හඳුනාගත් ගැටළුකාරී තත්ත්වයන් පහත පරිදි සඳහන් කළ හැක.

වර්තමානය වන විට නේවාසික ක්‍රියාකාරකම් පාරිසරික සංවේදී ප්‍රදේවලට ව්‍යාප්ත වීමේ සම්භාවිතාව වර්ධනය වීම හා එම තත්ත්වය මඟ හරවා ගැනීම සඳහා සැලසුම්මය වශයෙන් පියවර ගත යුතු වීම.

යෝජිත දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඇතිවිය හැකි බලපෑම් හා අවශ්‍යතාවයන්ට අනුව ප්‍රදේශය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම අත්‍යවශ්‍යය වීම.

ප්‍රදේශයේ ජනතාව හා වගකිව යුතු පාර්ශවකරුවන්ගේ අදහස් අනුව, ප්‍රදේශයේ අවම බලපෑමක් යටතේ උද්ගතව පවතින කර්මාන්ත ක්‍රියාකාරකම් හා නේවාසික ක්‍රියාකාරකම් මිශ්‍ර වීම හේතුවෙන් ඇතිවිය හැකි අනිසි බලපෑම් කෙරෙහි අවධානය යොමු කිරීම.

ඒ අනුව හෝමාගම ආශ්‍රිතව උද්ගත වෙමින් පවතින ඉහත ගැටළු අරඹයා හා මාහේනවත්ත ප්‍රදේශය සඳහා යෝජනා වී ඇති දැනුම් කේන්ද්‍රීය නගරයේ හා අනෙකුත් මහා මාර්ග හා අධිවේගී මාර්ග සංවර්ධනයන්ගේ ප්‍රතිලාභ තුලින් හෝමාගම සැලසුම් ප්‍රදේශය සාර්ථක නගරයක් හා පහසුකම් සපිරි විධිමත් නගරයක් ලෙස සංවර්ධනය කිරීමට හමුවන අවස්ථාව උපරිම ලෙස භාවිතයට ගැනීම 2031 වර්ෂය සඳහා සැලසුම් කරනු ලබන නව සංවර්ධන සැලැස්මේ අභිප්‍රාය වී ඇත.

එමෙන්ම " බුද්ධිමතුන්ගේ හරිත නගරය" යන දිගුකාලීන දැක්ම හරහා හරිත ප්‍රදේශ සුරක්ෂිත කරන පසුබිමක් තුල, දැනුම් කේන්ද්‍රීය නගරයක් සඳහා අවස්ථාව සැකසූ තත්ත්වයක් හා පොහොසත් නේවාසික නගරයක් නිර්මාණය කිරීම හෝමාගම සංවර්ධන සැලැස්ම (2022–2031) පසුබිම් කර ඇත.

## 06 පරිච්ඡේදය සංවර්ධන සැලැස්ම

### සංකල්පීමය සැලැස්ම

#### හැඳින්වීම

සැලසුම් සංකල්පය මඟින් අනාගතයේ සමස්ථ සැලසුම් ප්‍රදේශය ආවරණය කරමින් සිදු කිරීමට බලාපොරොත්තු වන සංවර්ධනයේ ස්වභාවය පැහැදිලි කිරීම අපේක්ෂා කරයි. ඒ අනුව මෙහිදී හෝමාගම ප්‍රදේශයේ සංවර්ධන අභිප්‍රායන් ප්‍රධාන වශයෙන් නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය, නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය සංවර්ධනය, නේවාසික කලාප සංවර්ධනය හා පරිසර සංරක්ෂණය යන පැතිකඩයන් කෙරෙහි අවධානය යොමු කළ ආකාරය සංවර්ධන සැලසුම් සංකල්පය හරහා හඳුන්වා දී ඇත. වර්තමානයේ හෝමාගම සැලසුම් ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව ඇති සියළුම නගර හා එම නගර අතර පවතින අන්තර් සම්බන්ධතාව පිළිබඳව විමසීමේදී හෝමාගම නගරය කේන්ද්‍ර කොට ගනිමින් කහතුඩුව හා ගොඩගම යන සෙසු නගර කෙරෙහි වෙළඳ හා සේවා පහසුකම් ඒකරාශී වී ඇති බව අවබෝධ වනු ඇත. හෝමාගම නගරය පරිපාලන, වෙළඳ හා සේවා පහසුකම් සියල්ල කැටි වූ ප්‍රාදේශීය නගරයක් ලෙස හඳුනා ගත හැකිය. අනාගතයේ හෝමාගම සැලසුම් ප්‍රදේශය ආශ්‍රිතව හා ඉන් පරිබාහිරව ක්‍රියාත්මක වීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති හරහා හෝමාගම නගරය තවදුරටත් ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මක වීමට ඇති හැකියාව සාපේක්ෂව ඉහළ මට්ටමක පවතින බව විස්තරාත්මක විශ්ලේෂණයන්ට අනුව හඳුනාගත හැකිය. ඒ අනුව මෙම නගරය හෝමාගම සැලසුම් ප්‍රදේශයේ ප්‍රධාන නාගරික මධ්‍යස්ථානය ලෙස සංවර්ධනය කිරීමට සුදුසු බවට සංවර්ධන සැලසුම් සංකල්පය මඟින් ඉස්මතු කර දක්වා ඇත. එමෙන්ම කහතුඩුව හා ගොඩගම නගර සෙසු නාගරික මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය කළ යුතු බවද හඳුනාගෙන ඇත.

හෝමාගම සැලසුම් ප්‍රදේශයේ අනාගත ආර්ථික සංවර්ධනය නේවාසික පසුබිම හා බැඳුනු දැනුම් කේන්ද්‍රික නවෝත්පාදන ක්‍රියාකාරකම් විහිදුනු තත්ත්වයක් තුල නිර්මාණය වීම අපේක්ෂා කළ හැකිය. මන්ද යත් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව දක්නට ලැබෙන සංවර්ධන නැඹුරුතාව නේවාසික භාවිතයන්, නවෝත්පාදනය සඳහා අත්‍යාවශ්‍ය සංවර්ධන පසුබිම සකස් කිරීම හා දැනුම් කේන්ද්‍රික නගරයක් නිර්මාණය කිරීම සඳහා යොමුවන ආකාරයක් හඳුනාගත හැකි නිසාවෙනි. තවද භූමියෙන් තුනෙන් එකකට ආසන්න ප්‍රදේශයක් පරිසර සංවේදී කලාප ලෙස හඳුනාගැනෙන මෙම ප්‍රදේශයේ නේවාසික සංවර්ධනයන්ගේ නැඹුරුතාව පරිසර සංවේදී කලාප දෙසට යොමු වීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය. ඒ අනුව ඉහළ ජන ඝනත්වයක් හෝමාගම හා කහතුඩුව යන නගර කේන්ද්‍ර කර ගත් පාරිසරික සංවේදීතාවන්ගෙන් අඩු ප්‍රදේශ දෙසට ආකර්ෂණය කර ගැනීම සංවර්ධන සැලැසුම් සංකල්පය යටතේ විශේෂ අවධානයට යොමු කර ඇත. එමෙන්ම ගොඩගම නගරය කේන්ද්‍ර කරගත් මාලබේ, මීගොඩ, මාහේනවත්ත හා මිල්ලෑව යන ප්‍රදේශ සම්බන්ධ කෙරෙන නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය නිර්මාණය කිරීම මෙහිදී තවදුරටත් අවධානයට යොමු කර ඇත. එහිදී විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් පර්යේෂණ, අධ්‍යාපන ආයතන, කර්මාන්ත හා අනෙකුත් සේවා සපයන දෙස් විදෙස් ආයතන එම කලාපය තුලට ඒකරාශී කර ගැනීම ඉලක්ක කර ඇත. තවද හෝමාගම සංවර්ධන සැලසුම් (2022–2031) දැක්ම අනුව යමින් පරිසර සංවේදී කලාප සුරක්ෂිත කිරීමේ අරමුණින් අඩු ඝණත්ව නේවාසික කලාපයක් (Low Density Residential Zone) හඳුන්වා දීමද සංවර්ධන සැලසුම් සංකල්පය යටතේ අවධාරණය කර ඇත. තවද ප්‍රදේශය ආශ්‍රිත ප්‍රධාන ස්වභාවික ජල පද්ධති ලෙස සැලකෙන මහා ඔය, පුස්වැලි ඔය හා කැළණි ගඟ ආශ්‍රිත ප්‍රදේශ සංවර්ධනයේදී අහිතකර බලපෑම්වලට යොමු නොවන අකාරයේ සැලසුම් සංකල්පයක් හඳුන්වා දී ඇත.

හෝමාගම නගරයට ප්‍රවිෂ්ට වීම සඳහා පවතින ප්‍රධාන මාර්ග ලෙස හයිලෙවල් මාර්ගය, ලෝලෙවල් මාර්ගය, කොළඹ හොරණ මාර්ගය, කැළණි වැලි දුම්රිය මාර්ගය හා දකුණු කොළඹ අධිවේගී මාර්ගය හඳුනා ගත හැකිය. නමුත් ප්‍රදේශය තුල මාර්ග පද්ධතියේ පවතින නොදියුණු මට්ටම, පවතින භූමියට නිවැරිදි වටිනාකමක් හා භූමියෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට බාධාවක් වී ඇත. මේ හේතුවෙන් හෝමාගම ප්‍රදේශය සම්බන්ධ කෙරෙන ප්‍රධාන ප්‍රදේශිය මාර්ග (Regional Linkages) හා ශක්තිමත් සම්බන්ධතාවක් ගොඩනැගීම උදෙසා එම අතුරුමාර්ග සංවර්ධනය කිරීම අපේක්ෂා කර ඇත. තවද හෝමාගම ප්‍රදේශය අවකාශ කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට යෝජිත රුවන්පුර අධිවේගී මාර්ගය, කොට්ටාව, මාහේනවත්ත හා කඩුවෙල යා කරමින් ඉදි කිරීමට යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගය යන මාර්ග සහ පවතින මාර්ග පද්ධතිය හා ඒකාබද්ධ කර ගනිමින් ප්‍රදේශයේ ගමනාගමන පහසුකම් තීව්‍ර කිරීම සිදුවිය යුතු බව සැලසුම් සංකල්පය මඟින් පැහැදිලි කර ඇත.

ඒ හරහා කුඩා නගර නිර්මාණය කිරීම තුලින් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු ව්‍යාප්ත වීම සඳහා අවකාශයක් සකසා දීමද අවධානයට යොමු කර ඇත.

හෝමාගම සංවර්ධන සැලසුම් සංකල්පය සාරාංශයක් ලෙස ගත් විට තාක්ෂණය හා නව නිපැයුම් ආර්ථිකයකින් හෙබි විසිරුණු හරිත කලාපයන්ගෙන් පොහොසත් ආකර්ශනීය නේවාසික නගරයක් නිර්මාණය කිරීමේ දිගුකල් දැක්ම සාක්ෂාත් කර ගැනීම අපේක්ෂා කරයි.

මෙහි විස්තර කළ සැලසුම් සංකල්පයන්, සංවර්ධන සැලැස්මේ ඉදිරි දැක්මත් ඒකාබද්ධ කර අනාගත හෝමාගම ප්‍රදේශයේ නගර ආකෘතිය (Urban Form) දැක්වීමේදී පෙර අවස්ථාවන්ට වඩා වෙනස්වූත් වඩාත් සාධාරණීකරණය වූත් විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ ප්‍රදේශයේ ගොඩනැගිලි ඝනත්වයන් ඒ අනුව ප්‍රදේශයටම විශේෂිත වූ කලාපීය සාධකයක් (Zone Factor) මත පදනම් වූ ආකර්ශනීය හා විවිධත්වයකින් යුත් නගර ආකෘතියක් (Urban Form) නිරායාසයෙන් නිර්මාණය වීම අපේක්ෂා කරයි (රූපය 6.1).



*රූපය 6.1 : හෝමාගම සංවර්ධන සැලසුම් සංකල්පය හා අපේක්ෂිත නගර ආකෘතිය 2022-2031*



# 6.4. යෝජිත භූමි පරිහරණ සැලැස්ම (Proposed Landuse Plan)

## 6.4.1. හැඳින්වීම

යෝජිත භූමි පරිහරණ සැලැස්ම මඟින් හෝමාගම සංවර්ධන සැලැස්ම (2022–2031) ට අනුව හෝමාගම ප්‍රදේශයේ ඉඩම් භාවිතය සිදුවන ආකාරය නිරූපණය කරනු ලබයි. මෙහිදී ප්‍රධාන වශයෙන් සංවර්ධන දැක්ම මුදුන්පත් කර ගැනීම සඳහා නිර්මාණය කරන ලද ප්‍රධාන සංවර්ධන අරමුණු පදනම් කර ගත් පරමාර්ථ භූමිය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා වන ඉඩම් භාවිතය පැහැදිලි කරයි.

හෝමාගම සංවර්ධන සැලසුම් සංකල්පයට (2022–2031) අනුව ප්‍රධාන වශයෙන්, වාණිජ කලාප තුනක් මත හා නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපයක් මත සිදුවන සංවර්ධන ක්‍රියාකාරකම් හරහා පෙළ ගස්වන සුවිශේෂී නගර ආකෘතියක් හරහා ගොඩනැගෙන හරිත නේවාසික ප්‍රදේශයක් නිර්මාණය කිරීම අපේක්ෂා කරයි. ඒ අනුව හෝමාගම සංවර්ධන සැලැස්මේ දැක්ම වනුයේ "බුද්ධිමතුන්ගේ හරිත නගරය"නිර්මාණය කිරීමයි.

මෙහිදී හෝමාගම ප්‍රදේශයේ ඉඩම් භාවිතය සඳහා යෝජිත කලාපිකරණ සැලැස්ම ප්‍රධාන වශයෙන් සෘජු බලපෑමක් ඇති කරයි. වැඩි ඝනත්ව වාණිජ කලාප ලෙස හඳුන්වාදෙන හෝමාගම, කහතුඩුව හා ගොඩගම යන ප්‍රදේශ පදනම් කරගත් නගර සංවර්ධන ව්‍යාපෘති මෙහි අපේක්ෂිත නගර ආකෘතිය ලබා ගැනීමට අවැසි මූලික මඟ පෙන්වීම ලබා දේ.

කොළඹ සිට හෝ පිළියන්දල සිට හෝ පාදුක්ක දිශාවෙන් පැමිණෙන කෙනෙකුට හෝමාගම ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ කලාප තුනක් පිළිබඳ හැඟීමක් දනවන ලෙස මෙම නගර තුන නිර්මාණය කිරීම අපේක්ෂාව වී ඇත. ඒ සඳහා විශේෂයෙන්ම මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම යටතේ ඉදිරිපත් කර ඇති මහා මාර්ග ධූරාවලිය සංවර්ධනයේ පදනම ලෙස යොදා ගනිමින් මෙම නගර ආකෘතිය වාණිජ කලාප තුලින් ඉස්මතු කර ගැනීමට මෙහිදී කටයුතු කර ඇත.

පසුව ක්‍රමයෙන් එම වාණිජ කලාප පසු කළ යන මිනිසුන්ට ක්‍රමයෙන් හීනවී යන නගර ආකෘතියක් නෙත ගැටෙන, මාර්ග දෙපස හරිත තීර ප්‍රදර්ශනය වන දර්ශනීය කුඹුරු යාය හා හරිත පැහැති ශාක දසනින් දිස් වන, සුවපහසු නේවාසික ප්‍රදේශයක් යන ස්වාභාවික හැඟීම දැන්විය හැකි ලෙසට මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය නිර්මාණය කිරීම අපේක්ෂාව වී ඇත. මෙහිදී විශේෂයෙන්ම මහා මාර්ග ධූරාවලිය, යෝජිත හරිත උද්‍යාන ව්‍යාපෘති, යෝජිත රුක් රෝපණ තීරද, යෝජිත රේඛීය උද්‍යාන, දර්ශනීය ස්ථාන එම නේවාසික පරිසරය නිර්මාණය කිරීමට අවැසි පසුබිම සකස් කිරීමට යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම හරහා අවස්ථාව සලසනු දැකිය හැක. හෝමාගම සංවර්ධන සැලැස්ම ( 2022–2031 ) අනුව මෙම යෝජිත භූමි පරිහරණ සැලැස්ම පහත සඳහන් අරමුණු හා අභිමතාර්ථ දෙස අවධානය යොමු කර ඇති අතර ඊට සමගාමීව යමින් එම සැලැස්ම සකස් කර ඇති බව සඳහන් කළ හැක.

ඉන් ඔබ්බට පැමිණි විට දිස් වනුයේ වැඩි සනත්ව නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය සංවර්ධන කලාපයයි ක්‍රමයෙන් උස්වන ගොඩනැගිලි හා නවීන පන්නයේ ගොඩනැඟිලිවලින් සමන්විත මෙන්ම නවීන තාක්ෂණ පදනම් කර ගත් නාගරික ක්‍රියාකාරකම් සිදුවන හරිත, නිස්කලංක පරිසරයක් නිර්මාණය කිරීම මෙහිදී අපේක්ෂා කරයි. රුක් රෝපණ තීරුවලින් අනූන වූ මහා මාර්ග, භූදර්ශන සැලසුම් හරහා නිර්මාණය කෙරුණු ප්‍රවාහන මධ්‍යස්ථාන, විද්‍යා හා තාක්ෂණය සමගාමී විශ්ව විද්‍යාල, පර්යේෂණාගාර, කර්මාන්ත හා සුඛෝපභෝගී නිවාස පහසුකම් වලින් සපිරි ප්‍රදේශයක් මහා මාර්ග ධූරාවලිය හරහා ලබා ගැනීමට අවශ්‍යය ඉඩකඩ සැකසීම මෙම භූමි පරිහරණ සැලැස්ම යටතේ අවධානය යොමු කර ඇත.

ඉන් පසු දිස් වනුයේ අඩු සනත්ව නේවාසික කලාපයයි. පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කෙරෙන ආකාරයේ නේවාසික සංවර්ධනයක් අපේක්ෂා කරන මෙම කලාපය, අපේක්ෂිත නගර ආකෘතියේ පහළම අවස්ථාව ලෙස හඳුන්වා දිය හැක. විශාල තෙත් බිම් උද්‍යාන, කැළණි ගඟ හා පුස්වැලි ඔය දෙපස රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය වුනු සනත්වයෙන් අඩු සාමකාමී හා විවේකී ස්වභාවයක් ඉස්මතු කෙරෙන හා ග්‍රාමීය සුන්දරත්වය මතු කර දක්වන කලාපය ලෙස මෙම ප්‍රදේශය හඳුනා ගත හැකිය.

මේ අනුව යෝජිත භූමි පරිහරණ සැලැස්ම හරහා නිර්මාණය කිරීමට අපේක්ෂිත නගර ආකෘතිය පහත හරස්කඩ දර්ශනයන් මඟින් පැහැදිලි කල හැකිය.

## 6.4.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම

***සිතියම 6.1 :** යෝජිත භූමි පරිහරණ සැලැස්ම -2031*



***සැකසුම :** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.4.3. අපේක්ෂිත නගර ආකෘතිය (Urban Form)









# 6.5. මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම (Transportation Development Strategic Plan)

## 6.5.1. මහාමාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග

හෝමාගම ප්‍රදේශය සම්බන්ධව පසුගිය අවුරුදු කිහිපය හා වර්තමානය තත්ත්වය දෙස සංසන්දනාත්මක විමසුමක නිරත වුවහොත්, එය මහාමාර්ග හා ප්‍රවාහන පද්ධතිය අතින් විශාල දියුණුවක් ලබා සිටින බව කිව හැකිය. ඉංග්‍රීසි පාලකයාගේ අවධානයට ලක්වන මෙම ප්‍රදේශය, කැළණිවැලි දුම්රිය මාර්ගය හා හයිලෙවල් ප්‍රධාන මාර්ගය ඉදිවීමත් සමග පුළුල් පරාසයක නාගරික ලක්ෂණ ව්‍යාප්ත වීමට ප්‍රවේශයක් වූ බව දැකිය හැකිය.

2016 ශ්‍රී ලංකා රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ දකුණු අධිවේගී මාර්ගය හෝමාගම ප්‍රදේශය ආසන්නයේ ඉදිවීම හා කොට්ටාව මෙන්ම කහතුඩුව අධිවේගී අන්තර් හුවමාරු හඳුන්වාදීම හමුවේ සීඝ්‍ර නේවාසික සංවර්ධන ක්‍රියාදාමයකට යොමුවන හෝමාගම ප්‍රදේශය, දුර්වල හා අකර්මන්‍ය අන්තර් මාර්ග පද්ධතියකින් සමන්විත වීම නගර සංවර්ධනයේ දුර්වල පැතිකඩක් ලෙස දැකිය හැකිය.

ජාතික භෞතික සංවර්ධන සැලසුම (2050) ට අනුව කොළඹ දිස්ත්‍රික්කය ප්‍රධාන ආර්ථික කලාපය ලෙස හඳුනාගෙන ඇත. වත්මන් රාජ්‍ය ප්‍රතිපත්තිය හමුවේ දැනුම් කේන්ද්‍රීය නගර සංකල්පය හෝමාගම ප්‍රදේශය තුල ස්ථාපිත කිරීම හරහා එම ආර්ථික තලය ශක්තිමත් කිරීමට ප්‍රයත්න දරණ වග සඳහන් කළ හැකිය.

එවැනි මහා පරිමාණ ව්‍යාපෘති හා සීඝ්‍ර ජනගහන වර්ධනයක අයිතිකරු බවට පත්ව තිබෙන හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මාර්ග පද්ධතිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම ඉතා වැදගත් වනු ඇත. හුදෙක් හෝමාගම ප්‍රධාන නගර සීමාව තුල පමණක් නොව, සමස්ථ හෝමාගම ප්‍රදේශයේම විසිරී පවතින මාර්ග ජාලය සැලකිල්ලට ගනිමින් තිරසාර මහා මාර්ග හා ප්‍රවාහන සැලැස්මක අවශ්‍යතාවය සපුරාලීම අවශ්‍යය වනු ඇත. ජනගහන වර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද පුරෝකථනයන් පරිදි හෝමාගම ප්‍රදේශයේ සමස්ථ ජනගහනය 2031 වනවිට ආසන්න වශයෙන් ලක්ෂ හයක් දක්වා වර්ධනය වේයැයි අනුමාන කර ඇති අතර සංක්‍රමණික පිරිස ලක්ෂ දෙකක් පමණ අගයක් දක්වා වර්ධනය විය හැකිය. එහෙයින් සුක්ෂම හා කාර්යක්ෂම මාර්ග පද්ධතියක් හා රථගාල් ස්ථානයන්ගේ අවශ්‍යතාවය පැහැදිලි වනු ඇත. තවද මාර්ග තදබදය අවම කෙරෙන, පොදු ප්‍රවාහනය කෙරෙහි මූලික අවධානය යොමු වූ හා පදිකයන් සඳහා වූ මංමාවත් හා ඒ හා සම්බන්ධ යටිතල පහසුකම් දියුණු කිරීමේ අවශ්‍යතාවය මෙහිදී අතිශය වැදගත් වනු ඇත.

වර්තමානය වන විටත් ග්‍රාමීය ලක්ෂණ පෙන්නුම් කරන හෝමාගම ප්‍රදේශය, ප්‍රමාණවත් පළලකින් යුත් විසිරුණු මාර්ග පද්ධතියක් ප්‍රදර්ශනය නොකරයි. විශේෂයෙන් මාර්ග පද්ධතියේ ධුරාවලියක් දක්නට නොලැබේ. ගොඩනැගිලි ඉදි කිරීමේදී හා නගරාශ්‍රිත නගර ආකෘතිය (Urban Form) අපිළිවෙල ස්වභාවයක් ගැනීමට එය ප්‍රධාන හේතුවක් වී ඇත. මාර්ගයේ පළල හෝ කාණ්ඩය මත ගොඩනැගිලි සීමාව තීරණය කෙරෙන හෙයින් ප්‍රතාපවත් හා නවීකරණයට යොමු වූ නාගරික ලක්ෂණ ඉස්මතු කරගැනීම උදෙසා විධිමත් මාර්ග ධුරාවලියක් අවශ්‍යය වීම සඳහන් කළ හැකිය.

හෝමාගම නගරය කොළඹ දිස්ත්‍රික්කයේ නගරාශ්‍රිතව වැඩකරන බහුතරයක් ජනතාවට නේවාසික පහසුකම් සපයන සශ්‍රීක භූමි ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. වර්තමානය වන විට ලක්ෂ 3 කට ආසන්න පිරිසකට වාස භූමි සපයන මෙම ප්‍රදේශයට රැකියාව කිරීමේ පරමාර්ථයෙන් පැමිණ පදිංචි වන ප්‍රමාණය හෝමාගම ප්‍රදේශය සඳහා පැමිණෙන මුළු සංක්‍රමණික පිරිසෙන් 45% ක් වැනි ඉහළ අගයකි. 2031 වර්ෂය සඳහා හෝමාගම සංවර්ධන සැලැස්ම යටතේ සිදු කරන ලද පුරෝකතනයන්ට අනුව නේවාසික ජන සංඛ්‍යාව ලක්ෂ 6 කට ආසන්න අගයක් ගැනීම සුවිශේෂී වේ.

විශේෂයෙන්ම ප්‍රදේශය ආශ්‍රිතව සිදුවන යටිතල පහසුකම් හා සංවර්ධන ව්‍යාපෘතීන්ගේ බලපෑම හේතුවෙන් හෝමාගම නගරය දෙසට සංක්‍රමණය වන එසේත් නැතිනම් සංසරණය වන මගී ජනගහනයේ විශාල වර්ධනය වීමක් අපේක්ෂා කළ හැකිය.

***රූපය 6.2 :*** *අපේක්ෂිත නගර ආකෘතිය (Urban Form)*



***සැකසුම :*** *බසනාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

2014 වර්ෂයේදී සිදුකරන ලද COM Trans අධ්‍යයනයට අනුව කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන තදබදය දක්නට ලැබෙන ප්‍රධාන මාර්ග කිහිපයක් හඳුනාගෙන ඇති අතර, ඊට හෝමාගම ප්‍රදේශය හරහා ගමන් ගන්නා හයිලෙවල් මාර්ගය හා ලෝලෙවල් මාර්ගය ඇතුලත් වීම මෙහිදී විශේෂයෙන් අවධානයට යොමු කළ යුතුව ඇත. හයිලෙවල් මාර්ගයේ ප්‍රවාහනයේ තරම (Road Capacity) පැයකට වාහන 2300 (PCU) ක ප්‍රමාණයක් වේ. COM Trans අධ්‍යනයට අනුව 2014 වර්ෂයේ එහි ප්‍රමාණය පැයකට වාහන 2000 (PCU) දක්වා වර්ධනය වී ඇති ආකාරයක් දැකිය හැකිය. තවද ලෝලෙවල් මාර්ගයේ ප්‍රවාහනයේ තරම (Road Capacity) පැයකට වාහන 2200කට පමණ අවකාශය සලස්වා තිබුනද 2014 වර්ෂය වන විට එය පැයකට වාහන 2900 ක් දක්වා වර්ධනය වී තිබීම විශේෂ අවධානයකට ගත යුතු වේ. අනාගතයේ හෝමාගම හා කොළඹ දිස්ත්‍රික්කය අවට සිදුවන සංවර්ධන ක්‍රියාවලින්ගේ බලපෑම හේතු කොටගෙන හෝමාගම ප්‍රදේශ ආශ්‍රිතව උග්‍ර වාහන තදබදයක් අපේක්ෂා කළ හැකිය.

2031 වර්ෂය සඳහා සකස්කරනු ලබන සංවර්ධන සැලැස්ම යටතේ අනාගතයේදී වැඩිවන සමස්ථ ජන සංඛ්‍යාවට ප්‍රවාහන සම්බන්ධ කටයුතු පහසුවෙන් හා කාර්යක්ෂමව සිදු කර ගැනීම සඳහා කිනම් ආකාරයේ මහාමාර්ග හා ප්‍රවාහන අංශයේ සංවර්ධනයක් අවශ්‍යද යන්න මෙහිදී සුවිශේෂී අවධානයකට යොමු කළ යුතුව ඇත. ඊට අදාලව හෝමාගම සංවර්ධන සැලැස්මට සාපේක්ෂව සිදු කරන ලද ප්‍රවාහනය සම්බන්ධ අධ්‍යයනයන්ට අනුව ප්‍රවාහන තදබදය සඳහා බලපානු ලබන සමස්ථ ජන සංඛ්‍යාව 1,900,000 ක අගයක් ගනී. සංවර්ධන සැලැස්ම යටතේ සලකා බලන ලද උපකල්පනයන්ට අනුව වාහන තදබදය සඳහා බලපානු ලබන වාහන ප්‍රමාණය පැයකට වාහන 380,000 ක් වන අතර එම වාහන ප්‍රමාණය සඳහා සපයාදිය යුතු මාර්ග අවකාශය (Accommodation Capacity) 1200 (වාහන\පැය\දවසකට) ක් පමණ වේ. ඒ අනුව අනාගතයේදී සපයා දිය යුතු මාර්ග මංතීරු සංඛ්‍යාව මංතීරු 324 ක් පමණ වේ

*රූපය 6.3 : බස්නාහිර පළාත් ප්‍රධාන මාර්ග ඔස්සේ වාහන තදබදය විශ්ලේෂණය*




**මූලාශ්‍රය:** *COM Trans අධ්‍යනය, ORIENTAL CONSULTANTS CO., LTD.,2014*

හෝමාගම මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපයා මාර්ග සැලැස්ම පිළිබඳ තීරණයක් ගැනීමට පළමුව ඊට පරිබාහිර නගරාශ්‍රිතව සිදුවන මහා මාර්ග හා දුම්රිය මාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය, දුම්රිය දෙපාර්තමේන්තුව මගින් සංවර්ධනය කිරීමට යෝජනා කරන ලද මහා මාර්ග හා අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘති ඇතුළුව විදුලි දුම්රිය මාර්ග ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් නගර පාදක කර ගනිමින් 2031 වර්ෂය සඳහා සිදු කරනු ලබන සංවර්ධන සැලසුම් හරහා සංවර්ධනය කිරීමට යෝජනා කරන ලද මහා මාර්ග හා ප්‍රවාහන සම්බන්ධ ව්‍යාපෘති පිළිබඳවද මෙහිදී විශේෂ අවධානය යොමු කර ඇත. තවද දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය හා මිල්ලෑව අධ්‍යාපන කලාපය පදනම් කරගනිමින් සංවර්ධනය කිරීමට යෝජනා කරන ලද මාර්ග සංවර්ධන ව්‍යාපෘති කෙරෙහිද අවධානය යොමු කිරීමක් සිදු කොට ඇත. විශේෂයෙන්ම හෝමාගම සැලසුම් සීමාවට පරිබාහිරව සිදුකරනු ලබන නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ද සැලකිලිමත්වී ඇති බව සඳහන් කළ හැකිය.

**සිතියම 6.2 :** *නගරාන්තර මහා මාර්ග හා දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘති*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.5.2. යෝජිත මහාමාර්ග සංවර්ධන ධූරාවලිය

### 6.5.2.1. යෝජිත A වර්ගයේ මාර්ග හා B වර්ගයේ මාර්ග

මෙම නගරාන්තර මහා මාර්ග හා ප්‍රවාහනය සම්බන්ධ ව්‍යාපෘති සැලකිල්ලට ගනිමින් සහ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව 2031 වර්ෂය වන විට ළඟා කර ගැනීමට බලාපොරොත්තු වන ගොඩනැගිලි ඝනත්වය පදනම් කර ගනිමින් හෝමාගම සැලසුම් ප්‍රදේශය තුල අභ්‍යන්තර මාර්ග සංවර්ධනය වීමේ ධූරාවලියක් හඳුනා ගැනීම සිදු කර ඇත.

ඒ අනුව යමින් හෝමාගම සැලසුම් ප්‍රදේශය හරහා දිවෙන මංතීරු හතරක් සහිතව සංවර්ධනය කිරීමට යෝජිත සියළුම මාර්ග A කාණ්ඩයේ මාර්ග ලෙස හඳුනා ගෙන ඇති අතර, රට හයිලෙවල් මාර්ගය (A4), කොළඹ හොරණ මාර්ගය (B84) මාර්ගය, ලෝලෙවල් (අවිස්සාවේල්ල) මාර්ගය අයත් වේ.

හෝමාගම සංවර්ධන සැලැස්ම (2022–2031) අනුව මංතීරු දෙකක් සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කරන ලද මාර්ග B කාණ්ඩයේ මාර්ග ලෙස හඳුනා ගෙන ඇති අතර එම මාර්ග පහත අනුව පෙළ ගැස්විය හැකිය. සංවර්ධන සැලැස්ම සකස් කිරීමට සමගාමීව සිදුකරන ලද විස්තරාත්මක විශ්ලේෂණයන්ට අනුව (Connectivity, Integration Analysis And Concept Of Development Plan) හඳුනාගන්නා ලද මෙම මාර්ගයන් ප්‍රදේශයේ සංවර්ධනයේ මාර්ගෝපදේශකයා ලෙස සඳහන් කළ හැකිය. යෝජිත වැඩි ඝනත්වයකින් යුතුව සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශය ආවරණය වන පරිදි කොටු දැලක් (Grid Pattern) ලෙස B කාණ්ඩයේ මාර්ග හඳුනා ගැනීම මෙහිදී සිදු කර ඇත. එම මාර්ග පහත පරිදි නම් කළ හැකිය.

1. *තිරිපිටිය – සියඹලාගොඩ පාර හෙවත් පොල්ගස්ඕවිට පාර*
2. *කහතුඩුව – කිරිවත්තුඩුව පාර*
3. *කිරිගම්පමුණුව – ශ්‍රී සරණංකර පාර*
4. *මාලපල්ල මාර්ගය හෙවත් හෝමාගම ගලවිල කොට්ටාව මාර්ගය*
5. *හෝමාගම තලගල මාර්ගය*
6. *දාම්පේ – පිටිපන මාර්ගය*
7. *මීගොඩ,දාම්පේ බෙරකටිය මාර්ගය*
8. *නැදුන්හේන, නාවලමුල්ල,වැලිපිල්ලෑව මාර්ගය හා ලෙනගල මාර්ගය*
9. *යෝජිත බටහිර අතුරු මාර්ගය*
10. *උඩුවන පන්සල හන්දිය මාර්ගය හෙවත් පිටිපන, මාවත්ගම, ඕවිටිගම, උඩුවන මාර්ගය*
11. *යෝජිත මාහේනවත්ත සිට මිල්ලෑව දක්වා දිවෙන නව මාර්ගය*
12. *හබරකඩ – රණාල මාර්ගය*
13. *ඕවිලාන – මාදුලාව මාර්ගය*
14. *ගලගෙදර – හොරණ මාර්ගය*
15. *(B 267) මාම්පේ – කොට්ටාව මාර්ගය (කොට්ටාව – පිලියන්දල මාර්ගය)*
16. *(B 239) කොට්ටාව – තලගල මාර්ගය*
17. *(B 452) වල්ගම – දියගම මාර්ගය (මොරගහහේන පාර)*
18. *(B 451) වල්ගම – අතුරුගිරිය මාර්ගය*
19. *(B 240) කෝට්ටේ – බෝපේ මාර්ගය (මාලඹේ – ගොඩගම මාර්ගය)*
20. *(B 354) පනාගොඩ හේන්පිට මාර්ගය*

*ඉහත මාර්ග කාණ්ඩයට අයත් නොවන එහෙත් පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන නඩත්තු කරනු ලබන මාර්ග හා ඒ වර්ගයේ මාර්ග කාණ්ඩයට ඇතුලත් නොවන මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අනෙකුත් මාර්ග බී කාණ්ඩය යටතට ගැනෙන අතර එම මාර්ගයන් සඳහා යෝජිත මාර්ග පළල අදාළ නොවන අතර ගොඩනැගිලි සීමාවන් බලපැවැත්වේ.*

**සිතියම 6.3 :** *යෝජිත A හා B කාණ්ඩයේ මාර්ග*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.5.2.2. මාර්ග නිර්මාණය විය යුතු ආකාරය හා එහි සැලසුම් ක්‍රියාමාර්ග

***රූපය 6.4 :** යෝජිත A කාණ්ඩයේ මාර්ග නිර්මාණය විය යුතු ආකාරය*




***සැකසුම:** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

***රූපය 6.5 :** යෝජිත B කාණ්ඩයේ මාර්ග නිර්මාණය විය යුතු ආකාරය*




***සැකසුම:** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.5.2.3. සංවර්ධනය කිරීමට යෝජිත C කාණ්ඩයේ මාර්ග

***සිතියම 6.4 :*** *යෝජිත C කාණ්ඩයේ මාර්ග*




***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.5.2.4. C කාණ්ඩයේ මාර්ග නිර්මාණය විය යුතු ආකාරය හා එහි සැලසුම් ක්‍රියාමාර්ග

***රූපය 6.6 :*** *යෝජිත C කාණ්ඩයේ මාර්ග නිර්මාණය විය යුතු ආකාරය*




***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 ට අනුව එහි ප්‍රධාන අරමුණු අතර දියුණු අතුරු මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම හා වැඩි සනත්වයකින් යුතුව සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන කලාපය තුල C කාණ්ඩයේ මාර්ග සනත්වය වර්ධනය කිරීම හරහා අපේක්ෂිත සංවර්ධනය අත් කර ගැනීම අරමුණ වේ.

එමෙන්ම උපක්‍රමානුකූලව වැඩි බර තැබීමකින් සංවර්ධනය කිරීමට හඳුනාගන්නා ලද නගර වන හෝමාගම, ගොඩගම හා කහතුඩුව සංවර්ධනය කිරීමට මෙම අතුරු මාර්ග පද්ධතිය සම්බන්ධ කර ගැනීම මෙහි නවත් අරමුණක් ලෙස විශේෂයෙන් සඳහන් කළ හැකිය.

එපමණක් නොව අනාගතයේදී වර්ධනය විය හැකි ජනගහනය පරිසර සංවේදී කලාපවලට යොමුවීම වැලැක්වීම පිණිස කරනු ලබන සංවේදී උපක්‍රමයක් ලෙසත්, නගර සංවර්ධන සැලසුම් සංකල්පය යටතේ අපේක්ෂිත නාගරික ආකෘතිය (Urban Form) භූමිය තුල නිර්මාණය වීමට අවැසි අවකාශය සකස් කිරීමේ මූලික අවධිය ලෙසත්, මෙම C කාණ්ඩයේ මාර්ග පද්ධතිය හඳුන්වා දිය හැකිය.

C කාණ්ඩයේ මාර්ග හඳුනා ගැනීමේදී ප්‍රධාන වශයෙන්ම යෝජිත A හා B කාණ්ඩයේ මාර්ග වලට සෘජු සම්බන්ධතාවක් පවතින මාර්ග කෙරෙහි වැඩි අවධානයක් යොමුකර ඇති බව සඳහන් කළ යුතුය. එපමණක් නොව සංවර්ධන සැලසුම් සංකල්පය භූමිය තුල ස්ථාපනය කිරීම උදෙසා යොදන ලද මූලික සැලසුම් රාමුව ලෙස මාර්ග පද්ධතිය නිර්මාණය කිරීමත්, අනෙකුත් ප්‍රදේශ වල ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන ව්‍යාපෘතිවල අනාගත ප්‍රතිලාභ අත්කරගැනීමේ මාධ්‍යක් ලෙසද මෙම මාර්ග පද්ධතිය ක්‍රියාත්මක කිරීම අනු අරමුණු අතර වේ.

මෙමෙ සංවර්ධන සැලැස්ම යටතේ මංතීරු මීටර් 7 ලෙස සංවර්ධනය කිරීමට හඳුනා ගන්නා ලද මාර්ගයන් C කාණ්ඩයේ මාර්ග ලෙස හැඳින්විය හැක. මෙම මාර්ගයන් හෝමාගම සංවර්ධන සැලැස්මේ පරිච්ඡේදය 9 හි සඳහන් කර ඇති අතර එම මාර්ග ලැයිස්තුවේ නම හෝමාගම ප්‍රාදේශීය සභාව මගින් සඳහන් කරන ලද මාර්ග නාමලේඛනයේ සඳහන් නම හා නොගැලපෙන විට සිතියම් අංක 6.4 අනුව මාර්ගය හඳුනාගත යුතුය.

D කාණ්ඩය යටතට ගැනෙන මාර්ගයන් පහත පරිදි කාණ්ඩ කල හැක.

1. *ඉහත B හා C කාණ්ඩයට අයත් නොවන,*
    - *ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශිත සියලු මාර්ග*
    - *ප්‍රාදේශීය සභාව නඩත්තු කරන මාර්ග*
    - *පළාත් පාලන ආයතන විසින් පවරාගෙන ඇති මාර්ග*
    - *පළාත් පාලන ආයතන විසින් නඩත්තු කරන මාර්ග*
2. *පෞද්ගලික අයිතිය තහවුරු කල නොහැකි මාර්ග*

ඉහත මාර්ග සඳහා වන යෝජිත මාර්ග පළල පහත පරිදි විය යුතුය.

***වගුව 6.1 :*** *යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන් සඳහා වන පිරිවිතරයන්*

| **කාණ්ඩය** *(Grade)* | **මංතීරු සංඛ්‍යාව** *(No.Lanes)* | **සේවා තීරු** *(Service Line)* | **යෝජිත මාර්ග පළල** *(Proposed Road Width)* |
|---|---|---|---|
| *A* | *4* | *අදාල වේ.* | *23.4 මීටර* |
| *B* | *2* | *අදාල වේ.* | *13.4 මීටර* |
| *C* | *2* | *අදාල වේ.* | *7 මීටර* |
| *D* | *2* | *නැත* | *6 මීටර* |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

ඉහත වගුව අංක 6.1 හි සඳහන් පරිදි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සතුව පවත්නා මාර්ගයන්හි යෝජිත මාර්ග පළල හා ගොඩනැගිලි සීමාව ඉහත පරිදි විය යුතු අතර අනාගත සංවර්ධන අවකාශය හා 2031 සංවර්ධන සැලසුම් දැක්ම ලඟා කර ගැනීම මෙහි මූලික අරමුණ වී ඇත.

තවද සංවර්ධනයේදී මෙම මාර්ග පළල හා ගොඩනැගිලි සීමාවන් කලාප සංගුණකය තීරණය වීම කෙරෙහි බලපාන ආකාරය හෝමාගම සංවර්ධන සැලැස්මේ දෙවන වෙළුමෙහි තවදුරටත් සඳහන් කර ඇත. එහිදී වගු අංක 6.1 හි එන පිරිවිතරයන් පිලිබඳ සලකා බැලීම සිදු කල යුතු වේ. නේවාසිකයන්ට ප්‍රියමනාපවත් හා සැප පහසු ජීවිතයක් අත්කර දීම උදෙසා කරනු ලබන උත්ප්‍රේරකයක් ලෙසද මෙය ක්‍රියාත්මක කිරීම අභිප්‍රායක් වී ඇත. ඒ තුලින් ප්‍රදේශය පුරා ග්‍රාමීය ලක්ෂණ සුරක්ෂිත කිරීමත්, හරිත ප්‍රදේශ වර්ධනය කිරීමත් අපේක්ෂාව වී ඇති බව තවදුරටත් සඳහන් කළ හැකිය.

## 6.5.3. යෝජිත බහු මහල් වාහන නැවතුම් අංගන සැලැස්ම

යෝජිත කලාපීකරණ සැලැස්ම යටතේ හෝමාගම, ගොඩගම හා කහතුඩුව යන ප්‍රදේශ වැඩි ඝනත්ව වාණිජ කලාප (High Density Commercial Zone) ලෙස සංවර්ධනය කිරීමට අදහස් කර ඇති අතර එහි සැරිසරන මගී ජන සංඛ්‍යාව පහත පරිදි සඳහන් කළ හැකිය.

***වගුව 6.2 :*** *හෝමාගම ප්‍රධාන වාණිජ කලාප තුල සංසරණය වන ජන සංඛ්‍යාව*

| | ***සංසරණය වන ජනසංඛ්‍යාව*** |
|---|---|
| *හෝමාගම (High Density Commercial Zone 1)* | *69697* |
| *ගොඩගම (High density Commercial Zone 2)* | *18665* |
| *කහතුඩුව (High Density Commercial Zone 3)* | *34684* |

***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

මේ අනුව මාර්ග තදබදය සම්බන්ධයෙන් කරන ලද අධ්‍යයනයන්ට අනුව හෝමාගම, ගොඩගම හා කහතුඩුව යන කලාපවල සැරිසරන වාහන ප්‍රමාණය පිළිවෙලින් පැයකට වාහන 21138, 2595 සහ 4888 ක අගයක් ගනී.එපමණක් නොව යෝජිත සංවර්ධන ව්‍යාපෘති අන්තර්ගත කර ගනිමින් සිදුකරන ලද Integration Analysis, Connectivity Analysis සහ Gephi Analysis වලට අනුව ද හෝමාගම, ගොඩගම හා කහතුඩුව යන නගර වල මහාමාර්ග හා ප්‍රවාහනය මෙන්ම නාගරික ක්‍රියාකාරකම් (Urban Activities) ඒකාබද්ධ වීම (Integration) ඉස්මතු වන අතර ප්‍රවාහනය හා ගමනාගමන පහසුකම් සැපයීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යෝජිත සැලැස්ම තුළ යොමු කිරීම ඉතා වැදගත් වේ.

***රූපය 6.7 :*** *Gephi විශ්ලේෂණය*



***රූපය 6.8 :*** *Connectivity විශ්ලේෂණය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

***රූපය 6.9 :*** *Integration විශ්ලේෂණය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

***රූපය 6.10 :*** *බස්නාහිර පළාත තුළ මාර්ග වල සම්බන්ධතාව*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

මේ සියළු සංසන්දනාත්මක විශ්ලේෂණයන්ට අනුව බහුමහල් වාහන නැවතුම් අංගන නිර්මාණය වීමේ අවශ්‍යතාවය පැහැදිලි කළ හැකි අතර හෝමාගම, ගොඩගම හා කහතුඩුව යන නගර සංවර්ධන ව්‍යාපෘති හරහා එම එක් එක් නගර මධ්‍ය සඳහා බහුමහල් වාහන නැවතුම් අංගන නිර්මාණය කිරීම යෝජිත බව නැවත වරක් සඳහන් කළ යුතුව ඇත.

තවද මෙලෙස යෝජනා කරනු ලබන බහුමහල් වාහන නැවතුම් අංගන හුදෙක් ආර්ථික අවශ්‍යතා සඳහා පැමිණෙන මගී ජනතාව සඳහා පමණක් නොව හෝමාගම ප්‍රදේශයේ සැරිසරන සියළුම මගීන්ගේ ප්‍රවාහන හා ගමනාගමනයේ පහසුව තකා වෙන් විය යුතු බව මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වේ. ඒ අනුව යෝජිත බහුමහල් වාහන නැවතුම් අංගන නිර්මාණය කිරීමට යෝජිත ප්‍රදේශ පහත පරිදි පෙන්වා දිය හැකිය.

- ***හෝමාගම නව නගර මධ්‍ය - යෝජිත පොදු බහුමහල් වාහන නැවතුම් අංගනය***

***රූපය 6.11 :*** *හෝමාගම නව නගර මධ්‍ය - යෝජිත පොදු බහුමහල් වාහන නැවතුම් අංගනය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

හරිත නගර සංකල්පය පෙරදැරි කරගෙන සිදු කරනු ලබන හෝමාගම නව නගර ව්‍යාපෘතිය යටතේ නගරය කියවීමේ හැකියාව (Legibility) තවත් තීව්‍ර කරනු සඳහා හරිත ගොඩනැගිලි නියාමනය යටතේ යෝජිත බහුමහල් වාහන නැවතුම් අංගනය නිර්මාණය විය යුතු වීම මෙහි සුවිශේෂී ලක්ෂණයක් වේ.

- ***ගොඩගම නගර මධ්‍ය - යෝජිත පොදු වාහන නැවතුම් අංගනය***

***රූපය 6.12 :*** *හෝමාගම නව නගර මධ්‍ය - යෝජිත පොදු බහුමහල් වාහන නැවතුම් අංගනය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

- ## කහතුඩුව නගර මධ්‍ය - යෝජිත පොදු වාහන නැවතුම් අංගනය

***රූපය 6.13 :*** *කහතුඩුව නව නගර මධ්‍ය - යෝජිත පොදු වාහන නැවතුම් අංගනය*







***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

- ## හෝමාගම මූලික රෝහල පරිශ්‍රය - යෝජිත පොදු වාහන නැවතුම් අංගනය 2

***රූපය 6.14 :*** *හෝමාගම මූලික රෝහල පරිශ්‍රය - යෝජිත පොදු වාහන නැවතුම් අංගනය 2*







***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020 වර්ෂය*

- ## දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන සැලැස්ම හරහා ඉදිකිරීමට යෝජිත බහුමහල් නැවතුම් අංගනය

දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන සැලැස්මට අනුව ප්‍රවාහනය හා ගමනාගමනය සම්බන්ධයෙන් සිදු කරන ලද විශ්ලේෂණයටන්ට අනුව තාක්ෂණ කලාපය තුල පැයක් ඇතුලත සැරිසරන මුළු වාහන ප්‍රමාණය 261,685 (Vehicle/Hour) ක් බව හඳුනා ගෙන ඇත. ඒ අතුරින් ප්‍රදේශය තුල සැරිසරන සමස්ථ පෞද්ගලික වාහන ප්‍රමාණය 248,094 ක අගයක් ගනී. හෝමාගම තාක්ෂණ නගර සංවර්ධන සැලැස්මට අනුව යෝජිත විදුලි දුම්රිය නැවතුම් ස්ථානය (LRT) වටා විශ්වවිද්‍යාල ජාලයක් එකතැනකට ඒකරාශී වීමක් (Education Cluster) දක්නට ලැබේ. ඒ අනුව ඉහතින් සඳහන් කරන ලද 248,094 ක් වූ පෞද්ගලික වාහන ප්‍රමාණයෙන් 40% කට ආසන්න ප්‍රමාණයක් විශ්වවිද්‍යාල පද්ධතිය ආශ්‍රිතව ඒකරාශී

වේයැයි උපකල්පනය කළහොත්, එම ප්‍රදේශයට පැයකට පැමිණෙන වාහන සංඛ්‍යාව 99000 ක පමණ ප්‍රමාණයක් බවට අනුමාන කළ හැකිය. දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ පළවන අදියර යටතේ උසස් අධ්‍යාපන අංශයේ සංවර්ධන කටයුතු සිදුවන හෙයින් සංවර්ධන සැලැස්ම හරහා පොදු බහුමහල් වාහන නැවතුම් අංගනයක් ඉදිකිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

***රූපය 6.15 :** දැනුම් කේන්ද්‍රීය නගර කලාපය තුල යෝජිත බහුමහල් නැවතුම් අංගනය*



***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

## 6.5.4. යෝජිත අතුරු මාර්ග හා සේවා මාර්ග *(Proposed By Pass Roads & Service Road Developments)* සංවර්ධන ව්‍යාපෘති

හෝමාගම නගර මධ්‍ය දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වනුයේ වර්ග කිලෝමීටර 2 කට ආසන්න ප්‍රදේශයක නාගරික ක්‍රියාකාරකම් මේ වන විට ව්‍යාප්තව ඇති ආකාරයයි. නගර මධ්‍යයේ ප්‍රධාන නාගරික අංග (Main Urban Activities) ලෙස සැලකෙන හෝමාගම මූලික රෝහල, දුම්රිය නැවතුම් ස්ථානය, පොදු වෙළඳපොළ, පරිපාලන ඒකකය, උසාවිය, බස්නැවතුම් ස්ථානය, පොලිසිය, පාසැල්, වෙළඳ මධ්‍යස්ථාන මෙම වපසරිය තුළ ව්‍යාප්ත වී ඇත.

තවද 2031 වර්ෂය සඳහා සකස් කරන ලද හෝමාගම සංවර්ධන සැලැස්ම යටතේ හෝමාගම නගරය ඇතුලත් කරගනිමින් සීමා සලකුණු කරන ලද වැඩි ඝනත්ව වාණිජ කලාපය (High Density Commercial Zone) ලෙස සංවර්ධනය කිරීම අපේක්ෂා කර ඇත. ඒ අනුව හෝමාගම නගර මධ්‍ය තුල ප්‍රධාන නාගරික පහසුකම් (Urban Facilities) සඳහා පහසුවෙන් ළඟා වීමට හැකි පරිදි හා කාර්යක්ෂම ගමනාගමන පහසුකම් පද්ධතියක් ස්ථාපිත කිරීමේ අරමුණින් මෙන්ම මාර්ග අතර ඒකාබද්ධතාව (Intergration) තීව්‍ර කිරීමේ අරමුණෙන් පහත පරිදි අතුරු මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා අවධානය යොමු කර ඇත.

2031 හෝමාගම සංවර්ධන සැලැස්ම අනුව හෝමාගම කලාපය (High Density Commercial Zone) තුල සැරිසරන මගී ජනගහනය දිනකට මිනිසුන් 69000 ක ප්‍රමාණයක් බව පුරෝකථනය කර ඇත. මේ අනුව නගර මධ්‍ය තුල මිනිසුන්ට පහසුවෙන් ගමන් කිරීමෙන් හා පොදු ප්‍රවාහන සේවාවලට ළඟා වීම හරහා තම එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා කාර්යක්ෂම (Efficient) හා ඒකාබද්ධ (Integrated) මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම අත්‍යාවශ්‍ය වේ. විශේෂයෙන්ම රෝහල, පරිපාලන ඒකක, බස්නැවතුම්-පොළ, දුම්රිය නැවතුම්පොළ හා පොදු වෙළඳ ඒකක අතර කාර්යක්ෂම හා පහසු මගී සංසරණයක් සඳහා අවශ්‍යය අවකාශය සකස්කර දීම මෙහි ප්‍රධාන අරමුණු අතර වේ. එපමණක් නොව හෝමාගම නව නගර සංවර්ධනය හරහා නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන නාගරික උද්‍යාන හා අනෙකුත් ආර්ථික පහසුකම් කෙරෙහිද මෙහිදී විශේෂ අවධානයක් යොමු කර ඇත.

එපමණක් නොව හෝමාගම දැනුම් කේන්ද්‍රීය නගරයට ළඟා වීම සඳහා පවතින ප්‍රධාන මාර්ගය ලෙස හයිලෙවල් මාර්ගය හඳුනාගත හැකිය. මොරටුව විශ්ව විද්‍යාලය මඟින් සිදු කරන ලද මාර්ග ධාරිතා සමීක්ෂණයට අනුව හයිලෙවල් මාර්ගයේ ධාරිතාව පැයකට වාහන 2300කි. 2014 වර්ෂය වන විට එය 2000ක් දක්වා වර්ධනය වී ඇත. 2031 වර්ෂයේදී හෝමාගම ප්‍රදේශය හා ඒ අවට අනෙකුත් නගර වල සිදුවන සීග්‍ර සංවර්ධනයන් හේතුවෙන් හෝමාගම කලාපය තුල (High Density Commercial Zone) මාර්ග තදබදය සඳහා බලපානු ලබන වාහන ප්‍රමාණය (Traffic Demand) පැයකට වාහන 22,296 ක් බව පුරෝකථනය කර ඇත. මේ අනුව හයිලෙවල් මාර්ගය තුල ඇතිවන මාර්ග තදබදය මඟහරවා ගැනීම උදෙසා හා දැනුම් කේන්ද්‍රීය නගරය තම ගමනාන්තය ලෙස අරමුණු කර පැමිණෙන මගීන්ට ඉක්මනින් හා පහසුවෙන් එහි ළඟා වීම උදෙසාත් මෙම අතුරැ මාර්ග සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කළ බව පැහැදිලි කළ හැක.

*රූපය 6.16 : වැඩි ඝනත්ව වාණිජ කලාපය 1 තුල යෝජිත අන්තර් මාර්ග හා සේවා මාර්ග*




***මූලාශ්‍රය :** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

මහා මාර්ග හා ප්‍රවාහන සංවර්ධන උපාය මාර්ග සැලැස්ම

යෝජිත බහු මහල් වාහන නැවතුම් අංගන සැලැස්ම

**වගුව 6.3 :** *වැඩි ඝනත්ව වාණිජ කලාපය 1 තුල යෝජිත අන්තර් මාර්ග හා සේවා මාර්ග*

| | මාර්ගයේ නම | දිග | සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන ආකාරය |
|---|---|---|---|
| 1 | බටහිර අතුරු මාර්ගය | 1 කිලෝමීටර් | මංතීරු 4 කින් යුක්ත වේ. |
| 2 | මඩවලකුඹුර මාර්ගය | 700 මීටර් | මංතීරු 2 කින් යුක්ත වේ (7m). |
| 3 | නගර සීමා මාවත | 1 කිලෝමීටර් | මංතීරු 2 කින් යුක්ත වේ. (7m) |
| 4 | රෝහල මාවත | 800 මීටර් | මංතීරු 2 කින් යුක්ත වේ (7m). |
| 5 | වලව්ව පාර | 700 මීටර් | මංතීරු 2 කින් යුක්ත වේ. (7m) |
| 6 | ගලවිල මාර්ගය | 3 කිලෝමීටර් | මංතීරු 2 කින් යුක්ත වේ. (13.4m) |
| 7 | ඩෙන්සිල් කොබ්බැකඩුව මාර්ගය | 1.26 මීටර් | මංතීරු 2 කින් යුක්ත වේ./ (7m) |

**මූලාශ්‍රය :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

- ## ගොඩගම නගර මධ්‍ය

**රූපය 6.17 :** *ගොඩගම යෝජිත අතුරු මාර්ග හා සේවා මාර්ග සංවර්ධනය කිරීම්*




**මූලාශ්‍රය :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

**වගුව 6.4 :** *ගොඩගම යෝජිත අතුරු මාර්ග හා සේවා මාර්ග*

| | මාර්ගයේ නම | දිග | සංවර්ධනය කිරීමට බලාපොරොත්තුවන ආකාරය |
|---|---|---|---|
| 1 | නව අතුරු මාර්ගය 1 | 2 km | මංතීරු 2 ක් සහිතව (7m) |
| 2 | නව අතුරු මාර්ගය 2 | 1 km | 9m |
| 3 | නව සේවා මාර්ගය 3 | 1 km | 9m |

**මූලාශ්‍රය :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

- කහතුඩුව නගර මධ්‍ය

*රූපය 6.18 : යෝජිත සේවා මාර්ගය කහතුඩුව නගරය*




*මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

මීටර 450 ක පමණ දිගකින් යුත් මෙම යෝජිත සේවා මාර්ගය මංතීරු 2ක කින් (අඩි 30) යුතුව නිර්මාණය කිරීමට යෝජනා කර ඇත.

## 6.5.5. යෝජිත මීගොඩ කුඩා ප්‍රවාහන මධ්‍යස්ථානය නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය

*රූපය 6.19 : යෝජිත මීගොඩ ප්‍රවාහන මධ්‍යස්ථානය*



*මූලාශ්‍රය : තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

මෙහිදී මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය හා මීගොඩ දුම්රිය නැවතුම් ස්ථානය ආශ්‍රිත අක්කර 6 ක භූමි ප්‍රදේශය පිළිබඳ අවධානය යොමු කර ඇත. වාණිජ හා ව්‍යාපාර අරමුණු කර ගනිමින් නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය තුළ සැරිසරන සමස්ථ ජගහනය දිනකට මිනිසුන් 30446 ක් බව පුරෝ-කථනය කර ඇති අතර, දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා වාණිජ අවශ්‍යතා මූලික කරගනිමින් ආකර්ෂණය වන පිරිසෙහිද ඉහළ යාමක් අපේක්ෂා කළ හැක.

නවද යෝජිත විදුලි දුම්රිය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මීට අන්තර්ගත කර ගෙන ඇති අතර, පොදු ප්‍රවාහන සේවාවක් ලබා දීමටද මින් අපේක්ෂා කර ඇත.

### 6.5.6. යෝජිත මාකුඹුර අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

***රූපය 6.20 :*** *යෝජිත රුවන්පුර අධිවේගී මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*




***මූලාශ්‍රය :*** *රුවන්පුර අධිවේගී මාර්ග ව්‍යාපෘතිය, මාර්ග සංවර්ධන අධිකාරිය,2017*

ජාතික අවශ්‍යතාවයක් මත මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන රුවන්පුර අධිවේගී මාර්ගය හෝමාගම කහතුඩුව අධිවේගී මාර්ගයෙන් ප්‍රවේශය ලබා ගන්නා අතර, රත්නපුර නගරය දක්වා ඉදිකිරීමට යෝජනා වී ඇත.

## 6.6. තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග සැලැස්ම (Sustainable Environment Development Strategic Plan)

### 6.6.1. හැඳින්වීම

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 හි දැක්මට අනුව හෝමාගම ප්‍රදේශය අනාගතයේදී හරිත නගරයක් ලෙස සංවර්ධනය කිරීමට මුලිකවම වැදගත්වන සැලැස්මක් ලෙස තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග සැලැස්ම ඉදිරිපත් කළ හැක.

මෙම සැලැස්මෙහි දැක්මෙහි ප්‍රකාශනය පරිච්ඡේදයේ දක්වා ඇති අයුරින් හරිත සංකල්පය ඉස්මතු කිරීම ප්‍රධාන අරමුණකි. හෝමාගම ප්‍රදේශය තුල පවතින භෞතික හා පාරිසරික පිහිටීම දෙස විශේෂ අවධානයක් යොමු කරමින් අනාගතයේදී එම භෞතික හා පාරිසරික ප්‍රදේශයන් තිරසාර භාවිතයන් කරා යොමු කර ගන්නා ආකාරය විස්තරාත්මකව පරිසර උපාය මාර්ග සැලැස්ම මගින් ඉදිරිපත් කෙරේ. මෙහි විශේෂත්වයක් ලෙස තාක්ෂණය හා නව නිපැයුම් සඳහා අවකාශය වෙන් වූ බුද්ධිමතුන්ගේ නගරයක් වන හෝමාගම ප්‍රදේශය රට අනුරූපී වූ සාමකාමී නිදහස් චින්තනයක් සඳහා උපකාරී වන පරිසර පද්ධතින්ගෙන් අනුනවූ නගරයක් කරා රැගෙන යාමේ උපාය මාර්ගයන් මෙම සැලැස්ම තුල අන්තර්ගත කර ඇත.

2018 වර්ෂය සඳහා හෝමාගම සැලසුම් ප්‍රදේශය උදෙසා සකස් කරන ලද භූමි පරිහරණ දත්ත අනුව එහි මුළු භූමි ප්‍රමාණයෙන් 25% ක ප්‍රමාණයක් හරිත ප්‍රදේශය ලෙස භාවිතාවන ආකාරයක් දැකිය හැක. තවද ඉන් 2% ක ප්‍රමාණයක් පහත්බිම් බිම්, කුඹුරු වශයෙන්ද 1% ක ප්‍රතිශතයක් තෙත් බිම් ලෙසද තවත් 1% ක ප්‍රමාණයක් ජලජ ප්‍රදේශය ලෙසද ව්‍යාප්ත වී ඇති ආකාරයක් දැකිය හැක.

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 අනුව එහි දැක්ම වනුයේ "බුද්ධිමතුන්ගේ හරිත නගරය" යන්නයි. එමෙන්ම සංවර්ධන සැලැස්ම ප්‍රධාන අරමුණක් වනුයේ පරිසරය සුරකින හරිත නගරයක් නිර්මාණය කිරීමයි. ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම යටතේ පවතින හරිත ප්‍රදේශ හා ජලජ ප්‍රදේශ සුරක්ෂිත කිරීමත් ඒවා වැඩි දියුණු කිරීමත් යන අභිමතාර්ථය මූලික කරගනිමින් සකස් කර ඇති බව මෙහිදී සඳහන් කළ හැකිය.

## 6.6.2. පරිසර සංරක්ෂණ ප්‍රදේශ

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙහි පවතින තෙත්බිම් පහත අකාරයට වර්ගීකරණය කර දැක්විය හැකිය.

I. *මිරිදිය ජලාශ හා ජලමාර්ග, වගුරු බිම්*
II. *අත්හැර දැමූ මැටි වලවල්, සහ කැනීම් ප්‍රදේශ ඇතුලත්ව නොගැඹුරු මිරිදිය වගුරු බිම්*
III. *අත්හරින ලද කුඹුරු බිම් (පුරන් වූ කුඹුරු)*
IV. *කුඹුරු බිම් /දෙනිය/ඹිවිට/පිල්ලෑව/ගොඩවල*

බස්නාහිර පළාත් තෙත්බිම් කලාපීකරණ සැලැස්මට අනුව හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තෙත්බිම් පහත ආකාරයට කලාප 02 කට වෙන් කල හැකිය.

1. *තෙත්බිම් ස්වභාවික සංරක්‍ෂිත කලාපය*
2. *කුඹුරු වගා හා තෙත්බිම් කෘෂිකාර්මික කලාපය*

### 01. තෙත්බිම් ස්වභාවික සංරක්‍ෂිත කලාපය

ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

### 02. කුඹුරු වගා හා තෙත්බිම් කෘෂිකාර්මික කලාපය

පවතින වගා කුඹුරු, පුරන්වූ කුඹුරු බිම් සහ රිට සම්බන්ධ දෙනිය, ඹිවිට යනාදී අනුශාංගික ප්‍රදේශ සහ තෙත්බිම් කෘෂිකර්මාන්තය සිදුකරන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කුඹුරු බිම් සහ අත්හරින ලද කුඹුරු බිම් විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර එම පහත් භූමි ප්‍රදේශයන් ජල රැඳවුම් සහ ජල බැසයාමේ හැකියාව සහ ගංවතුර අවධානම අවම කිරීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් සංරක්ෂණය කල යුතුය.

හෝමාගම තෙත්බිම් කලාපීකරණ සැලැස්ම සිතියම් අංක 6.5. මඟින් දක්වා ඇති අතර කලාප සඳහා වූ සාමාන්‍යය කොන්දේසි, මාර්ගෝපදේශයන් සහ විශේෂිත සංවර්ධන කොන්දේසි හෝමාගම සංවර්ධන සැලැස්මේ දෙවන කොටසෙහි සඳහන් කර ඇත.

**සිතියම 6.5 :** *තෙත්බිම කලාපීකරණ සැලැස්ම හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය 2022-2031*




**මූලාශ්‍රය :** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරි, 2021*

## 6.6.3. භූදර්ශන කළමනාකරණ සැලැස්ම



මෙම සැලැස්ම මගින් ප්‍රදේශයේ පවත්නා ස්වභාවික භූදර්ශන ලක්ෂණ සංරක්ෂණය සහ තීව්‍ර කිරීම ප්‍රධානම අරමුණ වේ. එමගින් නගරයට පවතින අනන්‍යතාවය ආරක්ෂා කරගත හැකිවේ.

එයට අමතරව පාරිසරික වශයෙන් සංරක්ෂණය පෙරදැරි කරගත් ක්‍රමවත් සැලසුම් මගින් විවිධ පරිසර පද්ධති මං මාවත් ආදිය තිරසාර ලෙස භූදර්ශන සංවර්ධනය මෙම සැලැස්ම මගින් අපේක්ෂිතය.

ගෝලීය කාලගුණ විපර්යාස සඳහා අනාගතයේ මුහුණ දීමට හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ භූදර්ශන සැලසුම පහත අරමුණු අනුව සැකසෙනු ඇත.

(අ). *නාගරික උෂ්ණත්ව වැඩිවීම, කාබන් පියසටහන වැඩිවීම වායු දූෂණය වැඩිවීම, ජල ගැලීම් වැඩිවීම වැනි ආපදා තත්ත්වයන් අවම කිරීමට නාගරික වන ගහනය වැඩි කිරීම.*

(ආ). *නාගරික ජෛව විවිධත්වය වර්ධනය සඳහා පරිසරයට ආවේණික වූ දේශීය ශාක විවිධත්වයක් සහිතව එක් කිරීම.*

(ඇ). *අවිදින්නන් තවත් දිරිමත් කිරීමට සහ පදිකයන්ගේ ආරක්ෂාව සඳහා වෙන්වූ පදික මං තීරු සෙවන හා ආසන සහිතව ලබාදීම.*

(ඈ). *සංවේදී පරිසර පද්ධතීන් ආරක්ෂා කිරීම සහ ඥානාන්විත භාවිතයන් (Wise use) හඳුන්වා දීම මඟින් තිරසර ලෙස පරිසර හිතකාමී විනෝද කටයුතු සඳහා යොදා ගැනීම.*

(ඉ). *නාගරික චතුරස්‍ර, පොදු උද්‍යාන වැනි අපරව්‍යුහ පහසුකම් සහිත මනාව සැලසුම් කල විවෘත භූමි ප්‍රදේශ ජනතාව වෙනුවෙන් නිර්මාණය.*

(ඊ). *විවිධ උද්‍යාන, මං තීරු, සුදුසු දැන්වීම් පුවරු, විදුලි ආලෝකය එක් කිරීම මගින් නගරයට අලංකාරයක්, අනන්‍යතාවයක් මෙන්ම, ආර්ථිකමය සංවර්ධනයක්ද ලබාදීම.*

## 6.6.4. දර්ශනීය ස්ථාන (Scenic view points)

දර්ශනීය ස්ථාන බොහොමයක් හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හඳුනාගත හැකිය. ඒ අතර ඓතිහාසික ඇඹලව රත්ගල් වෙහෙර පිහිටි භූමි ප්‍රදේශය, ගලගෙදර පාලම අවට ප්‍රදේශය, හෙරලියාවල මාකන්දන මාර්ගය දෙපස සහ මත්තේගොඩ පස්වන පටුමග දෙපස දැක්විය හැකිය. තවද 2008-2025 හෝමාගම සංවර්ධන සැලැස්ම යටතේ හඳුනාගන්නා ලද ලීනාවත්ත සහ කුරුගල ප්‍රදේශ ද මෙම ප්‍රදේශ යටතට ගැනේ. මෙම දර්ශනීය ස්ථාන සුරැකෙන අයුරින් සංවර්ධන කටයුතු සිදුකිරීම තුලින් මෙම සුන්දර පරිසරය ආරක්ෂා කරගත යුතුය.

මෙහි සඳහන් දර්ශනීය ස්ථාන කිසිඳු හෙයකින් අවහිර වන ආකාරයේ ඉදිකිරීම්, ගොඩකිරීම් හෝ කසල බැහැර කිරීම් ආදිය හෝ ගල් කැඩීමක් හෝ එම ප්‍රදේශ විනාශවන ආකාරයේ කිසිඳු ක්‍රියාවක් සිදු නොකළ යුතුය. එමෙන්ම මෙම ස්ථාන හැරුණු විට හෝමාගම සැලසුම් ප්‍රදේශය තුල පවතින යම් මාර්ගයක් මැදි කරගත් නෙත් බිම් සැලැස්මට අදාල ඕනෑම ප්‍රදේශයක් එහි දර්ශනීය භාවයට තර්ජනයක් වන ආකාරයේ ක්‍රියාකාරකම් සඳහා අවස්ථාව ලබා නොදිය යුතුය.

*සිතියම 6.6 : දර්ශනීය ස්ථාන හෝමාගම සංවර්ධන සැලැස්ම 2021- 2030*




*මූලාශ්‍රය : පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.6.5. හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ආපදා අවධානම අවම කිරීමේ සැලැස්ම

- *පවතින ආපදා තත්ත්වය*

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වාර්තා වූ ප්‍රධානම ස්වභාවික ආපදා තත්ත්වය වන්නේ ගංවතුර ආපදා තත්ත්වයයි.

මෙම ගංවතුර ආපදා තත්ත්වය ඇතිවීම කෙරෙහි ප්‍රදේශයේ භූ විෂමතා තත්ත්වය ප්‍රධාන සාධකයක් වේ. එනම් ප්‍රදේශයේ බොහෝ භූ රූපණ ලක්ෂණයන් අඩ තැනි හෝ අවසාදිත තැන්පත් වූ දියළු නිම්න වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ප්‍රධාන ගංගා සහ එහි අතු ගංගා වල ජලවහන පද්ධතීන් මූලික ජලවහන ද්‍රෝණි දෙකකට අයත් වේ. එයින් පළමු වැන්න ප්‍රදේශයේ උතුරු මායිම අසලින් ගලන කැළණි ගඟට සම්බන්ධවන පුස්වැලි ඔය සහ හෙට්ටිගේ ඇල යන මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ඇල මාර්ග සහ ඔයවල් වලින් සම්බන්ධ කැළණි නිම්න මිටියාවත් ජල ද්‍රෝණියයි. දෙවැන්න නම් මහ ඔය, නුදුන් ඇල වැනි කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ අතු ඇල මාර්ග දෙකකින් සමන්විත වූ කළු ගඟ උප ජල ද්‍රෝණියක් වන බොල්ගොඩ ජලාශයට සම්බන්ධ වන ජල ද්‍රෝණි ප්‍රදේශයයි. ඉහත ඇල මාර්ග ආශ්‍රිත වගුරු හා දියලු ප්‍රදේශයන් බහුලව වී වගාව සඳහා භාවිතා වන අතර නිරන්තර ගං වතුර නිසා වගා හානිවලට ගොදුරු වන ප්‍රදේශයක්ද වෙයි. මෙලෙස ගංවතුරට ගොදුරු වන ප්‍රධාන ප්‍රදේශ ලෙස පහත සඳහන් ග්‍රාම නිලධාරී කොට්ඨාශ වාර්තා වේ (මෙම විස්තරය සිතියම් අංක 6.7 සහ වගු අංක 6.5 මඟින් දක්වා ඇත).

***වගුව 6.5 :*** *හෝමාගම සැලසුම් ප්‍රදේශය තුල ගංවතුර උවදුරට භාජනය වන ප්‍රදේශ*

| **ග්‍රාම නිලධාරී වසම** | **ගංවතුරට ගොදුරු වන ප්‍රදේශය (වර්ග කිලෝමීටර්)** |
|---|---|
| *ආටිගල නැගෙනහිර (446)* | *1.82* |
| *ආටිගල බටහිර (446A)* | *0.13* |
| *හබරකඩ උතුර (481)* | *0.39* |
| *හබරකඩ දකුණ (481B)* | *0.21* |
| *හෙන්පිට (451)* | *0.58* |
| *ජල්තර (449)* | *1.22* |
| *මීගස්මුල්ල (482E)* | *0.08* |
| *මීගොඩ උතුර (447)* | *0.08* |
| *මුල්ලේගම උතුර (481D)* | *0.17* |
| *මුල්ලේගම දකුණ (481A)* | *0.22* |
| *පනාගොඩ නැගෙනහිර (482A)* | *0.08* |
| *පනාගොඩ නගරය (482B)* | *0.18* |
| *පානළුව (447B)* | *1.48* |
| *වල්පිට (450A)* | *0.3* |
| *වටරැක උතුර (448B)* | *0.84* |
| *වටරැක දකුණ (448)* | *0.16* |
| ***ගංවතුරට ගොදුරු වන සමස්ත ප්‍රදේශය*** | ***7.94*** |

***මූලාශ්‍රය :*** *වාරිමාර්ග දෙපාර්තමේන්තුව - 2016*

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2016 මැයි මාසයේ ඇතිවූ ගංවතුර තත්ත්වයෙන් පුස්වැලි ඔය අවට ප්‍රදේශයේ පුද්ගලයන් 5266 ක් බලපෑමට ලක්වූ අතර ජීවිත හානි සංඛ්‍යාව 03 කි. නිවාස 16ක් සම්පූර්ණ හානියට ලක්විය. 2018 මැයි මාසයේ ඇතිවූ ගංවතුර තත්ත්වයෙන් පුද්ගලයන් 1827 ක් බලපෑමට ලක්වූ අතර ආපදාවට ලක්වූ පවුල් සංඛ්‍යාව 469 කි.

එමෙන්ම ඉදිකිරීම් හා සේවා ව්‍යාප්තිවල ප්‍රතිඵලයක් ලෙස ජල මාර්ග අවහිර වීම නිසා මෙන්ම ප්‍රදේශයේ වගුරු බව අධික වීමත් නිසාවෙන් අනපේක්ෂිත සුළු ගං වතුර ඇති වීමත් ස්ථාන කීපයකම දක්නට ලැබේ (සිතියම් අංක 6.7).

- *උපාය මාර්ග*

I. *අඩු ජන ඝනත්ව නේවාසික කළාපීකරණය.*

II. *නාගරික උපයෝගිතාවයන් සඳහා මෙම ජල ද්‍රෝණි දෙක භාවිත කිරීමේදී ඒවායේ ස්වභාවික ගැලීම් රටාව කෙරෙහි මනා අධ්‍යයනයක් සිදු කිරීමත් එම ඉදිකිරීම් වැනි කාර්යයන් නිසා ඒ ආශ්‍රිත භූමි පරිහරණ රටාවන් වලට සිදුවන බලපෑම් පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයක් සිදු කල යුතුය.*

III. *ප්‍රදේශයේ පවතින ඇල මාර්ග පිරිසිදු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ නඩත්තු කිරීම.*

IV. *ප්‍රදේශය තුළ දැනට පවතින ජල බැස්නා කාණු පද්ධතිය විධිමත් කිරීම සහ නඩත්තු කිරීම.*

V. *බෑවුම් විශ්ලේෂණය මඟින් හඳුනාගත් පහත් බිම් ප්‍රදේශ නාගරික වනෝද්‍යාන ලෙස කලාප කිරීම.*

***සිතියම 6.7 :** ගංවතුර ආපදා තත්වයට මුහුණ දෙන ප්‍රදේශ*




***මූලාශ්‍රය :** වාරිමාර්ග දෙපාර්තමේන්තුව - 2018*

## 6.6.6. හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශිය සැලැස්ම (PORS)

නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රමිති මට්ටම්වලට අනුව ජනගහනය 1000 කට හෙක්ටයාර් 1.4 ක භූමි ප්‍රමාණයක් අවම වශයෙන් පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම සැකසීමේදී වෙන්කළ යුතු වුවත් පවතින ඉඩම් හිඟතාවය නිසාවෙන් හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට මෙම ප්‍රමිති මට්ටම ජනගහනය 1000කට හෙක්ටයාර 1ක් ලෙස යොදාගෙන ඇත. හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2019 වසර වන විට ජනගහනය 279,236 (සම්පත් පැතිකඩ දත්ත 2019) ලෙස සංගණන වාර්තාවේ දක්වා ඇත. සංවර්ධන සැලැස්මේ දත්ත විශ්ලේෂණයන්ට අනුව 2031 වන විට ජනගහනය ආසන්න වශයෙන් ලක්ෂ 6 ක් දක්වා වර්ධනය විය හැකි බව පුරෝකථනය කර ඇත. ඒ අනුව 2031 වන විට පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා ඉඩම් හෙක්ටයාර් 600 ක භූමි ප්‍රමාණයක් අවම වශයෙන් වෙන්කළ යුතුය. කෙසේ වෙතත්, මෙහිදී අවධාරණය කළ යුත්තේ පවත්නා ග්‍රාමීය අංග නාගරීකරණය වෙමින් පවතින හෙයින්, විවෘත ප්‍රදේශ නිර්මාණය කිරීම අනාගත අවශ්‍යතාවය සලකා බලා සිදු කළ යුතු බවයි..

සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන අංශ දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලනු ලැබේ. සෘජු විනෝද කටයුතු පහසුකම් යටතේ ජනතාවට ක්‍රියාකාරී ලෙස සහභාගී වීමට හැකි ආකාරය එනම්,

I. ක්‍රීඩා කිරීම
II. පිහිනීම
III. දිවීම
IV. ඇවිදීම
V. බෝට්ටු පැදීම
VI. සාම්ප්‍රදායික මසුන් ඇල්ලීම නිදසුන් ලෙස දැක්විය හැක.

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉහත අවශ්‍යතාවයන් සපුරාගත හැකි ස්ථාන ප්‍රමාණවත් නොවන අතර, එම ස්ථාන පිළිබඳව විස්තර වගු අංක 6.6 යටතේ සහ සිතියම් අංක 6.8 යටතේ දක්වා ඇත.

*වගුව 6.6 : හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වර්තමානය වනවිට පවතින සෘජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන*

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය ( හෙක්ටයාර්) |
|---|---|---|
| 1. | පවතින ඉතා කුඩා උද්‍යාන<br>Existing Pocket Parks (EPP) | 2.29 |
| 2. | පවතින කුඩා උද්‍යාන<br>Existing Mini Parks (EMP) | 9.60 |
| 3. | පවතින අසල උද්‍යාන<br>Existing Local Parks (ELP) | 1.10 |
| 4. | පවතින ප්‍රජා උද්‍යාන<br>Existing Community Parks (ECP) | 4.90 |
| 5. | පවතින රේඛීය උද්‍යාන<br>Existing Linear Parks (ELiP) | 0.10 |
| | **එකතුව** | **17.99** |

*මූලාශ්‍රය : හෝමාගම ප්‍රාදේශීය සභාව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත 2019*

***සිතියම 6.8 :*** *වර්තමානයේ හෝමාගම ප්‍රදේශය ආශ්‍රිත පොදු එළිමහන් විනෝද කටයුතු ස්ථාන*




***සැකසුම :*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

වගු අංක 6.7 සදහන් තොරතුරු වලට අනුව හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දැනට හෙක්ටයාර් 18 ක් පොදු එළිමහන් විනෝද කටයුතු සදහා විවෘත භූමි ලෙස පවතින අතර, වර්තමාන ජනගහනය වන 251,185 සදහා පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම් ලෙස හෙක්ටයාර් 251 ක් වෙන්ව තිබිය යුතුය. නමුත් වර්තමාන ජනගහනයට ප්‍රමාණවත් පොදු එළිමහන් විවෘත භූමි පහසුකම් හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නොමැති අතර, දැනට පවතින ස්ථානවලද පහසුකම් ප්‍රමාණ–වත් නොවේ.

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන පහත පරිදි වේ.

I. පුස්තකාල – 33
II. සිනමා ශාලා – 01
III. මීට අමතරව සුසානභූමි 40 ක් පවතී.

*වගුව 6.7 : හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඍජු විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන*

| අනු අංකය | උද්‍යාන සහ ක්‍රීඩා පිටි වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර්) | වර්තමාන භාවිතය | ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|
| | පවතින ඉතා කුඩා උද්‍යාන - Existing Pocket Parks (EPP) | | | |
| 1. | EPP 01 | 0.10 | වොලිබෝල් ක්‍රීඩා පිටිය | කිරිවත්තුඩුව දකුණ |
| 2. | EPP 02 | 0.10 | ළමා ක්‍රීඩා පිටිය | මත්තේගොඩ මධ්‍යම "ඒ" |
| 3. | EPP 03 | 0.18 | ළමා ක්‍රීඩා පිටිය | මත්තේගොඩ බටහිර |
| 4. | EPP 04 | 0.06 | ක්‍රීඩා පිටිය | මූණමලේ |
| 5. | EPP 05 | 0.10 | ග්‍රීන් වැලි ක්‍රීඩා පිටිය | මත්තේගොඩ බටහිර |
| 6. | EPP 06 | 0.10 | දික්හේන්වත්ත ක්‍රීඩා පිටිය | කුඩාමාදුව |
| 7. | EPP 07 | 0.08 | ඉලවන් ස්ටාර් ක්‍රීඩා පිටිය | කුඩාමාදුව |
| 8. | EPP 08 | 0.05 | සල්මල් ක්‍රීඩා පිටිය | මත්තේගොඩ නැගෙනහිර |
| 9. | EPP 09 | 0.05 | ළමා ක්‍රීඩා පිටිය | හෙරලියාවල |
| 10. | EPP 10 | 0.18 | සාරභූමි ක්‍රීඩා පිටිය | හෝමාගම නැගෙනහිර |
| 11. | EPP 11 | 0.08 | ළමා ක්‍රීඩා පිටිය | ගලවිලවත්ත උතුර |
| 12. | EPP 12 | 0.05 | පුහුදෙල්ගහවත්ත ක්‍රීඩා පිටිය | හිරිපිටිය |
| 13. | EPP 13 | 0.13 | නාමල් උයනේ ක්‍රීඩා පිටිය | නියදගල |
| 14. | EPP 14 | 0.02 | එක්සත් සුභ සාධක ආයතනයේ ක්‍රීඩා පිටිය | නියදගල |
| 15. | EPP 15 | 0.10 | පැපිලිවල ක්‍රීඩා පිටිය | මාබුල්ගොඩ |
| 16. | EPP 16 | 0.05 | වොලිබෝල් ක්‍රීඩා පිටිය | කිරිබේරියකැලේ |
| 17. | EPP 17 | 0.13 | ක්‍රීඩා පිටිය | දොලහේන |
| 18. | EPP 18 | 0.02 | ළමා උයන | වල්පිට |
| 19. | EPP 19 | 0.03 | වොලිබෝල් ක්‍රීඩා පිටිය | වල්පිට |
| 20. | EPP 20 | 0.10 | ප්‍රසන්න උයන ක්‍රීඩා පිටිය | මත්තේගොඩ මධ්‍යම "බී" |
| 21. | EPP 21 | 0.18 | නදුන් උයන ක්‍රීඩා පිටිය | මත්තේගොඩ මධ්‍යම "බී" |
| 22. | EPP 22 | 0.10 | ළමා ක්‍රීඩා පිටිය | කිරිගම්පමුණුව |

| | | | | |
|---|---|---|---|---|
| 23. | EPP 23 | 0.10 | බටවල පොදු ක්‍රීඩා පිටිය | බටවල |
| 24. | EPP 24 | 0.10 | ජයලිගම ක්‍රීඩා පිටිය | රිලාවල |
| 25. | EPP 25 | 0.10 | සැනසුම් සෙවන ක්‍රීඩා පිටිය | රිලාවල |
| | **උප එකතුව** | **2.29** | | |
| | **පවතින කුඩා උද්‍යාන - Existing Mini Parks (EMP)** | | | |
| 26. | EMP 01 | 0.30 | හෙරලියාවල පොදු ක්‍රීඩා පිටිය | හෙරලියාවල |
| 27. | EMP 02 | 0.50 | වෑතර රන්තරු ක්‍රීඩා පිටිය | වෑතර |
| 28. | EMP 03 | 0.40 | සදුන්පුර ක්‍රීඩා පිටිය | මත්තේගොඩ නැගෙනහිර |
| 29. | EMP 04 | 0.50 | ළමා ක්‍රීඩා පිටිය | මත්තේගොඩ මධ්‍යම "බී" |
| 30. | EMP 05 | 0.30 | හපුආරච්චි ක්‍රීඩා පිටිය | සංඝාරාම |
| 31. | EMP 06 | 0.40 | මුණමලේ වත්ත ක්‍රීඩා පිටිය | මුණමලේ |
| 32. | EMP 07 | 0.60 | සී.හොක්ස් ක්‍රීඩා පිටිය | ගලවිලවත්ත දකුණ |
| 33. | EMP 08 | 0.80 | විල්ෆ්‍රඩ් සේනානායක ක්‍රීඩා පිටිය | කටුවාන |
| 34. | EMP 09 | 0.50 | ක්‍රීඩා පිටිය | මඩුලව උතුර |
| 35. | EMP 10 | 0.20 | ජයවර්ධනවත්ත ක්‍රීඩා පිටිය | කහතුඩුව බටහිර |
| 36. | EMP 11 | 0.40 | ක්‍රීඩා පිටිය | කහතුඩුව දකුණ |
| 37. | EMP 12 | 0.50 | බේසම් ක්‍රීඩා පිටිය | මත්තේගොඩ මධ්‍යම "ඒ" |
| 38. | EMP 13 | 0.60 | සමගි උයන ක්‍රීඩා පිටිය | මත්තේගොඩ බටහිර |
| 39. | EMP 14 | 0.20 | කොතලාවල ක්‍රීඩා පිටිය | හබරකඩ උතුර |
| 40. | EMP 15 | 0.20 | මුණසිංහගම ප්‍රජාශාලා ක්‍රීඩා පිටිය | මාගම්මන නැගෙනහිර |
| 41. | EMP 16 | 0.30 | ප්‍රගති ක්‍රීඩා පිටිය | කහතුඩුව උතුර |
| 42. | EMP 17 | 0.20 | දීගලවත්ත ක්‍රීඩා පිටිය | ජල්තර |
| 43. | EMP 18 | 0.20 | අරලිය උයන ක්‍රීඩා පිටිය | මත්තේගොඩ මධ්‍යම "බී" |
| 44. | EMP 19 | 0.20 | සිල්ව ගාර්ඩ්න් ක්‍රීඩා පිටිය | වටරැක උතුර |
| 45. | EMP 20 | 0.60 | සිසිල් සෙවණ ක්‍රීඩා පිටිය | සියඹලාගොඩ උතුර |
| 46. | EMP 21 | 0.50 | සිටි ඔෆ් ලයිෆ් ක්‍රීඩා පිටිය | කහතුඩුව උතුර |
| 47 | EMP 22 (PORS සිතියමෙහි දක්වා නොමැත) | 0.40 | මීගොඩදෙණිය ක්‍රීඩා පිටිය | මීගොඩ උතුර |
| 48. | EMP 23 (PORS සිතියමෙහි දක්වා නොමැත) | 0.80 | ගල්වලමුල්ල ක්‍රීඩා පිටිය | පානළුව |
| | **උප එකතුව** | **9.60** | | |
| | **පවතින අසල උද්‍යාන - Existing Local Parks (ELP)** | | | |
| 49. | ELP 01 | 1.10 | නිවාස සංකීර්ණ ක්‍රීඩා පිටිය | මත්තේගොඩ මධ්‍යම "ඒ" |
| | **උප එකතුව** | **1.10** | | |

| අනු අංකය | උද්‍යාන සහ ක්‍රීඩා පිටි වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර්) | වර්තමාන භාවිතය | ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|
| | **පවතින ප්‍රජා උද්‍යාන - Existing Community Parks (ECP)** | | | |
| 50. | ECP 01 | 4.90 | මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රීඩා සංකීර්ණය | දියගම බටහිර |
| | **උප එකතුව** | **4.90** | | |
| | **පවතින රේඛීය උද්‍යාන - Existing Linear Parks (ELiP)** | | | |
| 51. | EliP 01 | 0.10 | මත්තේගොඩ වැව | මත්තේගොඩ බටහිර |
| | **උප එකතුව** | **0.10** | | |
| | **මුළු එකතුව** | **17.99** | | |

**සැකසුම :** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2020*

## 6.6.6.1. යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 2022–2031

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2031 වන විට ජනගහනය ලක්ෂ 6කට ආසන්න ප්‍රමාණයක් ලෙස වර්ධනය විය හැකි බවට පුරෝකථනය කර ඇත. ඒ අනුව 2031 වන විට පොදු එළිමහන් විනෝද කටයුතු සඳහා ඉඩම් හෙක්ටයාර් 600 ක් අවම වශයෙන් වෙන්කළ යුතුය. නමුත් පවතින හිස් ඉඩම් ප්‍රමාණය අනුව එම අවශ්‍යතාවය 2031 වර්ෂය වන විට 50% ක මට්ටමෙන් ළඟා කර ගැනීම මෙම සැලැස්ම හරහා අපේක්ෂා කර ඇත.

**වගුව 6.8:** *හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022–2031 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම*

| අනු අංකය | උද්‍යාන වර්ගය | ප්‍රමාණය ( හෙක්ටයාර්) |
|---|---|---|
| 1. | යෝජිත ඉතා කුඩා උද්‍යාන<br>Proposed Pocket Parks (PPP) | 0.30 |
| 2. | යෝජිත කුඩා උද්‍යාන<br>Proposed Mini Parks (PMP) | 30.30 |
| 3. | යෝජිත අසල උද්‍යාන<br>Proposed Local Parks(PLP) | 46.20 |
| 4. | මධ්‍යම ප්‍රජා උද්‍යාන<br>Proposed Community Parks (PCP) | 12.10 |
| 5. | යෝජිත රේඛීය උද්‍යාන<br>Proposed Linear Parks (PLiP) | 254.19 |
| | **එකතුව** | **343.09** |
| 6. | පවතින පොදු එළිමහන් විවෘතභූමි ප්‍රමාණය<br>Existing PORS | 17.99 |
| | **සමස්ථ එකතුව** | **361.08** |

**සැකසුම :** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2020*

***සිතියම 6.9 :*** *හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2022–2031 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම*




***මූලාශ්‍රය :*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

***වගුව 6.9 :*** *හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 2022-2031 වසර සඳහා යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම.*

| අනු අංකය | උද්‍යාන සහ ක්‍රීඩා පිටි වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර්) | වර්තමාන භාවිතය | යෝජිත භාවිතය | ග්‍රාම නිළධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|---|
| | **යෝජිත ඉතා කුඩා උද්‍යාන - Proposed Pocket Parks (PPP)** | | | | |
| 1. | PPP 01 | 0.2 | විවෘත භූමිය | ඉතා කුඩා උද්‍යාන | හෝමාගම නගරය |
| 2. | PPP 02 | 0.1 | විවෘත භූමිය | | කහතුඩුව උතුර |
| | **එකතුව** | **0.3** | | | |
| | **යෝජිත කුඩා උද්‍යාන - Proposed Mini Parks (PMP)** | | | | |
| 3. | PMP 01 | 1.0 | විවෘත භූමිය | කුඩා උද්‍යාන | ගලවිලවත්ත දකුණ |
| 4. | PMP 02 | 0.2 | විවෘත භූමිය | | කිතුලවිල |
| 5. | PMP 03 | 0.5 | විවෘත භූමිය | | පිටිපන දකුණ |
| 6. | PMP 04 | 0.4 | පාසල් ක්‍රීඩා පිටිය | | දම්පේ |
| 7. | PMP 05 | 0.4 | පාසල් ක්‍රීඩා පිටිය | | කිරිවත්තුඩුව උතුර |
| 8. | PMP 06 | 0.8 | කර්මාන්ත | | කටුවන |
| 9. | PMP 07 | 0.4 | රබර් | | හේන්පිට |
| 10. | PMP 08 | 0.4 | | | ආටිගල නැගෙනහිර |
| 11. | PMP 09 | 0.7 | | | ආටිගල බටහිර |
| 12. | PMP 10 | 0.6 | | | වල්පිට, ජල්තර |
| 13. | PMP 11 | 0.2 | කුඹුරු | | වල්පිට |
| 14. | PMP 12 | 0.8 | රබර් | | බටවල |
| 15. | PMP 13 | 0.5 | | | හබරකඩ උතුර |
| 16. | PMP 14 | 0.5 | | | මුල්ලේගම දකුණ |
| 17. | PMP 15 | 0.7 | | | හෝමාගම දකුණ |
| 18. | PMP 16 | 0.6 | | | හෝමාගම උතුර |
| 19. | PMP 17 | 0.7 | | | ගලවිලවත්ත උතුර, හෝමාගම නගරය |
| 20. | PMP 18 | 0.6 | | | ගලවිලවත්ත උතුර |
| 21. | PMP 19 | 0.8 | | | හිරිපිටිය |
| 22. | PMP 20 | 0.8 | | | කිතුල්හේන |
| 23. | PMP 21 | 0.6 | | | කිතුල්හේන |
| 24. | PMP 22 | 0.9 | | | සිද්දමුල්ල උතුර |
| 25. | PMP 23 | 0.9 | | | සංඝාරාම |
| 26. | PMP 24 | 0.6 | | | කුඩමාදුව |
| 27. | PMP 25 | 0.9 | | | සියඹලාගොඩ උතුර |
| 28. | PMP 26 | 0.7 | | | සියඹලාගොඩ උතුර |
| 29. | PMP 27 | 0.8 | | | කිරිගම්පමුණුව |
| 30. | PMP 28 | 0.4 | | | මත්තේගොඩ මධ්‍යම "බී", කිරිගම්පමුණුව |
| 31. | PMP 29 | 0.8 | | | බ්‍රාහ්මණගම |
| 32. | PMP 30 | 0.7 | | | බ්‍රාහ්මණගම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 33. | PMP 31 | 0.3 | රබර් | කුඩා උද්‍යාන | මාබුල්ගොඩ |
| 34. | PMP 32 | 0.9 | | | කටුවාන |
| 35. | PMP 33 | 0.4 | | | කටුවාන |
| 36. | PMP 34 | 1.0 | | | හෝමාගම බටහිර |
| 37. | PMP 35 | 0.4 | | | හෝමාගම බටහිර |
| 38 | PMP 36 | 0.6 | | | පානළුව |
| 39. | PMP 37 | 0.8 | | | පානළුව |
| 40. | PMP 38 | 0.3 | | | පානළුව |
| 41. | PMP 39 | 0.5 | | | මටරීක උතුර |
| 42. | PMP 40 | 1.0 | | | මාවතගම |
| 43. | PMP 41 | 0.5 | | | ප්‍රසන්නපුර |
| 44. | PMP 42 | 0.7 | | | කහතුඩුව දකුණ |
| 45. | PMP 43 | 0.6 | | | පාලාගම |
| 46. | PMP 44 | 1.0 | | | වෙනිවැල්කොල |
| 47. | PMP 45 | 0.7 | | | මාගම්මන නැගෙනහිර |
| 48. | PMP 46 | 0.7 | | | උඩුවන |
| 49. | PMP 47 | 1.0 | | | උන්දුරුගොඩ |
| | **උප එකතුව** | **30.3** | | | |
| | **යෝජිත අසල උද්‍යාන - Proposed Local Parks (PLP)** | | | | |
| 50. | PLP 01 | 1.8 | පොල් | මධ්‍යම උද්‍යාන පහළ මට්ටම | පිටිපන උතුර |
| 51. | PLP 02 | 1.4 | රබර් | | ජල්තර |
| 52. | PLP 03 | 1.0 | | | ජල්තර |
| 53. | PLP 04 | 1.2 | | | හේන්පිට |
| 54. | PLP 05 | 1.2 | | | ආටිගල බටහිර |
| 55. | PLP 06 | 1.1 | | | ආටිගල නැගෙනහිර |
| 56. | PLP 07 | 1.5 | | | ජල්තර |
| 57. | PLP 08 | 2.4 | | | බටවල |
| 58. | PLP 09 | 2.1 | | | ආටිගල නැගෙනහිර |
| 59. | PLP 10 | 2.5 | | | පානළුව |
| 60. | PLP 11 | 1.1 | | | පානළුව |
| 61. | PLP 12 | 1.1 | | | බටවල |
| 62. | PLP 13 | 1.3 | | | ගලවිලවත්ත දකුණ |
| 63. | PLP 14 | 1.0 | | | නියදගල |
| 64. | PLP 15 | 1.5 | | | මත්තේගොඩ බටහිර |
| 65. | PLP 16 | 1.0 | | | මාවතගම |
| 66. | PLP 17 | 1.2 | | | හෝමාගම බටහිර |
| 67. | PLP 18 | 1.3 | | | පනාගොඩ බටහිර |
| 68. | PLP 19 | 1.6 | | | මීගස්මුල්ල |
| 69. | PLP 20 | 1.1 | | | නාවලමුල්ල |
| 70. | PLP 21 | 1.1 | | | මටරීක උතුර |

| | | | | | |
|---|---|---|---|---|---|
| 71. | PLP 22 | 1.0 | රබර් | මධ්‍යම උද්‍යාන පහළ මට්ටම | ලියන්වල |
| 72. | PLP 23 | 1.1 | | | ඕවිටිගම |
| **අනු අංකය** | **උද්‍යාන සහ ක්‍රීඩා පිටි වර්ගය** | **ප්‍රමාණය (හෙක්ටයාර්)** | **වර්තමාන භාවිතය** | **යෝජිත භාවිතය** | **ග්‍රාම නිළධාරී කොට්ඨාශය** |
| | **යෝජිත අසල උද්‍යාන - Proposed Local Parks (PLP)** | | | | |
| 73. | PLP 24 | 1.2 | රබර් | මධ්‍යම උද්‍යාන පහළ මට්ටම | මාදිවෙල දකුණ |
| 74. | PLP 25 | 1.0 | | | කදනවත්ත |
| 75. | PLP 26 | 1.5 | | | දොලහේන |
| 76. | PLP 27 | 1.1 | | | කිරිවත්තුඩුව උතුර |
| 77. | PLP 28 | 1.1 | | | කිරිවත්තුඩුව දකුණ |
| 78. | PLP 29 | 1.1 | | | කහතුඩුව බටහිර |
| 79. | PLP 30 | 2.5 | | | සියඹලාගොඩ උතුර, රිලාවල |
| 80. | PLP 31 | 1.1 | | | පිටිපන දකුණ |
| 81. | PLP 32 | 1.7 | | | හොරකඳවල |
| 82. | PLP 33 | 1.2 | | | පිටිපන උතුර |
| 83. | PLP 34 | 1.1 | | | අම්බලන්ගොඩ |
| | **උප එකතුව** | **46.2** | | | |
| | **යෝජිත ප්‍රජා උද්‍යාන - Proposed Community Parks (PCP)** | | | | |
| 84. | PCP 01 | 3.1 | විවෘත භූමිය | මධ්‍යම උද්‍යාන ඉහළ මට්ටම | දියගම බටහිර |
| 85. | PCP 02 | 5.1 | ආයතනික | | දියගම බටහිර |
| 86. | PCP 03 | 3.9 | රබර් | | නාවලමුල්ල |
| | **උප එකතුව** | **12.1** | | | |
| | **යෝජිත රේඛිය උද්‍යාන - Proposed Linear Parks (PLi.P)** | | | | |
| 87. | PLi.P 01 | 74.6 | කැළණි ගඟ ආරක්ෂණ ප්‍රදේශය (60m) | රේඛිය උද්‍යාන | |
| 88. | PLi.P 02 | 100.9 | පුස්වැලි ඔය ආරක්ෂණ ප්‍රදේශය (40m) | | |
| 89. | PLi.P 03 | 77.6 | කළු ගඟ අතු ඔය ආරක්ෂණ ප්‍රදේශය (40m) | | |
| 90. | PLi.P 04 | 0.84 | ඔලුපත්තව වැව ආරක්ෂණ ප්‍රදේශය (12m) | | කුඩාමාදුව , සියඹලාගොඩ උතුර |
| 92. | PLi.P 05 | 0.25 | මත්තේගොඩ කුඩා වැව ආරක්ෂණ ප්‍රදේශය (12m) | රේඛිය උද්‍යාන | මත්තේගොඩ මධ්‍යම "බී" |
| | **උප එකතුව** | **254.19** | | | |
| | **මුළු එකතුව** | **343.09** | | | |

***මූලාශ්‍රය :*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය,2020*

**සිතියම 6.10 :** *යෝජිත පොදු උද්‍යාන සැලැස්ම - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය 2022 - 2031*




**මූලාශ්‍රය :** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 1. *යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම සඳහා උපාය මාර්ග*

1.1. *දැනට පවතින සියළුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩා කළහැකි සහ පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට ක්‍රීඩා සහ සෘජු විනෝද පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනයට ගැනීම, වර්ගීකරණය කිරීම, ප්‍රතිසංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.*

1.2. *දේශයේ පවතින සංවර්ධනය කළ යුතු සියළු ක්‍රීඩාංගන පහසුකම් සහිතව ප්‍රතිසංවර්ධනය කිරීම.*

1.3. *ඉඩම් සහ අනු බෙදීම්වලදී වෙන් කරනු ලබන 10% අදාළ විවෘත භූමි සම්බන්ධ නීති රෙගුලාසි බලාත්මක කිරීම සහ එම ඉඩම් සෘජු විනෝද පහසුකම් සඳහා පමණක් යොදා ගැනීම.*

1.4. *මෙලෙස පොදු උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමට හඳුනා ගන්නා ලද භූමි ප්‍රදේශයන් අදාළ භාවිතය සඳහා පමණක් යොදා ගැනීම සිදු කල යුතුය.*

## 2. *රේඛීය උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීම*

ප්‍රදේශයේ පවතින සියළුම ඇළ, ඔය සහ ගඟ රක්ෂිතයන් රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කළ යුතු අතරම එය ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය ප්‍රමාණවත් විනෝදාස්වාද කටයුතු සහ පහසුකම් සැලසීමට මෙන්ම ගංවතුර උවදුර පවතින ප්‍රදේශවල එය පාලනයට යොදා ගත හැකිය.

මෙහිදී රේඛීය උද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රදේශ හා අනෙකුත් රක්ෂිත ප්‍රදේශ ගස්වවා පවත්වාගෙන යාමට කටයුතු කල යුතු අතර එවැනි ප්‍රදේශ වල කිසිඳු ඉදිකිරීමක් සිදු නොකළ යුතුය (සිතියම 6.10).

## 3. *පවතින සුසාන භූමි භූදර්ශන සැලසුම් මගින් ප්‍රතිනිර්මාණය කිරීම.*

මෙහිදී හෝමාගම සැලසුම් ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන සුසානභූමි ගස් වවා භූ අලංකරණ කටයුතුවලට යොදා ගැනීම සිදු කල යුතු අතර එමගින් ප්‍රදේශයේ හරිත ලක්ෂණ ඉස්මතු කර දැක්වීමට කටයුතු කල යුතුය.

## 4. *මාර්ග දෙපස රුක් රෝපණ තීරු ප්‍රදේශ ඇති කිරීම*

මාර්ග සඳහා පවතින සහ යෝජිත රක්ෂිතයන්ද රුක් රෝපණ තීරු සංකල්පය ඔස්සේ හැකි සෑම මාර්ගයකම දෙපස සංවර්ධනය කරමින් හරිත මංපෙත් වැඩි දියුණු කළ යුතුය. පහත සඳහන් මාර්ග ඒ සඳහා යෝජනා කරනු ලැබේ (සිතියම 6.10).

I. *හයිලෙවල් මාර්ගය (A4), හෝමාගම.*
II. *කොළඹ – හොරණ මාර්ගය (B-84), හෝමාගම.*
III. *ගලවිල මාර්ගය – ඩෙන්සිල් කොබ්බෑකඩුව මාර්ගය, හෝමාගම.*
IV. *ගොඩගම මාර්ගය (B240), හෝමාගම.*
V. *අතුරුගිරිය මාර්ගය (B452), හෝමාගම.*

VI. *ශ්‍රී ඤාණවිමල මාවත (B451)*
VII. *කොට්ටාව මාර්ගය, හෝමාගම.*
VIII. *හෝමාගම දියගම මාර්ගය (B452), හෝමාගම.*
IX. *කොට්ටාව –හොරණ මාර්ගය (B239), හෝමාගම.*
X. *නියදගල මාර්ගය – ශ්‍රී සෝමාලංකාර මාවත, හෝමාගම.*
XI. *පොල්ගස්ඕවිට මාර්ගය – සල්ගහ ප්‍රවේශ මාර්ගය, හෝමාගම.*
XII. *කිරිගම්පමුණුව මාර්ගය, හෝමාගම.*
XIII. *කහතුඩුව මාර්ගය ජම්බුගහමුල්ල හන්දිය දක්වා, හෝමාගම.*
XIV. *පිට්පන තලගල මාර්ගය, හෝමාගම.*
XV. *දම්පේ – පිට්පන මාර්ගය, හෝමාගම.*
XVI. *ආටිගල මාර්ගය – මීගොඩ මාර්ගය, හෝමාගම.*
XVII. *ලෙනගල නාවලමුල්ල මාර්ගය, හෝමාගම.*

රුක් රෝපණ තීරු ප්‍රදේශ සඳහා යොදාගත හැකි ශාක වර්ග ඇමුණුම 11 මඟින් දක්වා ඇත.

## 5. *2030 වන විට උෂ්ණත්වය අඩු කිරීම - ක්‍රමවේදය*

A. *කාර්මික හා කර්මාන්ත ගොඩනැගිලි හැර වර්ග මීටර් 1000 හෝ එය ඉක්මවන සියලුම සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කරනු ලබන හරිත ගොඩනැගිලි සහතිකය ලබා ගත යුතුය.*
B. *සියළුම කාර්යාල සහ නිවාස ඉදිකිරීමේදී වහල මත හරිත පියසි ඉදිකිරීම සහ හරිත පියසි තුල ජල විසිදුම් ක්‍රම ( Water sprinkler) භාවිතයට යොමු කිරීම.*
C. *ගොඩනැගිලි වර්ණ ගැන්වීමේදී ලා වර්ණ යෙදීම පිළිබඳව දැනුවත් කිරීම.*
D. *යෝජිත සියළුම වාහන නැවතුම්හලවල් සඳහා හරිත නැවතුම් සංකල්පය හඳුන්වාදීම සහ පවතින වාහන නැවතුම්පලවල් හරිත නැවතුම්පලවල් ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම*
E. *බිම් ඇතුරුම් ක්‍රමය ජලය පොලවට උරාගන්නා ක්‍රමවේදයන්ට පමණක් සීමා කිරීම (interlocking ) සහ ඒවා ද ලා වර්ණයන්ට පමණක් සීමා කිරීම.*
F. *පවතින ක්‍රීඩාභූමි, උද්‍යාන සහ විවෘත භූමි නඩත්තු කිරීම සහ යෝජිත විවෘත භූමි හරිත සංකල්පයන් මූලික කොට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.*
G. *හරිත අපරව්‍යුහ පහසුකම් (Green Infrastructure) හඳුන්වා දීම.*

## 6.6.7. සංස්කෘතික, ආගමික සහ පෞරාණික වටිනාකමින් යුතු ස්ථාන කළමනාකරණ සැලැස්ම

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංස්කෘතික සහ පෞරාණික වටිනාකමකින් යුතු ස්ථාන රැසක් හදුනාගත හැකිය.

### 1. කන්දෙගල පුරාණ විහාරය

පනාගොඩ නගරය ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටා ඇත. කොළඹ දිස්ත්‍රික්කයේ උසම ස්ථානයක ගල් පර්වතයක් මත මනස්කාන්ත පරිසරයක මෙම විහාරය පිහිටා ඇත. අතීතයේ දළදා වහන්සේද මෙහි සගවා තබාගෙන ඇති බවට සාක්ෂි ඇත. මෙම විහාරයේ බ්‍රාහ්මණ අක්ෂර සහිත ලිපියක් ඇති බවටද සාක්ෂි ඇත එමෙන්ම මෙහි ගල් ලෙනෙහි පැරණි දේවාලයක්ද, පොකුණු දෙකක්ද ඇති අතර, පර්වතය මධ්‍යයේ නාග පොකුණ නමින් හදුන්වන පොකුණක් ඇත.

### 2. ඇඹුල්ගම පුරාණ විහාරය

හේන්පිට ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටා ඇත. අතීතයේ මෙම විහාරය අඹුලුව රන්ගල වෙහෙර ලෙසද අම්බිලි ගාල වෙහෙර වශයෙන්ද හැදින්වූ අතර මෙය වර්තමානයේ ඇඹුල්ගම රජමහා විහාරය ලෙස හැදින්වේ. ශ්‍රී මහා බෝධියෙහි හටගත් ඵලයන්ගෙන් එක් ඵලයක් මෙහි රෝපනය කළ බව සදහන් වේ. ඉහත තොරතුරු සලකා බැලීමෙන් මෙම විහාරය මිහිදු යුගය දක්වාද විහිදී යන ඓතිහාසික වැදගත්කමක් ඇති විහාරයක් බව පැහැදිලිවේ.

මෙහි දැනට රජ දවස කළ කටාරම් ඇති ලෙන් විහාරයක් ඇත. එහි පැරණි බුදු පිළිම කඩා නිදන් ගෙන ඇති බවට සාක්ෂි ඇත. එම බුදු පිළිම නෂ්ඨාවශේෂ වශයෙන් අදටත් පවතී. පළමු විහාරය පරසතුරු උවදුරු වලින් විනාශ කොට ඇත. දෙවන ලෙනෙහි සප්නථ විහාරය කර තිබේ. තුන්වන වන විහාරය මාර්ග අංක 293 හි ගගබඩ (නැගෙනහිර) පිහිටා ඇති අතර 1948 එය කඩා නව විහාරයක් ඉදිකර ඇත. දැනට අවුරුදු 200කට ආසන්න පැරණි ධර්මශාලා සංඝාවාස ගරා වැටීමට ආසන්න තත්ත්වයේ ඇත. මෙහි පැවති පැරණි කාසි පිළිබඳ තොරතුරු විහාරයේ ඇති අතර ගිරිශිඛර මධ්‍යයෙහි ඓතිහාසික නටඹුන්ද පිහිටා තිබේ.

### 3. මිනුවන්විල නිධන්ගල

මෙය සිංහල රජසමයට අයත් උරුමයකි

### 4. මීගොඩ පුරාණ විහාරය

වසර 150 ක් පමණ පැරණි ඓතිහාසික වශයෙන් වැදගත් ස්ථානයකි.

### 5. ලෙනගල රජමහා විහාරය

ලෙනගල දැඩිගමුව පිහිටා ඇති මෙය ගල් ලෙන් සහිත විහාරයකි. ගල් ලෙන් තුල විවිධ බුදු පිළිම අඹා ඇත.

### 6. ශ්‍රී සුදර්මාරාම විහාරය

හෙරලියාවල පිහිටා ඇති මෙම විහාරයේ බුදු පිළිම සහ අනෙකුත් පිළිම කදුරු ලීයෙන් නිමකර ඇත. මෙම විහාරය දඹදෙණි යුගයේ සම්ප්‍රදාය අනුව ඉදිකර තිබේ.

7. කන්දේ පුරාණ විහාරය

පනාගොඩ ප්‍රදේශයේ පිහිටා ඇත.

8. ශ්‍රී සාලවනෝද්‍යාරාමය

දියගම නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටා ඇත.

9. ශ්‍රී ශෛලාන්තායතනය

හබරකඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටා ඇත.

10. මාගම්මන පුරාණ විහාරය

මාගම්මන බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටා ඇත.

11. ශ්‍රී සුදර්ශනාරාමය

සියඹලාගොඩ දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටා ඇත.

- *උපාය මාර්ග*

1. *සංස්කෘතික, ඓතිහාසික සහ පුරා විද්‍යාත්මක වශයෙන් වැදගත් වන ස්ථාන පුරා විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුව සංරක්ෂණය කිරීම.*
2. *සංරක්ෂණය කරන ලද ස්ථාන නිසි පරිදි නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම.*
3. *03. මෙම ස්ථාන වල ඓතිහාසික හා සංස්කෘතික, පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව දැනුවත් බාවයක් ඇති කිරීම සහ දේශීය හා විදේශීය සංචාරක වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම තුලින් ප්‍රදේශයේ ජනතාවට ආර්ථිකමය වශයෙන් දායකත්වය ලබා ගැනීමට කටයුතු කිරීම හා ජේකිය ආයතන හා සම්බන්ධිකරණ කටයුතු සංවර්ධනය කිරීම.*
4. *තවද මෙම ප්‍රදේශ තුල ගස් වැවීම වැනි භූ දර්ශන ක්‍රියාකාරකම් සිදු කල යුතු අතර ඒ තුලින් ප්‍රදේශය තුල හරිත ලක්ෂණ ඉස්මතු කර දැක්වීමට කටයුතු සැලැස්විය යුතුය.*
5. *මෙම ප්‍රදේශ ආශ්‍රිතව සිදුකරනු ලබන ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් හෝ වාණිජමය හෝ ඉඩම් ආශ්‍රිත කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ හෝ ඊට අදාල ජේකිය ආයතනවල පූර්ව අනුමතියකට යටත්ව සිදු කල යුතුය.*
6. *ඇඹුල්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා සංස්කෘතිමය අනන්‍යතාව වර්ධනය කිරීම.*

# 6.7. ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම (Economic Development Strategic Plan)

## 6.7.1. හැඳින්වීම

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 යටතේ හෝමාගම ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලැස්ම හරහා අවධානය යොමු කරනු ලබන සැලසුම් අභිමතාර්ථ පහත පරිදි පෙන්වා දිය හැක.

### *G.1. පරිසරය සුරකින, හරිත නගරයක්*
### *A safeguarded Environment, A Green City*

1. *බරාව පරිසර සංවේදී කලාපය ආශ්‍රිත හෙක්ටයාර 3370 ක් පමණ වූ අඩු ඝනත්ව නේවාසික ප්‍රදේශය පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා විවෘත කිරීම හරහා එම භූමියේ වටිනාකම ඉහළ නැංවීමට කටයුතු කිරීම.*
2. *2031 වර්ෂය වනවිට හෝමාගම, ගොඩගම හා කහතුඩුව යන නගරාශ්‍රිතව හරිත නගර සංකල්පය ප්‍රදර්ශනය කිරීම හා හරිත සංකල්පය යටතේ නගරය කියවීම (Legibility) සඳහා හරිත උද්‍යාන නිර්මාණය කිරීම.*

### *G.2. පොහොසත් නගරයක්, සුවපහසු නේවාසික ප්‍රදේශයක්*
### *An Affluence City, A Comfortable Neighborhood*

1. *2031 වර්ෂය වන විට හෝමාගම හා කහතුඩුව යන නගර ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන (Neighborhood Centers) ලෙස සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.*

### *G.3. යෝජිත දැනුම් කේන්ද්‍රීය නගරය හා බැඳුණු සේවා ව්‍යාප්ත කිරීම සඳහා සේවා තීරයක්*
### *Promote A Tech Corridor, Accommodating High Tech Industries and Service*

1. *2031 වර්ෂය වන විට යෝජිත නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය තුල සංවර්ධනය කිරීමට අපේක්ෂා කරන මාහේනවත්ත, මීගොඩ හා ටෙම්පල් බර්ග් කර්මාන්ත කලාපය අතර ප්‍රවාහන පද්ධතිය සංවර්ධනය කිරීම තුලින් සම්බන්ධතාව (Connectivity) තීව්‍ර කිරීමට කටයුතු කිරීම.*

හෝමාගම සැලසුම් ප්‍රදේශයේ ආර්ථික සැලැස්ම පිළිබඳ අවධානය යොමු කිරීමට පෙර නගරයක ආර්ථිකය යනු කුමක්ද යන්න පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම වැදගත් වේ. ඒ අනුව යම් නගරයක නිෂ්පාදනයක් හෝ සේවාවක් ආරම්භ වන ස්ථානයේ සිට පාරිභෝගිකයා අතට එම නිෂ්පාදනය හෝ සේවාව පත්වන අවස්ථාව දක්වා සිදුවන සමස්ථ ක්‍රියාවලිය එම නගරයේ ආර්ථික ක්‍රියාවලිය ලෙස හඳුනාගත හැකිය. නවද එමගින් දළ දේශීය නිෂ්පාදිතයට කෙරෙන දායකත්වයද ඒ තුළ ගැබ්ව පැවතීම සුවිශේෂත්වයක් ගනී.

යම් ප්‍රදේශයක ආර්ථිකය කෙරෙහි බලපාන සාධක අතර එහි පිහිටීම, යටිතල පහසුකම්, පවතින සම්පත්වල ස්වභාවය හා ප්‍රමාණය, විශේෂයෙන්ම ප්‍රවාහන හා මහා මාර්ග අතර පවතින සම්බන්ධතාව හා අනෙකුත් ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන සමග පවතින සම්බන්ධතාව විශේෂ තැනක් ගනී. ඒ අනුව හෝමාගම ආර්ථික සංවර්ධන සැලැස්ම මුලධර්ම 5ක් යටතේ සකස් කිරීමට කටයුතු කර ඇත. 1). දැනුම හා බැඳුනු ව්‍යාපෘති, 2). ප්‍රවාහනය හා මහා මාර්ග සංවර්ධනය, 3). නෛතිකමය හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, 4). කොළඹ දිස්ත්‍රික්කය තුල හෝමාගම සැලසුම් ප්‍රදේශයේ පිහිටීම හා 5). මහා පරිමාණ කර්මාන්ත සංවර්ධනයේ ප්‍රතිලාභ ලබා ගැනීම යන මුලධර්ම කෙරෙහි අවධානය යොමු කර ඇත.

වර්ෂ 1998 දී මහ කොළඹ ව්‍යුහ සැලැස්ම (CMRSP) සැලැස්ම මගින් හෝමාගම නගරය බස්නාහිර පළාතේ හතරවන මට්ටමේ නගරයක් ලෙස හඳුනාගෙන තිබූ අතර එම කාල වකවානුවේදී හෝමාගම ප්‍රදේශය, කර්මාන්ත සංවර්ධනය හා නේවාසික සංවර්ධනය හා බැඳුනු සේවා සපයන මධ්‍යස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ හෝමාගම නගරය ප්‍රධාන වශයෙන් නේවාසික පහසුකම් සපයන සේවා මධ්‍යස්ථානයක් ලෙසත් කර්මාන්ත 215 ට පමණ තම නිෂ්පාදන කටයුතු කරගෙන යාමට දායක වන ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. බස්නාහිර පළාත දළ දේශීය නිෂ්පාදිතය සඳහා දක්වන දායකත්වයෙන් 56.5% (2015– මහ බැංකු වාර්තාව) ක ප්‍රතිශතයක් සේවා අංශය මගින් සපයනු ලබන අතර 34% (2015 – මහ බැංකු වාර්තාව) ප්‍රතිශතයක් කර්මාන්ත මගින් වේ. ඒ අනුව හෝමාගම නගරය එහි එක් පුරුකක් බවට උපකල්පනය කළ හැකිය.

තවද හෝමාගම සැලසුම් ප්‍රදේශයේ රැකියාවල නියැලීමේ සංයුතිය දෙස අවධානය යොමු කිරීම මෙහිදී වැදගත් වේ. හෝමාගම සම්පත් පැතිකඩ දත්තයන් අනුව හෝමාගම ප්‍රදේශයේ රැකියාවල නියුතු මුළු ශ්‍රම බලකායෙන් 47% ක ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු අතර 18% ක ප්‍රමාණයක් රජයේ රැකියාවල නියුතු බව පැහැදිලිවේ. එමෙන්ම ප්‍රදේශයේ පුද්ගලයකුගේ මාසික අදායම් මට්ටම නිරීක්ෂණය කිරීමේදී පැහැදිලි වනුයේ රුපියල් 80,000 කට වැඩි මාසික අදායමක් උපයන ප්‍රමාණය, සමස්ථ ජනගහනයෙන් 60% කට අසන්න අගයක් (COM Trans Study–2014) ගන්නා බවයි.

එමෙන්ම අධ්‍යාපන මට්ටම අනුව සේවා නියුක්තිය මුළු ශ්‍රම බලකායෙන් 84% ක් ඉහළ අගයක් වන අතර සේවා වියුක්තිය 20% ක පමණ අඩු ප්‍රතිශතයක් ගනී. මේ අනුව හෝමාගම ප්‍රදේශය ඉහළ අධ්‍යාපන මට්ටමකින් සමන්විත, ඉහළ අදායමක් ලබන නේවාසිකයන් පිරිසක් ජීවත්වන, නේවාසික සංවර්ධනය හා බැඳුනු සේවා සපයන ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.

2050 ජාතික භෞතික සැලැස්ම අනුව හෝමාගම ප්‍රදේශය ආර්ථික කලාපය තුල පිහිටා ඇති අතර ශ්‍රී ලංකා ආර්ථිකය නගා සිටුවීම සඳහා හෝමාගම ප්‍රදේශයෙන් ප්‍රබල ආර්ථික දායකත්වයක් ලබා දීම එහි අපේක්ෂා අතර වේ.

## 6.7.2. ප්‍රධාන ආර්ථික පෙරගමන්කරුවන් (Main Economic Drivers)

වර්තමානයේ හෝමාගම සැලසුම් ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික පෙරගමන්කරුවා වශයෙන් යෝජිත මාගේනවත්ත දැනුම් කේන්ද්‍රිය නගරය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ සලකා බැලීමේදී කර්මාන්ත හරහා දළ දේශීය නිෂ්පාදිතයට වන දායකත්වය 28% වැනි පහල අගයක් වේ. එමෙන්ම අධි තාක්ෂණය හා සමගාමී අපනයන සඳහා ශ්‍රී ලංකාව දක්වන දායකත්වය 1% ක් පමණ වන අතර ආසියාතික රටවල් අතර ශ්‍රී ලංකාව පහළ ස්ථානයක සිටින බව හඳුනගත හැකිය. *(මූලාශ්‍රය: the panel of the united nations commission on sceinece & technology for development 28–30 Nov. 2017)*

එමෙන්ම විද්‍යාව හා තාක්ෂණය සමගාමී කර්මාන්ත සම්බන්ධව ගත් විට ශ්‍රී ලංකාවේ වාර්ෂික අපනයන අදායම රුපියල් මිලියන 382.64 පමණ වේ. පර්සනක හා තාක්ෂණය දියුණු අවදියක, රට අදාල නිෂ්පාදන සම්බන්ධයෙන් පවතින ඉල්ලුම අනුව ශ්‍රී ලංකාව වර්තමානයේ එහි නිරතවන ප්‍රමාණය ඉතාමත් අඩු මට්ටමක පසුවන බව විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ආයතනය පෙන්වා දී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් උසස් ප්‍රමිතියෙන් යුත් නිෂ්පාදන හා විදේශ විනිමය වර්ධනය කර ගැනීමේ අරමුණෙන් මාලඹේ හෝමාගම හා මිල්ලෑව යන ප්‍රදේශ අවධානයට යොමු කර ඇත. මාලඹේ හා හෝමාගම ප්‍රදේශ නවෝත්පාදන හා දැනුම පදනම් කරගෙන නව අධ්‍යාපන ක්‍රමයක් ඇති කිරීම සඳහා අවධානය යොමු කර ඇති අතර, මිල්ලෑව ප්‍රදේශය නව තාක්ෂණය සමගාමී අධ්‍යාපන හා පර්යේෂණ සංවර්ධන කටයුතු කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම මෙහිදී විශේෂතාවයක් ගනී.

## 6.7.2.1. හෝමාගම දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය

සෞභාග්‍යයේ දැක්ම වත්මන් රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ නවෝත්පාදනය හා දැනුම කේන්ද්‍ර කරගත් ව්‍යාපෘති සම්බන්දයෙන් මූලික අවධානයක් යොමු කර තිබෙනු දැකිය හැකිය. තාක්ෂණය මත පදනම් වන සමාජයක් අරමුණ යටතේ දැනුම් කේන්ද්‍රීය ශතවර්ෂයේ කෘෂිකර්මය, කර්මාන්ත ක්ෂේත්‍රය හා සේවා අංශය අනාගතයේදී තාක්ෂණය මත යැපෙන ආර්ථික අංශ බවට පත්කිරීම අරමුණු කර ඇත. 21 වන සියවසයේ නැගී එන තාක්ෂණයන් සඳහා උපාය මාර්ගිකව ආයෝජනය කිරීමටත්, අධ්‍යාපන ක්‍රමයට එක කිරීමටත්, ආර්ථිකය සමග මුසු කිරීමටත් පියවර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

ඒ අනුව ජනතාවගේ ජීවන තත්වය ඉහල දැමීම සඳහා විශාල සමාජ සංවර්ධනයක් සිදුකොට තාක්ෂණික නවෝකරණ සංස්කෘතියක් ගොඩනැගීම සිදු කල යුතු බව හඳුනා ගෙන ඇත.

යෝජිත දැනුම් කේන්ද්‍රීය නගර ව්‍යාපෘතිය හෝමාගම ප්‍රදේශයේ ආර්ථිකයේ ප්‍රධානම නියමුවා බවට පරිවර්තනය වන අතර, එයින් ප්‍රදේශයට මෙන්ම සමස්ථ දේශීය ආර්ථිකයට දායකත්වය සැපයීම ප්‍රධාන අරමුණ වේ.

2031 වර්ෂයේදී හෝමාගම නගරයේ ආර්ථික නියමුවා ලෙස දැනුම් කේන්ද්‍රීය නගරය යෝජනා කර ඇත. දැනුම් කේන්ද්‍රීය නගරය තුලින් නව රැකියා අවස්ථා මෙන්ම නව නිෂ්පාදන අවස්ථා, නව කර්මාන්ත හා නව නිපැයුම් සඳහා අවස්ථාව උදා කර දී ඇත. මෙහි විශේෂත්වය වන්නේ තොරතුරු තාක්ෂණය, මෘදුකාංග හා ඒ ආශ්‍රිත නව නිපැයුම් සඳහා මෙම නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය කලාපය තුල ප්‍රමුඛස්ථානයක් දී තිබීමයි. එමගින් හෝමාගම ආර්ථිකයේ පුනර්ජීවයක් මෙන්ම හෝමාගම ආර්ථිකය අපනයන ආර්ථිකයක් දක්වා සංවර්ධනය කිරීමට අදහස් කර ඇත.

හෝමාගම දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන මෙහෙවරයන් පහත පරිදි පෙන්වා දිය හැක.

A. *දැනුම පදනම් කොට ගත් ව්‍යාපාර බිහි කිරීම*
B. *තාක්ෂණික කර්මාන්ත බිහි කිරීම*
C. *දැනුම් පදනම් වූ ආයතනවල නවෝත්පාදනය සහ තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.*
D. *ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක්*
*අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග, කෘත්‍රිම බුද්ධිය, රොබෝ තාක්ෂණය ක්ලවුඩ් කම්පියුටන් නැනෝතාක්ෂණය හා ත්‍රිමාණ බුද්ධිය වැනි නවීන තාක්ෂණ භාවිතය උපරිම තලයට ගෙන ඒම.*
E. *ඩිජිටල්කරණය වූ ලංකාවක්*
*තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන හා BPO මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.*
F. *ජනතා කේන්ද්‍රීය ඩිජිටල් ආණ්ඩුක්‍රමයක්*
*මෘදුකාංග ඉංජිනේරුවන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීම, මෘදුකාංග නිෂ්පාදනය සඳහා අවස්ථාව සකසා දීම ආ ඒ ආශ්‍රිත පුහුණු මධ්‍යස්ථාන බිහි කිරීම.*
G. *තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක්*
*රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලික පදනම සකස් කර දී ඇත.*

මේ සඳහා ප්‍රධාන අරමුණු ලෙස නවෝත්පාදන කුසලතා වර්ධනය හරහා ඉහළ අදායම්ලාභී රැකියා බිහි කිරීම හා සමාජීය අසමානතා අඩු කිරීම හා ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම පෙන්වා දිය හැක.

හෝමාගම දැනුම් කේන්ද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2022–2031 වර්ෂය වන විට ළඟා කර ගැනීමට බලාපොරොත්තුවන ප්‍රධාන ආර්ථික අරමුණු පහත පරිදි පෙන්වා දිය හැක.

1. *රැකියා අවස්ථා නිර්මාණය කිරීම.*
2. *නව ව්‍යාපාර හා 2031 වන විට බහු ජාතික ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම.*
3. *සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.*
4. *2031 වන විට ලොව පිළිගත් ප්‍රමුඛ පෙළේ විද්‍යාඥයින් බිහි කිරීම.*

2031 වර්ෂය වන විට මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා දැනුම් කේන්ද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතිය අදියර 3 ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර, රට අදාල ව්‍යාපෘති පහත පරිදි පෙන්වා දිය හැකිය. හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 යටතේ, හෝමාගම තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතියේ අදියර 01 අනුව ක්‍රියාත්මක කිරීමට හඳුනාගන්නා ලද ව්‍යාපෘති හෝමාගම නව සංවර්ධන සැලැස්මේ එන වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්-පාදන කලාපය හා කර්මාන්ත හා නවෝත්පාදන කලාපය (කලාප-කරණ සැලැස්ම 2022–2031) තුල නේවාසික භාවිතයන් සඳහා වෙන් නොවුණු ඉඩම් අත්කර ගැනීම හරහා හෝ පුද්ගලික, රාජ්‍ය හවුල්කාර ක්‍රමවේදය හරහා ක්‍රියා-ත්මක කිරීම සුදුසු බව හඳුනා ගෙන ඇත.

මෙහිදී යෝජිත විශ්ව විද්‍යාල හා පර්යේෂණ ආයතන වටා ඒකරාශී වූ වර්ග කිලෝමීටර 3.5 ක භූමි ප්‍රදේශයක් අදියර 1 යටතේ සංව-ර්ධනය කිරීම අභිප්‍රාය වී ඇත. දැනුම් කේන්ද්‍රිය නගර සංවර්ධන ව්‍යාපෘතියේ උක්ත අරමුණු ළඟා කර ගැනීම සඳහා සංවර්ධනයේ මූලික අවධානය අධ්‍යාපන හා පර්යේෂණ ආයතන සංවර්ධනය, නැනෝ තාක්ෂණ ආයතනය හා රට අදාල ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අවකාශය සකස්කර දීම සඳහා යොමු කර ඇත.

තවද වඩාත් ඵලදායි ආර්ථික ප්‍රතිලාභ ළඟා කර ගැනීම උදෙසා කොළඹ ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානයේ සිට මාහේනවත්ත දක්වා ශක්තිමත් හා කාර්යක්ෂම ගමනා ගමන හා මංමාවත් පහසුකම් වර්ධනය කිරීම අවධානයට යොමු කර ඇත.

එපමණක් නොව එම සංවර්ධන ව්‍යාපෘති සාර්ථකව ක්‍රියාත්මක වීම කෙරෙහි අවශ්‍ය උපයෝගිතා පහසුකම් ශක්තිමත් කිරීම හා සක්‍රිය කිරීම සඳහා අවැසි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීමක් ද සිදු කර ඇත.

## I. *බටහිර අතුරු මාර්ගය (Western By-Pass) සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

***රූපය 6.21 :*** *බටහිර අතුරු මාර්ගය (Western By-Pass) සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

කොළඹ ආර්ථික නගරයේ සිට දැනුම් කේන්ද්‍රීය නගරය දක්වා සහ මාකුඹුර අධිවේගී අන්තර් හුවමාරුවේ සිට මාහේන-වත්ත දක්වා කාර්යක්ෂම හා සුවපහසු ගමනාගමනයක් ලබා දීමේ අරමුණෙන් හෝමාගම සැලසුම් සීමාවේ හයිලෙවල් මාර්ගයේ සිට පින්බිම හරහා කටුවාන හන්දිය දක්වා මංතීරු 4කින් යුත් අතුරු මාර්ගයක් නිර්මාණය කිරීමට මෙහිදී අවධානය යොමු කර ඇත.

## II. *උඩුවන පන්සල මාර්ගය මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීම*

***රූපය 6.22 :*** *උඩුවන පන්සල මාර්ගය මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීම*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

යෝජිත බටහිර අතුරු මාර්ගය (western by – pass) හා සෘජු සම්බන්ධතාවක් ඇතිකිරීම මගින් මාහේනවත්ත දැනුම් කේන්ද්‍රීය නගරය සඳහා ළඟා වීමට කාර්ය-ක්ෂම මාර්ගයක් නිර්මාණය කිරීම මෙහි අරමුණ වී ඇත. ඒ අනුව හෝමාගම කටුවාන මංසන්දියේ සිට උඩුවන පන්සල මාර්ගය, පිටිපන – තලගල මාර්ගයේ පන්සල හන්දිය දක්වා මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීම සැලසුම් කර ඇත.

## III. යෝජිත දැනුම් කේන්ද්‍රීය නගරය හරහා මිල්ලෑව යාකෙරෙන අන්දමින් ඉදිකිරීමට යෝජිත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

***රූපය 6.23 :*** *යෝජිත දැනුම් කේන්ද්‍රීය නගරය හරහා මිල්ලෑව යාකෙරෙන අන්දමින් ඉදිකිරීමට යෝජිත මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*




***මූලාශ්‍රය :*** *දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2021*

පිටිපන තලගල මාර්ගයේ පන්සල හන්දියේ සිට පාසැල් හන්දිය දක්වාත් එහි සිට දාම්පේ පිටිපන මාර්ගයේ සිට මාහේනවත්ත දැනුම් කේන්ද්‍රීය නගරය හරහා දාම්පේ මාර්ගය දක්වා මෙම මාර්ගය ඉදිකිරීමට යෝජිත අතර එය මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

මෙම මාර්ගය හරහා දැනුම් කේන්ද්‍රීය නගරයේ අධ්‍යාපන හා පර්යේෂණ ආයතන මිල්ලෑව අතර ශක්තිමත් සෘජු සම්බන්ධතාවක් ගොඩනැගීම අපේක්ෂා කරන අතර බහුජාතික ව්‍යාපාර හා විදේශ ආයෝජකයන් මෙම සංවර්ධනය කෙරෙහි ආකර්ෂණය කර ගැනීම අභිප්‍රාය වී ඇත.

## IV. කටුවන හන්දියේ සිට මාහේනවත්ත පෙළ පොත් ගබඩාව දක්වා ඉදිකිරීමට යෝජිත නව මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

***රූපය 6.24 :*** *කටුවන හන්දියේ සිට මාහේනවත්ත පෙළ පොත් ගබඩාව දක්වා ඉදිකිරීමට යෝජිත නව මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අධිවේගී මාර්ගය යහ සම්බන්ධ ප්‍රවේශ පහසුකම් වර්ධනය කිරීමේ අදහසින් හා අයෝජකයන්ගේ ආකර්ෂණය ලබා ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය අඩි 50ක පළලින් යුත් මාර්ග පහසුකම් ලබා දීමට යෝජිතය.

## V. *විශ්වවිද්‍යාල, පර්යේෂණ හා සංවර්ධන ආයතන සංවර්ධන කලාපය*

***රූපය 6.25 :*** *විශ්වවිද්‍යාල, පර්යේෂණ හා සංවර්ධන ආයතන සංවර්ධන කලාපය*




***මූලාශ්‍රය :*** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාහේනවත්ත ප්‍රදේශයේ අක්කර 126 කට ආසන්න භූමි ප්‍රමාණයක් විශ්වවිද්‍යාල ,පර්යේෂණ හා සංවර්ධන ආයතන සංවර්ධනය සඳහා හඳුනා ගෙන ඇත. ඒ අනුව එන්.එස්.බී.එම්. (NSBM) හරිත විශ්ව විද්‍යාලය, ජයවර්ධනපුර, කොළඹ හා මොරටුව විශ්ව විද්‍යාලවල තාක්ෂණ පීඨ ඉදිකිරීම සඳහා අවකාශය වෙන් කිරීම අභිප්‍රාය වී ඇත. මෙහිදී ළමුන් 38,000 ක් පමණ ප්‍රමාණයක් සඳහා අධ්‍යාපන පහසුකම් සලසා දීම අපේක්ෂා කර ඇති අතර, ළමුන් 30,000ක පමණ ප්‍රමාණයක් පර්යේෂණ හා සංවර්ධනය සඳහා යොමු කිරීම අවධානයට යොමු කර ඇත.

## VI. *නැනෝ තාක්ෂණ හා විද්‍යා සංකීර්ණය*

ආර්ථිකයට අවශ්‍යය වන විද්‍යාත්මක හා තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතන මගින් මෙම ප්‍රදේශය බුද්ධිමය කේන්ද්‍රස්ථානය බවට පරිවර්තනය කිරීම එහි ඇතුලාන්තය වී ඇත. ඒ අනුව නව නිපැයුම් හා පර්යේෂණවල ශ්‍රී ලංකාවේ ගෝලීය කේන්ද්‍රස්ථානය ලෙස සංවර්ධනය කිරීම හා ආසියාවේ ප්‍රමුඛතම දැනුම් ආර්ථිකයේ ප්‍රථම හා මුලිකම ස්ථානය ලෙස මාහේනවත්ත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ එක් පියවරක් ලෙස මෙය හඳුන්වා දිය හැක.

ඒ අනුව යමින් දැනට ශ්‍රී ලංකාවේ අපනයන ආදායම් උපයන ප්‍රබල ව්‍යාපාර සම්බන්ධ කර ගනිමින් නව පර්යේෂණ සිදු කරනු ලබන නැනෝ තාක්ෂණ ආයතන හරහා ආර්ථිකය ශක්තිමත් කිරීමට මෙහිදී විශේෂ අවධානය යොමු කර ඇත. ඒ අනුව නැනෝ තාක්ෂණ හා විද්‍යා සංකීර්ණය ඉදි කිරීම උදෙසා අක්කර 4 ක භූමි ප්‍රමාණයක් හඳුනා ගෙන ඇත.

***රූපය 6.26 :*** *නැනෝ තාක්ෂණ හා විද්‍යා සංකීර්ණය*




***මූලාශ්‍රය :*** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

***රූපය 6.27 :*** *ජීව විද්‍යා තාක්ෂණ උද්‍යානය (Bio Technology Park) සංවර්ධන ව්‍යාපෘතිය*




***මූලාශ්‍රය :*** *තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

## VII. *පොදු බහු මහල් වාහන නැවතුම් අංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය*

***රූපය 6.28 :*** *යෝජිත පොදු බහුමහල් වාහන නැවතුම් අංගනය - මාහේනවත්ත*



***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

හෝමාගම දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා දිනකට එම කලාපය තුල පුරෝකථනය කරන ලද සංසරණය වන මුළු ජනගහනය 649,087 ක් වේ. මින් 25% ක පමණ ප්‍රමාණයක් පෞද්ගලික වාහන භාවිත කිරීම හරහා තම ජංගම සේවාවන් ඉටු කර ගැනීමට පෙළඹේ යයි උපකල්පනය කළහොත් මිනිසුන් 162,271 ක ප්‍රමාණයක් පෞද්ගලික වාහන භාවිතා කරයි. මේ අනුව වාහන නැවත්වීමට අවශ්‍ය පහසුකම් සැපයීම තුලින් පැයකට එක් පුද්ගලයකුගෙන් රුපියල් 100 ක් වශයෙන් ගණනය කළහොත් ලැබෙන අදායම දිනකට රුපියල් මිලියන 16 ක් බව පුරෝකථනය කළ හැක. ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම හරහා සංවර්ධන කලාපයෙහි අනුමත භාවිත යටතේ බහුමහල් රථගාල් වාණිජමය අවශ්‍යතාවයක් ලෙස මහජනයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. තවද පොදු ප්‍රවාහනය දිරිමත් කිරීම හරහා වාහන තදබදය අවම කිරීමට කුඩා පොදු ප්‍රවාහන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට මෙම සැලැස්ම හරහා කටයුතු යොදා ඇත.

## VIII. *යෝජිත මීගොඩ ප්‍රවාහන මධ්‍යස්ථානය හා වෙළඳ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

මෙහිදී මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය හා මීගොඩ දුම්රිය නැවතුම් ස්ථානය ආශ්‍රිත අක්කර 6ක භූමි ප්‍රදේශය පිළිබඳ අවධානය යොමු කර ඇත. වාණිජ හා ව්‍යාපාර අරමුණු කර ගනිමින් දැනුම් කේන්ද්‍රීය නගර කලාපය තුල සැරිසරන සමස්ථ ජනගහනය දිනකට මිනිසුන් 30446 ක් බව පුරෝකථනය කර ඇත. ඒ අනුව ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීම හා වාණිජ හා සේවා පහසුකම් සපයන මධ්‍යස්ථානයක් ලෙස මෙම ප්‍රදේශය සංවර්ධනය කිරීම හරහා ආර්ථිකමය වැසි රැසක් අත්කර ගැනීමට හැකි වනු ඇත. එමෙන්ම මෙම ව්‍යාපෘතිය හරහා නිර්මාණය වන රැකියා අවස්ථා ප්‍රමාණය 758 කි.

එපමණක් නොව ශ්‍රී ලංකාවේ ප්‍රවාහනය මූලික කරගත් සංවර්ධන ව්‍යාපෘති හරහා ඉඩම් වටිනාකමෙහි සීග්‍ර වර්ධනයක් හඳුනාගත හැක. උදාහරණයක් ලෙස මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය හරහා ඒ අවට ප්‍රදේශයේ පර්චසයක වටිනාකම ලක්ෂ 20 ක් ලෙස හඳුනා ගත හැකිය.

*රූපය 6.29 : යෝජිත මීගොඩ ප්‍රවාහන මධ්‍යස්ථානය හා වෙළඳ මධ්‍යස්ථානය*



*මූලාශ්‍රය : තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2018*

මේ අනුව මීගොඩ ප්‍රදේශයේ ඉඩම් මිල ගණන් වල වැඩි වීමක් අපේක්ෂා කළ හැක. ඒ අනුව විශේෂයෙන්ම සුඛෝපභෝගී නිවාස සංකීර්ණ ඉදිවීමට පවතින ඉල්ලුම වැඩි වීම හරහා ප්‍රදේශයට විශාල ආර්ථික වාසි ප්‍රමාණයක් අත්කර ගත හැකි බව පුරෝකථනය කළ හැක.

## IX. *යෝජිත වාණිජ හා සේවා පහසුකම් මධ්‍යස්ථානය*

*රූපය 6.30 : යෝජිත වාණිජ හා සේවා පහසුකම් මධ්‍යස්ථානය*




*මූලාශ්‍රය : තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය, 2020*

යෝජිත දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමත් සමග 2031 වර්ෂය වනවිට දිනකට මෙම ප්‍රදේශය ආශ්‍රිතව සැරිසරන ජන සංඛ්‍යාව 700,000ක් පමණ වන බව පුරෝකථන මගින් හඳුනාගෙන ඇත. වර්තමානය වන විට ක්‍රියාත්මක නැනෝ තාක්ෂණ ආයතනය, මහින්ද රාජපක්ෂ ජාතික පාසැල, එන්.එස්.බී.එම් (NSBM) හරිත විශ්ව විද්‍යාලය හා අනෙකුත් විශ්ව විද්‍යාල ජාලය හරහා දිනකට එහි සැරිසරන ජන සංඛ්‍යාව ආසන්න වශයෙන් ලක්ෂයක් දක්වා වර්ධනය විය හැකි බව පුරෝකථනය කළ හැකිය. නමුත් එහි පැමිණෙන ජනතාවට එදිනෙදා ආහාර අවශ්‍යතා, බැංකු අවශ්‍යතා, විවේක ගැනීමේ හා මූලික අවශ්‍යතා සපුරා ගැනීමට සුදුසු සේවා ප්‍රදේශයක් ක්‍රියාත්මක නොවන අතර ඒ සඳහා ඉල්ලුමක් පවතින බව පැහැදිලිව පෙනේ.

ඒ අනුව වර්තමානය වන විට දාම්පේ පිටිපන මාර්ගයට මුහුණලා පවතින නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම සඳහා වාණිජ හා සේවා පහසුකම් මධ්‍යස්ථානයක් ඉදි කිරීමට යෝජනා කරන අතර ඒ හරහා රැකියා අවස්ථා නිර්මාණය කිරීම හා ආර්ථික වාසි ලබා ගැනීම අපේක්ෂා කර ඇත.

## X. ඇඹුල්ගම පාදක සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම

මෙම සැලැස්ම යටතේ ප්‍රධාන වශයෙන් අතුරුගිරිය අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හා දොම්පේ නගරය ඇඹුල්ගම හන්දිය හරහා සම්බන්ධ කිරීමට සැලසුම් කර ඇත. ඒ සඳහා ඇඹුල්ගම මංසන්ධියේ සිට කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමෙන් දොම්පේ හා ඇඹුල්ගම නගර අතර සහසම්බන්ධතාවය නිර්මාණය කිරීමට අරමුණු කර ඇත. දොම්පේ නගරය හා අතුරුගිරිය අන්තර් හුවමාරු මධ්‍යස්ථානය අතර සම්බන්ධතාවය ඇඹුල්ගම – පනාගොඩ ප්‍රධාන මාර්ගය මීටර් 9 යක පළලින් යුතුව සංවර්ධනය කිරීම හරහා ලඟා කර ගැනීමට අපේක්ෂා කර ඇත.

තවද මෙම ව්‍යාපෘතිය හරහා ඇඹුල්ගම මංසන්ධිය නගර අලංකරණ සැලැස්මක් යටතේ සේවා සපයන නගරයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

තවද මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හා යෝජිත පාලම සංවර්ධනය කිරීම හරහා ටෙම්පල් බර්ග් කර්මාන්ත කලාපය ආයෝජකයන්ගේ අවධානයට යොමු කරවීමට අපේක්ෂා කර ඇත. මේ හරහා හෝමාගම ප්‍රදේශිය සභා බලප්‍රදේශයේ  ආර්ථික හැකියාව වර්ධනය කිරීම අරමුණු කර ඇත.

***රූපය 6.31 :*** *ඇඹුල්ගම නගර සංවර්ධන ව්‍යාපෘති සංකල්පය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

## XI. වැඩි සනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය තුල හඳුනා ගන්නා ලද මාර්ග සංවර්ධනය කිරීම

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 ට අනුව වැඩි සනත්ව විද්‍යා හා තාක්ෂණ කලාපය 2 ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගන්නා ලද කලාපය තුල අතුරු මාර්ග පද්ධති නොදියුණු මට්ටමක පවතින ආකාරයක් දැකිය හැක. විද්‍යා හා තාක්ෂණය පදනම් කර ගත් නිෂ්පාදන හා සම්බන්ධ පර්යේෂණ සඳහා ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ අරමුණෙන් මෙම මාර්ග මෙහිදී හෝමාගම සංවර්ධන සැලැස්ම 2022 – 2031 යටතේ යෝජිත වැඩි සනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය තුල යෝජිත මාර්ග මංතීරු දෙකක පහසුකම් සහිතව සංවර්ධනය කිරීම අපේක්ෂා කරන අතර ඉඩම් වටිනාකම ඉහළ දැමීම හරහා නිෂ්පාදන පදනම් කරගත් පර්යේෂණ ආයතන ආකර්ෂණය කර ගැනීම බලාපොරොත්තු වී ඇත.

***රූපය 6.32 :*** *වැඩි ඝනත්ව විද්‍යා හා තාක්ෂණ කලාපය 2 තුල හඳුනා ගන්නා ලද මාර්ග සංවර්ධනය කිරීමට යෝජිත ආකාරය*




**වර්තමාන තත්ත්වය** **යෝජිත තත්ත්වය**

***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.7.3. සුළු පරිමාණ ආර්ථික සංවර්ධන ව්‍යාපෘති (NON –Based Sector)

### 6.7.3.1. හෝමාගම නගර සංවර්ධන ව්‍යාපෘතිය

මෙහිදී ප්‍රධාන වශයෙන් හෝමාගම සංවර්ධන සැලැස්ම (2022–2031) ට අනුකූලව අපේක්ෂිත ආර්ථික ප්‍රතිලාභ අත්කර ගැනීම උදෙසා ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි මූලික අවධානය යොමු කර ඇත. ඒ අනුව ප්‍රධාන නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘති, මහා මාර්ග සංවර්ධන ව්‍යාපෘති හා උද්‍යාන සංවර්ධන ව්‍යාපෘති කෙරෙහි අවධානය යොමු කර ඇත. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හරහා පහත සඳහන් ආර්ථික අරමුණු ළඟා කර ගැනීම අපේක්ෂා කර ඇත.

- *2031 වන විට කාර්යක්ෂම සේවා සැපයුම් කේන්ද්‍රස්ථානයක් ලෙස ප්‍රධාන නගර මධ්‍ය සංවර්ධනය කිරීම.*
- *විවිධාංගීකරණය වූ වාණිජ භාවිතයන් සඳහා ප්‍රසාරණය වීමට අවකාශ සැලසීම.*

*ඉහත සඳහන් මූලික ආර්ථික අරමුණු සාක්ෂාත් කරගැනීමේ පුරෝගාමීන් ලෙස ප්‍රධාන නගර මධ්‍ය සංවර්ධන ව්‍යාපෘතීන් හඳුන්වා දිය හැක.*

භෞතික, සමාජීය හා පාරිසරික අතින් ඉතා වැදගත් ස්ථානයක් ගන්නා හෝමාගම නගරය මහරගම, කොට්ටාව හා අවිස්සාවේල්ල යන තදාසන්න නගරයන්ට සාපේක්ෂව කලාපයේ අනාගත අවශ්‍යතාවයන්ට සරිලන සංවර්ධන විභවතාවයන්ගෙන් සමන්විත නගරයක් ලෙස හඳුන්වාදිය හැක.

තොග හා සිල්ලර වෙළඳාම, කෘෂි භෝග අලෙවිය ඇතුළු අනෙකුත් සේවා වෙළඳාම් ඇතුළත්ව විවිධාංගීකරණය වු වෙළඳ ප්‍රජාවක් සිටින හෝමාගම නගරය ප්‍රසාරණය වීමේ අවකාශයන් නොමැති වීම මත නගරයේ නිෂ්පාදිතය හා නගරයේ වර්ධනය නතර වී පවතින ස්වභාවයෙන් දැක්විය හැකිය. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම්මය මඟපෙන්වීම යටතේ නගරයේ ප්‍රසාරණය තවදුරටත් නැගෙනහිර දිශාවට යොමු කිරීමත් අපේක්ෂා කරයි. බස්නැවතුම්පොල, බහුමහල් රථගාල, එළිමහන් රංග පීඨය අතුරු මහජන උද්‍යානයන්ගෙන් සමන්විත අංගසම්පූර්ණ සංවර්ධනයන් සිදුකිරීම මේ තුළින් අපේක්ෂා කෙරේ.

*රූපය 6.33 : හෝමාගම නගර සංවර්ධන සංකල්පය*




***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

නගරයේ නැගෙනහිර දිශාවන්ට වන්නට පිහිටි අක්කර 65 කින් යුත් භූමිය මේ සඳහා හඳුනාගනු ලැබූ අතර, මෙම භූමිය ගොවිතැනින් ඉවත්ව පුරන් මට්ටමේ පවත්නා අතර, අනවසර ඉඩම් ගොඩකිරීම සුලභව දක්නට ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් හෝමාගම සංවර්ධන සැලසුම (2022–2031) යටතේ සංවර්ධනයට හඳුනාගත් මෙම භූමිය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිර්දේශය මෙම අධිකාරිය විසින් ලබාගෙන ඇත.

නවීන වෙළඳ ලෝකයේ ගමන් දිශාව පැහැදිලිව හඳුනාගැනීමෙන් භූමිය බෙදා පැවරීමකින් සිදුවන තිරසාර සංවර්ධනය වෙනුවට සිරස් සංවර්ධනයන් සිදුකිරීම යෝග්‍ය බැවින්, ඊට අනුරූපව පැහැදිලි සැලැස්මක් සකස් කරන ලදී.

නගර මධ්‍ය තුළ නිරන්තරයෙන් දැකිය හැකි රථවාහන තදබදයට විසඳුමක් ලෙස විකල්ප මාර්ගයන් ඉදිකිරීම හා එම මාර්ගය පිටිපන – මාහේනවත්ත ඉදිවන නව දැනුම් කේන්ද්‍රීය නගරයට පිවිසෙන ප්‍රධාන ප්‍රවේශකත්වය ලෙසත් සංවර්ධනය කිරීමට යෝජිතය.ඒ තුළින් වර්තමානය වනවිට කාර්යාල වේලාවන්හිදී පැ.කි. 15 ක රථවාහන වේගයක් පවත්වා ගන්නා හෝමාගම නගර මධ්‍ය පැ.කි.50 ක රථවාහන වේගයෙන් කාර්යාල වේලාවන්හිදී පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. ඒ අනුව නගරය හරහා ගමන් ගන්නා රථවාහන වෙනුවෙන් වැයවන කාලය ඉතිරි කරගැනීම මෙන්ම රථවාහන හේතුවෙන් පරිසරයට වන හානිය අවම කරගැනීමටද අපේක්ෂා කෙරේ.

ඉහත සැලැස්මේ දක්වා ඇති ආකාරයට අක්කර 65 කින් යුත් භූමියේ 60% ක ප්‍රදේශයක් සංවර්ධනය කිරීමට තීරණය කර ඇති අතර, ඉතිරි 40% ජල රැඳවුම් ප්‍රදේශ ලෙස පවත්වා ගත යුතු වේ.

ඉහත සංකල්පයට අනුව හරිත වර්ණයෙන් යුත් විශාල විවෘත අවකාශයක් බටහිර දිශාවට වන්නටත්, ප්‍රවාහන මූලික කරගත් බහුමහල් රථගාලක් පවත්නා වාණිජ සංවර්ධනයක් නැගෙනහිර දිශාවට වන්නටත්, වාණිජ, ආයතනික ඇතුළු අනෙකුත් සේවා අංගයන්ගෙන් යුත් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් දකුණු දිශාවට වන්නටත් ස්ථාපිත කිරීමට මින් අපේක්ෂා කෙරේ.

නවීන ලෝකයේ නගර සැලසුම්කරණය විවෘත එළිමහන් භූමි නගර මධ්‍ය තුළ ස්ථානගත වීම සුවිශේෂී කාරණයක් වේ. නගරයක ජීවය ඒ නගර තුළ ගැවසෙන ජනතාව වන අතර, ඔවුන්ගේ පහසුව, අවශ්‍යතාවයන් හා නිදහස අරමුණු කොටගත් ප්‍රමාණයෙන් අක්කර 04 කින් යුත් විවෘත භූමිය ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස නම්කළ හැක. කොළඹ නරගයෙන් ආරම්භ වී ගොඩනැගිලි තදබදයක් ඔස්සේ ගමන් ගන්නා හයිලෙවල් මාර්ගයට අනාගතයේ හමුවන ප්‍රධානම හා සුවිශේෂීම විවෘත භූමිය හෝමාගම වීම මේතුළින් අපේක්ෂා කෙරේ.

එකවර මහජනතාව 3,000 කට අධික පිරිසකට එක්රැස් විය හැකි ආකාරයට සැලසුම් කර ඇති මෙම විවෘත භූමිය තුළ වර්ග අඩි 10,000 කින් යුත් එළිමහන් රංගපීඨ ඉදිකිරීමට යෝජිතය.

ව්‍යාපෘති අංක 02 යටතේ වර්ග අඩි 80,000 කින් යුත් වාණිජ සංවර්ධනයක් සිදුකිරීමට යෝජිත අතර, එය පෙර සඳහන් කළ එළිමහන් රංගපීඨය, බස්රථ නැවම්පොල හා බහුමහල් රථගාල සම්බන්ධ කරමින් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මෙම ගොඩනැගිල්ල කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතම වාණිජ සංකීර්ණය ලෙස සියළු අංගයන්ගෙන් සම්පූර්ණ නවීන තාක්ෂණ පහසුකම් සහිත ගොඩනැගිල්ලක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය. මෙම නවීන වාණිජ සංකීර්ණයේ ගෘහ නිර්මාණ සැලසුම් ඊට ඉදිරිපසින් ඇති හරිත පැහැති විවෘත භූමියට සමගාමීව එයට ගැළපෙන ආකාරයෙන් නිමකිරීමට යෝජිත අතර, අඩි 40 ක මාර්ගයකින් ප්‍රවේශය ලබාගැනීමටත්, එම මාර්ග හයිලෙවල් මාර්ග හා යෝජිත විකල්ප මාර්ග සම්බන්ධ කිරීමටත් යෝජිතය.

ව්‍යාපෘති අංක 03 යටතේ යෝජිත විකල්ප මාර්ගය බටහිර හරස් පාර (Western Bypass Road) මාර්ග ලෙස හඳුනාගෙන ඇති අතර, පළලින් මීටර් 9 කින් යුත් හා දිගින් මීටර් 29 කින් යුත් එම මාර්ගය මංතීරු 04 ක්, සේවා මාර්ග 02 කින් හා බයිසිකල් මංතීරු 02 කින් සමන්විත මාර්ගයක් වේ.

යෝජිත තොරතුරු දැනුම් කේන්ද්‍රීය නගරයට සෘජු හා ඉක්මන් ප්‍රවේශකත්වයක් ලබාදීම ප්‍රමුඛ කොටගත් මෙම ව්‍යාපෘතිය හයිලෙවල් මාර්ගයෙන් ආරම්භ වී කටුවාන දක්වා ඉදිකිරීමට යෝජිතය. ඊට සමගාමීව සේවා මාර්ගයක් සැලසුම් කර ඇති අතර, යෝජිත වාණිජ හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය මෙම සේවා මාර්ගය මුලික කරගෙන ඉදිකිරීමට සැලසුම් කර ඇත. තවද, ඒ සඳහා සියළු ප්‍රවේශකත්වයන් ඉන් ලබාගැනීමට අපේක්ෂිතය. ඉහත සඳහන් කළ ආකාරයට මෙම භූමියේ සංවර්ධනය සිදුකරනු ලබන 60% ක බිම් ප්‍රමාණය තුළ පෙර සඳහන් සේවා මාර්ගය හා සම්බන්ධ වන අඩි 20 ක පළලින් යුත් මාර්ග ජාලයක් සැලසුම් කර ඇති අතර, එමගින් නවීන වාණිජ සංකීර්ණයක් ඒ තුළ බිහිකිරීමට අපේක්ෂිතය.

ව්‍යාපෘති අංක 04 යටතේ යෝජිත විවෘත භූමිය හේතුකොට ගෙන වෙළඳාම් අහිමිවන ප්‍රජාව පුනස්ථාපනය කිරීම සඳහා වන නව වාණිජ සංකීර්ණය සංවර්ධනය කිරීම් ව්‍යාපෘතිය හඳුන්වාදිය හැකිය.

ව්‍යාපෘති අංක 05 යටතේ හෝමාගම නගරයට පිවිසීම සංකේතවත් කිරීම සඳහා සංකේතවත් වාණිජ අධි උස ගොඩනැගිල්ලක් ඉදිකිරීමට යෝජිත අතර, එය පෞද්ගලික අංශයේ දායකත්වයක් සමඟ සිදුකිරීමට සැලැස්මේ අන්තර්ගත වේ. සමස්ථ ව්‍යාපෘති භූමිය තුළ ඉතා වැදගත් ස්ථානයක් වන මෙම බිම් කොටසේ ප්‍රමාණයෙන් අක්කර 03 ක පමණ වපසරියකින් යුක්ත වන අතර, මහල් 10 (බිම් මහල +09) ක් අවමය වන පරිදි නවීන තාක්ෂණයෙන් යුත් අංග සම්පූර්ණ ගොඩනැගිල්ලක් ඉදිකිරීමට අපේක්ෂිතය.

ව්‍යාපෘති අංක 06 යටතේ බහුමහල් රථගාලක් ඉදිකිරීමට යෝජිත අතර, මෙම ගොඩනැගිල්ලේ මහල් සංඛ්‍යාව 06 (බිම් මහල +05) සැලසුම් කර ඇත. එකවර රථවාහන 300 ක් නවතා තැබීමේ හැකියාව සහිත යෝජිත නවීන වෙළඳ සංකීර්ණය, බස්නැවතුම්පොල සහ සම්බන්ධ කරගනිමින් ඉදිකිරීමට යෝජිත අතර, නගරයේ වාහන නතර කිරීමේ අවශ්‍යතාවය මින් සම්පූර්ණ කිරීමට අපේක්ෂිතයි.

භූමියේ ඉතිරි 40% ක ප්‍රමාණය ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශයන්ට අනුරූපීව ජල රැඳවුම් ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට යෝජිත අතර, ඒ තුළින් ප්‍රදේශයේ අනවසර හා අවිධිමත් පහත්බිම් ගොඩකිරීම් නවතා දැමීමටද අපේක්ෂිතය.

***රූපය 6.34 :** හෝමාගම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය - දළ සැලැස්ම*




| Lot No. | Proposed Uses |
|---|---|
| 1 | Commercial Development |
| 2 | Land for Shopping Mall development |
| 3 | Land for Commercial Development |
| 4 | Land for "Rajawasala" Development |
| 5 | Land for Department of Police |
| 6 | Existing Bus Stand Land |
| 7 | Existing Bank Facilities |
| 8 | Land for Multi storied vehicle park |
| 9 | Existing Land for commercial development |
| 10 | Land for commercial development |
| 11 | Land for Relocation |
| 12 | Land for Supermarket |
| 13 | Land for commercial development |
| 14 | Land for Banking Facilities |
| 15 | Land for Banking Facilities |
| 16 | Land for Health Related Activities |
| 17 | Land for Private Hospital Development |
| 18 | Land for Office Complex |
| 19 | RDA Land Relocation Site |
| 20 | Land for Housing Complex |
| 21 | Land for Housing Complex |
| 22 | Urban Park Development |

***සැකසුම :** බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 6.7.3.2. ගොඩගම නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2030

නිරන්තරයෙන් වාහන තදබදයන් සම්බන්ධව හෝමාගම ප්‍රදේශයේ සාකච්ඡාවට ලක්වන්නේ නම්, ඒ ගොඩගම මංසන්ධියයි. කලාපීය කේන්ද්‍රීය සම්බන්ධතාවය හේතුකොට ගෙන කාර්යාල වේලාවන්හිදී පැ.කි. 10 ක පමණ රථවාහන වේගයක් පවත්වාගෙන යන ගොඩගම මංසන්ධිය විකල්ප මාර්ගයක අවශ්‍යතාවය පෙන්නුම් කරයි. තවද, නගර මධ්‍යයේ කැළණිවැලි දුම්රිය මාර්ගයේ ගොඩගම දුම්රිය ස්ථානය අතර දුර කි.මී. 01 ට වඩා අඩුවන අතර, බස්රථ සේවාව හා දුම්රිය මගී සේවාව ඒකාබද්ධ කර අන්තර් සබඳතාවයන් ඇතිකරලීම ගොඩගම නගර සංවර්ධන සැලසුමේ ප්‍රධාන අරමුණක් වේ. ඒ යටතේ නගර මධ්‍ය හා දුම්රිය ස්ථානය අතර පවත්නා දුම්රියපොළ මාර්ගයේ දිශාව සෘජුව නිර්මාණය කිරීම තුළින් දුම්රිය ප්‍රවාහන සේවය ඇතුළු පොදු ප්‍රවාහනයට නවදුරටත් මගීන් නැඹුරු කරලීමට අපේක්ෂිතයි.

නගර මධ්‍ය තුළ ඇති මෙම අධිකාරිය සතු ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 04 කින් යුත් භූමියට අමතරව අක්කර 21 ක භූමියක් අත්පත් කරගැනීමට යෝජිත අතර, මේවනවිට පුරන් වූ කුඹුරු ඉඩමක් ලෙස මෙම භූමිය වර්තමානයේ පවතී. විධිමත ජලාපවහන සැලැස්මකට අනුව සංවර්ධනය කිරීමට යෝජිත මෙම භූමියේ කොටසක් සඳහා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් නිර්දේශ ලබාදී ඇත.

ඒ අනුව මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා හඳුනාගත් ප්‍රමාණයෙන් අක්කර 25 ක භූමිය, හයිලෙවල් මාර්ගය හා මීගොඩ පාර අතර පුරන් කුඹුරු මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීමටත් ඉතිරි බිම් ප්‍රමාණයක් ජල රැඳවුම් ලෙස සංවර්ධනය කිරීම සැලැස්මේ අන්තර්ගත වේ.

ගොඩගම නගර මධ්‍යස්ථානය "නොනිදන නගරයක්" ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතර ධාන්‍ය නිෂ්පාදන, ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදන, නගර මධ්‍යස්ථානය හරහා අතුරු මාර්ග සංවර්ධනයන් මත පදනම් වූ ප්‍රවාහන මධ්‍යස්ථානයක් සඳහා වාණිජමය වශයෙන් වෙළඳපළක් ඇති කිරීම අභිප්‍රාය වී ඇත.

***රූපය 6.35 :*** *ගොඩගම නගර සංවර්ධන ව්‍යාපෘතිය - දළ සැලැස්ම*




***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

යෝජිත උප ව්‍යාපෘති :

1. *මහා පරිමාණ ධාන්‍ය අලෙවි වෙළඳපොල*
2. *ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා තොග මධ්‍යස්ථානය*
3. *කුඩා බස් පර්යන්තය*
4. *මූලික වශයෙන්, ආහාර මධ්‍යස්ථාන, ආහාර නගරය, කුඩා සිනමාහල්, සාප්පු සවාරි වැනි මිශ්‍ර සංවර්ධන භාවිතයන් සඳහා මධ්‍යස්ථානයක්*
5. *මහජන විවෘත හා විනෝදාත්මක අවකාශ සංවර්ධනය*
6. *නිවාස සංවර්ධනය*
7. *A4 – හයිලෙවල් මාර්ගය සහ B240 – මලම්බේ-අතුරුගිරිය – පදුක්ක මාර්ගය සම්බන්ධ කරන තුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘති*
8. *ගොඩගම දුම්රිය ස්ථානය සම්බන්ධ කිරීම සඳහා අතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතියක්.*
9. *ප්‍රධාන පොදු ප්‍රවාහන ක්‍රම සම්බන්ධ කරමින් හඳුනාගෙන ඇති ප්‍රවේශ මාර්ග පළල් කිරීමේ ව්‍යාපෘති.*
10. *පොදු වාහන නැවැත්වීමේ පහසුකම් සැපයීම*

ඉහත උප ව්‍යාපෘතිවලට අනුව මෙම නගර මධ්‍යස්ථානය අදියර දෙකකින් සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. පළමු අදියරේදී අක්කර 9 ක පමණ ඉඩමක් අත්පත් කර ගැනීමටත්, අක්කර 9 ක ඉඩම හා අක්කර 4 ක ඉඩම සංවර්ධනය කිරීමටත්, උතුරු දිශාවෙන් හයිලෙවල් මාර්ගයට මුහුණලා පිහිටා ඇති අක්කර 4 ක ඉඩමක් දැනටමත් අත්පත් කර ගැනීමටත් යෝජනා වී තිබේ. එසේම, A4 – ඉහළ මට්ටමේ මාර්ගය සහ B240 – මාලඹේ – අතුරුගිරිය – පාදුක්ක මාර්ගය සම්බන්ධ කරන යෝජිත අතුරු මාර්ග සංවර්ධනය කිරීම හරහා නගරයේ ගමනාගමන පහසුකම් වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

දෙවන අදියරේදී කුඩා බස් නැවතුම්පොළ, හරිත උද්‍යාන සංවර්ධනය, මිශ්‍ර භාවිත ගොඩනැගිලි සංවර්ධනය සහ ප්‍රවේශ පහසුකම් පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ඉතිරි අක්කර 12 ක ඉඩමක් අත්පත් කර ගැනීමට යෝජනා කෙරේ.

එමෙන්ම යෝජිත අක්කර 25 ක මුළු භූමි ප්‍රමාණය සඳහා ජලාපවහන සැලැස්මක් සකස් කිරීමටත් යෝජනා කෙරේ. ඉඩම් සංවර්ධනයෙන් පසු, නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුන්වා දීමට නියමිත සැලසුම් මාර්ගෝපදේශ යටතේ ගොඩගම නගර මධ්‍යයේ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත. විධිමත ජලාපවාහන සැලැස්මකින් තොරව මෙහි සංවර්ධන කටයුතු සිදු නොකළ යුතු බවට ද හඳුනාගෙන ඇත.

## 6.7.3.3. කහතුඩුව නගර සංවර්ධන ව්‍යාපෘතිය - 2030

වර්තමානය වනවිට ග්‍රාමීය ලක්ෂණයන්ගෙන් යුත් හරිත ප්‍රදේශයක් ලෙස කහතුඩුව ප්‍රදේශ හඳුන්වාදිය හැකි අතර, සුළු වර්ෂාවකට පවා ජල ගැලීම ඇතිවන මුහුදු මට්ටමට සාපේක්ෂව පහළ මට්ටමක පිහිටන මෙම නගරය සංවර්ධනයවීමේ ඉඩප්‍රස්ථාව නොමැතිව ගැටළුකාරී තත්ත්වයට පත්ව ඇති බවක් නිරීක්ෂණය වේ.

ප්‍රදේශය පුරා පවතින පහත්බිම්, ස්වභාවික ජල ධාරා හා ඒ මත ඉදිකර ඇති අධිවේගී මාර්ගය හේතුවෙන් සංවර්ධන භූමින් අඩුවීම සිදු වී ඇති අතර, එහෙත් කහතුඩුව අන්තර් හුවමාරු මධ්‍යස්ථානය හේතු කොටගෙන අනාගත සංවර්ධන විභවතාවයන් දැඩිව පෙන්නුම් කරන නගරයක් ලෙස කහතුඩුව හඳුන්වාදිය හැක.

අන්තර් හුවමාරු මධ්‍යස්ථානයේ සිට කිලෝමීටර 2 ක් දුරට විහිදෙන භෞතික සැලසුම් සීමාවක් ඔස්සේ යමින් කහතුඩුව නගරය කෘෂි අපනයන ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත.

සමස්ත හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දෙස අවධානය යොමු කිරීමේදී අධිවේගී අන්තර් හුවමාරු පහසුකම් පවතින තත්වයක් තුල ඒ ආශ්‍රිතව වී වගා කුඹුරු කෘෂි බෝග වගා සතර දෙසින් දක්නට ලැබේ
.
භූමි භාවිතය කෙරෙහි අවධානය යොමු කිරීමේදී කහතුඩුව නගර සැලසුම් ප්‍රදේශය ආශ්‍රිතව බහුතර ප්‍රදේශයක් නේවාසික සංවර්ධනයක් කෙරෙහි යොමුව තිබෙනු දක්නට ලැබෙන නමුදු කහතුඩුව අන්තර්හුවමරු පරිශයේ සිට කිලෝමීටර 1 ක් දුරට විහිදෙන නාගරික ලක්ෂණ හා පහසුකම් සමග මුසුවන කුඹුරු හා කෘෂි වගා භූමි බහුලව දක්නට ලැබෙන බව පැහැදිලිය.

තවද එක් පසෙකින් කළු ගඟ අතු ඔයක් ලෙස සැලකෙන මහ ඔය ගලා බසින අතර වැසි කාලවලද මහ ඔය දෙපස පහත්බිම් ප්‍රදේශ ජලයෙන් යටවෙන තත්වයක් දක්නට ලැබේ. ඒ අනුව අධිවේගී අන්තර් හුවමාරු පාදක කර ගත් සංවර්ධනයක් සැලසුම් කල හැකි වුවද, ඒ සඳහා පවතින සංවර්ධනය සඳහා යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණවත් නොවන බැවින් මහා මාර්ග දෙපස රේඛීයව එම නාගරික පහසුකම් ව්‍යාප්ත වන බවක් දක්නට ලැබේ.

ඒ අනුව පවතින පහත් බිම්, කෘෂි වගාබිම්, කුඹුරු කෘෂි වගාව සදහා යොදා ගනිමින් අන්තර් හුවමාරුව ආශ්‍රිතව පවතින උස් බිම් හා රක්ෂිත ප්‍රදේශ ඒකාබද්ධ කරගනිමින් නාගරික ලක්ෂණ හා නාගරික පහසුකම් ඉස්මතු කරමින් කෘෂි අපනයන ගම්මානයක් ලෙස කහතුඩුව නගරය සංවර්ධනය කිරීමට හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 හි ආර්ථික සංවර්ධන උපායමාර්ග සැලැස්ම හරහා ලගා කර ගැනීමට අපේක්ෂා කර ඇත.

***රූපය 6.36 :*** *කහතුඩුව නගර සංවර්ධන ව්‍යාපෘතිය - දළ සැලැස්ම*




***සැකසුම :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 හි ආර්ථික සංවර්ධන උපාය මාර්ග සැලැස්ම හරහා ඉහත විස්තර කරන ලද හෝමාගම ආර්ථිකයේ ප්‍රධාන නියමුවා වන තාක්ෂණ නගර ව්‍යාපෘතීන් හා ඒ සමගාමීව තාක්ෂණ නගරයට සේවා සපයන ප්‍රධාන නගර ව්‍යාපෘතීන් හරහා සමස්ථ ප්‍රදේශය තුල ආර්ථික සංවර්ධනයට සමගාමීව ඉඩම් මිල ගණන් වල විශාල වර්ධනයක් අපේක්ෂා කරයි.

වර්තමානය වන විට හෝමාගම ප්‍රදේශය තුල ඉඩම් විකුණුම් මිල පර්චසයක් සඳහා රුපියල් 184,000 ක අගයක් ගනී. ජාතික නිවාස සංවර්ධන අධිකරියේ කරන ලද සමීක්ෂණයන්ට අනුකූලව ප්‍රදේශය පුරා සිදුවන යටිතල පහසුකම් සංවර්ධනය සැලකූ විට 2031 වන විට ඉඩම් විකුණුම් මිල රුපියල් 5,000,000/- දක්වා ඉහළ යන බව පුරෝකථනය කර ඇත.

ප්‍රදේශයේ මූලික ආර්ථික පෙරගමන්කරුවන් වන තාක්ෂණ නගර ව්‍යාපෘතිය සැලකූ විට ඉඩම් වටිනාකම තක්සේරු කිරීමේදී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය කරන ලද පුරෝකථනයන් හා සමානය. වෙළඳපොල ඉඩම් මිල ගණන් වල විචලනයන් සැලකිල්ලට ගත් විට හෝමාගම ප්‍රදේශයේ නේවාසික භාවිත සඳහා වූ ඉඩම් වල විකුණුම් මිල මිලියනයක් දක්වා ඉහළ යන බව පුරෝකථනය කර ඇත. තවදුරටත් එම අධිකාරිය මගින් පෙන්වා දෙනු ලබන්නේ නේවාසික ඉඩම් මිල පර්චසයක් සඳහා රුපියල් 750,000 සිට මිලියනය දක්වා අගයක් ගන්නා බවයි.

නේවාසික ඉඩම් මිලට සාපේක්ෂව වාණිජ භාවිත සඳහා වන ඉඩම් මිල විචලනය නේවාසික ඉඩම් මිල මෙන් දෙගුණයක් දක්වා ඉහළ යන බව පුරෝකතනය කර දක්වා ඇත.

මේ අනුව, හෝමාගම ප්‍රදේශයේ ආර්ථිකමය සංවර්ධන සඳහා වන ව්‍යාපෘතීන්ට සමගාමීව ප්‍රදේශයේ භූමිය සඳහා වන ආර්ථිකමය වටිනාකම පවතින තත්ත්වයට සාපේක්ෂව ඉතා ඉහළ සංවර්ධනයක් අපේක්ෂා කරයි. පහසුකම් සපිරි නේවාසික ප්‍රදේශයක් කරා යාමේ අභිමතාර්ථයට ඉහළ වටිනාකමක් මෙම ප්‍රදේශය තුල ඇතිවන බව මේ අනුව පැහැදිලි වේ.

# 6.8. අපරවයුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම *(Infrastructure Facilities Development Strategic Plan)*

## 6.8.1. ජල සැපයුම් සැලැස්ම (Water Supply Plan)

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල සැපයුම සම්බන්ධයෙන් අවධානය යොමු කළ විට පැහැදිලි වනුයේ ජලය සපයා ගැනීම විවිධ මූලාශ්‍ර මත පදනම් වෙමින් සිදුකර ගන්නා බවයි. 2019 වර්ෂයේ සම්පත් පැතිකඩ වාර්තාව අනුව හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පානීය ජල අවශ්‍යතාවය සපුරා ගන්නා ආකාරය පහත පරිදි පෙන්වා දිය හැක.

*__වගුව 6.10 :__ හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය පානීය ජල අවශ්‍යතාවය සපුරා ගන්නා ආකාරය, 2019*

| ***ජල මූලාශ්‍රය*** | ***ප්‍රතිශතය*** |
|---|---|
| *ප්‍රදේශය තුල ආරක්ෂිත ළිං* | *11.2* |
| *අනාරක්ෂිත ළිං* | *0.5* |
| *නල ජලය, ප්‍රදේශය තුළ, අදාල සේවා ප්‍රදේශය තුල, ප්‍රධාන සැපයුමෙන්* | *14.6* |
| *ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘති* | *2.0* |
| *නල ළිං* | *0.7* |
| *වෙනත්* | *0.01* |

*__මූලාශ්‍රය :__ සම්පත් පැතිකඩ වාර්තාව, 2019 වර්ෂය, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*



**11.2%**
ප්‍රදේශය තුල ආරක්ෂිත ළිං

**0.5%**
අනාරක්ෂිත ළිං

**14.6%**
නල ජලය, ප්‍රදේශය තුළ, අදාල සේවා ප්‍රදේශය තුල, ප්‍රධාන සැපයුමෙන්

**2.0%**
ග්‍රාමීය ජල සැපයුම් ව්‍යාපෘති

**0.7%**
නල ළිං

**0.01%**
වෙනත්

ඉහත සංඛ්‍යාලේඛන දත්ත අනුව හෝමාගම ප්‍රදේශයේ බහුතරයක් නිවාස (14.6 %) නම පානිය ජල අවශ්‍යතාවය නල ජලය, ප්‍රදේශය තුළ, අදාල සේවා ප්‍රදේශය තුල, ප්‍රධාන සැපයුම භාවිතා කිරීමෙන් සපුරා ගන්නා බවත් 11.2% ක පමණ නිවාස ප්‍රමාණයක් ප්‍රදේශය තුල ආරක්ෂිත ළිං මාර්ගයෙන් ජල අවශ්‍යතාවය සපුරා ගන්නා බවත් හඳුනා ගත හැකිය. හෝමාගම ප්‍රදේශයේ 2031 දක්වා වූ සංවර්ධන සැලැස්මට අනුව ප්‍රදේශයේ ප්‍රධානතම සංවර්ධන ව්‍යාපෘතිය ලෙස මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය දැක්විය හැකිය. මෙම ව්‍යාපෘතියට සමගාමීව ප්‍රදේශය තුල ඉතා ඉහළ සංවර්ධනයක් අපේක්ෂාවෙන් එම සංවර්ධනයන්ට ඉඩ සලසමින් 2022–2031 හෝමාගම සංවර්ධන සැලැස්ම නිර්මාණය කර ඇත.

අනාගත සංවර්ධන ව්‍යපෘති හා සබැඳිව ප්‍රදේශයේ අපරව්‍යුහ පහසුකම් ඉතා ඉහළ මට්ටමකට රැගෙන ආ යුතුය. අපරව්‍යුහ පහසුකම් සැලකූ විට නල ජල සැපයුම ප්‍රමුඛ ස්ථානයක් ගනී.

හෝමාගම ප්‍රදේශයේ සංවර්ධනයට දායක වන ජනගහන වර්ධනය සැලකූ විට 2031 වර්ෂයේදී 600,000 ක් වූ ජනගහනයක් අපේක්ෂා කෙරේ. ප්‍රදේශයේ ජනගහන වර්ධන වේගය කොළඹ දිස්ත්‍රික්කයේ අනෙකුත් නගර හා සැසඳූ කළ ඉහළම අගය වන 2.4% ක් ලෙස දැක්වේ. වර්තමානයේ ජනගහනය 296,380 ක් ලෙස 2019 සම්පත් පැතිකඩ දත්ත මගින් අනාවරණය වේ.

හෝමාගම ප්‍රදේශය තුල පවතින ජල සැපයුමට අමතරව නව ජල සැපයුම් පද්ධතියක් අවශ්‍ය බව පැහැදිලි වේ. NSWDB මගින් යෝජිත ව්‍යාපෘති අනුව 2040 වන විට මුළු හෝමාගම නගරයම ආවරණය වන පරිදි නල ජල සැපයුමක් ලබා දීමට කටයුතු යොදා ඇත. මෙහිදී දැනට හෝමාගම ප්‍රදේශයට නල ජලය සපයන ලබුගම හා කළටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථානවල ධාරිතාවයන් වැඩි කරනු ඇත.

මෙම ව්‍යාපෘති මගින් 373,304 ක් වූ ජනගහනයකට නල ජල සැපයුම ලබාදීමට හැකි බව පුරෝකථනය කර ඇත. සම්පූර්ණ ව්‍යාපෘතියේ තුන්වන අධියර වශයෙන් හෝමාගම ප්‍රදේශය ආවරණය වන පරිදි දිනකට ඝන මීටර 150,100 ධාරිතාවයක් සැපයිය හැකි වන පරිදි ලබුගම හා කලටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. මෙමගින් හෝමාගම නගරයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස 36 ක් මුළුමනින්ම ආවරණය කෙරේ.

ජාතික ජල සම්පාදන ජලාපවාහන මණ්ඩලය (NWSDB) පුරෝකථනයන්ට අනුව දිනකට පුද්ගලයකුගේ ජල අවශ්‍යතාව ලීටර 172 ක් වශයෙන් ගණනය කර ඇත. මේ අනුව ගත්විට 2031 හෝමාගම වැඩිවන ජනගහනය උදෙසා හා අනෙකුත් වාණිජ, කර්මාන්ත හා අනෙකුත් භාවිතයන් සඳහා වූ ජල ඉල්ලුම ආසන්න වශයෙන් දිනකට ඝන මීටර 95000 ලෙස ගණනය කළ හැකිය. ඒ අනුව බැලූ විට ජාතික ජල සම්පාදන ජලාපවාහන මණ්ඩලය (NWSDB) යෝජිත ව්‍යාපෘති හා ඒකාබද්ධ වූ විට හෝමාගම ප්‍රදේශයේ 2031 වර්ෂය සඳහා වූ ජල ඉල්ලුම මුළුමනින්ම ආවරණය කළ හැකිය. එබැවින් 2022-2031 සංවර්ධන සැලැස්ම යටතේ වැඩි වන ජල අවශ්‍යතාවය සඳහා විශේෂිත වූ නව සැලැස්මක් යෝජනා කිරීමට අවශ්‍යය නොවන බව පැහැදිලි වනු ඇත.

## 6.8.1.1. අනතර්ගත කරගනු ලබන ජල සැපයුම් ව්‍යාපෘති

***රූපය 6.37 :*** *ජල සැපයුම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජිත ප්‍රදේශය*




***මූලාශ්‍රය :*** *ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, 2018*

## 6.8.1.2. හෝමාගම සංවර්ධන සැලැස්ම යටතේ ජල සැපයුම ශක්තිමත් කිරීම සඳහා හා ජල මුලාශ්‍ර සුරක්ෂිත කිරීම සඳහා යෝජනා කරනු ලබන අනෙකුත් ක්‍රියාමාර්ග

- *යෝජිත අඩු ඝනත්ව නේවාසික කලාපය (Light Residential Development Zone) තුල වැසි ජල කළමනාකරණය හා සම්බන්ධ වැසි ජලය රැස් කිරීම (Water Harvesting) සඳහා යොමු වීම හා ග්‍රාමීය ජල යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම*

- *සමස්ථ හෝමාගම ප්‍රදේශය පුරා ව්‍යාප්තව පවතින තෙත් බිම් ප්‍රදේශ සඳහා, තෙත් බිම් මායිමේ සිට අමතර මීටර 1 ක් වූ සංරක්ෂණ ප්‍රදේශයක් ක්‍රියාත්මක කිරීම.*

## 6.8.2. විදුලි සැපයුම් හා කළමනාකරණ සැලැස්ම (Electricity Supply & Managemnt Plan)

හෝමාගම සැලසුම් ප්‍රදේශයට අදාල 2017 වර්ෂයේ භූමි පරිහරණ සැලැස්මට අනුව හෝමාගම මුළු භූමි ප්‍රමාණයෙන් 43% ක ප්‍රදේශයක් නේවාසික භාවිතය සඳහාද, 13% ක ප්‍රදේශයක් වෙළඳ භාවිතයන් සඳහාද, 3% ක ප්‍රදේශයක් ආයතන සඳහාද, 1% ක ප්‍රමාණයක් කර්මාන්ත සඳහාද බෙදා වෙන් වී ඇත. සම්පත් පැතිකඩ 2016 වර්ෂයට අදාලව සිදු කරන ලද සමීක්ෂණයන්ට අනුව හෝමාගම සැලසුම් බල ප්‍රදේශයේ ජීවත්වන පවුල් විදුලිය ලබා ගන්නා ආකාරය පහත පරිදි පෙන්වා දිය හැක.

*වගුව 6.11 : හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය විදුලි පහසුකම් සපයා ගන්නා ආකාරය*

| පවුල් අනුව විදුලිය පහසුකම් සපයා ගන්නා ආකාරය | | | | | | |
|---|---|---|---|---|---|---|
| **හෝමාගම ප්‍රාදේශීය සභාව** | සමස්ත පවුල් සංඛ්‍යාව | ජාතික විදුලි සැපයුමෙන් | ග්‍රාමීය ජල විදුලි යෝජනා ක්‍රම මඟින් | භූමිතෙල් | සූර්යකෝෂ | වෙනත් |
| | 65,926 | 64,484 | - | 1402 | 7 | 33 |

*මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තාව, 2016 වර්ෂය, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*

ඒ අනුව හෝමාගම ප්‍රදේශයේ මුළු පවුල් සංඛ්‍යාවෙන් 98% ක ප්‍රමාණයක් ජාතික විදුලි සම්පාදනය යටතේ සපයනු ලබන විදුලිය පරිභෝජනය කරන බව අනාවරණය වේ. එනම් වර්තමානය වනවිට විදුලි සැපයුම ප්‍රමාණවත් අයුරින් ක්‍රියාත්මක වන බව පැහැදිලි වේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2001 වර්ෂයේදී හෝමාගම ප්‍රදේශයේ ජනගහනය 187,202 ක්ද එය 2011 සංගණනයට අනුව 252,469 ක් දක්වා වර්ධනය වී ඇති බවද ගණනය කර ඇත. මේ දත්තයන්ට අනුව ප්‍රදේශයේ ජනගහන වර්ධන වේගය 2.4% ක් වේ. මේ අනුව ගණනය කිරීම් මගින් හා සම්පත් පැතිකඩ දත්තයන්ට අනුව ගත් විට 2019 වර්ෂයේදී ප්‍රදේශයේ ජනගහනය 296,380 ක් වේ. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පවුල් ඒකකයක සාමාජික සංඛ්‍යාව 4 ක් ලෙස සලකා, ගණනය කිරීමේදී ප්‍රදේශයේ නිවාස 74,095 ක් බව දැක්විය හැකිය.

විදුලි පරිභෝජනය හා අනාගත ඉල්ලුම ගණනය කිරීමේදී මූලිකවම 2031 දී ප්‍රදේශයේ මුළු ජනගහනය ගණනය කළ යුතු වේ. මෙහිදී ඉහත දැක්වූ ජනගහන වර්ධන වේගයද ජනගහන සංක්‍රමණ රටාව සලකා පුරෝකථනය කළ මුළු ජනගහනය ආසන්න වශයෙන් ලක්ෂ 6 ක පමණ ප්‍රමාණයක් (2031 වර්ෂයේදී) වේ. මේ ජනගහනය පුළුල් වශයෙන් ගත් කළ පවුල් 70,000 ක් ලෙසද සියළුම පවුල් තනි තනි ඒකක ලෙස තනි තනි නිවාසවල වෙසෙන බව උපකල්පනය කළ විට 2031 වර්ෂය වන විට නිවාස 101, 000 ක් අලුතින් ඇති වේ. මෙලෙස අලුතින් ඇතිවන නිවාස 101, 000 ක් වූ ප්‍රමාණය සඳහා නව විදුලි සැපයුමක් ලබාදිය යුතු වේ.

වර්තමානයේ මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි විදුලි සැපයුමක් ලංකා විදුලි බල මණ්ඩලය මගින් ලබා දී ඇත. විදුලි බල මණ්ඩලයේ ගණනය කිරීම්වලට අනුව මසකට එක් නිවසක් සඳහා වූ විදුලි සැපයුම 120 කිලෝවොට් පැය (kwh) වේ. මෙම සාමාන්‍ය අගය පාදක කොටගෙන ගණනය කළ විට හෝමාගම ප්‍රදේශය තුල වර්තමාන විදුලි පරිභෝජනය (නිවාස සඳහා පමණක්) 35.33 මෙගාවොට් පැය (mwh) වේ.

හෝමාගම සංවර්ධන සැලැස්මට සමගාමීව 2031 වර්ෂයේදී නගරයේ හා හඳුනාගත් විශේෂ කලාප තුල පැමිණෙන අනාගත සංවර්ධන ව්‍යාපෘතීන් හා ස්වභාවිකව සිදුවන ජනගහන වර්ධනය සලකා විට 2031 වර්ෂයේදී විදුලි සැපයුම 85.96 මෙගාවොට් පැය (mwh) දක්වා වර්ධනය කළ යුතු වේ. මේ අනුව 2031 වර්ෂයේදී වන නව විදුලි බල සැපයුම් අවශ්‍යතාවය 50.63 මෙගාවොට් පැය (mwh) බව ගණනය කර ඇත.

මෙයට අමතරව, හෝමාගම ප්‍රදේශය තුල කර්මාන්තශාලා 215ක ප්‍රමාණයක් පැතිරී පවතී. මේ වන විට එම කර්මාන්ත සඳහා 7962 මෙගාවොට් පැය (mwh) විදුලි සැපයුමක් සපයා ඇත.

වර්තමානයේ හෝමාගම මාහේනවත්ත ප්‍රදේශය ආශ්‍රිතව ක්‍රියාත්මක වන අධ්‍යාපන, පර්යේෂණ ආයතන හා නේවාසිකාගාර හේතුවෙන් පවත්නා විදුලි සැපයුම ප්‍රමාණවත් නොවන බව ලංකා විදුලි බල මණ්ඩලයේ අදහස වේ.

ඒ අනුව, හෝමාගම නගරයේ ඉදිරි සංවර්ධන යෝජනා අතුරින් මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර ව්‍යාපෘතිය ප්‍රධාන තැනක් ගනී. ප්‍රදේශය ඉමහත් සංවර්ධනයක් කරා රැගෙන යාමේ පුරෝගාමී ව්‍යාපෘතිය වශයෙන් මෙය හඳුනාගෙන ඇත. යෝජිතව තිබූ තාක්ෂණ නගර ව්‍යාපෘතිය සඳහා වූ විදුලි ඉල්ලුම මේවනවිටත් විදුලිබල මණ්ඩලය විසින් යෝජනා කර ඇත. යෝජිතව තිබූ තාක්ෂණ නගර සැලසුම් කමිටුව මගින් 2031 වර්ෂයේදී ඔවුන්ගේ සංවර්ධනයන් උදෙසා මුළු විදුලි ඉල්ලුම 76.3 මෙගාවොට් පැය (mwh) ප්‍රමාණයක් බව ගණනය කර ඇත. මෙම ඉල්ලුමට අනුව විදුලිබල මණ්ඩලය මගින් ආකාර දෙකකින් විදුලි සැපයුම ලබා දීමට කටයුතු යොදා ඇත. ප්‍රධාන වශයෙන් මුළු ඉල්ලුමෙන් 20 මෙගාවොට් පැය (mwh) ප්‍රමාණයක් මාහේනවත්ත ප්‍රදේශය ආශ්‍රිතව පිහිටුවන නව ප්‍රාථමික උප පොළ (Grid Substation) මගින්ද අනෙකුත් විදුලි ඉල්ලුම මිල්ලෑව ව්‍යාපෘතිය හරහා ලබා දීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ යෝජිත ව්‍යාපෘතියක් ලෙස මාහේනවත්ත ප්‍රදේශයේ ඉදි කිරීමට යෝජිත නව ප්‍රාථමික උප පොළ (Grid Substation) 90 මෙගාවොට් පැය (mwh) ධාරිතාවයකින් යුතු වේ. මේ අනුව මෙහි මුළු ධාරිතාවයෙන් 70 මෙගාවොට් පැය (mwh) ප්‍රමාණයක් හෝමාගම ප්‍රදේශයේ නේවාසික ඉල්ලුම සඳහා යෙදවීමට යෝජනා කර ඇත. මේ අනුව 2030 වර්ෂය සඳහා හෝමාගම ප්‍රදේශයට වන 50.63 මෙගාවොට් පැය (mwh) විදුලි ඉල්ලුම ඉහත ව්‍යාපෘතිය මගින් ආවරණය වන බව සඳහන් කළ හැක.

## 6.8.2.1. අන්තර්ගත කරගනු ලබන විදුලි සැපයුම් ව්‍යාපෘති

***රූපය 6.38 :** ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය මගින් ඉදිකිරීමට යෝජිත 90 මෙගාවොට් පැය (mwh) ධාරිතාවයෙන් යුත් ප්‍රාථමික විදුලි උප පොළ ඉදිකිරීමට යෝජිත ප්‍රදේශය*




***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

## 6.8.3. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම (Solid Waste Management Plan)

### 6.8.3.1. ඝන අපද්‍රව්‍ය යනු;

ගෘහස්ත කටයුතු, වෙළඳ හා වාණිජ කටයුතු කාර්මික හා කෘෂිකාර්මික කටයුතු වලදී මෙන්ම අනෙකුත් පොදු කටයුතුවලදී ද ජනනය වන ද්‍රවමය නොවන ද්‍රව්‍යයන්, ඝන අපද්‍රව්‍ය ලෙස සලකනු ලබයි. ආහාරමය අපද්‍රව්‍ය, ඇසුරුම් වශයෙන් ඉවත් කරන කඩදාසි, ලෝහ, ප්ලාස්ටික්, වීදුරු ආදිය, ඉවතලන රෙදි, ගෙවත්තේ එකතුවන අපද්‍රව්‍ය, ඉදිකිරීම් වලදී ඇතිවන අපද්‍රව්‍ය, කර්මාන්ත ශාලාවලින් ඉවතලන දෑ යනාදී විවිධ කොටස්වලින් ඝන අපද්‍රව්‍ය සංයුක්ත වී ඇත.

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් ලෙස සිදු නොකිරීම හා අපද්‍රව්‍ය පරිසරයට හිතකර අන්දමින් බැහැර නොකිරීම නිසා සෞඛ්‍යමය හා පාරිසරික ගැටළු උද්ගත වේ. මෙහිදී පාරිසරික වශයෙන් වැඩි අවධානයට පත් වූ කරුණක් වන්නේ ස්වභාවික පරිසරයට වන හානියයි. නිසි පාලනයක් නොමැතිව කැළිකසල විවෘත භූමි තුල ගොඩ ගැසීම හේතු කොටගෙන, ඒ තුළින් පෙරී එන ද්‍රවමය ශ්‍රාවයන් මගින් මතුපිට හා භූගත ජල සම්පත දූෂණය වීම නිසා යලිඳු පුනර්ජනනය කළ නොහැකි වන බරපතල පරිසර හානි සිදුවේ. එසේම විවෘත ප්‍රදේශවල සිදුකරන ඝන අපද්‍රව්‍ය දහනය මගින් මෙන්ම පිටවන වායුන් ප්‍රමාණවත් ලෙස පාලනය කිරීමට අසමත් වන පද්ධති සහිත උපකරණ තුළ සිදුවන අකාර්යක්ෂම අපද්‍රව්‍ය දහනය මගින් ද, වායු දූෂණය සිදුවේ. *(මූලාශ්‍රය : ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික උපාය මාර්ගය – 2000)*

### 6.8.3.2. ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

ඝන අපද්‍රව්‍ය ජනනය, ගබඩා කිරීම, එක්රැස් කිරීම, ප්‍රවාහනය, පරිසරයට හිතකර ලෙස වෙනත් ආකාරයකට සකස් කර අවසාන බැහැරලීම යන කරුණු ඝන අපද්‍රව්‍ය කළමනාකරණයෙහි අන්තර්ගත ක්‍රියාවලීන් වේ.

### 6.8.3.3. හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වර්තමාන තත්ත්වය

හෝමාගම ප්‍රාදේශීය සභාව මගින් සපයන ලද දත්තයනට අනුව දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ටොන් 36 ක් පමණ වේ. එයින් ටොන් 14 ක් පමණ ප්‍රමාණයක් දිරන ඝන අපද්‍රව්‍ය වන අතර, ටොන් 22 ක ප්‍රමාණයක් නොදිරන ඝන අපද්‍රව්‍ය වේ. ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය එකතුවන මූලාශ්‍රය අනුව ප්‍රතිශතයක් ලෙස පහත වගුව 6.12 මගින් දැක්වේ.

***වගුව 6.12 :** එකතුවන ඝන අපද්‍රව්‍ය එහි මූලාශ්‍රය අනුව*

| මූලාශ්‍රය | ප්‍රතිශතය (%) |
|---|---|
| නේවාසික | 38 |
| වෙළඳ | 15 |
| හෝටල් | 14 |
| රෝහල් | 03 |
| කර්මාන්ත ශාලා | 28 |
| වෙනත් (බැංකු, රජයේ ගොඩනැගිලි) | 02 |

***මූලාශ්‍රය :** සම්පත් පැතිකඩ වාර්තාව, 2016 වර්ෂය, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*

එකතු කරන ලද ඝන අපද්‍රව්‍ය 45% ක් පමණ වෙන් කරන ලද කසල සහ 55% ක් පමණ වෙන් නොකරන කසල වේ. නගරයේ සහ ප්‍රධාන මාර්ග දෙපස ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව මගින් දෛනිකව එකතු කිරීම සිදු කරන අතර අතුරු මාර්ගවල සතිපතාද වශයෙන් කසල එකතු කිරීම සිදු කරනු ලබයි. දොරින් දොර කසල එකතු කිරීමේ ක්‍රියාවලියට අනුව මෙය සිදු කරන අතර ජෛව හායනයට ලක්වන කසල සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි පොලිතින්, ප්ලාස්ටික්, විදුරු සහ කඩදාසි ලෙස වෙන්කර ලබා ගැනීම සිදු කරයි. මේ සඳහා ට්‍රැක්ටර්, අත් කරත්ත ආදිය යොදාගනු ලබයි.

ප්‍රාදේශීය සභා සීමාව තුළ බේකරි 30 ක්, හෝටල් 150 ක්, සිල්ලර කඩ 200 ක්, ෆාමසි 20 ක්, සුපිරි වෙළඳසැල් 12 ක්, සතිපොළ 02 ක්, මස් කඩ 10 ක්, මාළු කඩ 05 ක්, රෝහලක් සහ මාතෘ නිවාස 04 ක් ඇති අතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ 255,316 ක පමණ ජන සංඛ්‍යාවක් ජීවත් වන අතර නිවාස ඒකක සංඛ්‍යාව 64,485 කි.

මෙම කසළ කළමනාකරණ ක්‍රියාවලිය සඳහා ප්‍රාදේශීය සභාව සතු ට්‍රැක්ටර් 10 ක්, කම්පැක්ටර් 02 ක්, අත් කරත්තයක් සහ ලොරි රථයක් යොදාගනු ලබයි. කසල කළමනාකරණ ක්‍රියාවලිය සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු 13 දෙනෙකු ද, සෞඛ්‍ය පරිපාලකවරු 03 දෙනෙකු ද, වැඩ පරිපාලකවරු 02 දෙනෙකු ද, රියදුරන් 11 දෙනෙකු සහ කම්කරුවන් 30 ගේ සහයෝගය ලබා ගනී. හෝමාගම ප්‍රාදේශීය සභාව ආශ්‍රිත ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය පහත ප්‍රස්ථාර අංක 6.1. මගින් දැක්වේ.

*ප්‍රස්තාරය 6.1 : ඝන අපද්‍රව්‍ය සංයුතිය*




*මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තාව, 2016 වර්ෂය, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*

වර්තමානයේ ප්‍රාදේශීය සභාව මගින් එක්රැස් කරන කසලවලින් ටොන් 28 ක් පමණ කරදියාන කසල අංගනය වෙත යොමු කරන අතර, වෙන් කරන ලද කසල ටොන් 18–20 ත් අතර සහ මිශ්‍ර කසල ටොන් 08–10 ත් අතර ප්‍රමාණයක් ලෙස කරදියාන කසල අංගනය වෙත ලබාදෙයි. කරදියාන කසල අංගනය වෙත යොමු කිරීමෙන් පසුව ඉතිරිවන කසල ප්‍රමාණය ටොන් 08 ක් පමණ වන අතර එයින් වෙන් කර ලබාගන්නා සුදු පැහැ ඝනකම ප්ලාස්ටික්, පොලිතීන් බෑග්, කඩදාසි සහ කාඩ්බෝඩ් හෝමාගම ප්‍රාදේශීය සභාවේ සම්පත් පියසේදී බේල් ලෙස සකසා හොල්සිම් ආයතනයට ලබාදීම සිදු කරයි. එයට අමතරව එම කසල ටොන් 08 න් ප්‍රතිචක්‍රීකරණය සිදු කළ හැකි පොලිතීන්, ප්ලාස්ටික්, ටින්, යකඩ, වීදුරු, කඩදාසි සහ

කාඩ්බෝඩ් ලියාපදිංචි පෞද්ගලික ගැණුම්කරුවන් වෙත විකිණීම මගින් මසකට රු. 28,000 – 30,000 ත් අතර අමතර අදායමක් හෝමාගම ප්‍රාදේශීය සභාව උපයා ගනී. මෙලෙස හොල්සිම් ආයතනයට බේල් ලෙස ලබාදෙන කසල සහ සම්පත් පියසේදී වෙන් කිරීමෙන් පසුව ඉතිරිවන අක්‍රීය කසල අක්කර 02 ක් පමණ වන නාගරික සංවර්ධන අධිකාරිය සතු දූවවත්ත කසලාංගනය වෙත බැහැර කර පස් දමා යට කිරීම සිදු කරයි.

2008 වසරේ සිට ප්‍රදේශයේ කොම්පෝස්ට් බදුන් ලබාදීම ප්‍රාදේශීය සභාව මගින් සිදු කරන අතර ඉතාමත් සහනදායි මිලකට මෙම බදුන් ලබාදීම සිදු කරන අතර නිසි කසල කළමනාකරණ ක්‍රමවේදයන් පිළිබඳව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද, අත් පත්‍රිකා බෙදාහැරීමද සිදු කරයි.

## 6.8.3.4. අනාගත තත්ත්වය සඳහා සිදු කරන ලද පුරෝකථනයන්

හෝමාගම ප්‍රදේශයේ සාමාන්‍ය ජනගහන වර්ධන වේගය 2.4% ක අගයක් ගනී. මේ අනුව ගණනය කිරීම් මගින් හා සම්පත් පැතිකඩ දත්තයනට අනුව ගත් විට 2016 වර්ෂයේදී ප්‍රදේශයේ ජනගහනය 296,380 ක් වේ. ඒ අනුව වර්තමානයේ සමස්ථ ඝන අපද්‍රව්‍ය ජනනය දිනකට ටොන් 36 ක් පමණ වේ.

මෙහිදී ඉහත දැක්වූ ජනගහන වර්ධන වේගයද, ජනගහන සංක්‍රමණ රටාවද සලකා පුරෝකථනය කළ මුළු ජනගහනය ආසන්න වශයෙන් ලක්ෂ 6 ක් පමණ ප්‍රමාණයක් (2031 වර්ෂයේදී) වේ. මේ අනුව නාගරික ප්‍රදේශයක ජීවත්වන මිනිසෙකුගෙන් දිනකට කිලෝග්‍රෑම් 0.5 ක කසල ප්‍රමාණයක් ජනනය වේ යනුවෙන්ද කර්මාන්තය වැඩකරන පුද්ගලයෙකුගෙන් දිනකට කිලෝග්‍රෑම් 0.7 ක කසල ප්‍රමාණයක් ජනනය වේ යනුවෙන්ද, ග්‍රාමීය නේවාසික ප්‍රදේශයක ජීවත්වන මිනිසෙකුගෙන් දිනකට කිලෝග්‍රෑම් 0.3 ක කසල ප්‍රමාණයක් ජනනය වේ යනුවෙන්ද උපකල්පනය කර සිදුකරන ලද ගණනය කිරීම් වලට අනුව 2031 වර්ෂයේ සමස්ථ හෝමාගම ප්‍රදේශයේ ජනනනය වන කසල ප්‍රමාණය දිනකට ටොන් 400 ක් බව හඳුනාගෙන ඇත. මෙම ටොන් 400 ක් වූ කසල ප්‍රමාණයෙන් කසල ටොන් 105 ක පමණ ප්‍රමාණයක් නවෝත්පාදන නගර ක්‍රියාකාරකම් මගින් ජනනය වන බවද හඳුනා ගෙන ඇත.

හෝමාගම සංවර්ධන සැලැස්ම යටතේ කැලිකසල බැහැර කිරීම හා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් හඳුනා ගන්නා ලද වැදගත් අවස්ථාවක් ලෙස කරදියන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය හා පුත්තලම ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත අරුවක්කාලු ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතිය පෙන්වා දිය හැක. ඒ අනුව එම ව්‍යාපෘතීන් වලට සම්බන්ධ වී හෝමාගම අපද්‍රව්‍ය බැහැර කරලීම සිදු කිරීමට පියවර ගැනීම මෙහිදී සිදුකළ හැකිය.

යෝජිත හෝමාගම තාක්ෂණ නගරය අපද්‍රව්‍ය බැහැර කරලීම අරුවක්කාලු කසල බැහැර කිරීමේ ව්‍යාපෘතිය හා සම්බන්ධ වී ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇත.

ඊට අමතර හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය මගින් ජනනය වන කසල බැහැර කරලීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පහත පරිදි සඳහන් කළ හැක.

## 6.8.3.5. ප්‍රදේශයේ කසල බැහැර කිරීම සම්බන්ධයෙන් හඳුනාගත් ගැටළු

1. *මහජනතාව විසින් ප්‍රධාන මාර්ගයට අක්‍රමවත් ලෙස කසල බැහැර කිරීම.*
2. *කසල ලබාගන්නා රථයට ගමන් කිරීමට නොහැකි අතුරු මාර්ගවල කසල බැහැර කිරීම හේතුවෙන් කසල එකතුකිරීමේ අපහසුතාව.*
3. *නිවෙස් හිමියන් මාර්ගය අසළ කසල බැහැර කොට කසල අර්ධ වශයෙන් පිළිස්සීම.*
4. *කසල කළමනාකරණය සදහා අවශ්‍ය කම්පැක්ටර් සහ ට්‍රැක්ටර් රථවල හිඟකම.*

## 6.8.3.6. අනාගත සැලසුම් අවශ්‍යතා සහ යෝජනා

1. *ප්‍රදේශයේ අනාගත කසළ කළමනාකරණය සිදු කිරීම සඳහා අක්කර 04 ක පමණ ඉඩමක් හෝමාගම දකුණ ග්‍රාම නිලධාරී වසමෙන් හඳුනාගෙන ඇති අතර අක්කර 0.84 ක පමණ ඉඩමක් මිගස්මුල්ල ග්‍රාමනිලධාරී වසමෙන්ද හඳුනාගෙන ඇත. තවද මන්නේගොඩ නිවාස සංකීර්ණය අසල පර්චස් 80 ක් වන ප්‍රාදේශීය සභා ඉඩම යොදාගැනීම. .*
2. *දැනට කසල එකතුවීම ගැටළුවක් වී පවතින කසල එකතු කරනු නොලබන සෑම ග්‍රාම නිලධාරී වසමකම කසල එක්රැස් කිරීම.*
3. *නොදිරන කසල එකතු කිරීමට ස්ථාන කිහිපයක් ඇති කිරීම සහ එකතු කළ කසල ගබඩා කිරීමට ගබඩාවක් ඉදිකිරීම.*

## 6.8.3.7. හෝමාගම ප්‍රාදේශීය සභාව සඳහා යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපායන්

### *ක්‍රමෝපාය 01 – ඝන අපද්‍රව්‍ය ජනනය අවම කිරීම*

I. *ගෘහස්ථ, වෙළඳ, කාර්මික ක්ෂේත්‍රයන්හි ඝන අපද්‍රව්‍ය උත්පාදනය අවම කිරීම සහ එය දිරිමත් කිරීම සඳහා විධික්‍රම හඳුන්වාදීම.*

උදා : පොදු ස්ථාන හා පාසල් තුළ දැනුවත් කිරීමේ හා අධ්‍යාපනික වැඩසටහන් සංවිධානය කර ඒ හරහා මහජනයාට කසල කළමනාකරණය පිළිබඳ පවතින 3R ("Reduce, Reuse, Recycle") වැනි සංකල්පය හඳුන්වා දී ඒ තුළින් ඝන අපද්‍රව්‍ය ජනනයවීම අවම කිරීම.

### *ක්‍රමෝපාය 02 – සම්පත් නැවත ලබාගැනීම*

I. *ජනනය වූ කසල ජනනය වන ස්ථානයේදීම වෙන් කිරීම.*

උදා : ගෘහස්ථ, ආයතනික, වෙළඳ, කාර්මික ලෙස සහ කසල වල ස්වභාවය අනුව වර්ගීකරණය කර වෙන් වෙන්ව හඳුනාගත හැකි බඳුන් තැබීම. එනම්,

*(අ) කාබනික – කොළ පාට*
*(ආ) කඩදාසි – නිල් පාට*
*(ඇ) ප්ලාස්ටික් සහ පොලිතීන් – තැඹිලි පාට*
*(ඈ) ලෝහ – දුඹුරු පාට*
*(ඉ) වීදුරු – රතු පාට*

II. *පළාත් පාලන ආයතනය මගින් නිවාස, වෙළඳ ආයතන සඳහා කසල කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.*

*(අ) ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම අනිවාර්යය කිරීම.*
*(ආ) අධ්‍යාපනික හා දැනුවත් කිරීමේ වැඩසටහන් නිරතුරුව සංවිධානය කිරීම සහ එමගින් වෙන් නොකරන කසල එකතු නොකිරීමේ ක්‍රමවේදය (No Separation – No Collection) පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සහ ඒ අනුව ක්‍රියාත්මක වීම.*

### ක්‍රමෝපාය 03 – කෙටි කාලීන ජෛව හායනය වන සියළුම ඝණ අපද්‍රව්‍ය කාබනික පොහොර (කොම්පෝස්ට්) බවට පත් කිරීම ප්‍රවර්ධනය කිරීම. ජනතාව ඒ සදහා යොමු කිරීම සහ කාබනික පොහොර සදහා ලාබදායි වෙළද පොළවල් හදුන්වා දීම

I. *නිවාස සහ ආයතනවල ජනනය වන ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය ඒවා ජනනය වන ස්ථානයේදීම කාබනික පොහොර බවට පත් කිරීම.*

උදා : කොම්පෝස්ට් බදුන්, වල ක්‍රමය, ජිවකොටු ආදී ක්‍රම හදුන්වා දීම.

II. *විශාල ප්‍රමාණයෙන් ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය උත්පාදනය වන ස්ථාන*

උදා : හෝටල්, රෝහල් ආදී ස්ථාන සහ කොම්පෝස්ට් කිරීම සිදු නොකරන නිවාස ආදිය සදහා පළාත් පාලන ආයතන මගින් පාලනය වන ස්ථානයක සරල තාක්ෂණික ක්‍රම භාවිතයෙන් කොම්පෝස්ට් නිපදවීම.

III. *සෑම නිවසක්ම කොම්පෝස්ට් බදුනක් භාවිතා කිරීම හෝ පහසු තාක්ෂණයක් භාවිතය මගින් කාබනික පොහොර නිෂ්පාදනය සදහා දිරි ගැන්වීම සහ එමගින් ගෘහස්ථ කාබනික එළවළු, පලතුරු වගාව වැඩි කිරීම සහ කාබනික එළවළු වෙළදපොල දිරිමත් කිරීම.*

### ක්‍රමෝපාය 04 – රෝහල් සහ රජයේ ආයතන තුළ ජීව වායු නිෂ්පාදනයක් ස්ථාපනය කිරීම

I. *ජෛව හායනය වන ආහාරමය අපද්‍රව්‍ය, කෘෂි කාර්මික අපද්‍රව්‍ය, ජීවවායු නිෂ්පාදනය කිරීම සදහා යොදාගත හැකි අතර, නිෂ්පාදනය වන ජීව වායුව ආහාර පිසීම, ආලෝක කරණය වැනි දේ සදහා යොදා ගැනීම.*

### ක්‍රමෝපාය 05 – ජෛව හායනය වන ආහාරමය ද්‍රව්‍ය ඌරු කොටුවලට ලබාදීමේ වැඩපිළිවෙලක් සකස් කිරීම

### ක්‍රමෝපාය 06 – ජෛව හායනය නොවන (ප්‍රතිචක්‍රීකරණය කළ හැකි) ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම

I. *ජනතාව තුල භාණ්ඩ නැවත භාවිතය (Reuse) වැනි සංකල්ප ප්‍රවර්ධනය සදහා ආකල්පමය වෙනසක් ඇති කිරීමේ වැඩමුළු සංවිධානය කිරීම (පාසල් සහ ආයතනික මට්ටමින්).*
II. *ප්‍රතිචක්‍රීකරණය කළහැකි ඝන අපද්‍රව්‍ය (වීදුරු, කඩදාසි, ලෝහ) මිලදී ගනු ලබන ස්ථාන පිහිටුවීම, ප්‍රචලිත කිරීම සහ දිරි ගැන්වීම, වෙළදපොල සහ ව්‍යවසායකයින් වර්ධනය කිරීම.*
III. *පළාත් පාලන ආයතන මගින් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍ය මිලදී ගනු ලබන ගැනුම් කරුවන් ලියාපදිංචි කිරීම, ඔවුන් සමග නිරතුරු සම්බන්ධතා පවත්වා ගැනීම සහ ඒ පිළිබද තොරතුරැ ජනතාව වෙත ලබාදීම.*
IV. *එකතුවන කසල අතර ඇති පොල්කටු, යකඩ, ප්ලාස්ටික්, විදුලි උපකරණ වැනි දේ සදහා කසල පොළ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.*

## ක්‍රමෝපාය 07 – නාගරික ඝන අපද්‍රව්‍ය වෙත රෝහල් මගින් නිකුත් කරන සායනික ඝන අපද්‍රව්‍ය එකතුවීම වැලැක්වීම සඳහා ආයතනික ව්‍යුහයක් ස්ථාපනය කිරීම

I. සායනික ඝන අපද්‍රව්‍ය වෙන් කිරීම අනිවාර්ය කිරීම.
II. සායනික ඝන අපද්‍රව්‍ය අවසන් බැහැර කිරමට පෙර ඒවා අසාධනය නොවන ද්‍රව්‍ය බවට පත්කිරීම අනිවාර්ය කිරීම.
III. සායනික ඝන අපද්‍රව්‍ය සෞඛ්‍යාරක්ෂිතව බැහැර කිරීම සඳහා රෝහල් තුලම ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

## ක්‍රමෝපාය 08 – ඝණ අපද්‍රව්‍ය එකතු කිරීම සහ ප්‍රවාහනය කාර්යක්ෂම කිරීම

I. දොරින් දොර කසල එකතු කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.
II. ඝන අපද්‍රව්‍ය එකතු කරන දින සහ එම දිනවල එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය වර්ග (ප්ලාස්ටික්, පොල්කටු, වීදුරු) පිලිබඳව කාලසටහන් නිවෙස් සඳහා ලබා දීම (පළාත් පාලන ආයතනය මගින්).
III. ඝන අපද්‍රව්‍ය එකතු කරනු ලබන වාහනය පැමිණීමේදී "සීනුවක්" නාද කිරීම.
IV. පළාත් පාලන ආයතනවලට කොම්පෝස්ට් අංගන සඳහා අවශ්‍ය උපකරණ සහ පහසුකම් ලබාදීම.
V. ඝන අපද්‍රව්‍ය වර්ග සඳහා එකතු කරන වාහනයේ වෙන් කළ කොටස් තැබීම.
VI. බර වාහන ලගා විය නොහැකි ස්ථානවල අත් කරත්ත මගින් ඝන අපද්‍රව්‍ය එකතු කිරීම.

## ක්‍රමෝපාය 09 – සනීපාරක්ෂක බිම් පිරවුම් ස්ථාපනය කිරීම

I. ජෛවීය ක්‍රියාවලියට සහ ප්‍රතිචක්‍රීකරණය ක්‍රියාවලියට භාවිතා කළ නොහැකි ජීර්ණය නොවන අක්‍රිය සහ අනෙකුත් කසල බිම් පිරවීම සඳහා යොදාගැනීම සුදුසු වන අතර තනි පළාත් ආයතනයක් මගින් සනීපාරක්ෂක බිම් පිරවුමක් ස්ථාපනය කිරීම මූල්‍යමය වශයෙන් ප්‍රයෝගික නොවන අතර පළාත් පාලන ආයතන කීපයක් එකතු වී එය සිදු කිරීම ප්‍රයෝගික වේ.

## ක්‍රමෝපාය 10 – විද්‍යුත් ඝන අපද්‍රව්‍ය (E – Waste) කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවීම

I. ඉවතලන පරිගණක, යතුරුපුවරු, රූපවාහිනී, ජංගම දුරකථන වැනි උපාංග නාගරික ඝන අපද්‍රව්‍ය සමග බැහැර නොකළ යුතු අතරම එම අපද්‍රව්‍ය වෙන් කොට එක්රැස් කර ඒවා මිලදී ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ ලියාපදිංචි ගැනුම්කරුවන් වෙත ලබාදිය යුතුය.

## ක්‍රමෝපාය 11 – පසු විපරම් කමිටුවක් පිහිටුවීම

I. අදාල ආයතනවල නිලධාරී මණ්ඩලයකින් සමන්විත පසු විපරම් කමිටුවක් පිහිටුවීම මගින් පසු විපරම් කටයුතු සිදු කිරීම.

## 6.8.3.8. යෝජිත ඝන අපද්‍රව්‍ය බෙදා වෙන්කිරීමේ මධ්‍යස්ථාන



***සිතියම 6.11 :*** *යෝජිත ඝන අපද්‍රව්‍ය බෙදා වෙන්කිරීමේ මධ්‍යස්ථාන*




***මූලාශ්‍රය :*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරි, 2020*

***රූපය 6.39 :*** *යෝජිත කොම්පෝස්ට් කසල කළමනාකරණ මධ්‍යස්ථානය*




***මූලාශ්‍රය :*** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

## 6.8.4. මළ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම (Swearage Management Plan)

හෝමාගම ප්‍රදේශය තුල අපජල කළමනාකරණය පිළිබඳ සලකා බැලීමේදී වර්තමානයේ නගරය ආශ්‍රිත ඉතා සුළු ප්‍රදේශයක් ආවරණය වන අයුරින් අපජල කළමනාකරණය සඳහා කාණු පද්ධතීන් සහ නිවාසවලින් නිකුත් කෙරෙන මලාපවහන පද්ධතියක් දැකිය හැක. ර්ට අමතරව මූලික වශයෙන් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නේවාසික භාවිතයන්හි සුලභව දැකිය හැකි වන්නේ ආවරණය වූ වල වැසිකිලි ක්‍රමයයි. හෝමාගම සම්පත් පැතිකඩ දත්තයන්ට අනුව ප්‍රදේශය තුල වැසිකිලි වර්ග ඔස්සේ වැසිකිලි භාවිතය පිළිබඳ දත්ත පහත පරිදි දක්වා ඇත.

***වගුව 6.13 :*** *හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය තුල පවුල් අනුව වැසිකිලි භාවිතය වැසිකිලි වර්ග අනුව*

| වැසිකිළි වර්ගය | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ජල මුද්‍රිත, වැසිකිළි වලකට සම්බන්ධ | ජල මුද්‍රිත, අපජල නාල පද්ධතියකට සම්බන්ධ | ජල මුද්‍රිත නොවන වළ වැසිකිලි | ඍජු වළ වැසිකිළි | වෙනත් | වැසිකිළියක් භාවිතා නොකරන |
| පවුල් සංඛ්‍යාව | 61,310 | 2,588 | 947 | 1,028 | 14 | 39 |
| % | 93.0 | 3.9 | 1.4 | 1.6 | 0.0 | 0.1 |

***මූලාශ්‍රය :*** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

වර්තමානය වන විට ප්‍රදේශය තුල 296,380 ක ජනගහනයක් ජීවත්වන අතර ර්ට සමගාමීව වාණිජ භාවිතයන්, කර්මාන්ත හා අනෙකුත් ආයතන ප්‍රදේශය තුල විහිදී පවතී. මේ සියළු භාවිතයන් තුලින් දිනකදී පිටකරනු ලබන මුළු අපජල පරිමාව ආසන්න වශයෙන් දිනකට ලීටර 72,000 පමණ වන බව ගණනය කර දැක්විය හැක. වර්තමානයේදී ප්‍රාදේශීය සභාව මගින් ගලි බවුසර් භාවිතයෙන් මළ අපද්‍රව්‍ය ඉවත් කිරීමේ කටයුතු සිදු කරයි.

2031 වනවිට හෝමාගම ප්‍රදේශයේ තුල පුරෝකථනය කළ මුළු ජනගහනය ආසන්න වශයෙන් ලක්ෂ 6 ක් පමණ ප්‍රමාණය ක්ද, තාක්ෂණික නගර ව්‍යාපෘතිය හරහා 150,000 ක් ඉක්ම වූ ජනගහනයක්ද පුරෝකථනය කර ඇත. මෙලෙස හෝමාගම ප්‍රදේශයේ මුළු ජනගහනය ආසන්න වශයෙන් ලක්ෂ 6 ක් පමණ ප්‍රමාණය වන අතර පුද්ගලයකුගෙන් දිනකදී නිපදවෙන මුළු අපජල පරිමාව ලීටර 157 ක පමණ සාමාන්‍ය අගයක් වන බව උපකල්පනයට ගෙන ගණනය කිරීමේදී ප්‍රදේශය තුල 2031 වර්ෂයේදී දිනකට ලීටර 185,015 ක් වූ අපජල ප්‍රමාණයක් නිපදවන බව ගණනය කර ඇත. මේ අනුව ක්‍රමවත් අපජල කළමනාකරණයක් අවශ්‍ය වේ.

හෝමාගම ප්‍රදේශය සම්පූර්ණයෙන් ආවරණය වන පරිදි අපජල පද්ධතියක් නිර්මාණය කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව ටෙම්පල් බර්ග් කර්මාන්ත කලාපය තුළ පිහිටා තිබෙන අක්කර 4 ට ආසන්න භූමියක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගෙන ඇත. ජන සංඛ්‍යාව ඉතාමත් පහල අගයක් ගන්නා මෙම ඉඩම අනාගත මල අපද්‍රව්‍ය අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් අත්‍යාවශයෙන්ම ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘතියක් බව මෙම සැලැස්ම මඟින් හදුනාගෙන ඇත.

එම ප්‍රදේශය තුලම අපජල පිරිපහදු මධ්‍යස්ථානයක් ද යෝජනා කර ඇත. මේ අනුව මෙම අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ඇතුළුව ජාතික මලාපවාහන ව්‍යාපෘතියක් හෝමාගම ප්‍රදේශයේ වැඩි සනත්ව කලාපවල ක්‍රියාත්මක කිරීමට අත්‍යාවශ්‍ය බවත් ඒ සඳහා රට අදාල රේඛීය ආයතන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු බවත් මෙහිදී සඳහන් කළ හැක.

*රූපය 6.40 : යෝජිත අපජල පිරිපහදු මධ්‍යස්ථානය සඳහා හඳුනාගත් ප්‍රදේශය*




*මූලාශ්‍රය : බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2021*

06 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්ම

අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගික සැලැස්ම

මළ අපද්‍රව්‍ය
කළමනාකරණ සැලැස්ම

## 6.8.5. සේවා කළමනාකරණ සැලැස්ම (Services Management Plan)

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 යටතේ ප්‍රදේශයේ ව්‍යාප්ත විය යුතු සෞඛ්‍ය සේවා පහසුකම්, අධ්‍යාපන සේවා පහසුකම් සම්බන්ධයෙන් විශේෂයෙන් අවධානය යොමු කරමින් සකස් කරන ලද උපාය මාර්ගික සැලැස්මක් ලෙස සේවා කළමනාකරණ සැලැස්ම හඳුන්වා දිය හැක.

### 6.8.5.1. සෞඛ්‍ය සේවා පහසුකම්

හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දෙස අවධානය යොමු කිරීමේදී ඒ ආශ්‍රිතව මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල්, ආයුර්වේද රෝහල්, පෞද්ගලික රෝහල්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හා අනෙකුත් සායන මධ්‍යස්ථාන ප්‍රදේශය පුරා ව්‍යාප්ත වී ඇති ආකාරයක් දැකිය හැක. සිතියම 6. 12 ට අනුව එම සෞඛ්‍ය සේවා පහසුකම් වල ව්‍යාප්තිය හඳුනා ගත හැක. මෙහිදී එම පහසුකම් වල ව්‍යාප්තිය සලකා බැලීමේදී මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල් හා පෞද්ගලික රෝහල් සඳහා කිලෝමීටර 3 ක වපසරියක් කෙරෙහි අවධානය යොමු කර ඇති අතර සායන පවත්වන ස්ථාන මීටර් 500 ක වපසරියක් කෙරෙහි අවධානය යොමු කර ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයට (WHO) අනුව ඉදිරිපත් කර ඇති සම්මතයන්ට අනුව පුද්ගලයන් 1000 ක ට තිබිය යුතු ඇඳන් ප්‍රමාණය 5 කි. හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතවන්මන් ජනගහනය දෙස අවධානය යොමු කිරීමේදී පැහැදිලි වනුයේ ලක්ෂ 3ක ට (2019 වර්ෂයේ සම්පත් පැතිකඩ දත්ත අනුව ) ආසන්න නේවාසිකයන් පිරිසක් ජීවත් වන බවයි. 2010 වර්ෂයේ ඉදිරිපත් කරන ලද "Hospital & Bed Strength in Sri Lanka by District" යන වාර්තාවට අනුව හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව පවතින ඇඳන් ප්‍රමාණය 477 කි. 2010 සිට වර්තමානය දක්වා හෝමාගම ප්‍රදේශයේ රෝහල් ආශ්‍රිත සෞඛ්‍ය පහසුකම් වල ප්‍රසාරණයක් සිදු වී නැති බව හඳුනා ගත හැකි අතර වත්මන තුල එම ප්‍රදේශය ආශ්‍රිතව පවතින ඇඳන් ප්‍රමාණය 500ක් බව උපකල්පනය කළ හැක. ඒ අනුව වර්තමානයේ ලක්ෂ 3ක ට ආසන්න ජනගහනයට පැවතිය යුතු ඇඳන් ප්‍රමාණය 1500 ක් විය යුතුය. එනම් හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ප්‍රමාණවත් ඇඳන් ප්‍රමාණයක් දක්නට නොලැබෙන බව හඳුනා ගත හැකිය.

හෝමාගම නව සංවර්ධන සැලැස්ම (2022–2031) හරහා සිදුකරන ලද පුරෝකතනයන්ට අනුව හෝමාගම සමස්ථ ප්‍රදේශයේ නේවාසික ජනගහනය ලක්ෂ 6ක ට ආසන්න අගයක් වේ. ඒ අනුව ප්‍රදේශය ආශ්‍රිතව තිබිය යුතු ඇඳන් ප්‍රමාණය ඇඳන් 3000 ක් පමණ වේ. ඊට අදාලව හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින මූලික රෝහල් හා ප්‍රාදේශීය රෝහල් ඇතුළු අනෙකුත් සෞඛ්‍ය පහසුකම් වල වැඩි දියුණු කිරීමක් අවශ්‍ය වේ. නවද නව රෝහල් පහසුකම් සඳහා අවස්ථාව ලබා දිය යුතුය.

මෙහිදී විශේෂයෙන්ම හෝමාගම මූලික රෝහල, වැනර ප්‍රාදේශීය රෝහල ආශ්‍රිත පහසුකම් වැඩි දියුණු කිරීමට අවධානය යොමු කළ යුතුය.

එමෙන්ම හෝමාගම මූලික රෝහල ජාතික රෝහලක් ලෙස සංවර්ධනය කිරීම හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව පවතින අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ඇත. ඒ සඳහා අවශ්‍යය පසුබිම හෝමාගම නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහයෝගිතාව මත සංවර්ධනය කල යුතු බවට සැලසුම් කර ඇත.

**සිතියම 6.12 :** *සෞඛ්‍ය සේවා පහසුකම් වල ව්‍යාප්තිය - හෝමාගම ප්‍රාදේශීය සභා ප්‍රදේශය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## 6.8.5.2. අධ්‍යාපන සේවා පහසුකම්

***වගුව 6.14 :** හෝමාගම කොට්ඨාශයේ පවතින පාසල් වර්ගීකරණය*

| **කොට්ඨාශයේ පවතින පාසල් වර්ගීකරණය** | **සංඛ්‍යාව** |
|---|---|
| *1.මධ්‍ය මහා විද්‍යාල(1AB)* | *01* |
| *2.මහා විද්‍යාල (IC)* | *06* |
| *3.කණිටු විද්‍යාල (TYPE2)* | *22* |
| *4.ප්‍රාථමික විද්‍යාල (TYPE3)* | *08* |
| *5.විශේෂ අධ්‍යාපන ඒකක* | *13* |

***මූලාශ්‍රය :** සම්පත් පැතිකඩ වාර්තාව, 2016 වර්ෂය, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය*

හෝමාගම සැලසුම් ප්‍රදේශය තුල පවතින අධ්‍යාපනික ආයතන ප්‍රමාණය පහත පරිදි පෙන්වා දිය හැක. එමෙන්ම පාසල්වල සමස්ථ සිසුන් ප්‍රමාණය 30000 ක් පමණ වන අතර ගුරුවරුන් ප්‍රමාණය 1500ක් පමණ වේ.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ සම්මත ගුරු ශිෂ්‍ය අනුපාතය 1:21 ක් (මූලාශ්‍ර: අධ්‍යාපන දෙපාර්තමේන්තුව) බව සඳහන් කර ඇති අතර හෝමාගම ප්‍රදේශය ආශ්‍රිතව පවතින ගුරු සිසු අනුපාතය 1: 21 ක් පමණ වේ. එමෙන්ම පාසල් වල ව්‍යාප්තිය විශේෂයෙන්ම ප්‍රාථමික හා ද්විතික පාසල්වල ව්‍යාප්තිය පිළිබඳ සලකා බැලීමේදී කිලෝමීටර 3ක වපසරියක් ආවරණය වන පරිදි පාසල් ව්‍යාප්ත වී ඇති ආකාරයක් දැකිය හැකි අතර, එහි ව්‍යාප්තිය සමස්ථ ප්‍රදේශය ආවරණය කරන ආකාරයක් දැකිය හැකිය.

හෝමාගම ප්‍රදේශයේ 2016 වර්ෂයට අනුව සිටින සමස්ථ ජනගහනය ලක්ෂ 3ක ට ආසන්න අගයක් ගන්නා අතර ඉන් පාසල් අධ්‍යාපනයෙහි නියැලෙන ප්‍රමාණය 10% ක් පමණ ප්‍රතිශතයක් වේ. හෝමාගම නව සංවර්ධන සැලැස්ම හරහා සිදු කරන ලද පුරෝකතනයන්ට අනුව ප්‍රදේශයේ සමස්ථ ජනගහනය ලක්ෂ 6ක ට ආසන්න අගයක් ගනී. නවද තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය හරහා ප්‍රදේශය තුල අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැලෙන පිරිස හා ඒ සඳහා ප්‍රදේශයට පැමිණෙන සිසුන් පිරිස ඉහළ අගයක් ගැනීමට වැඩි ඉඩකඩක් ඇත. ඒ අනුව අනාගතයේදී 2031 වර්ෂයේ සමස්ථ ජනගහනයෙන් 20% ක ප්‍රතිශතයක් අධ්‍යාපනයෙහි නිරතවේයැයි උපකල්පනය කළහොත් 140,000 ක ශිෂ්‍ය පිරිසක් කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

**සිතියම 6.13 :** *හෝමාගම සැලසුම් ප්‍රදේශය තුළ අධ්‍යාපන සේවා පහසුකම්වල ව්‍යාප්තිය*




**සැකසුම :** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

ඒ අනුව වර්තමානයේදී පවතින පාසැල් සංඛ්‍යාව හා ඒවායේ පවතින පහසුනම් හා සසඳා බැලීමේදී 2031 වර්ෂය වනවිට අධ්‍යාපන සේවාවන්හි වැඩිදියුණු කළයුතු යෝජනාවන් පහත පරිදි දැක්විය හැකිය.

- *ප්‍රදේශය ආශ්‍රිතව ව්‍යාප්තව පවතින පාසල් වල පහසුකම් වැඩි දියුණු කිරීමට මූලික අවධානය යොමු කළ යුතුය. විශේෂයෙන්ම ප්‍රාථමික හා ද්විතික පාසල් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.*

- *දැනට පවතින ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම, රථගාල් ඇති කිරීම, සියළු පාසල්වලට පැමිණෙන පුද්ගලයින් සඳහා අවශ්‍ය පදික මංමාවත් මෙන්ම හඳුනාගන්නා ලද විකල්ප මාර්ග වැඩිදියුණු කිරීම තුලින් අවශ්‍ය පහසුකම් සලසා දීම.*

- *තවද සියලුම වර්ගයේ රජයේ සහ පෞද්ගලික පාසල් ඇතුළු අධ්‍යාපන ආයතන පොදු වාහන නැවතුම් ස්ථාන ලබා දීම සම්බන්ධයෙන් අවධානය යොමු කලයුතු අතර ඒ එක් එක් ආයතන ඒ සඳහා කටයුතු කිරීම අනිවාර්යය වේ. විශේෂයන්ම මහින්ද රාජපක්ෂ ජාතික පාසැල, වෑනර මහා විද්‍යාලය, හෝමාගම මහා විද්‍යාලය, ජනාධිපති මහා විද්‍යාලය, මීගොඩ මහා විද්‍යාලය ආශ්‍රිතව පොදු රථගාල් ක්‍රියාත්මක කිරීමට අවධානය යොමු කල යුතුය.*

# 6.9. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම (Project Implementation Strategic Plan)

## 6.9.1. හැඳින්වීම

හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (Project Implementation Strategic Plan) පිළිබඳ අවධානය යොමු කරන අතර විශේෂයෙන්ම එය සංවර්ධන සැලැස්ම තුල ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගන්නා ලද ව්‍යාපෘති සැලසුම්මය දැක්මකට අනුව ක්‍රියාවට නැංවීම අරමුණු කර ඇත. මෙහිදී එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හා වැදගත්කම මත කාණ්ඩ 03 ක් යටතේ ඒවා විස්තර කිරීම සිදු කර ඇත. එනම්,

1. *ප්‍රධාන ව්‍යාපෘති (First Priority Project)*
2. *අනුශාංගික ව්‍යාපෘති (Second Priority Project)*
3. *වෙනත් ව්‍යාපෘති (Third Priority Project)*

එම ව්‍යාපෘති පහත පරිදි හැඳින්වීමට පුළුවන.

### 1. *ප්‍රධාන ව්‍යාපෘති (First Priority Project)*

මෙලෙස හඳුනාගන්නා ලද ප්‍රධාන ව්‍යාපෘති හෝමාගම සංවර්ධන සැලසුම් සංකල්පය අනුව හඳුනා ගන්නා ලද ප්‍රධාන උපාය මාර්ගික අංශ හා භූ ස්ථාන පදනම් කරගෙන අවධානයට ගැනීම සිදු කර ඇති අතර එම එක් එක් ව්‍යාපෘති යටතේ අනු ව්‍යාපෘති රාශියක් ඒකරාශී වීම දැකිය හැක.

1. *මාහේනවත්ත අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
2. *යෝජිත කර්මාන්ත හා නවෝත්පාදන කලාපය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
3. *හෝමාගම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය*
4. *කහතුඩුව නව නගර සංවර්ධන ව්‍යාපෘතිය*

5. *ගොඩගම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය*
6. *බරාව තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය*

2. *අනුශාංගික ව්‍යාපෘති (Second Priority Project)*

a. මාහේනවත්ත අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

**මාර්ග සංවර්ධන ව්‍යාපෘති**

I. *බටහිර අතුරු මාර්ගය (Western By-Pass) මංතීරු 4කින් යුක්තව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
II. *උඩුවන පන්සල හන්දිය මාර්ගය මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
III. *පිටිපන තලගල මාර්ගය මංතීරු 2කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
IV. *දාම්පේ පිටිපන මාර්ගය මංතීරු 2කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
V. *මීගොඩ හරහා දිවෙන දාම්පේ මාර්ගය මංතීරු 2කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VI. *හෝමාගම දියගම මාර්ගය (වල්ගම හන්දියේ සිට ජම්බුගහමුල්ල හන්දිය දක්වා) මංතීරු 2කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VII. *ගන්කන්ද මාර්ගය හෙවත් කහතුඩුව මාර්ගය මංතීරු 2කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VIII. *මාහේනවත්ත සිට මිල්ලෑව දක්වා යෝජිත නව මාර්ගය මංතීරු 2කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

**වෙනත් ව්‍යාපෘති**

I. *පොදු බහුමහල් වාහන නැවතුම් අංගනය*
II. *යෝජිත මාහේනවත්ත වාණිජ හා සේවා පහසුකම් මධ්‍යස්ථානය*
III. *මීගොඩ ප්‍රවාහන මධ්‍යස්ථානය හා තොග භුවමාරු මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යෝජිත මාහේනවත්ත ජල සැපයුම් මධ්‍යස්ථානය*
IV. *යෝජිත මාහේනවත්ත ප්‍රාථමික විදුලි උපපොළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය*

b. යෝජිත කර්මාන්ත කලාපය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය

I. *නැදුන්හේන බස් නැවතුම් ස්ථානයේ සිට වැලිපිල්ලෑව පාසැල් හන්දිය දක්වා දිවෙන නාවලමුල්ල මාර්ගය හා ලේනගල මාවත මංතීරු 2 ක් සහිතව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
II. *පනාගොඩ ඇඹුල්ගම මාර්ගය මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
III. *බටවල මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

c. හෝමාගම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හඳුනා ගැනෙන අනුශාංගික ව්‍යාපෘති

I. *පවතින මඩවල කුඹුර මාර්ගය, හෝමාගම දුම්රිය නැවතුම හා හෝමාගම පැරණි නගරය සඳහා වන නව සේවා මාර්ගයක් (Service Road) ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
II. *හෝමාගම දුම්රිය ස්ථානය හා හෝමාගම පැරණි නගරය අතර පවතින සම්බන්ධතාව තීව්‍ර කිරීම සඳහා හෝමාගම දුම්රිය නැවතුම හා ඒකාබද්ධ බස් නැවතුම් ස්ථානයක් (Bus Bay) භූ දර්ශන සැලැස්මක් සහිතව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

III. හෝමාගම මූලික රෝහල යා කරමින් හයිලෙවල් මාර්ගය දක්වා දිවෙන රෝහල මාර්ගය මංතීරු 2කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
IV. කොට්ටාව සිට පිටිපන හන්දිය දක්වා දිවෙන ගලවිල මාර්ගය මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
V. හෝමාගම නව නගර මධ්‍ය තුල පොදු හරිත උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
VI. හෝමාගම නව නගරය සඳහා බහු මහල් වාහන නැවතුම් අංගනයක් ඉදි කිරීමේ ව්‍යාපෘතිය
VII. යෝජිත නව බටහිර අතුරු මාර්ගය මංතීරු 4කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
VIII. හයිලෙවල් මාර්ගය මංතීරු 4 කින් යුතුව හා මිනිසුන්ට පයින් ගමන් කිරීමට පහසු වන පහසුකම් සහිතව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
IX. අතුරුගිරිය මාර්ගය හා කහතුඩුව මාර්ගය යා කරමින් දිවෙන හෝමාගම දියගම මාර්ගය මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
X. හෝමාගම නව නගරය ආශ්‍රිත අධි සුඛෝපභෝගී වාණිජ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
XI. හයිලෙවල් මාර්ගයට මුහුණලා දැනට ක්‍රියාත්මක වන වාණිජ ක්‍රියාකාරකම් නැවත පදිංචි කරවීම සඳහා වන ව්‍යාපෘතිය
XII. කාර්යාල හා සේවා පහසුකම් සඳහා යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය
XIII. හෝමාගම මූලික රෝහල මූලික කර ගත් පොදු වාහන නැවතුම් ස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය

d. කහතුඩුව නගර සංවර්ධන ව්‍යාපෘතිය

I. කහතුඩුව මාර්ගය මංතීරු 2කින් යුතුව හා මිනිසුන්ට පයින් ගමන් කිරීමට පහසුවන පහසුකම් සහිතව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
II. කොළඹ හොරණ මාර්ගය මංතීරු 4කින් යුතුව හා මිනිසුන්ට පයින් ගමන් කිරීමට පහසුවන ලෙස පහසුකම් සහිතව සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
III. කහතුඩුව නගරය ආවරණය කරමින් යෝජිත පිටත වටරවුම් මාර්ගය ඉදිකිරීම
IV. යෝජිත නව මාර්ග ඉදිකිරීම හා පවතින මාර්ග පළල් කිරීමේ ව්‍යාපෘතිය
V. යෝජිත සුළු පරිමාණ බස් නැවතුම්පල සංවර්ධනය හා යෝජිත මිශ්‍ර භාවිත සඳහා යෝජිත ප්‍රතිමාරූපි (Iconic) ගොඩනැගිල්ල ඉදිකිරීම
VI. මහ ඇළ දෙපස ඇවිදින මංතීරු ඉදිකිරීමේ ව්‍යාපෘතිය
VII. යෝජිත කෘෂි අපනයන බෝග වෙළඳ මධ්‍යස්ථානය හා පොදු විනෝද කටයුතු මධ්‍යස්ථානය නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය
VIII. යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘතිය හා වාණිජ සංකීර්ණය ඉදිකිරීම
IX. යෝජිත කෘෂි අපනයන හා සමගාමී කර්මාන්ත ඉදි කිරීමේ ව්‍යාපෘතිය
X. යෝජිත නාගරික කෘෂි බෝග වගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

e. ගොඩගම නගර සංවර්ධන ව්‍යාපෘතිය

I. මහා පරිමාණ ධාන්‍ය අලෙවි වෙළඳපොල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
II. ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා තොග මධ්‍යස්ථානය නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය
III. මධ්‍ය අදායම් ලාභී නිවාස සංවර්ධන ව්‍යාපෘතිය
IV. A4 – හයිලෙවල් මාර්ගය සහ B240 – මලම්බේ-අතුරුගිරිය – පාදුක්ක මාර්ගය සම්බන්ධ කරන අතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘති
V. ගොඩගම දුම්රිය ස්ථානය සම්බන්ධ කිරීම සඳහා අතුරු මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
VI. ප්‍රධාන පොදු ප්‍රවාහන ක්‍රම සම්බන්ධ කරමින් හඳුනාගෙන ඇති ප්‍රවේශ මාර්ග පළල් කිරීමේ ව්‍යාපෘතිය

VII. *නගර මධ්‍යයේ නිර්මාණය කිරීමට යෝජිත හරිත උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය හා ඒ ආශ්‍රිත භූ දර්ශන (Landscaping) ව්‍යාපෘතිය*
VIII. *යෝජිත නවීන පහසුකම්වලින් සපිරි වාණිජ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
IX. *යෝජිත මිශ්‍ර භාවිත සඳහා යෝජිත වෙළඳ හා සේවා මධ්‍යස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (මූලික වශයෙන්, ආහාර මධ්‍යස්ථාන, ආහාර නගරය, කුඩා සිනමාහල්, සාප්පු සවාරි වැනි මිශ්‍ර සංවර්ධන භාවිතයන් සඳහා මධ්‍යස්ථානයක් )*
X. *පොදු වාහන නැවතුම් ස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XI. *බස් රථ නැවතුම් ස්ථානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

f. බරාව තෙත්බිම් සංවර්ධන ව්‍යාපෘතිය

I. *කැළණි ගඟ දෙපස රක්ෂිතය රේඛීය උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
II. *කැලණි ගඟ මඟී ප්‍රවාහන ව්‍යාපෘතියට සමගාමීව තොටුපල ඉදිකිරීම හා කඩමණ්ඩිය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
III. *පුස්වැලි ඔය දෙපස රක්ෂිතය රේඛීය හරිත රක්ෂිත ලෙස සංවර්ධනය කිරීම*
IV. *බරාව තෙත්බිම් සංවර්ධනය කිරීම (ජෛව පද්ධති හරිත උයන)*
V. *ලෝලෙවල් මාර්ගය මංතීරු 4 කින් යුතුව සංවර්ධනය කිරීම*
VI. *ලෝලෙවල් මාර්ගයේ පුස්වැලි ඔය හරහා ඉදිකර ඇති පාලම ප්‍රතිමාරුපී ඉදිකිරීමක් ලෙස නැවත නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය*

g. හෝමාගම රේඛීය උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය

I. *මත්තේගොඩ වැව, කුඩා වැව හා ඔලුපට්ටාව වැව ආශ්‍රිත රක්ෂිත ප්‍රදේශ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
II. *කළු ගඟ අතු ඔය රේඛීය උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

h. හෝමාගම පොදු උද්‍යාන සංවර්ධන ව්‍යාපෘති (වගුව 6.7 හා වගුව 6.9ට අනුව)

I. *යෝජිත EMP08 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
II. *යෝජිත PMP 35 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
III. *යෝජිත PLP 17 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
IV. *යෝජිත PMP 01 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
V. *යෝජිත PLP 14 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VI. *යෝජිත PMP 06 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VII. *යෝජිත PLP 16 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VIII. *යෝජිත PMP 32 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
IX. *යෝජිත PLP 28 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
X. *යෝජිත PMP 42 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XI. *යෝජිත PLP 34 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XII. *යෝජිත PLP 80 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XIII. *යෝජිත ECP 01 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XIV. *යෝජිත ELP 01 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XV. *යෝජිත PMP 11 උද්‍යානය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*

*සැ.යු: යෝජිත පොදු උද්‍යාන සැලැස්ම (PORS) පරිශීලනය කිරීම අවශ්‍ය වේ.*

## 4. *වෙනත් ව්‍යාපෘති (Third Priority Project)*

I. *ජම්බුගහමුල්ල හන්දියේ සිට තලගල හන්දිය දක්වා දිවෙන කොට්ටාව තලගල මාර්ගය*
II. *පාදුක්ක මීගොඩ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
III. *කොට්ටාව හා පොල්ගස්ඕවිට නගරය යාකෙරෙන පොල්ගස්ඕවිට මාර්ගය*
IV. *කෝට්ටේ බෝපේ මාර්ගය (අතුරුගිරිය මාර්ගය )*
V. *මත්තේගොඩ හන්දියේ සිට දියගම හන්දිය දක්වා දිවෙන කොට්ටාව තලගල මාර්ගය*
VI. *රෝහල පාර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VII. *හයිලෙවල් මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
VIII. *කොළඹ හොරණ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
IX. *පන්සල හන්දිය කපුගහ දෙනිය මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
X. *දොලහේන මුණමලේ වත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XI. *මුනමලේවත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*
XII. *උඩුවන පන්සල මාර්ගය සංවර්ධනය කිරීම*

## 6.9.2. ක්‍රමෝපායමාර්ග ව්‍යාපෘති

### a. *මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය*

***වගුව 6.15 :*** *මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘති වාර්තාව*

| ***ව්‍යාපෘතිය හඳුනාගැනීම*** | |
|---|---|
| ***ව්‍යාපෘති මාතෘකාව*** | *මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය* |
| ***ව්‍යාපෘතිය*** | *මාහේනවත්ත දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය අදියර 01* |
| ***ව්‍යාපෘති යෝජනාව*** | *මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 යටතේ ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇති හෝමාගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ආර්ථිකය නගා සිටුවීමේ ක්‍රියාවලියේ ප්‍රධාන ආර්ථික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස පෙන්වා දිය හැකිය. ශ්‍රී ලංකාවේ දැනුම කේන්ද්‍ර කරගත් ආයතන ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික යටිතල පහසුකම් ලෙස සැලකෙන භූමිය, ජලය, විදුලිය, සන්නිවේදන හා තොරතුරු තාක්‍ෂණය සම්බන්ද පහසුකම් සැපයීම කෙරෙහි මෙම ව්‍යාපෘතිය අදියර 1 යටතේ සංවර්ධනය කිරීමට අවධානය යොමු කර ඇත.*<br><br>*විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නවෝත්පාදන හා දැනුම් කේන්ද්‍රීය මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා සේවා තීරයක් නිර්මාණය කිරීමේ අරමුණ යථාර්තයක් බවට පත්කිරීමේ ප්‍රධානම ව්‍යාපෘතිය ලෙස මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය හඳුන්වා දිය හැකිය. මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනා ගන්නා ලද විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් නවෝත්පාදන අනාගතයේදී ශ්‍රී ලංකාව තුල බිහිවීම උදෙසා අවශ්‍ය දැනුම කේන්ද්‍ර කරගත් ආයතන සැලසුම් ප්‍රදේශයට අකර්ශනය කර ගැනීම මෙහිදී අවධානයට යොමු කර ඇත. ඒ අනුව බහුමහල් වාහන නැවතුම් අංගන, ජල සැපයුම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, විදුලි අවශ්‍යතා සම්පාදනය කිරීම, අපජලය කළමනාකරණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා මාර්ග ඇතුළු අනෙකුත් ගමනා ගමන පහසුකම් සැපයීම සම්බන්ධ පොදු නියාමතා රැගත් පහසුකම් සැලැස්මක් නීතිප්‍රකාරව ප්‍රකාශයට පත් කිරීම මෙහි මූලික අදියර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.*<br><br>*එම බලාත්මක කරන ලද යටිතල පහසුකම් සැලැස්ම යටතේ දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනා ගන්න ලද ඉඩම් හා පවතින ඉඩම් සැලසුම්ගත ව්‍යාපෘතියට අනුගත වන ලෙස පරිහරණයට මඟ පෙන්වීමක් ලබාදීම තවදුරටත් අරමුණු කර ඇත.*<br><br>*සෞභාග්‍යයේ දැක්ම වත්මන් රාජ්‍ය ප්‍රතිපත්තිය යටතේ නවෝත්පාදනය හා දැනුම කේන්ද්‍ර කරගත් ව්‍යාපෘති සම්බන්දයෙන් මූලික අවධානයක් යොමු කර තිබෙනු දැකිය හැකිය. තාක්ෂණය මත පදනම් වන සමාජයක් අරමුණ යටතේ දැනුම් කේන්ද්‍රීය ශතවර්ෂයේ කෘෂිකර්මය, කර්මාන්ත ක්ෂේත්‍රය හා සේවා අංශය අනාගතයේදී තාක්ෂණය මත යැපෙන ආර්ථික අංශ බවට පත්කිරීම අරමුණු කර ඇත. 21 වන සියවසයේ නැගී එන තාක්ෂණයන් සඳහා උපාය මාර්ගිකව ආයෝජනය කිරීමටත්, අධ්‍යාපන ක්‍රමයට එක කිරීමටත්, ආර්ථිකය සමග මුසු කිරීමටත් පියවර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව ජනතාවගේ ජීවන තත්වය ඉහල දැමීම සඳහා විශාල සමාජ සංවර්ධනයක් සිදුකොට තාක්ෂණික නව්‍යකරණ සංස්කෘතියක් ගොඩනැගීම සිදු කල යුතු බව හඳුනා ගෙන ඇත.* |

| ***ව්‍යාපෘතියේ පිහිටීම*** | | | | |
|---|---|---|---|---|
| ***පිහිටීම*** | ***පළාත*** | *බස්නාහිර* | ***දිස්ත්‍රික්කය*** | *කොළඹ* |
| | ***ප්‍රාදේශීය සීමාව*** | *හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | ***පරිපාලන ඒකකය*** | *හෝමාගම ප්‍රාදේශීය සභාව* |
| ***සීමාවන්*** | ***උතුර*** | ***නැගෙනහිර*** | ***දකුණ*** | ***බටහිර*** |
| | | | | |
| ***ප්‍රවේශය*** | *පිට්පන තලගල මාර්ගය, දාම්පේ මාර්ගය, කොට්ටාව තලගල මාර්ගය* | | | |
| ***පිහිටීම දක්වන සිතියම*** |  | | | |

<table>
<tr><td>භූමි පරිහරණ සැලැස්ම</td><td colspan="8">
</td></tr>
<tr><td colspan="9">ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති ස්වභාවය</td><td>නව</td><td>✓</td><td>දියුණු කළ යුතු</td><td></td><td>විස්තීරණය කළ යුතු නිවාස</td><td></td><td>භූමිය සංවර්ධනය කිරීම පමණක්</td><td></td></tr>
<tr><td rowspan="2">ව්‍යාපෘති ප්‍රභේද</td><td>සංරක්ෂණය</td><td>වාණිජ</td><td>භූ දර්ශන</td><td>උරුමයන්</td><td>නිවාස</td><td>ප්‍රතිස්ථාපන</td><td colspan="2">වෙනත්</td></tr>
<tr><td></td><td>✓</td><td>✓</td><td></td><td>✓</td><td>✓</td><td colspan="2">මාර්ග සංවර්ධනයන්</td></tr>
<tr><td colspan="2">ව්‍යාපෘතියේ ඉලක්ක</td><td colspan="2">ආර්ථික</td><td>✓</td><td colspan="2">සමාජීය</td><td colspan="2">✓</td></tr>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="8">1. ජාත්‍යන්තර නව නිපැයුම් කේන්ද්‍රස්ථානයක්<br>අන්තර්ජාලය ආශ්‍රිතව බිහි වූ උපාංග, කෘතිම බුද්ධිය, රොබෝ තාක්ෂණය ක්ලවුස් කම්පියුටන් නැනෝතාක්ෂණය හා ත්‍රිමාණ බුද්ධිය වැනි නවීන තාක්ෂණ භාවිතය උපරිම තලයට ගෙන ඒම.<br>2. ඩිජිටල්කරණය වූ ලංකාවක්<br>තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන හා BPO මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.<br>3. ජනතා කේන්ද්‍රීය ඩිජිටල් ආණ්ඩුක්‍රමයක්<br>මෘදුකාංග ඉංජිනේරුවන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීම, මෘදුකාංග නිෂ්පාදනය සඳහා අවස්ථාව සකසා දීමආ ඒ ආශ්‍රිත පුහුණු මධ්‍යස්ථාන බිහි කිරීම.<br>4. තොරතුරු තාක්ෂණ ව්‍යවසායකත්වයක්<br>රාජ්‍ය ප්‍රතිපත්ති යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට මූලික පදනම සකස් කර දී ඇත.<br>5. රැකියා අවස්ථා 150,000 ක් නිර්මාණය කිරීම.<br>6. ආසන්න වශයෙන් 100 වැඩි නව ව්‍යාපාර හා 2030 වන විට බහු ජාතික ව්‍යාපාර 20ක් ආකර්ෂණය කර ගැනීම<br>7. සුළු හා මධ්‍යපරිමාණ ව්‍යවසායකයින්ගේ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම.<br>8. 2030 වන විට ලොව පිළිගත් උසස් විද්‍යාඥයින් 1000ක් බිහි කිරීම.</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="8">වර්තමානයේ හෝමාගම සැලසුම් ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික පෙරගමන්කරුවා වශයෙන් යෝජිත මාහේනවත්ත දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය හඳුනාගත හැකිය. ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ සලකා බැලීමේදී කර්මාන්ත හරහා දළ දේශීය නිෂ්පාදිතයට වන දායකත්වය 28% වැනි පහල අගයක් වේ. එමෙන්ම අධි තාක්ෂණය හා සමගාමී අපනයන සඳහා ශ්‍රී ලංකාව දක්වන දායකත්වය 1% ක් පමණ වන අතර ආසියාතික රටවල් අතර ශ්‍රී ලංකාව පහළ ස්ථානයක සිටින බව හඳුනගත හැකිය. (මූලාශ්‍ර: the panel of the united nations commission on sceinece & technology for development 28-30 Nov. 2017)<br><br>එමෙන්ම විද්‍යාව හා තාක්ෂණය සමගාමී කර්මාන්ත සම්බන්ධව ගත් විට ශ්‍රී ලංකාවේ වාර්ෂික අපනයන අදායම රුපියල් මිලියන 382.64 පමණ වේ. පරිසනක හා තාක්ෂණය දියුණු අවධියක, රට අදාල නිෂ්පාදන සම්බන්ධයෙන් පවතින ඉල්ලුම අනුව ලංකාවේ වර්තමානයේ එහි නිරතවන ප්‍රමාණය ඉතාමත් අඩු මට්ටමක පසුවන බව විද්‍යා තාක්ෂණ හා නවෝත්පාදන සම්බන්ධීකරණ ආයතනය පෙන්වා දී ඇත. මේ අනුව මාහේනවත්ත දැනුම් කේන්ද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීම ජාතික අවශ්‍යතාවයක් ලෙස පෙන්වා දිය හැක.</td></tr>
</table>

**වයාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා. ස.අ. | ✓ | පෞද්ගලික | ✓ | රජයේ | |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්වය** | යෝජිත තාක්ෂණ නගර සීමාව තුල අදියර 1 සංවර්ධන කටයුතු සඳහා හදුනාගන්නා ලද ඉඩම පෞද්ගලික ඉඩම් වන අතර බොහොමයක් ඉඩම්වල වත්මන් භාවිතය රබර් හා පොල් වගාවන් වේ. | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | - | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලැස්ම** | අංකය | මිනින්දෝරුගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | | | | අක්: | රූ. | පර්. |
| | | | | 4000 | | |

**වයාපෘතිය ක්‍රියාත්මක කිරීම**

| | | | | | |
|---|---|---|---|---|---|
| **වයාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | PPP | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | මහා නගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | රජයේ අදායම්, ණය, දේශීය හා විදේශ ආයෝජන |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම්** | **ජලය** | **අවශ්‍ය ධාරිතාව** | 161,886 m3 /d | | **විදුලිය** | **අවශ්‍ය ධාරිතාව** | 76..3 mwh |
| | | **පවත්නා ධාරිතාව** | 180,000 m3 /d | | | **පවත්නා ධාරිතාව** | 90 mwh |
| | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | ඔව් | නැත | | **යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **කලාපය** | විද්‍යා හා තාක්ෂණ නගර සංවර්ධන කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | | නැත | |

**වින්‍යාස සැලැස්ම**

**සැකසුම:** *බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය, 2020*

## b. හෝමාගම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය

***මගුව 6.16 :*** *හෝමාගම නගර සංවර්ධන ව්‍යාපෘති වාර්තාව*

| | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
| **ව්‍යාපෘති මාතෘකාව** | *හෝමාගම නව නගර සංවර්ධන ව්‍යාපෘතිය* | | | |
| **ව්‍යාපෘතිය** | *හෝමාගම නව නගර සංවර්ධනය* | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | *මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගර සංවර්ධන ව්‍යාපෘතියත් සමග හෝමාගම නව නගර සංවර්ධනයට ලැබෙනුයේ සුවිශේෂී ස්ථානයකි. හෝමාගම නව නගරය හරහා මාහේනවත්ත දැනුම් කේන්ද්‍රික නගරයට ප්‍රධාන පහසුකම් සපයන ප්‍රධාන වාණිජ නගරය ලෙස හඳුනා ගත හැකිය. තවද මෙම නගර සංවර්ධනය හරහා හරිත නගර සංකල්පය යටතේ නගරය කියවීම උදෙසා හරිත උද්‍යානයක් නිර්මාණය ව අතර හෝමාගම නව සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රධාන වාණිජ කලාපය ලෙසද සංවර්ධනය කිරීමට අවධානය යොමු කර ඇත. තවද ප්‍රධාන ප්‍රවාහන පහසුකම් හා අනෙකුත් සමාජීය සේවාවන් ඒකරාශී වූ ප්‍රධාන නගරය ලෙස මෙය හඳුනා ගත හැකි අතර පහත සඳහන් අනු ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇත.*<br>• *Western By-Pass නව මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය*<br>• *Western By-Pass නව මාර්ගයට සමාන්තරව අඩි 30 ක නව අභ්‍යන්තර සේවා මාර්ගයක් අකරවිට මාර්ගය සම්බන්ධවන ලෙස ඉදි කිරීම*<br>• *වාණිජ ආයතන නැවත පදිංචි කිරීම සඳහා යෝජිත ඉඩම් සංවර්ධනය කිරීම*<br>• *යෝජිත බහුමහල් රථගාල ඉදිකිරීම*<br>• *හෝමාගම නව නගර මධ්‍යයේ යෝජිත හරිත උද්‍යානය සංවර්ධනය කිරීම*<br>• *මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති*<br>• *සේවා මාර්ග සංවර්ධනය කිරීම*<br>• *වාණිජ සංවර්ධනය*<br>• *කාර්යාල පහසුකම් සැපයීම සම්බන්ධ ව්‍යාපෘති*<br><br>*සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 60% ක භූමි ප්‍රදේශයක් ඉහත සංවර්ධන කටයුතු සඳහා යොදා ගන්නා අතර සෙසු ප්‍රදේශ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස ක්‍රියාත්මක වේ. මෙම සංවර්ධන ව්‍යාපෘතිය හරහා ඉඩම් අහිමි වන පුද්ගලයන් සඳහා ඔවුන්ගේ එකඟතාව මත අහිමි වන භූමි ප්‍රමාණය සඳහා විකල්ප ඉඩම් මෙම ව්‍යාපෘති භූමිය තුලින්ම ලබාදීමට යෝජිතය.* | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | *බස්නාහිර* | **දිස්ත්‍රික්කය** | *කොළඹ* |
| | **ප්‍රාදේශීය සීමාව** | *හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය* | **පරිපාලන ඒකකය** | *හෝමාගම ප්‍රාදේශීය සභාව* |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | | | | |
| **ප්‍රවේශය** | *හයිලෙවල් මාර්ගය, යෝජිත බටහිර අතුරු මාර්ගය* | | | |
| **පිහිටීම දක්වන සිතියම** |  | | | |

| | |
|---|---|
හෝමාගම කලාපීකරණ සැලැස්මේ මධ්‍ය ඝනත්ව නේවාසික කලාපයෙහි බලපවත්වන නියමතා සහ භාවිතයන් පිලිවෙලින් වගු අංක 8.4.1 හා 8.4.2 මගින් දැක්වේ.

***වගුව 8.4.1 :*** *මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියමතා*

| | |
|---|---|
| *කලාප මායිම් (ඛණ්ඩාංක)* | *ඇමුණුම 18 යටතේ සටහන් කර ඇත.* |
| *කලාප සංගුණකය* | *1.4* |
| *අනුමත උස සීමාව* | *කලාපීකරණය මඟින් උස සීමා කර නොමැති නම් සංවර්ධනකරුට ඉදිකිරීමට ඇති භූමියේ වර්ග ප්‍රමාණය අනුව සහ නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් රෙගුලාසි අනුව ගොඩනැගිලි්ලෙහි උස තීරණය වේ.* |
| *අනුමත උපරිම බිම් කට්ටි ආවරණය* | *3 වන උපලේඛනයේ ඇ ආකෘතිය අනුව කටයුතු කල යුතුය.* |
| *කලාපයට අදාළ වෙනත් කරුණු* | • *දක්ෂිණ අධිවේගී මාර්ගයේ රෙගුලාසි මෙම කලාපය සඳහා බලපැවැත්වේ. ඒ සඳහා අංක 2235/54 - 2021.7.8 ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන ලද සැලසුම් හා ගොඩනැගිලි නියෝග / රෙගුලාසි (පොදු) හි 17 වන උපලේඛනය අනුව කටයුතු කලයුතුය..*<br><br>• *භූ විද්‍යා හා පතල් කැනීමේ දෙපාර්තමේන්තුව විසින් ඛනිජ කැනීම් හඳුනාගෙන ඇති ඇමුණුම 23 හා දැනට ක්‍රියාත්මක වන කළු ගල් කැඩීමේ කර්මාන්තය අවට පවත්නා නේවාසික සංවර්ධනයන්ට අවහිර නොවන පරිදි සලකා බලනු ලැබේ. අනුමැතිය සලකා බැලීම සඳහා අවම වශයෙන් කළු ගල් පිහිටි භූමියේ සිට මීටර් 100ක සීමාව තුල නේවාසික සංවර්ධනයක් නොතිබිය යුතුය. එසේ නොවන අවස්ථාවල ප්‍රතිස්ථාපන පහසුකම් සහිතව සලකා බලනු ලැබේ. එසේම, නේවාසික සංවර්ධනයන් සලකා බැලීමේදී එය ගල පිහිටා ඇති මායිමේ සිට මීටර් 100 ක් දුරින් තිබිය යුතුය.*<br><br>• *ස්ථානීය පිහිටීම මත සලකා බලා පස් හා වැලි කැපීමේ කර්මාන්ත සඳහා අවසර දෙනු ලැබේ.* |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

## 08 පරිච්ඡේදය
## යෝජිත සංවර්ධන කලාප හා නියමතා

### මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය

මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියාමනා සහ භාවිතයන්

***වගුව 8.4.2 :** මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන කලාපීකරණ භාවිතයන්*

| **භාවිතයන්** | | **ඉඩමේ අවම ප්‍රමාණය (වර්ග මීටර්)** | **අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය** |
|---|---|---|---|
| නේවාසික | නිවාස | 150 | අවසර ලත් ගෙබිම් අනුපාතය අනුව |
| | නිල නිවාස / සේවක නිවාස | 150 | |
| | වැඩිහිටි/ ආබාධිත නිවාස | 1000 | |
| | ළමා නිවාස | 1000 | |
| | ළමා සුරැකුම් මධ්‍යස්ථාන | 500 | |
| සෞඛ්‍ය | සත්ව සුරැකුම් මධ්‍යස්ථාන | 500 | |
| | වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන (එක වෛද්‍යවරයෙකු පමණක් සේවය කරන) | 150 | 50 |
| | වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන | 500 | අවසර ලත් ගෙබිම් අනුපාතය අනුව |
| | ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන | 300 | |
| | සත්ත්ව රෝහල් | 500 | |
| | සත්ත්ව සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන | 250 | |
| | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන | 250 | |
| අධ්‍යාපන | පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන | 500 | |
| | ප්‍රාථමික අධ්‍යාපන මධ්‍යස්ථාන | 4000 | |
| | ද්විතීයික අධ්‍යාපන මධ්‍යස්ථාන | 8000 | |
| | පෞද්ගලික උපකාර පන්ති | 250 | එක් බිම් කට්ටියක් උපරිම ව.මී.40 නොඉක්මවිය යුතුය. උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 10 යි. |
| | | 500 | එක් බිම් කට්ටියක් තුළ වර්ග මීටර 80 නොඉක්මවිය යුතුය. උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 20 යි. |
| | කලායතන/රංගායතන | 1000 | |

## මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය

මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියාමතා සහ භාවිතයන්

<table>
<tr><th colspan="2">භාවිතයන්</th><th>ඉඩමේ අවම ප්‍රමාණය (වර්ග මීටර්)</th><th>අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය</th></tr>
<tr><td rowspan="6">ආයතන</td><td rowspan="2">කාර්යාල</td><td>250 (A හා B මාර්ගවල පමණි)</td><td>-</td></tr>
<tr><td>250 (C මාර්ගවල පමණි)</td><td>වර්ග මීටර 100 යි</td></tr>
<tr><td rowspan="3">වෘත්තීය කාර්යාල</td><td>150 (මාර්ගයේ පළල 4.5m/3m)</td><td>වර්ග මීටර 20 යි</td></tr>
<tr><td>250 (මාර්ගයේ පළල 6m)</td><td>වර්ග මීටර 40 යි</td></tr>
<tr><td>250 (A,B මාර්ගවල)</td><td>සීමාවක් නැත</td></tr>
<tr><td>බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන (A, B මාර්ගවල)</td><td>250</td><td rowspan="9">අවසර ලත් ගෙබිම් අනුපාතය අනුව</td></tr>
<tr><td rowspan="10">සමාජ සේවා සහ පොදු පහසුකම්</td><td>ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන</td><td>150</td></tr>
<tr><td>සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන</td><td>500</td></tr>
<tr><td>ආගමික මධ්‍යස්ථාන</td><td>500</td></tr>
<tr><td>ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා (A, B මාර්ගවල)</td><td>500</td></tr>
<tr><td>පුස්තකාල</td><td>150</td></tr>
<tr><td>පුනරුත්ථාපන මධ්‍යස්ථාන</td><td>500</td></tr>
<tr><td>ආදාහනාගාර</td><td>500</td></tr>
<tr><td>ආදාහනාගාර</td><td>500</td><td>-</td></tr>
<tr><td>සුසාන භූමි</td><td>-</td><td>-</td></tr>
<tr><td rowspan="7">වාණිජ</td><td>වෙළඳසැල්</td><td>150</td><td>වර්ග මීටර 100</td></tr>
<tr><td>සුපිරි වෙළඳසැල්</td><td>500</td><td>වර්ග මීටර 100</td></tr>
<tr><td>උත්සවශාලා (A, B මාර්ගවල)</td><td>1000</td><td>අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව</td></tr>
<tr><td rowspan="2">බෝජනාගාර</td><td>250 (A, B මාර්ගවල)</td><td>සීමාවක් නැත</td></tr>
<tr><td>250 (අනෙකුත් මාර්ගවල)</td><td>වර්ග මීටර 100</td></tr>
<tr><td>විවෘත වෙළඳසැල්</td><td>500</td><td>-</td></tr>
<tr><td>ඔසුසැල්</td><td>150</td><td>වර්ග මීටර 100</td></tr>
</table>

| භාවිතයන් | | ඉඩමේ අවම ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| වාණිජ | රසායනාගාර සේවා සහ එකතු කිරීමේ මධ්‍යස්ථාන | 150 | වර්ග මීටර 100 |
| | පාරිභෝගික සේවා මධ්‍යස්ථාන | 150 | වර්ග මීටර 150 |
| | අවමංගල්‍ය ශාලා (A, B මාර්ගවල) | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | අවමංගල්‍ය ශාලා උත්සව ශාලා සමඟ (A, B මාර්ගවල) | 1000 | |
| | ඉන්ධන පිරවුම්හල් (A, B මාර්ගවල) | 1000 | |
| | ඉන්ධන පිරවුම්හල් හා වාහන සේවා මධ්‍යස්ථාන (A, B මාර්ගවල) | 1500 | |
| | ඉන්ධන පිරවුම්හල් හා වෙළඳ සංකීර්ණ (A, B මාර්ගවල) | 1500 | |
| | ගෑස් පිරවුම්හල් හා විදුලි ආරෝපණ මධ්‍යස්ථාන | 1000 | |
| | බහු මහල් රථගාල් | 1000 | |
| | විවෘත රථගාල් | 250 | |
| | ගබඩා | 1000 | |
| සංචාරක කටයුතු | නිවාඩු නිකේතන (A, B හා C මාර්ගවල) | 300 | |
| | ආගන්තුක නිවාස (A, B හා C මාර්ගවල) | 250 | |
| | ලැගුම්හල් (A, B හා C මාර්ගවල) | 250 | |
| | සංචාරක හෝටල් (A, B හා C මාර්ගවල) | 500 | |
| | සංචාරක තොරතුරු මධ්‍යස්ථාන (A, B හා C මාර්ගවල) | 150 | වර්ග මීටර 100 |
| | ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන (A, B මාර්ගවල) | 250 | වර්ග මීටර 150 |
| | කබානා හෝටල්, අනෙකුත් හෝටල් (A, B හා C මාර්ගවල) | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| නිෂ්පාදන කර්මාන්ත | පතල් හා කැණීම් ආශ්‍රිත නිස්සාරණ කර්මාන්ත | - | - |
| | සිමෙන්ති, කොන්ක්‍රීට් සහ පිඟාන් මැටි ආශ්‍රිත නිෂ්පාදන (A, B මාර්ගවල) | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත (A, B, C මාර්ගවල) | 1000 | |
| | රෙදිපිළි, ඇඳුම් පැළඳුම් සහ සම් භාණ්ඩ නිෂ්පාදන (A, B, C මාර්ගවල) | 1000 | |

**මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය**

මධ්‍ය ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියාමතා සහ භාවිතයන්

| භාවිතයන් | | ඉඩමේ අවම ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| සේවා කර්මාන්ත | විදුලි සහ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත(A, B, C මාර්ගවල) | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | ආහාර සහ මධ්‍යසාර රහිත පාන කර්මාන්ත (A, B, C මාර්ගවල) | 1000 | |
| | ගෘහස්ථ කර්මාන්ත | 500 | වර්ග මීටර 50 |
| | පරිසර දූෂණය අවම සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| සේවා කර්මාන්ත | වාහන සේවා මධ්‍යස්ථාන (A, B, C මාර්ගවල) | 500 (යතුරුපැදි, ත්‍රී රෝදරථ සේවා මධ්‍යස්ථාන හා වාහන අභ්‍යන්තර පිරිසිදු කිරීම හා නවීකරණය) | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | | 1000 (අනෙකුත් වාහන සේවා මධ්‍යස්ථාන) | |
| | වාහන අලුත් වැඩියා මධ්‍යස්ථාන / විසිරි පින්තාරු සිදුකරන මධ්‍යස්ථාන (A, B මාර්ගවල) | 500 | - |
| | කුලී රථ සේවා මධ්‍යස්ථාන | 250 | - |
| | ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන | 250 | - |
| | ඇඹරුම්හල් / වී මෝල් | 250 | - |
| | ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපොලවල් (A, B මාර්ගවල) | 500 | - |
| | ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන | 250 | - |
| විවේක හා විනෝද කටයුතු | ඉතා කුඩා උද්‍යාන (Pocket Park) | - | - |
| | කුඩා උද්‍යාන (Mini Park) | - | - |
| | අසල උද්‍යාන (Local Park) | - | - |
| | ප්‍රජා උද්‍යාන (Community Park) | - | - |
| | නගර උද්‍යාන (Town Park) | - | - |
| | මධ්‍ය නාගරික උද්‍යාන (Central Urban Park/City Park) | - | - |

| භාවිතයන් | | ඉඩමේ අවම ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| විවේක හා විනෝද කටයුතු | ප්‍රාදේශීය උද්‍යාන (Regional Park) | - | - |
| | රේඛීය උද්‍යාන (Lin-ear Park) | - | - |
| | ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන | 500 | - |
| | කලාගාර / කෞතුකාගාර | 500 | - |
| | කායවර්ධන මධ්‍යස්ථාන | 500 | |
| | එළිමහන් රංග ශාලා | 500 | - |
| | බෝට්ටු ජැටි /පාරු නවාතැන් | - | - |

*සටහන 1*
*කිසියම් ඉඩම් කට්ටියක් A හා B මාර්ගයකට හෝ A හා B මාර්ග සම්බන්ධ වන ලෙස අඩි 30ක ප්‍රවේශයක් පවතින්නේ නම් ඉහළ ඝණත්ව වාණිජ කලාප I හි සඳහන් භාවිතයන් සඳහා අවසර දීම සලකා බලනු ලැබේ.*

*සටහන II*
*මෙම කලාපය තුළ වාහන සේවා ස්ථාන, ලෝහ උණු කිරීමේ සිදු කරන කර්මාන්ත, විසිරු පින්තාරු කටයුතු හෝ වායු සමීකරණ අලුත් වැඩියා කරන ගරාජයක්, අධික ශබ්දයක් කම්පනයක් සිදුවිය හැකි සම්මුච්චිත යන්ත්‍ර ධාරිතා අශ්වබල 5ට ඉහළ කර්මාන්ත, අප්‍රසන්න ගන්දයක් ඇතිවිය හැකි රෙසින / කාබනික ද්‍රාවක ආදිය භාවිතා කරන කර්මාන්ත, අන්තරාදායක කර්මාන්ත නේවාසික භාවිත සමඟ ගැටෙන අවස්ථාවලදී අවසර දීම සලකා බලනු නොලැබේ.*

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

# 8.5. වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01)

මාහේනවත්ත දැනුම් කේන්ද්‍රීය නගරය කේන්ද්‍ර කර ගනිමින් කිලෝමීටර 3කට ආසන්න වපසරියක විහිදෙන මෙම කලාපය, විද්‍යාව හා තාක්ෂණය පදනම් කරගත් අධ්‍යාපන ආයතන, පර්යේෂණ ආයතන හා කර්මාන්ත සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇත. තවද මහා මාර්ග හා එහි පළල මත තීරණයවන සංවර්ධනයන් හරහා අපේක්ෂිත නගර ආකෘතිය (Urban Form) ලබා ගැනීම මෙහිදීද අරමුණු කර ඇත.

## 8.5.1. වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01) සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

හෝමාගම නගර සංවර්ධන සැලැස්මේ වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපයෙහි බලපවත්වන නියමතා සහ භාවිතයන් පිලිවෙලින් වගු අංක 8.5.1 සහ 8.5.2 මගින් දැක්වේ.

***වගුව 8.5.1 :*** *වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය සඳහා බලපවත්වන නියමතා*

| | |
|---|---|
| කලාප මායිම් (ඛණ්ඩාංක) | ඇමුණුම 19 යටතේ සටහන් කර ඇත. |
| කලාප සංගුණකය | 2.7 |
| අනුමත උස සීමාව | කලාපීකරණය මඟින් උස සිමා කර නොමැති නම් සංවර්ධනකරුට ඉදිකිරීමට ඇති භූමියේ වර්ග ප්‍රමාණය අනුව සහ නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් රෙගුලාසි අනුව ගොඩනැගිල්ලෙහි උස තීරණය වේ. |
| අනුමත උපරිම බිම් කට්ටි ආවරණය | සියලුම භාවිතයන් සඳහා - 60% |
| කලාපයට අදාළ වෙනත් කරුණු | • භූ විද්‍යා හා පතල් කැනීමේ දෙපාර්තමේන්තුව විසින් ඛනිජ කැනීම් හඳුනාගෙන ඇති (ඇමුණුම 23) හා දැනට ක්‍රියාත්මක වන කළු ගල් කැඩීමේ කර්මාන්ත, පවත්නා නේවාසික සංවර්ධනයන්ට අවහිර නොවන පරිදි සලකා බලනු ලැබේ. අනුමැතිය සලකා බැලීම සඳහා අවම වශයෙන් කළු ගල් පිහිටි භූමියේ සිට මීටර් 100ක සිමාව තුල නේවාසික සංවර්ධනයක් නොතිබිය යුතුය.<br>• එසේ නොවන අවස්ථාවල ප්‍රතිස්ථාපන පහසුකම් සහිතව සලකා බලනු ලැබේ. නේවාසික සංවර්ධනයන් සලකා බැලීමේදී එය ගල පිහිටා ඇති මායිමේ සිට මීටර් 100 ක් දුරින් තිබිය යුතුය. |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

## 08 පරිච්ඡේදය යෝජිත සංවර්ධන කලාප හා නියමතා

වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01)

වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01) සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

***වගුව 8.5.2 :** වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන නියාමන සැලසුම් කලාපය I) සඳහා බලපවත්වන කලාපීකරණ භාවිතයන්*

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| අධ්‍යාපන | පර්යේෂණ මධ්‍යස්ථාන | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | තාක්ෂණික විශ්ව විද්‍යාල | 4000 | |
| | විද්‍යා හා තාක්ෂණ ආයතන | 1000 | |
| | වෘත්තීය පුහුණු ආයතන | 2000 | |
| | ජීව විද්‍යාත්මක පර්යේෂණ මධ්‍යස්ථාන | 4000 | |
| | අභ්‍යාවකාශ පර්යේෂණ මධ්‍යස්ථාන | 4000 | |
| | රසායනාගාර හා විද්‍යාගාර | 1000 | |
| | අන්තර්ජාතික සම්මේලනශාලා | 4000 | |
| | විදුලි සන්නිවේදන හා දත්ත සැකසුම් මධ්‍යස්ථාන | 1000 | |
| | පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන | 500 | |
| | ප්‍රාථමික අධ්‍යාපන මධ්‍යස්ථාන | 4000 | |
| | ද්විතියික අධ්‍යාපන මධ්‍යස්ථාන | 8000 | |
| | තෘතීයික අධ්‍යාපන මධ්‍යස්ථාන | 8000 | |
| කර්මාන්ත | නැනෝ තාක්ෂණ කර්මාන්ත | 1000 | |
| | ජීවවිද්‍යා තාක්ෂණික | 1000 | |
| | අධි තාක්ෂණ කර්මාන්ත | 1000 | |
| | නව නිපැයුම් හා නව තාක්ෂණය පදනම් කරගත් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | 1000 | |
| | ද්විතික සැකසුම් කර්මාන්ත (තාක්ෂණ නගර ව්‍යාපෘතියට අදාල) | 1000 | |
| | ගෘහස්ථ කර්මාන්ත - නේවාසික සමඟ | 150 | වර්ග මීටර 50 |
| සේවා කර්මාන්ත | තුලී රථ සේවා මධ්‍යස්ථාන | 250 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන | 250 | |
| | ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන | 250 | |

වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01)

වැඩි ඝනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01) සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| විවේක හා විනෝද කටයුතු | ඉතා කුඩා උද්‍යාන (Pocket Park) | - | - |
| | කුඩා උද්‍යාන (Mini Park) | - | - |
| | අසල උද්‍යාන (Local Park) | - | - |
| | ප්‍රජා උද්‍යාන (Community Park) | - | - |
| | නගර උද්‍යාන (Town Park) | - | - |
| | මධ්‍ය නාගරික උද්‍යාන (Central Urban Park/City Park) | - | - |
| | ප්‍රාදේශීය උද්‍යාන (Regional Park) | - | - |
| | රේඛීය උද්‍යාන | - | - |
| | සිනමා ශාලා | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | සමාජ ශාලා | 500 | |
| | ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන | 500 | |
| | කායවර්ධන මධ්‍යස්ථාන | 500 | |
| ආයතන | කාර්යාල | 500 | |
| | කාර්යාල සංකීර්ණ | 500 | |
| | වෘත්තීය කාර්යාල | 150 | |
| | බැංකු, රක්ෂණ හා මූල්‍ය ආයතන | 150 | |
| | ස්වයංක්‍රීය මුදල් ගනුදෙනු මධ්‍යස්ථාන | - | |
| නේවාසික | නිවාස ඒකක | 150 | |
| | නිවාස සංකීර්ණ | 1000 | |
| | නේවාසිකාගාර | 250 | |
| | නිල නිවාස / සේවක නිවාස | 250 | |
| | වැඩිහිටි/ ආබාධිත නිවාස | 1000 | |
| | ළමා සුරැකුම් මධ්‍යස්ථාන | 500 | |
| වාණිජ | වෙළඳසැල් | 150 | |
| | සුපිරි වෙළඳසැල් | 1000 | |
| | ඔසුසැල් | 250 | |
| | බෝජනාගාර | 250 | |

**08 පරිච්ඡේදය**
**යෝජිත සංවර්ධන කලාප හා නියමතා**

වැඩි සනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01)

වැඩි සනත්ව අධ්‍යාපන හා නවෝත්පාදන කලාපය (සංවර්ධන මාර්ගෝපදේශ සැලැස්ම - 01) සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| වාණිජ | හෝටල් | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | ඉන්ධන පිරවුම්හල් | 1000 | |
| | ජාත්‍යන්තර ව්‍යාපාර හා සම්මේලන මධ්‍යස්ථාන | 4000 | |
| | පාරිභෝගික සේවා මධ්‍යස්ථාන | 150 | |
| | ගෑස් පිරවුම්හල් හා විදුලි ආරෝපණ මධ්‍යස්ථාන | 1000 | |
| | සන්නිවේදන කුළුණු | 250 | |
| | බහු මහල් රථගාල් | 1000 | |
| | විවෘත රථගාල් | 250 | |
| | නව ව්‍යාපාර හා නව නිපැයුම් ප්‍රවර්ධන මධ්‍යස්ථාන | 150 | |
| | ව්‍යවසායකත්ව ප්‍රවර්ධන ආයතන | 150 | |
| | උත්සවශාලා | 1000 | |
| | ගබඩා | 500 | |
| සෞඛ්‍ය | රෝහල් | 1000 | |
| | වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථාන (එක වෛද්‍යවරයෙකු පමණක් සේවය කරන) | 250 | වර්ග මීටර 50 |
| | වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන | 500 | වර්ග මීටර 50 |
| | සත්ත්ව රෝහල් | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | සත්ත්ව සායන හා ප්‍රතිකාර මධ්‍යස්ථාන | 250 | |
| | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන | 150 | |
| | රසායනාගාර සේවා සහ එකතු කිරීමේ මධ්‍යස්ථාන | 150 | |
| සමාජ සේවා | පුස්තකාල | 150 | |
| | ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා | 1000 | |
| සංචාරක | නිවාඩු නිකේතන | 300 | |
| | ආගන්තුක නිවාස | 250 | |
| | ලැගුම්හල් | 250 | |
| | සංචාරක හෝටල් | 500 | |
| | නාගරික හෝටල් | 500 | |
| | ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන | 250 | |
| | කබානා හෝටල් | 500 | |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

# 8.6. වැඩි ඝනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය



හෝමාගම සංවර්ධන සැලැස්ම 2022–2031 යටතේ වන සංවර්ධන සැලසුම් සංකල්පය අනුව යෝජිත තාක්ෂණ තිරය පදනම් කර ගනිමින් මාහේනවත්ත තාක්ෂණ කලාපය හා සමගාමීව, විද්‍යාව හා තාක්ෂණය සම්බන්ධ නිෂ්පාදන පදනම් කරගත් පර්යේෂණ හා සුළු පරිමාණ කර්මාන්ත සංවර්ධනය සඳහා ප්‍රමුඛතාව ලබා දීම මෙහිදී අරමුණු කර ඇත. එමෙන්ම දැනට ක්‍රියාත්මක වන ටෙම්පල් බර්ග් කර්මාන්ත කලාපය කේන්ද්‍ර කර ගනිමින් කිලෝමීටර 2කට ආසන්න ප්‍රදේශයක මෙහි ව්‍යාප්තිය හඳුනා ගත හැක. තවද මහා මාර්ග හා එහි පළල මත තීරණයවන සංවර්ධනයන් හරහා අපේක්ෂිත නගර ආකෘතිය (Urban Form) ලබා ගැනීම මෙහිදිද අරමුණු කර ඇත.

## 8.6.1. වැඩි ඝනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය සඳහා බලපවත්වන නියමතා

හෝමාගම නගර සංවර්ධන සැලැස්මේ වැඩි ඝනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය හි බලපවත්වන නියමතා සහ භාවිතයන් පිලිවෙලින් සඳහා වගු අංක 8.6.1 සහ 8.6.2 මගින් දැක්වේ.

***වගුව 8.6.1 :*** *වැඩි ඝනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය සඳහා බලපවත්වන නියමතා*

| | |
|---|---|
| *කලාප මායිම් (ඛණ්ඩාංක)* | *ඇමුණුම 20 යටතේ සටහන් කර ඇත.* |
| *කලාප සංගුණකය* | *1.6* |
| *අනුමත උස සීමාව* | *කලාපීකරණය මඟින් උස සීමා කර නොමැති නම් සංවර්ධනකරුට ඉදිකිරීමට ඇති භූමියේ වර්ග ප්‍රමාණය අනුව සහ නාගරික සංවර්ධන අධිකාරියේ අනෙකුත් රෙගුලාසි අනුව ගොඩනැගිල්ලෙහි උස තීරණය වේ.* |
| *අනුමත උපරිම බිම් කට්ටි ආවරණය* | *3 වන උපලේඛනයේ ඇ ආකෘතිය අනුව කටයුතු කල යුතුය.* |
| *කලාපයට අදාළ වෙනත් කරුණු* | • *ටෙම්පල්බර්ග් කර්මාන්ත කලාපය තුළ ස්ථාපිත වන නව කර්මාන්ත මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශය මත සලකා බලනු ලැබේ.*<br>• *මෙම කලාපය තුළ දැනට පවතින නේවාසික භාවිතයන්ට බලපෑමක් නොවන අයුරින් පවත්නා කළුගල් කඩා ඉවත් කරගැනීමට අවසර දෙනු ලැබේ.*<br>• *භූ විද්‍යා හා පතල් කැනීමේ දෙපාර්තමේන්තුව විසින් ඛනිජ කැනීම් හඳුනාගෙන ඇති ඇමුණුම 23 හා දැනට ක්‍රියාත්මක වන කළු ගල් කැඩීමේ කර්මාන්ත, පවත්නා නේවාසික සංවර්ධනයන්ට අවහිර නොවන පරිදි සලකා බලනු ලැබේ. අනුමැතිය සලකා බැලීම සඳහා අවම වශයෙන් කළු ගල් පිහිටි භූමියේ සිට මීටර් 100ක සීමාව තුල නේවාසික සංවර්ධනයක් නොතිබිය යුතුය. එසේ නොවන අවස්ථාවල ප්‍රතිස්ථාපන පහසුකම් සහිතව සලකා බලනු ලැබේ. එසේම, නේවාසික සංවර්ධනයන් සලකා බැලීමේදී එය ගල පිහිටා ඇති මායිමේ සිට මීටර් 100 ක් දුරින් තිබිය යුතුය.* |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

*වගුව 8.6.2 : වැඩි ඝනත්ව කර්මාන්ත හා නවෝත්පාදන කලාපය සඳහා බලපවත්වන කලාපීකරණ භාවිතයන්*

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| නිෂ්පාදන කර්මාන්ත | විද්‍යා හා තාක්ෂණ කලාප - 1 ට අදාළ කර්මාන්ත උද්‍යාන | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | අධි තාක්ෂණ කර්මාන්ත | 1000 | |
| | සුළු හා මධ්‍ය පරිමාණ නිෂ්පාදන කර්මාන්ත | 1000 | |
| | ද්විතියික සැකසුම් කර්මාන්ත | 1000 | |
| | ගල් කැඩීමේ හා ඇඹරීමේ කර්මාන්ත | - | - |
| සේවා කර්මාන්ත | වාහන සේවා මධ්‍යස්ථාන (A, B මාර්ගවල) | 500 (යතුරුපැදි, ත්‍රී රෝදරථ සේවා මධ්‍යස්ථාන වාහන අභ්‍යන්තර පිරිසිදු කිරීම හා නවීකරණය) | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | | 1000 (අනෙකුත් වාහන සේවා මධ්‍යස්ථාන) | |
| | වාහන අලුත් වැඩියා මධ්‍යස්ථාන / විසිරි පින්තාරු සිදුකරන මධ්‍යස්ථාන | 500 | |
| | තුලී රථ සේවා මධ්‍යස්ථාන | 250 | |
| | ලොන්ඩරි/ඇඳුම් පිරිසිදු කිරීමේ ස්ථාන | 150 | |
| | ඇඹරුම්හල් / වී මෝල් | 250 | |
| | ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපොළවල් | 500 | |
| | ඉලෙක්ට්‍රොනික උපකරණ අලුත්වැඩියා මධ්‍යස්ථාන | 150 | |
| අධ්‍යාපන | පර්යේෂණ මධ්‍යස්ථාන | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | විද්‍යා හා තාක්ෂණික ආයතන | 1000 | |
| | වෘත්තීය පුහුණු ආයතන | 2000 | |
| | අධ්‍යාපනික රසායනාගාර හා විද්‍යාගාර | 1000 | |
| | විදුලි සන්නිවේදන හා දත්ත සැපයුම් මධ්‍යස්ථාන | 1000 | |

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| අධ්‍යාපන | පෞද්ගලික උපකාරක පන්ති | 250 (උපරිම ව.මී.40 නොඉක්මවිය යුතුය. උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 10.) | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | | 500(එක් බිම් කට්ටියක් තුළ වර්ග මීටර 80 නොඉක්මවිය යුතුය. උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 20.) | |
| නේවාසික | නිවාස ඒකක | 150 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | නිවාස සංකීර්ණ | 1000 | |
| | නේවාසිකාගාර | 250 | |
| | නිල නිවාස / සේවක නිවාස | 150 | |
| | වැඩිහිටි/ ආබාධිත නිවාස | 1000 | |
| | ළමා නිවාස | 1000 | |
| | ළමා සුරැකුම් මධ්‍යස්ථාන | 500 | |
| වාණිජ | බහු මහල් රථගාල් | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | වෙළඳසැල් | 150 | |
| | භෝජනාගාර | 250 | |
| | නව ව්‍යාපාර හා නව නිපැයුම් ප්‍රවර්ධන මධ්‍යස්ථාන | 150 | |
| | ව්‍යවසායකත්ව ප්‍රවර්ධන ආයතන | 150 | |
| | ඔසුසැල් | 150 | |
| | ඉන්ධන පිරවුම්හල් | 1000 | |
| | ඉන්ධන පිරවුම්හල් හා වාහන සේවා මධ්‍යස්ථාන | 1500 | |
| | ඉන්ධන පිරවුම්හල් හා වෙළඳ සංකීර්ණ | 1000 | |
| | ගෑස් පිරවුම්හල් හා විදුලි ආරෝපණ මධ්‍යස්ථාන | 1000 | |

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| වාණිජ | ගොඩනැගිලි මත සන්නිවේදන කුළුණු | 150 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | සන්නිවේදන කුළුණු | 250 | |
| | විවෘත රථගාල් | 250 | |
| | උත්සවශාලා | 1000 | |
| | ගබඩා | 500 | |
| සෞඛ්‍ය | වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | ඉඟත 1 හැර එක් වෛද්‍යවරයෙකු පමණක් සේවා සපයන වෛද්‍ය මධ්‍යස්ථාන | 150 | 50 |
| සමාජ සේවා | පුස්තකාල | 150 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථාන | 150 | |
| | ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා | 500 | |
| | සමාජ හා සංස්කෘතික මධ්‍යස්ථාන | 1000 | |
| | ආදාහනාගාර | 500 | |
| සංචාරක කටයුතු | නිවාඩු නිකේතන (A,B හා C මාර්ගවල) | 300 | |
| | ආගන්තුක නිවාස (A,B හා C මාර්ගවල) | 250 | |
| | ලැගුම්හල් (A,B හා C මාර්ගවල) | 250 | |
| | සංචාරක හෝටල් (A,B හා C මාර්ගවල) | 500 | |
| | කබානා හෝටල් (A,B හා C මාර්ගවල) | 500 | |
| විවේක හා විනෝද කටයුතු | ඉතා කුඩා උද්‍යාන | - | - |
| | කුඩා උද්‍යාන | - | - |
| | අසල උද්‍යාන | - | - |
| | ප්‍රජා උද්‍යාන | - | - |
| | නගර උද්‍යාන | - | - |
| | මධ්‍ය නාගරික උද්‍යාන | - | - |
| | ප්‍රාදේශීය උද්‍යාන | - | - |
| | රේඛීය උද්‍යාන | - | - |

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය |
|---|---|---|---|
| විවේක හා විනෝද කටයුතු | සිනමා ශාලා | 1000 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | සමාජ ශාලා | 500 | |
| | කායවර්ධන මධ්‍යස්ථාන | 1000 | |
| | ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන | 500 | |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

# 8.7. අඩු ඝනත්ව නේවාසික කලාපය

පුස්වැලි ඔය කේන්ද්‍ර කරගනිමින් ව්‍යාප්තව පවතින පරිසර සංවේදී ප්‍රදේශය ආශ්‍රිතව විහිදෙන මෙම ප්‍රදේශය නේවාසික සංවර්ධනයන් සඳහා ප්‍රමුඛතාව ලබා දී ඇත. තවද මහා මාර්ග හා එහි පළල මත තීරණයවන සංවර්ධනයන් හරහා අපේක්ෂිත නගර ආකෘතිය (Urban Form) ලබා ගැනීම මෙහිදීද අරමුණු කර ඇත.

## 8.7.1. අඩු ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

හෝමාගම නගර සංවර්ධන සැලැස්මේ අඩු ඝනත්ව නේවාසික කලාපයෙහි බලපවත්වන නියමතා සහ භාවිතයන් පිලිවෙලින් සඳහා වගු අංක 8.7.1 සහ 8.7.2 මගින් දැක්වේ.

***වගුව 8.7.1 :*** *අඩු ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියමතා*

| | |
|---|---|
| කලාප මායිම් (ඛණ්ඩාංක) | ඇමුණුම 21 යටතේ සටහන් කර ඇත. |
| කලාප සංගුණකය | 0.8 |
| අනුමත උස සීමාව | කලාප සංගුණකය අනුව සහ අනෙකුත් රෙගුලාසි අනුව තීරණය කරනු ලබයි. |
| අනුමත උපරිම බිම් කට්ටි ආවරණය | 3 වන උපලේඛනයේ ඇ ආකෘතිය අනුව කටයුතු කල යුතුය. |
| කලාපයට අදාළ වෙනත් කරුණු | • නේවාසික සංවර්ධනය සඳහා අවසර දෙනු ලබන අවම බිම් ප්‍රමාණය පර්චස් 10 ක් වේ.<br>• ඇඹුල්ගම - පනාගොඩ මාර්ගයට කිසියම් බිම් කොටසක් මුහුණලා ඇතිවිට වැඩි ඝනත්ව වාණිජ කලාප - I හි භාවිතයන් සහ ගබඩා සංකීර්ණ අවසරදීම සලකා බලනු ලැබේ. |

| | |
|---|---|
| කලාපයට අදාළ වෙනත් කරුණු | • භූ විද්‍යා හා පතල් කැනීමේ කාර්යාංශය විසින් ඛණිජ කැණීම් සඳහා හඳුනාගෙන ඇති (ඇමුණුම 23) ප්‍රදේශවල ලිනාවත්ත හා කුරුගල හැරුණු විට අනෙකුත් ප්‍රදේශ තුල පතල් කැනීම සඳහා අවසර ලබා දීම සලකා බලනු ලැබේ. එසේම, නේවාසික සංවර්ධනයන් සලකා බැලීමේදී එය ගල පිහිටා ඇති මායිමේ සිට මීටර් 100 ක් දුරින් තිබිය යුතුය.<br><br>• මෙම කලාපය තුළ භූ විද්‍යා හා පතල් කැනීමේ කාර්යාංශය මඟින් ඛනිජ නිධි පවත්නා ස්ථාන ලෙස හඳුනාගෙන ඇති ඉඩම් ආශ්‍රිතව කිසියම් සංවර්ධන කටයුත්තක් සඳහා අවසර ලබා දීමට පෙර භූ විද්‍යා හා පතල් කැනීමේ කාර්යාංශයේ නිර්දේශ ලබා ගත යුතුය. (ඇමුණුම 23 හි 1,2 හා 3 වශයෙන් සඳහන් ස්ථාන)<br><br>• ස්ථානීය පිහිටීම මත සලකා බලා පස් කැපීම සඳහා අවසරදීම සලකා බලනු ලැබේ.<br><br>• කිසියම් බිම් කට්ටියක් A හා B මාර්ගයකට මුහුණලා ඇති විට පමණක් වාණිජ භාවිතයන් සඳහා නිරවුල් සහතිකයක් ලබා ගැනීමට යටත්ව සලකා බලනු ලැබේ. |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

***වගුව 8.7.2 :*** *අඩු ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන කලාපීකරණ භාවිතයන්*

| **අනුමත භාවිතයන්** | | **ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)** | **අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)** |
|---|---|---|---|
| නේවාසික | නිවාස | 250 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | වැඩිහිටි/ ආබාධිත නිවාස | 1000 | |
| | ළමා නිවාස | 1000 | |
| | ළමා සුරැකුම් මධ්‍යස්ථාන | 250 | |
| වාණිජ | වෙළඳසැල් | 250 | වර්ග මීටර් 100 |
| | පාරිභෝගික සේවා මධ්‍යස්ථාන | 250 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | පරිසර හිතකාමී භෝජනාගාර | 1000 | |
| | ඔසුසැල් | 250 | |

අඩු ඝනත්ව
නේවාසික කලාපය

අඩු ඝනත්ව නේවාසික කලාපය සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

| අනුමත භාවිතයන් | | ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්) | අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්) |
|---|---|---|---|
| සෞඛ්‍ය | වෛද්‍ය උපදේශන සේවා මධ්‍යස්ථාන | 500 | වර්ග මීටර් 250 |
| | ළමා හා මාතෘ සායන මධ්‍යස්ථාන | 150 | වර්ග මීටර් 100 |
| | ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථාන | 150 | වර්ග මීටර් 50 |
| අධ්‍යාපන | පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | පෞද්ගලික උපකාර පන්ති | 150 (උපරිම ව.මී.20 නොඉක්මවිය යුතුය. උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 10.) | |
| | | 250 (එක් බිම් කට්ටියක් තුළ වර්ග මීටර 40 නොඉක්මවිය යුතුය. උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව 20.) | |
| කර්මාන්ත | ගෘහ කර්මාන්ත - නේවාසික සමඟ | 250 | 50 |
| | මැටි ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත | 1000 | - |
| සංචාරක | නිවාඩු නිකේතන | 250 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | කබානා හෝටල් | 1000 | |
| | ලැගුම්හල් | 500 | |
| | ආයුර්වේද පංචකර්ම මධ්‍යස්ථාන | 250 | |
| | සංචාරක තොරතුරු මධ්‍යස්ථාන | 150 | |
| | පාරිසරික සංචාරක ව්‍යාපෘති | 4000 | |

| **අනුමත භාවිතයන්** | | **ඉඩමේ ප්‍රමාණය (වර්ග මීටර්)** | **අවසර දෙනු ලබන උපරිම ගෙබිම් ප්‍රමාණය (වර්ග මීටර්)** |
|---|---|---|---|
| විනෝද හා විනෝද කටයුතු | ඉතා කුඩා උද්‍යාන (Pocket Park) | - | - |
| | කුඩා උද්‍යාන (Mini Park) | - | - |
| | අසල උද්‍යාන (Local Park) | - | - |
| | ප්‍රජා උද්‍යාන (Community Park) | - | - |
| | මධ්‍ය නාගරික උද්‍යාන (Central Ur-ban Park/City Park) | - | - |
| | ප්‍රාදේශීය උද්‍යාන (Regional Park) | - | - |
| | රේඛීය උද්‍යාන | - | - |
| | එළිමහන් රංග ශාලා | 500 | අවසර ලත් ගෙබිම් ප්‍රමාණ අනුපාතය අනුව |
| | කලාගාර / කෞතුකාගාර | 500 | |
| | ගෘහස්ථ ක්‍රීඩා මධ්‍යස්ථාන | 500 | |
| | ගොල්ෆ් ක්‍රීඩා පිටි | - | - |
| | ජලාශ්‍රිත ක්‍රීඩා පිටි | - | - |
| | බෝට්ටු ජැටි /පාරු නවාතැන් | - | - |
| | නැංගුරම් තොටුපොළවල් | - | - |

**සැකසුම:** *බස්නාහිර පළාත් අංශය*

## 8.8. තෙත් බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය



ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

### 8.8.1. තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

හෝමාගම නගර සංවර්ධන සැලැස්මේ තෙත් බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය සඳහා බලපවත්වන නියමනා සහ භාවිනයන් පිලිවෙලින් වගු අංක 8.8.1 සහ 8.1.2 මගින් දැක්වේ.

***වගුව 8.8.1 :*** *තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය - බලපවත්වන නියමතා*

| | |
|---|---|
| *සංවර්ධන කලාපය* | *තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය (ඇමුණුම 22)* |
| *කලාප අර්ථකථනය* | *ඉහළ ජෛව විවිධත්ව අගයක් ඇති තෙත්බිම් ප්‍රදේශ සහ ගංවතුර අවදානම අවම කිරීමට හා පාලනය සඳහා හේතුවන තෙත්බිම් හා ජල රැඳවුම් හා ජල බැසයාමේ ප්‍රදේශ ලෙස වෙන් කල යුතු ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.* |
| *කලාප මායිම් (බණ්ඩාංක)* | *හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල තෙත්බිම් භූ බණ්ඩාංක බස්නාහිර පළාත් තෙත්බිම් ප්‍රධාන සැලැස්මේ සඳහන් කර ඇත.* |
| *කලාප සංගුණකය* | *අදාළ නොවේ.* |
| *කලාපයට අදාළ වෙනත් කරුණු* | • *මෙම කලාපයේ අනුමත සියලු ඉදිකිරීම් කුළුණු මත විය යුතුය*<br>• *තෙත්බිම් ආශ්‍රිතව ඇළ මාර්ගවල තීව්‍රතාව අනුව භාවිතයන් සඳහා අවසර දීම සිදු කල යුතු අතර එය ඇමුණුම් 24 මඟින් දක්වා ඇත.* |

***සැකසුම :*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය*

තෙත් බිම් ස්වභාවික
සංරක්ෂිත කලාපය

තෙත්බිම් ස්වභාවික සංරක්ෂිත
කලාපය සඳහා බලපවත්වන
නියමතා සහ භාවිතයන්

*වගුව 8.8.2 : තෙත් බිම් ස්වභාවික සංරක්ෂිත කලාපය සඳහා බලපවත්වන කලාපීකරණ භාවිතයන්*

| |
|---|
| ***අනුමත භාවිතයන්*** |
| *තෙත්බිම් ස්වභාවික උද්‍යාන* |
| *පරිසර හිතකාමී අවන්හල්- වර්ග අඩි 1200 (කුළුණු මත ඉදිවූ)* |
| *කුඩා පරිමාණයේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථාන - (කුළුණු මත ඉදිවූ) වර්ග අඩි 1500, ආසන ධාරිතාවය -75, වේදිකාව - 30'X 50'* |
| *එළිමහන් ශරීර සුවතා ස්ථාන/ ශාරීරික ව්‍යායාම් පහසුකම් ඇති ස්ථාන* |
| *තෙත්බිම් කෞතුකාගාර - වර්ග අඩි 1000 (කුළුණු මත ඉදිවූ)* |
| *කබානා (කුළුණු මත ඉදිවූ )* |
| *සම්ප්‍රදායික ධීවර කර්මාන්තය* |
| *වියලි කාලගුණ තත්ත්වයේදී පමණක් ක්‍රීඩා කළ හැකි ස්ථාන (විවෘත තෘණ භූමිවල ස්වභාවය නොවෙනස්වන ආකාරයට ක්‍රීඩාවේ යෙදීම)* |
| *මල් එකතු කිරීම* |
| *ජලාශ්‍රිත ගමනාගමනය (ආරක්ෂාකාරීව අන්තර්ග්‍රහණය කර ක්‍රියාත්මක කළ හැකි නම්)* |
| *තෙත්බිම් වනාන්තර* |
| *ජාතික වැදගත්කමක් සහිත රජයේ අනුමත පොදු අපරවයුහ ව්‍යාපෘති* |
| *නව වාරිමාර්ග ඉදිකිරීම් / ගංවතුර ආරක්ෂණ ඉදිකිරීම්* |
| *තෙත්බිම් වනාන්තර* |
| *ජාතික වැදගත්කමක් සහිත රජයේ අනුමත පොදු අපරවයුහ ව්‍යාපෘති* |
| *නව වාරිමාර්ග ඉදිකිරීම් / ගංවතුර ආරක්ෂණ ඉදිකිරීම්* |
| *භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශයේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ කොන්දේසිවලට යටත්ව සිදු කරගෙන යන කැනීම් ආශ්‍රිත ව්‍යාපෘති* |
| ***අවසර නොදෙන භාවිතයන්*** |
| *මෙම කලාපය තුළ වෙනත් සියලු භාවිතයන් තහනම් වේ.* |

***සැකසුම :** පරිසර හා භූ දර්ශන අංශය*

# 8.9. කුඹුරු වගා හා තෙත්බිම් කෘෂිකාර්මික කලාපය

පවතින කුඹුරු වගා, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය, ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ සහ තෙත්බිම් කෘෂි කර්මාන්තය සිදු කරන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.

## 8.9.1. කුඹුරු වගා හා තෙත්බිම් කෘෂිකාර්මික කලාපය සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන්

හෝමාගම නගර සංවර්ධන සැලැස්මේ කුඹුරු වගා හා තෙත්බිම් කෘෂි කාර්මික කලාපය සඳහා බලපවත්වන නියමතා සහ භාවිතයන් පිලිවෙලින් වගු අංක 8.9.1 සහ 8.9.2 මගින් දැක්වේ.

***වගුව 8.9.1 :*** *කුඹුරු වගා හා තෙත්බිම් කෘෂි කාර්මික කලාපය සඳහා බලපවත්නා නියමතා*

| | |
|---|---|
| *සංවර්ධන කලාපය* | *කුඹුරු වගා හා තෙත්බිම් කෘෂි කාර්මික කලාපය (ඇමුණුම 22)* |
| *කලාප අර්ථකථනය* | *පවතින කුඹුරු වගා, පුරන්වූ කුඹුරු බිම් සහ ඊට සම්බන්ධ දෙනිය, ඕවිට යනාදී අනුශාංගික ප්‍රදේශ සහ තෙත්බිම් කෘෂි කර්මාන්තය සිදු කරන ප්‍රදේශ මෙම කලාපයට අයත් වේ.* |
| *කලාප මායිම් (බණ්ඩාංක)* | *හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල තෙත්බිම් භූ බණ්ඩාංක බස්නාහිර පළාත් තෙත්බිම් ප්‍රධාන සැලැස්මේ සඳහන් කර ඇත.* |
| *කලාප සංගුණකය* | *අදාළ නොවේ.* |
| *කලාපයට අදාළ වෙනත් කරුණු* | • *වැදගත් මහජන අපර ව්‍යුහ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ දුර්ලභ අවස්ථාවකදී, කොන්දේසි ලිහිල් කළ හැක.*<br>• *මෙම සැලැස්ම තුල හෝමාගම, කහතුඩුව, ගොඩගම නගර සංවර්ධන කටයුතු සඳහා ජල කළමනාකරණ සැලැස්මක් අනුව සංවර්ධනය කිරීමට හඳුනාගෙන, කලාපිකරණ සැලැස්මේ සලකුණු කර ඇති ප්‍රදේශ හැර මෙම කලාපය තුල කිසිදු පස් පිරවීමක් සඳහා අවසර දෙනු නොලැබේ.* |

***සැකසුම :*** *පරිසර හා භූ දර්ශන අංශය, නාගරික සංවර්ධන අධිකාරිය*

*වගුව 8.9.2 : කුඹුරු වගා හා තෙත්බිම් කෘෂිකාර්මික කලාපය සඳහා බලපවත්නා කලාපීකරණ භාවිතයන්*

| ***අනුමත භාවිතයන්*** |
|---|
| *මෙම කලාපය තුල පවතින වගා කුඹුරු හා පුරන් කුඹුරුබිම් රට සම්බන්ධ දෙණිය, ඕවිට තුල ගොවිජන සංවර්ධන පනතට අනුකූල වන අනුමත භාවිතයන් පමණක් සිදුකළ හැකිය. මෙම කලාපය තුල වෙනත් සියළු භාවිතයන් තහනම් වේ.*<br><br>*මෙම කලාපය තුල කුඹුරු ඉඩම් නාම ලේඛනයට අයත් නොවන තෙත් බිම් කෘෂිකාර්මික කටයුතු සිදු කරන ප්‍රදේශවල පහත සඳහන් භාවිත සඳහා අවසර දෙනු ලැබේ.*<br><br>1. *තෙත් බිම් ආශ්‍රිතව සිදු කරන කෘෂිකර්මාන්තය*<br>2. *අපිශාක වගාවන්*<br>3. *පරිසර හිතකාමී ජලජ ජීවී වගා පොකුණු*<br>4. *වියළි කාලගුණ ක්‍රීඩා පිටිය.*<br>5. *නාගරික කෘෂිකර්මාන්තය* |
| ***අවසර නොදෙන භාවිතයන්*** |
| *මෙම කලාපය තුල වෙනත් සියලු භාවිතයන් සහ කිසිදු ඉදිකිරීමක් සඳහා අවසර නොමැත.* |

***සැකසුම :*** *පරිසර හා භූ දර්ශණ අංශය, නාගරික සංවර්ධන අධිකාරිය*

## *සටහන් :*

ඉහත කලාපයන්හි අනුමත භාවිතයන් ක්‍රියාත්මක කිරීම යටත් කරනු ලබන කොන්දේසි

(අ). *වැදගත් පොදු අපර ව්‍යුහ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වූ දුර්ලභ අවස්ථාවකදී, ඉහත කොන්දේසි ලිහිල් කළ හැක. (අවසර ඇති උපරිම යටිතල පහසුකම් ව්‍යාපෘති – විදුලිය, ජලසැපයුම, දුරකථන, මහා මාර්ග, දුම්රිය මාර්ග ආදිය)*

(ආ). *තෙත්බිමක් ආශ්‍රිතව හෝ තෙත්බිමක් තුල උස්බිම් ප්‍රදේශ (Highland areas) පවතින අවස්ථාවේදී යෝජිත සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබාදීමට පෙර සීමා මායිම් නිර්ණය කර ගැනීම සඳහා මිනුම්දෝරු සැලැස්ම (Survey Plan) සලකා බැලිය යුතුය.*

(ඇ). *යම් අවස්ථාවක තෙත් බිම් භූ ඛණ්ඩාංක සම්බන්ධව ගැටළු ඇතිවූ විටෙක එම ඛණ්ඩාංක වෙනස්වීමේ ප්‍රවනතාව මීටර 3–10 අතර වන නිසාවෙන් එවැනි අවස්ථාවක, තෙත්බිම් කලාපීකරණයට අනුව යම් තෙත්බිම් කලාපයක මායිමේ සිට පිටතට මීටර් 3–10 දුර ප්‍රමාණයක පවතින තෙත්බිම් ප්‍රදේශ, ආසන්න සංවර්ධන සැලැස්මේ සඳහන් තෙත්බිම් කලාපයට අයත් වන අතර එම කලාපයේ අදාළ නීති රෙගුලාසි සහ අනුමත භාවිතයන්ට යටත්ව ක්‍රියාකල යුතුය. (භූ ගෝලීය පිහිටුම් පද්ධතියට අනුව ස්ථානීය පිහිටීම නිවැරදිව නිර්ණය කරගැනීමේදී පවතින දෝෂ සහගත තත්ත්වය මගහරවා ගැනීම සඳහා)*

(ඈ). *අවශ්‍ය අවස්ථාවන්හිදී පරිසර පනත යටතේ පවතින " නියමිත ව්‍යාපෘති " සඳහා මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ගොවිජන සේවා සංවර්ධන දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ආදී ආයතන-යන්ගේ අතිරේක වැඩ බිම් විශේෂිත තත්වයන් ආරෝපනය කල හැක.*

(ඉ). *කිසියම් තෙත්බිමක් සංවර්ධනය වීමේදී ඉහත කොන්දේසින් උල්ලංඝනය වීමක් සිදු වුවහොත් මධ්‍යම පරිසර අධිකාරිය, ගොවිජනසේවා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ නාගරික සංවර්ධන අධිකාරිය ආයතන සතු බලතල යටතේ නීතිමය පියවර ගනු ලැබේ.*

09

පරිච්ඡේදය

# යෝජිත මාර්ග පළල, ගොඩනැගිලි සීමා, රක්ෂිත

හෝමාගම සංවර්ධන සැලැස්මේ මාර්ග ජාලය සංවර්ධනය කිරීමේදී ප්‍රමුඛතා පදනම මත හඳුනාගත් පුළුල් කළ යුතු මාර්ග සඳහා යෝජිත මාර්ග පළලක් ලබාදී ඇති අතර, අනෙකුත් මාර්ග සඳහා ගොඩනැගිලි සීමා හඳුන්වාදී ඇත. එසේම, ඇළ දොළ ගංගා හා වැව් සඳහාද ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් 2010.07.14 දිනැති හා අංක 1662/17 දරණ ගැසට් නිවේදනය අනුව ප්‍රකාශයට පත් කර ඇති ඇළ රක්ෂිත ප්‍රදේශ මෙම ප්‍රදේශයට අදාළ වන අතර, එම ගැසට් නිවේදනය මගින් ආවරණය නොවන ජල ප්‍රදේශයන් සඳහා රක්ෂිත වගු අංක 9.4 හා 9.5 මගින් හඳුන්වාදී ඇත.

# 9.1. යෝජිත මාර්ග පළල ක්‍රියාත්මක වන මාර්ග

## 9.1.1. යෝජිත A වර්ගයේ මාර්ග

(පළමු කොටසෙහි සිතියම් අංක 6.3)

*වගුව 9.1 : යෝජිත A වර්ගයේ මාර්ග*

| No | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්) | ගොඩනැගිලි සීමාව | |
|---|---|---|---|---|
| | | | (මීටර්) | (අඩි) |
| 1. | හයිලෙවල් මාර්ගය (A4) | 23.4 | 18.3 | 60 |
| 2. | කොළඹ - හොරණ පාර (AB10) | 23.4 | 15.3 | 50 |
| 3. | ලෝලෙවල් මාර්ගය (B84) | 23.4 | 15.3 | 50 |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

## 9.1.2. යෝජිත B වර්ගයේ මාර්ග

(පළමු කොටසෙහි සිතියම් අංක 6.3)

*වගුව 9.2 : යෝජිත B වර්ගයේ මාර්ග*

| No | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්)) | ගොඩනැගිලි සීමාව | |
|---|---|---|---|---|
| | | | (මීටර්) | (අඩි) |
| 1. | හිරිපිටිය - සියඹලාගොඩ පාර හෙවත් පොල්ගස්ඕවිට පාර | 10 | 12.2 | 40 |
| 2. | කහතුඩුව - කිරිවත්තුඩුව පාර | 10 | 12.2 | 40 |
| 3 | කිරිගම්පමුණුව පාර - ශ්‍රී සරණංකර මාවත | 10 | 12.2 | 40 |
| 4. | මාලපල්ල මාර්ගය හෙවත් හෝමාගම ගලවිල කොට්ටාව මාර්ගය | 10 | 12.2 | 40 |
| 5. | හෝමාගම තලගල මාර්ගය | 10 | 12.2 | 40 |

| No | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්)) | ගොඩනැගිලි සීමාව | |
|---|---|---|---|---|
| | | | (මීටර්) | (අඩි) |
| 6. | දාම්පේ - පිටිපන මාර්ගය | 10 | 12.2 | 40 |
| 7. | මීගොඩ,දාම්පේ බෙරුකැටිය මාර්ගය | 10 | 12.2 | 40 |
| 8. | නැදුන්හේන, නාවලමුල්ල,වැලිපිල්ලෑව මාර්ගය හා ලෙනගල මාර්ගය | 10 | 12.2 | 40 |
| 9. | යෝජිත බටහිර අතුරු මාර්ගය | 10 | 12.2 | 40 |
| 10. | උඩුවන පන්සල හන්දිය මාර්ගය හෙවත් පිටිපන, මාවත්ගම, ඕවිටිගම, උඩුවන මාර්ගය | 10 | 12.2 | 40 |
| 11. | යෝජිත මාහේනවත්ත සිට මිල්ලෑව දක්වා දිවෙන නව මාර්ගය | 10 | 12.2 | 40 |
| 12. | ඕවිලාන - මාදුලාව මාර්ගය | 10 | 12.2 | 40 |
| 13. | හබරකඩ - රණාල මාර්ගය | 10 | 12.2 | 40 |
| 14. | (B 123) ගලගෙදර - හොරණ මාර්ගය | 10 | 15.3 | 50 |
| 15. | (B 267) මාම්පේ - කොට්ටාව මාර්ගය (කොට්ටාව පිළියන්දල මාර්ගය) | 10 | 15.3 | 50 |
| 16. | (B 239) කොට්ටාව - තලගල මාර්ගය | 10 | 15.3 | 50 |
| 17. | (B 452) වල්ගම - දියගම මාර්ගය (මොරගහහේන මාර්ගය) | 10 | 15.3 | 50 |
| 18. | (B 451) වල්ගම - අතුරුගිරිය මාර්ගය | 10 | 15.3 | 50 |
| 19. | (B 240) කෝට්ටේ - බෝපේ මාර්ගය (මාලබේ ගොඩගම මාර්ගය) | 10 | 15.3 | 50 |
| 20. | (B 354) පනාගොඩ හේන්පිට මාර්ගය | 10 | 15.3 | 50 |

***සැකසුම:*** *බස්නාහිර පළාත් අංශය*

## 9.1.3. යෝජිත "C" වර්ගයේ මාර්ග

(පළමු කොටසෙහි සිතියම් අංක 6.4)

*වගුව 9.3 : යෝජිත "C" වර්ගයේ මාර්ග*

| No | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්) | ගොඩනැගිලි සීමාව | |
|---|---|---|---|---|
| | | | (මීටර්) | (අඩි) |
| 1. | කොස්හේන පාර | 7 | 6.1 | 20 |
| 2. | ශාසනාභිවර්ධන මාවත සහ නියඳගල මාර්ග සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 3. | පැලෑදගොඩ පාර | 7 | 6.1 | 20 |
| 4. | අකරවිට මාවත | 7 | 6.1 | 20 |
| 5. | ලේලන්ඩ් පාර | 7 | 6.1 | 20 |
| 6. | ලයනල් ජයසිංහ මාවත | 7 | 6.1 | 20 |
| 7. | දහම් මාවත | 7 | 6.1 | 20 |
| 8. | වෙදගේවත්ත පාර | 7 | 6.1 | 20 |
| 9. | මහින්ද මාවත | 7 | 6.1 | 20 |
| 10. | වල්පිට පාර | 7 | 6.1 | 20 |
| 11. | කොම්පයාහේන පාර | 7 | 6.1 | 20 |
| 12. | ගල්කන්ද පාර | 7 | 6.1 | 20 |
| 13. | මොරගහහේන පාර සහ කුලසිරි කුමාරගේ පාර සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 14. | සිරි රත්න මාවත | 7 | 6.1 | 20 |
| 15. | පැලෑදගොඩ පාර සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 16. | දුම්රිය පාර | 7 | 6.1 | 20 |
| 17. | කොට්ටාව - මත්තෙගොඩ ( සල්ගහ හන්දියට ලගාවන මාර්ගය) | 7 | 6.1 | 20 |
| 18. | වැතර පරණ පාර | 7 | 6.1 | 20 |
| 19. | කැස්බෑව - කිදෙල්පිටිය - බණ්ඩාරගම පාර | 7 | 6.1 | 20 |
| 20. | සල්ගස් මාවත | 7 | 6.1 | 20 |
| 21. | මාකුඹුර පුරාණ රජමහ විහාර ඉදිරිපිට පාර | 7 | 6.1 | 20 |
| 22. | පැපැලිවල පාර | 7 | 6.1 | 20 |

යෝජිත මාර්ග පළල ක්‍රියාත්මක වන මාර්ග

යෝජිත "C" වර්ගයේ මාර්ග

| No | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්) | ගොඩනැගිලි සීමාව | |
|---|---|---|---|---|
| | | | (මීටර්) | (අඩි) |
| 23. | රණතිසරු උයන පාර | 7 | 6.1 | 20 |
| 24. | පුබුදු මාවත | 7 | 6.1 | 20 |
| 25. | කුලතුංග මාවත | 7 | 6.1 | 20 |
| 26. | ජාලියගම පාර | 7 | 6.1 | 20 |
| 27. | කුඩමාදුව පාර | 7 | 6.1 | 20 |
| 28. | පොල්ගස්ඕවිට සම්බන්ධවන පාර කුඩමාදුව සියඹලාගොඩ පාර | 7 | 6.1 | 20 |
| 29. | විදර්ශන මාවත | 7 | 6.1 | 20 |
| 30. | සරණතිස්ස පාර | 7 | 6.1 | 20 |
| 31. | සුභසාධක මාවත | 7 | 6.1 | 20 |
| 32. | මීගොඩ ආයුර්වේද රෝහල සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 33. | ප්‍රගති මාවත | 7 | 6.1 | 20 |
| 34. | හිරිපිටිය මාවත සහ බෝගහවිල මාවත සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 35. | ශ්‍රී සුදර්ශනාරාම පාර | 7 | 6.1 | 20 |
| 36. | හෙරලියවල පාර | 7 | 6.1 | 20 |
| 37. | උඩුවගේවත්ත පාර | 7 | 6.1 | 20 |
| 38. | පිංකෙත පාර | 7 | 6.1 | 20 |
| 39. | නගරසීමා මාවත | 7 | 6.1 | 20 |
| 40. | වලව්ව පාර | 7 | 6.1 | 20 |
| 41. | මුණමලේවත්ත පාර | 7 | 6.1 | 20 |
| 42. | උඩුවන පන්සල පාර සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 43. | දොලහේන ගොවිජනපද පාර සම්බන්ධවන පිටිපන තලගල පාර | 7 | 6.1 | 20 |
| 44. | කුරුසි මාවත | 7 | 6.1 | 20 |
| 45 | දොලහේන - මුණමලේ වත්ත පාර | 7 | 6.1 | 20 |
| 46 | කොහලාවල මාවත | 7 | 6.1 | 20 |
| 47. | සමගි මාවත ( දියගම) | 7 | 6.1 | 20 |

**09 පරිච්ඡේදය
යෝජිත මාර්ග පළල,
ගොඩනැගිලි සීමා, රක්ෂිත**

යෝජිත මාර්ග පළල
ක්‍රියාත්මක වන මාර්ග

Proposed C Type Roads

| No | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්) | ගොඩනැගිලි සීමාව | |
|---|---|---|---|---|
| | | | (මීටර්) | (අඩි) |
| 48. | හිරිපිටිය පාර | 7 | 6.1 | 20 |
| 49. | දූවවත්ත පාර | 7 | 6.1 | 20 |
| 50. | අන්කුට්ටවල පාර | 7 | 6.1 | 20 |
| 51. | ගොඩගමවත්ත පාර | 7 | 6.1 | 20 |
| 52 | කොට්ටාව - මත්තෙගොඩ (සල්ගහ හන්දියට ලගාවන මාර්ගය) | 7 | 6.1 | 20 |
| 53. | ශ්‍රී සුදර්ශනාරාම පාර | 7 | 6.1 | 20 |
| 54. | සුගතානන්ද නාහිමි මාවත | 7 | 6.1 | 20 |
| 55. | ශ්‍රී සුදර්ශනාරාම පාර | 7 | 6.1 | 20 |
| 56 | නලින්ප්‍රිය මාවත | 7 | 6.1 | 20 |
| 57 | දියගම පාර හා කහතුඩුව සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 58 | කුරුදුවත්ත පටුමග | 7 | 6.1 | 20 |
| 59. | දියගම නුගේ ඉදිරිපිට පාර | 7 | 6.1 | 20 |
| 60 | දියගම සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 61. | මාකන්දන පාර | 7 | 6.1 | 20 |
| 62 | ඕවිටිගම පන්සල ඉදිරිපිට පාර | 7 | 6.1 | 20 |
| 63. | බණ්ඩාර මාවත | 7 | 6.1 | 20 |
| 64. | කුරුදුවත්ත පාර | 7 | 6.1 | 20 |
| 65. | කොළඹ - හොරණ සම්බන්ධවන කුඩමාදුව පාර | 7 | 6.1 | 20 |
| 66. | ශ්‍රී විජයරාම පන්සල අදුරුගොඩ පාර | 7 | 6.1 | 20 |
| 67 | වෙනිවැල්කොල කොරලඉම පාර | 7 | 6.1 | 20 |
| 68. | උක්කොටුව පාර | 7 | 6.1 | 20 |
| 69. | තුඩුවවත්ත පාර | 7 | 6.1 | 20 |
| 70 | කොළඹ - හොරණ පාර සහ කහතුඩුව සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 71. | කොළඹ - හොරණ පාර සහ ප්‍රගති මාවත සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 72. | වැකන්ද පාර ( කෝට්ටේ - බෝපේ පාර සිට හෝමාගම අතුරුගිරිය පාර) | 7 | 6.1 | 20 |
| 73. | සරණතිස්ස මාවත සම්බන්ධවන පාර 1 | 7 | 6.1 | 20 |

| No | මාර්ගයේ නම | යෝජිත මාර්ග පළල (මීටර්) | ගොඩනැගිලි සීමාව | |
|---|---|---|---|---|
| | | | (මීටර්) | (අඩි) |
| 74. | සරණතිස්ස මාවත සම්බන්ධවන පාර 3 | 7 | 6.1 | 20 |
| 75. | සරණතිස්ස මාවත සම්බන්ධවන පාර 2 | 7 | 6.1 | 20 |
| 76. | කහතුඩුව නව නගර පාර | 7 | 6.1 | 20 |
| 77. | බෝගහවිල පාර | 7 | 6.1 | 20 |
| 78 | කොට්ටාව - හොරණ පාර සහ තුඩුවත්ත පාර සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 79 | දියගම පන්සල ඉදිරිපිට පාර | 7 | 6.1 | 20 |
| 80 | ශ්‍රී සෝමාලංකාර මාවත | 7 | 6.1 | 20 |
| 81 | හිරිපිටිය පාර | 7 | 6.1 | 20 |
| 82 | මාගම්මන පන්සල ඉදිරිපිට පාර | 7 | 6.1 | 20 |
| 83 | කුලසිරි කුමාරගේ මාවත | 7 | 6.1 | 20 |
| 84 | වෛද්‍ය මාවත | 7 | 6.1 | 20 |
| 85 | නාවලමුල්ල සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 86 | නාවලමුල්ල පාර සිට ආටිගල පාර දක්වා | 7 | 6.1 | 20 |
| 87 | බටවල සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 88 | පැලෑදගොඩ පාර සහ කොම්පයාහේන සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |
| 89 | රොමියෙල් මාවත | 7 | 6.1 | 20 |
| 90 | විමාන මාවත | 7 | 6.1 | 20 |
| 91 | උසාවි පාර | 7 | 6.1 | 20 |
| 92 | නියදගල පාර | 7 | 6.1 | 20 |
| 93 | අම්බලන්ගොඩ - පාලාගම පාර | 7 | 6.1 | 20 |
| 94 | නේවත්ත පාර | 7 | 6.1 | 20 |
| 95 | රූබන් අමරතුංග මාවත | 7 | 6.1 | 20 |
| 96 | දොලහේන ගොවිජනපද පාර | 7 | 6.1 | 20 |
| 97. | ආටිගල සම්බන්ධවන පාර | 7 | 6.1 | 20 |

**සැකසුම:** බස්නාහිර පළාත් අංශය

(අ). *යෝජිත වීථි රේඛාවේ සිට (1) අඩියක හරිත තීරයක් පවත්වාගෙන යා යුතුය.*

(ආ). *මෙම මාර්ග ලැයිස්තුවේ නම හෝමාගම ප්‍රාදේශීය සභාව මගින් සඳහන් කරන ලද නාමලේඛනයේ නම හා නොගැලපෙන විට පළමු කොටසෙහි සිනියම් අංක 6.4 අනුව මාර්ගය හඳුනාගත යුතුය.*

(ඇ). *මහින්ද රාජපක්ෂ ජාතික පාසැල් ප්‍රධාන දොරටුව ඉදිරිපිට සිට කොළඹ විශ්ව විද්‍යාලය දක්වා දිවෙන මාර්ගය සඳහා ගොඩනැගිලි සීමාව මාර්ගය මධ්‍යයේ සිට අඩි 70ක් වන අතර ඉන් අඩි 20ක් ගස් වවා හරිත තීරයක් ලෙස පවත්වා ගෙන යායයුතුය.*

## 9.1.4. යෝජිත D වර්ගයේ මාර්ග

යෝජිත D වර්ගයේ මාර්ග සඳහා ඉහත A, B හා C කාණ්ඩයට අයත් නොවන, ප්‍රාදේශීය සභාව මඟින් ප්‍රකාශිත සියළු මාර්ග, ප්‍රාදේශීය සභාව නඩත්තු කරන සහ පෞද්ගලික අයිතිය තහවුරු නොවන සියළු මාර්ග අයත්වේ.

මෙම යෝජිත D වර්ගයේ මාර්ග සඳහා අවම යෝජිත මාර්ග පළල ලෙස මීටර් 6 ක් පවත්වාගෙන යා යුතුය. (හෝමාගම ප්‍රාදේශීය සභාව විසින් ගැසට් කරන ලද මාර්ග ලැයිස්තුව ඇමුණුම් අංක 25 මඟින් දක්වා ඇත.)

## 9.1.5. ගොඩනැගිලි සීමා ක්‍රියාත්මක වන මාර්ග

හෝමාගම නගර සංවර්ධන සැලැස්ම යටතේ ප්‍රමුඛතා පදනම මත සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇති මාර්ගවලට අමතරව පවත්නා මාර්ග සඳහා ඉදිරි සංවර්ධන අවශ්‍යතා සලකා ගොඩනැගිලි සීමාවන් හඳුන්වාදී ඇත. ඒ අනුව පහත මාර්ග සඳහා ගොඩනැගිලි සීමා ක්‍රියාත්මක වේ.

### 9.1.5.1. "A" හා "B" වර්ගයේ මාර්ගවලට ඇතුළත් නොවූ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් අනෙකුත් සියලු මාර්ග - (ගොඩනැගිලි සීමාව මීටර් 9 යි.)

1. *හෝමාගම රෝහල පාර*
2. *දික්හේන බටවල විල උඩ පාර*
3. *දොලේකඩේ මාකුඹුර පාර*
4. *රණාල හබරකඩ පාර*
5. *හොරගල දාම්පේ පාර*
6. *කහතුඩුව දියකඩ පාර*
7. *හයිලෙවල් පාර හා කෝට්ටේ – බෝපේ පාර සම්බන්ධවන පාර*
8. *මත්තෙගොඩ කුඩමාදුව සංඝාරාම පාර*
9. *මීගොඩ ගැහැනුවල ආටිගල පාර*
10. *මීගොඩ නඩුහේන පාර*
11. *මුල්ලෙගම හබරකඩ පාර*
12. *නඩුහේන නාවලමුල්ල වැලිපිල්ලෑව පාර*
13. *නියඳගල හිරිපිටිය දොලේකඩේ පාර*
14. *සීලාලංකාර මාවත*
15. *වටරැක බෙරුකැටිය පාර*

16. *වටරැක පින්නලන්ද පාර*
17. *වෑකන්ද පාර*
18. *වෑතර විද්‍යාගම පාර*
19. *ලියන්වල – කුරුගල මාර්ගය*
20. *මාවත්ගම මාර්ගය (හයිලෙවල් මාර්ගය හා උඩුවන පන්සල හන්දිය යා කෙරෙන මාර්ගය)*

## 9.1.5.2. "D" වර්ගයේ මාර්ග

- පළාත් පාලන ආයතන සතු මාර්ග – ගොඩනැගිලි සීමාව මාර්ගය මැද සිට මීටර් 6
- පළාත් පාලන ආයතන විසින් නඩත්තු කරනු ලබන හා අනෙකුත් පොදු මාර්ග – ගොඩනැගිලි සීමාව මාර්ගය මැද සිට මීටර් 4.5

(පළාත් පාලන ආයතනය විසින් ගැසට් කරන ලද මාර්ග ලැයිස්තුව ඇමුණුම් අංක 25 මගින් දක්වා ඇත.)

## 9.1.5.3. පෞද්ගලික මාර්ග සම්බන්ධයෙන් වනවිට ගොඩනැගිලි සීමා පවත්වාගෙන යාම

පුද්ගලික මාර්ග සඳහා මාර්ගයේ මායිමේ සිට මීටර් 1.5 ක ගොඩනැගිලි සීමාවක් පවත්වාගෙන යා යුතුය.

## 9.1.6. යෝජිත වීථි රේඛාව සංවර්ධන කටයුතු සඳහා විවෘත කිරීම

සංවර්ධන අවසරපත්‍ර නිකුත් කිරීමේදී සංවර්ධන භූමියට යෝජිත වීථි රේඛාවක් ඇති අවස්ථාවක ඉඩමේ අයිතිකරු විසින් මුදල් ලබාගැනීමකින් තොරව ඔප්පුවක් මගින් යෝජිත මාර්ග පළල් කිරීම තුල ඉඩම් කොටස අවස්ථාවෝචිත පරිදි අදාළ පළාත් පාලන ආයතනයට, මාර්ග සංවර්ධන අධිකාරියට, පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ප්‍රදානයක් ලෙස පොදු පරිහරණය සඳහා මුදාහරින්නේ නම් වීථි රේඛාවේ පළල, සංවර්ධනය සඳහා සලකා බලන භෞතික පළල ලෙස ආදේශ කර ගනිමින් සංවර්ධනය සලකා බැලීමට අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ. ඒ අනුව, A, B, C හා D වර්ගයේ මාර්ග සඳහා පහත පරිදි කටයුතු කරනු ලැබේ.

### *1. A හා B වර්ගයේ මාර්ග*

A හා B වර්ගයේ මාර්ගයකට මුහුණලා පවත්නා බිම් කොටසක් සංවර්ධනයේදී යෝජිත මාර්ගයේ පළල සංවර්ධනකරුගේ බිම් කොටසින් අත්හැරීම අත්‍යවශ්‍ය නොවන අතර, වැඩි ඝනත්ව වාණිජ කලාප තුල සංවර්ධනයන් සිදු කරන්නේ නම් යෝජිත මාර්ගයේ පළල සඳහා අවශ්‍ය ඉඩකඩ මාර්ගයේ මධ්‍යයේ සිට අදාළ ඉඩමට අයත් කොටස කිසිඳු බාධකයකින් (මායිම් තාප්ප, මායිම් වැටවල්) තොරව පවත්වාගෙන යා යුතුය. එසේ වුවද, යෝජිත මාර්ග පළලට අදාළ වර්ග ප්‍රමාණ වාසිය ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, මාර්ග මධ්‍යයේ සිට සංවර්ධන ඉඩමට අයත් කොටස මාර්ගයට මුදා හැර අදාළ ආයතනවලට තෑගි ඔප්පුවකින් පැවරිය යුතුය.

2. *C වර්ගයේ මාර්ග*

C වර්ගයේ මාර්ගයකට මුහුණලා පවත්නා බිම් කොටසක් සංවර්ධනයේදී යෝජිත වීථි රේඛාව බිම් කොටසින් අත්හැරීම අත්‍යවශ්‍ය නොවන අතර, අදාල භූමිය තුල නේවාසික නොවන සංවර්ධනයන් සිදු කරනේ නම් හෝ සංවර්ධනයේ අවශ්‍යතාවය අනුව පමණක් යෝජිත වීථි රේඛාවේ පළලට අවශ්‍ය ඉඩකඩ මාර්ගයේ මධ්‍යයේ සිට සංවර්ධන ඉඩමට අයත් කොටස අදාළ ආයතනයට අතිරේක වියදමකින් තොරව පැවරිය යුතුය. එසේ නොවුනද, මාර්ග පළල අවම මීටර් 7 ක් වීමට අවශ්‍ය ඉඩකඩ මාර්ග මධ්‍යයේ සිට සංවර්ධන ඉඩමට අයත් කොටස මාර්ග පුළුල් කිරීම සඳහා වෙන් කර පළාත් පාලන ආයතනයේ සහයෝගය ඇතිව භෞතිකව සකස් කර අදාල පළාත් පාලන ආයතනයට පැවරිය යුතුය.

3. *D වර්ගයේ මාර්ග*

D වර්ගයේ මාර්ගයකට මුහුණලා පවත්නා බිම් කොටසක් සංවර්ධනයේදී මාර්ගයේ පළල අවම මීටර් 6 ක් වීමට අවශ්‍ය ඉඩකඩ සඳහා ප්‍රවේශ මාර්ගයේ මධ්‍යයේ සිට අදාළ වන ඉඩකඩ ප්‍රවේශ මාර්ගය පුළුල් කිරීම සඳහා වෙන්කර, පළාත් පාලන ආයතනයේද සහයෝගය ඇතිව භෞතිකව සැකසිය යුතුය. එම ඉඩම් කොටස පළාත් පාලන ආයතනයට අතිරේක වියදමකින් තොරව පැවරිය යුතුයි.

D.i) සංවර්ධන කටයුතු සඳහා අවසර දීමට යෝජිත වීථි රේඛා විචෘත කිරීම පමණක් ප්‍රමාණවත් වන අතර, අනුකූලතා සහතික ලබා ගැනීමට පෙර නිත්‍යානුකූල පැවරීම් කටයුතු සිදු කල යුතුය.

# 9.2. දුම්රිය මාර්ග රක්ෂිත සහ අධිවේගී මාර්ග රක්ෂිත

## 9.2.1. දුම්රිය මාර්ග

දැනට පවත්නා දුම්රිය මාර්ග සහ යෝජිත දුම්රිය මාර්ග සඳහා අදාළ වන මාර්ග රක්ෂිත දුම්රිය දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව තීරණය කරනු ලැබේ.

## 9.2.2. අධිවේගී මාර්ග රක්ෂිත

අංක 2235/54 – 2021.7.8 ගැසට් මඟින් ප්‍රකාශයට පත් කරන ලද සැලසුම් හා ගොඩනැගිලි නියෝග / රෙගුලාසි (පොදු) හි 17 වන උපලේඛනය අනුව කටයුතු කලයුතුය.

## 9.3. ඇළ / දොළ , වැව්, ගංගා සහ ජලාශ සඳහා රක්ෂිත / ගොඩනැගිලි සීමා

හෝමාගම නගර සංවර්ධන සැලැස්මේ වගු අංක 9.4 හි විශේෂයෙන් සඳහන් කර ඇති ගංගා, ඇළ මාර්ග, වැව් සහ ජලාශවල රක්ෂිත සීමාවන්ට/ගොඩනැගිලි සීමාවන්ට අමතරව ප්‍රදේශයේ ජලය බැසයන හෝ බැස යාමට සලස්වා ඇති හෝ ජලය බැස යාමේ අරමුණින් නිර්මාණය කර ඇති හෝ ස්වභාවික සියළු ප්‍රධාන ඇළ මාර්ග, සියළු අතුරු ඇළ මාර්ග හා සියළු පෝෂක ඇළ මාර්ගයන්හි මතුපිට පළලට අනුරූපීව පහත ලේඛනයේ දක්වා ඇති පරිදි ඇළ ඉවුරු දෙකෙහිම මායිමේ සිට දුර ප්‍රමාණයන් ඇළ රක්ෂිත / ගොඩනැගිලි සීමාවන් වශයෙන් පවත්වාගෙන යා යුතුය.

***වගුව 9.4 :*** *ඇළ දොළ රක්ෂිත / ගොඩනැගිලි සීමාව*

| ඇළෙහි මතුපිට පළල (මීටර්) | ඇළ ඉවුරේ මායිමේ සිට රක්ෂිතය | |
|---|---|---|
| | විවෘත ඇළ සඳහා (මීටර්) | මතුපිට ආවරණය කරන ලද ඇළ සඳහා (මීටර්) |
| 1.0 – 1.2 | 1.0 | 0.3 |
| 1.3 – 3.0 | 2.0 | 1.0 |
| 3.1 – 4.5 | 2.75 | 1.0 |
| 4.6 – 6.0 | 3.5 | 1.5 |
| 6.1 – 9.0 | 4.5 | 1.5 |
| 9.0 ට වැඩි | 6.5 | 2.0 |

***මූලාශ්‍රය :*** *ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව*

9.3.a. *ඉහත රක්ෂිත සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි අධිකාරිය, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව හා පළාත් පාලන ආයතනය විසින් ප්‍රකාශ කර ඇති දුර ප්‍රමාණ මෙම ප්‍රකාශයේ රක්ෂිත ප්‍රමාණයන්ට වැඩිවන අවස්ථාවක එම ආයතනය විසින් ප්‍රකාශ කරනු ලබන රක්ෂිත තැබිය යුතුය.*

9.3.b. *ඉහත රක්ෂිතයන්ට අමතරව මීටර් 1 ට අඩු ජල කාණු සඳහා රක්ෂිතයක් තැබිය යුතු අවස්ථාවක එම කාණුවේ මායිමේ සිට මීටර් 0.5 ක රක්ෂිතයක්/ගොඩනැගිලි සීමාවක් තැබිය යුතුය.*

9.3.c. *විශේෂයෙන් ගොඩනැගිලි සීමා / ජල රක්ෂිත පවත්වාගෙන යා යුතු ගංගා, වැව්, ඇළවල්*

*මගුව 9.5 : විශේෂයෙන් ගොඩනැගිලි සීමා / ජල රක්ෂිත පවත්වාගෙන යා යුතු ගංගා, වැව්, ඇළවල්*

| ගංගාවේ නම | තැබිය යුතු රක්ෂිතය ඇළ ඉවුරේ සිට (මීටර්) |
|---|---|
| කැලණි ගඟ | 20 |
| පුස්සැලි ඔය | 10 |
| මහ ඔය - i (කළු ගඟ අතු ඔය) | 8 |
| මහ ඔය - ii (කිඹුල්කොටුව ඇළ) | 8 |
| නුදුන් ඇළ | 8 |
| ඔළුපට්ටාව වැව | 15 |
| මත්තෙගොඩ වැව | 15 |
| පරඩැල් වැව | 15 |

*සැකසුම : බස්නාහිර පළාත් අංශය*

9.3.d. *ඇළ මාර්ග රක්ෂිත සඳහා කොන්දේසි හා නියමයන්*

I. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන විධායක නිලධාරිගේ ලිඛිත අනුමැතිය නොමැතිව ඇළ රක්ෂිත ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශිත ඇළ රක්ෂිත ප්‍රදේශ තුල කිසිඳු ආකාරයක ගොඩනැගිලි හෝ ව්‍යුහ ඉදිකිරීමක් සහ (හෝ) ගොඩකිරීමක් නොකළ යුතුය.

II. මෙම ප්‍රකාශිත ඇළ රක්ෂිත තුල ඇති යම් ඇළකට සංස්ථාවේ අනුමැතියකින් තොරව මළ නල, කර්මාන්ත අපද්‍රව්‍ය හෝ කිසිඳු දූෂකකාරකයක් දැමීම බැහැර කිරීම හෝ එසේ කරනු ලැබීමට සැලැස්වීම නොකළ යුතුය.

III. කිසිඳු විකල්ප මාර්ගයක් නොමැති අවස්ථාවලදී පමණක් ඇළ රක්ෂිතය ප්‍රවේශ මාර්ගයක් ලෙස භාවිතා කළ හැකි වුවත්, එම මාර්ගය මත ගල් අතුරා තාර දැමීම හෝ කොන්ක්‍රීට් කිරීම හෝ වෙනත් ඇතිරීමක් කිරීම සිදු නොකළ යුතුය.

IV. එවැනි ඇළ මාර්ගයක රක්ෂිතයක් තුල වාණිජ කටයුතු, වෙනත් ඕනෑම කාර්යයක් සඳහා බදු වශයෙන් ලබාදීම, පුද්ගලයකු, සමිතියක්, ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් විසින් නොකළ යුතුය.

V. ඇළ රක්ෂිත ලෙස ප්‍රකාශිත ප්‍රදේශ තුල රථවාහන ගාල් කිරීම, ගරාජ සඳහා භාවිතා කිරීම සඳහා ඉඩම් කොටස් භාවිතා නොකළ යුතුය

9.3.e. *අනෙකුත් කරුණු*

ඉහත කිසිඳු අවස්ථාවක රක්ෂිත/ගොඩනැගිලි සීමා තුල මායිම් තාප්ප ඉදිකිරීම් සඳහා අවසර දෙනු නොලැබේ. එසේ වුවද, මායිම් වැටක්, දැල්වැටක් අවසරදීම සලකා බලනු ලැබේ.



# තුන්වන කොටස

# අර්ථකතනයන්

- Intergrity Analysis – මාර්ග අතර ඒකාබද්ධතාව හඳුනා ගැනීම සඳහා කරන විශ්ලේෂණයකි
- Urban Form – නගර ආකෘතිය. නගර නිර්මාණකරණය තුළ නගරය දිස්වන ආකාරය පැහැදිලි කිරීම සඳහා භාවිතා කරන්නකි.
- Connectivty – ප්‍රදේශයක ප්‍රධාන හන්දි නැත්නම් ප්‍රධාන නගර මධ්‍ය අතර පවතින සම්බන්ධතාව හඳුනා ගැනීම සඳහා කරන විශ්ලේෂණයකි.
- Gephi Analysis – නගර හා එහි ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීම සඳහා භාවිත කරන මෘදුකාංගයකි. එමගින් කරනු ලබන විශේෂණ මේ නමින් හඳුන්වනු ලැබේ.
- Development Pressure Analysis – නගරවල නාගරිකභාවය හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණයකි.
- Sensitivity Analysis – පරිසර සංවේදී ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණයකි.
- Livability Analysis – නගරයක් තුල මිනිසාට ජීවත්වීම සඳහා සුදුසු වාතාවරණයක් තිබෙන ප්‍රදේශ හඳුනාගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණයකි.
- Potential Space Analysis – නගරයක් තුල නාගරික ක්‍රියාකාරීත්වය සඳහා තිබිය යුතු යටිතල පහසුකම් ඇතුළු අනෙකුත් සාධක ඒකරාශී වූ ප්‍රදේශ හඳුනා ගැනීම සඳහා කරනු ලබන විශ්ලේෂණයකි.
- COM Trans – Urban Transport System Development Project For Colombo Metropolitan Region And Suburbs
- NVIVO – ගුණාත්මක දත්ත විශ්ලේෂණය සඳහා යොදා ගන්නා මෘදුකාංගයකි

# කෙටි යෙදුම්

| | |
|---|---|
| නා.සං.අධි. | නාගරික සංවර්ධන අධිකාරිය |
| CMRSP | Colombo MetroRegional Structure Plan |
| NWSDB | National Water Supply & Drainage Board |
| WHO | World Health Organaization |
| RDA | Road Development Authority |
